(iii) ඒ හේතුවෙන් පොතුවිල් ප්‍රාදේශීය සභාවට අදාළ ව්‍යාපාර බදු අය කිරීමට නොහැකිවී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය යටතේ පෞද්ගලික මැනුම්කරුවන් මඟින් ඉඩම් මැනුම් සිදුකර "උරුමය" ඔප්පු කඩිනමින් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන්නේද;

(v) එසේ සකස් කරන මිනින්දෝරු සැලසුම් භාවිතා කර එම ඉඩම් "උරුමය" යෝජනා ක්‍රමයට ඇතුළත් කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள் காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொத்துவில் பிரதேச செயலகப் பிரிவுக்குட்பட்ட சின்னஉல்லை, அறுகம்பே, சர்வோதயபுரம், ஜலால்தீன் சதுக்கம், குடாக்கள்ளி, விஸ்கி பொயிண்ட், கொட்டுக்கல் மற்றும் லைட் ஹவுஸ் போன்ற சுற்றுலாத் தளங்களில் சுற்றுலா விடுதிகளை நடத்துபவர்களின் காணிகளுக்கு அரசாங்கம் சரியான முறையில் நில அளவீடுகளைச் செய்து உறுதிகளை வழங்கவில்லை என்பதை அறிவாரா என்பதையும்;

(ii) அத்தகைய ஆவணங்கள் இல்லாத சுற்றுலா விடுதிகளை இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபையில் பதிவுசெய்ய முடியாது என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) அதன் காரணமாக, பொத்துவில் பிரதேச சபைக்கு ஏற்புடைய வியாபார வரிகளை அறவிட முடியாமல் உள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(iv) அவ்வாறெனில், பிரதேச செயலாளரின் அனுமதியின்கீழ் தனியார் நிலஅளவையாளர்கள் மூலம் நிலஅளவை செய்து 'உருமய' உறுதிகளை விரைவாகப் பெறுவதற்கான வாய்ப்பை வழங்க முடியுமா என்பதையும்;

(v) அவ்வாறு நில அளவையாளர்களால் தயாரிக்கப்படும் வரைபடத்தைப் பயன்படுத்தி அந்தக் காணிகளை 'உருமய' திட்டத்தில் சேர்க்க முடியுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that the Government has not conducted surveys and issued deeds for the lands owned by individuals operating holiday resorts in tourist areas such as Sinna Ullai, Arugam Bay, Sarvodayapura, Jalaldeen Square, Kudakalliya, Whisky Point, Kottukal and Light House in the Pottuvil Divisional Secretary'a Division;

(ii) whether he admits that holiday resorts lacking such documentation cannot be registered with the Sri Lanka Tourism Development Authority;

(iii) whether he is aware that, as a result, the Pottuvil Pradeshiya Sabha has been unable to levy the relevant business tax;

(iv) if so, whether steps will be taken to provide an opportunity, under the approval of the Divisional Secretary, for land surveys to be carried out by private surveyors in order to expedite the issuance of "Urumaya" deeds; and

(v) whether such lands can be included in the "Urumaya" scheme, using the survey plans prepared in the said manner?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) මෙම ප්‍රදේශවල මැනුම් කර නොමැතිව ජයභූමි ඔප්පු ලබා ගත් පුද්ගලයින් සිටින අතර, මේ වන විට සින්න උල්ල, ආරුගම්බේ, ජලාල්දීන් චතුරශ්‍රය, සර්වෝදයපුරම් යන ප්‍රදේශවල නිවාඩු නිකේතන පවත්වා ගෙන යන පුද්ගලයින් සඳහා අදාළ මැනුම් කටයුතු සිදු කරමින් පවතින බැවින් එම කටයුතු නිම වී නොමැත. කුඩාකල්ලි, විස්කි පොයින්ට්, කොට්ටුක්කල් සහ ලයිට් හවුස් යන ප්‍රදේශවල පෞද්ගලික ඉඩම් පවතින අතර, රජයේ ඉඩම් සඳහා මැනුම් ඉල්ලීම් යොමු කිරීමට නියමිතව ඇත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) දැනට "හිමිකම" නමින් නිදහස් දීමනාපත්‍ර ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා පෞද්ගලික මැනුම්කරුවන් මඟින් ඉඩම් මැනුම් කිරීමට අවස්ථාවක් සලසා නොමැත.

(v) නොහැක.

(ආ) අදාළ නොවේ.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

1990ஆம் ஆண்டு ஏற்பட்ட யுத்தம் காரணமாக வடக்கு, கிழக்கு மாகாணங்களில் செய்கை பண்ணப்படாத பல்லாயிரக்கணக்கான ஏக்கர் நெற்காணிகள், 2006, 2010ஆம் ஆண்டுகளில் அரசால் வன இலாகா, வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்துக்காக வர்த்தமானியில் பிரசுரிக்கப்பட்டு கையகப்படுத்தப்பட்டன. பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் சர்வோதயபுரம், செங்காமம், செல்வவெளி, பள்ளியடிவட்டை, வேகாமம், துக்கொள்ள, கிரான்கோவை, கும்மாவெளி, காட்டுமடு, 60ஆம் கட்டை போன்ற இடங்களிலுள்ள காணிகளை விடுவிக்குமாறு பல ஆண்டுகளாகப் போராடியும் இன்றுவரைக்கும் நியாயம் கிடைக்கவில்லை. மாவட்ட வன இலாகாவால் விரும்பம் தெரிவிக்க மறுக்கும் நிலையில், புதிய அநுர குமார திஸாநாயக்க அரசினது அமைச்சரவையின் முடிவின் பிரகாரம், செய்கை பண்ணிய மற்றும் செய்கை பண்ணியதாக அடையாளப்படுத்தப்பட்ட காணிகளை விடுவிக்கவென நியமிக்கப்பட்ட மாவட்டக் குழுவினது சிபாரிசு வழங்கப்பட்ட மேற்படி இடங்களிலுள்ள அடையாளப்படுத்தப்பட்ட காணிகளை விரைவாக விடுவித்து, எமது பகுதி விவசாயிகள் விவசாயம் செய்வதற்கு அனுமதி வழங்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ පළමුවන අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1990 කාලයේ සිට මේ රටේ යුදමය තත්ත්වයක් පැවතුණා. ඒ යුදමය තත්ත්වය අවසන් වීමත් සමඟ ඒ ප්‍රදේශවල ඉඩම් වන සංරක්ෂණ සහ වනජීවී කලාප විධියට ගැසට් කරලා තිබෙනවා. ඒ ප්‍රදේශවල ජනතාව නේවාසික කටයුතු, කෘෂිකාර්මික කටයුතු, වාණිජ කටයුතු කරගෙන යද්දී, ඉඩම් ගැටලුව බරපතළ ප්‍රශ්නයක් විධියට තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නයෙන් අසා ඇති ප්‍රදේශයට විතරක් නොවෙයි, උතුරේත්, නැඟෙනහිරත්, දකුණේ සමහර ප්‍රදේශවලත් මේ ප්‍රශ්නය තිබෙනවා. දැනට උතුරු නැඟෙනහිරට අදාළව ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි, ඒ වාගේම දිස්ත්‍රික්කයේ දේශපාලන අධිකාරිය සහ නිලධාරින් එක්ක සාකච්ඡා කරලා වන සංරක්ෂණ සහ වනජීවී භූමිවල තිබෙන කෘෂිකාර්මික ඉඩම් සහ නේවාසික ඉඩම් නිදහස් කර ගැනීමට අදාළ සාකච්ඡාවක් අපි ආරම්භ කර තිබෙනවා. සමහර දිස්ත්‍රික්කවල මේ වන කොට ඒ ප්‍රශ්නය නිරාකරණය වෙලා තිබෙනවා, සැලකිය යුතු මට්ටමකින්. ඒ නිසා මේ කියන ප්‍රදේශයට අදාළවත් ඒ ඒ ආයතනවල දැනට පවතින නීති රීති යටතේ අවශ්‍ය කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, වන සංරක්ෂණ සහ වනජීවී භූමි විධියට ගැසට් කිරීමට අමතරව, ඒ ප්‍රදේශවල තිබෙන තවත් බරපතළ ප්‍රශ්නයක් තමයි දේශපාලනඥයන් සහ ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනඥයන්ගේ හිතවතුන් ඒ වාගේ ප්‍රදේශවල අක්කර සිය ගණන් අල්ලා ගෙන තිබීම. එම නිසා ඒ සියල්ල නිරවුල් කරන්න ඕනෑ. කිලිනොච්චිය, මුලතිව් ආදි දිස්ත්‍රික්කවල ගොවිතැන් කටයුතු කරන ඇත්ත ගොවියාට ඉඩම් අක්කරයක් නැති වුණාට දේශපාලනඥයන් ඒ ප්‍රදේශවල අක්කර 100-150 අල්ලාගෙන තිබෙනවා. වනජීවී සංරක්ෂණ සහ වන සංරක්ෂණ

[ගරු අරවින්ද සෙනරත් මහතා]

දෙපාර්තමේන්තුවට අයත් භූමිවල තිබෙන ඉඩම් නිදහස් කරන්න ආණ්ඩුව විධියට නීත්‍යනුකූලව කටයුතු කරනවා වාගේම දේශපාලනඥයන් බලහත්කාරයෙන් අල්ලාගෙන තිබෙන ඉඩම් ටිකත් ගොවියන්ට දෙන්න ඕනෑ. ඒ නිසා අපි මේ වෙලාවේ අපේ පැත්තෙන් ඉල්ලීමක් කරනවා, තම තමන්ගේ පක්ෂවල ගෝල බාල ආදීන් ඒ ඉඩම් අල්ලාගෙන තිබෙනවා නම්, ඒ ඉඩම් ඇත්ත ගොවීන්ට ලබා දෙන්න කියලා. ගරු මන්ත්‍රීතුමාගේ අතුරු ප්‍රශ්නයට උත්තරය විධියට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මේකයි. ඒ අදාළ ආයතනත් සමඟ අපි දැන් කථා කරමින් ඉන්නවා. ඉක්මනින්ම ඒ භූමි නීත්‍යනුකූලව බැහැර කරන්න, ගොවීන්ට ලබා දෙන්න කටයුතු කරන්න අප සූදානම්.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே! எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

கடந்த அரசாங்கத்தால் நடைமுறைப்படுத்தப்பட்ட பொதுமக்களது பாவனையிலுள்ள அரச காணிகளுக்கு உரிமம் வழங்கும் வேலைத்திட்டத்தின்கீழ், அம்பாறை மாவட்டத்தின் அநேகமான பிரதேச செயலாளர் பிரிவுகளில் குறிப்பாக, பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் நூற்றுக்கும் அதிகமான பொதுமக்களது உத்தரவுப்பத்திரங்கள் பிரதேச செயலகத்தால் பெற்றுக்கொள்ளப்பட்டு ஆதாரமாக கடிதம் ஒன்று மட்டுமே வழங்கப்பட்டுள்ளது. இரண்டு வருடங்களாகியும் இன்றுவரை அந்தப் பொதுமக்களுக்கு உரிமம் தொடர்பான ஆவணங்கள் வழங்கப்படவில்லை. பிரதேச செயலகத்துக்குச் சென்று பொதுமக்கள் இது தொடர்பாக விசாரிக்கும்போது, இந்த உரிமம் தொடர்பான ஆவணங்களைப் பதிவுசெய்வதில் தற்போது சட்டச் சிக்கல்கள் உள்ளதாகத் தெரிவிக்கின்றார்கள். தமது கையிலிருந்த உத்தரவுப்பத்திரத்தைப் பாரமளித்து உரிமமும் பெற முடியாமல் தவிக்கும் இந்தப் பொதுமக்களுக்கு புதிய அரசானது இந்த உரிமம் தொடர்பான ஆவணங்களைப் பதிவுசெய்து வழங்க ஆவன புரியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර මේකයි. පසුගිය ජනාධිපතිවරණයට මාස කිහිපයකට පෙර, එවකට පැවැති ආණ්ඩුව තමයි "උරුමය" ඉඩම් ඔප්පු ලබා දීමේ වැඩසටහන සූදානම් කළේ. ඔප්පු ලක්ෂ 20ක් දෙන්න ඒ ආණ්ඩුව වැඩ පිළිවෙළ හැදුවා. ඔප්පු ලක්ෂ 20ක් දෙන්න තියා, ඔප්පු ගන්න අය දැනුවත් කරන්න ලියුම් කඩදාසියක්වත් යවන්න කඩදාසි නැති කාලයේ තමයි ඒ වාගේ තීන්දු අරගෙන තිබෙන්නේ. ඒවා දේශපාලන තීන්දු. ඒ ව්‍යාපෘති රටේ හැකියාව, නිලධාරින් සතු ධාරිතාව, තිබෙන මුදල් ප්‍රමාණ ආදි කිසිවක් සොයා බැලීමකින් තොරව ලක්ෂ 20, ලක්ෂ 50 ඡන්ද ගොඩවල් ඉලක්ක කරගෙන කරපු ව්‍යාපෘති. මේ කියන ව්‍යාපෘතිය තුළත් දැවැන්ත අඩුපාඩු සහ ගැටලු තිබුණා. එම නිසා අපේ ආණ්ඩුව ආවාට පස්සේ ඒ කටයුත්ත නතර කරලා, කමිටුවක් පත් කරලා, ඒ කමිටුවෙන් වාර්තාවක් ගත්තා, එය විධිමත්ව, ඉතාම සාධාරණව සහ නීත්‍යනුකූලව කරන්න ඕනෑ ආකාරය පිළිබඳව. එම වාර්තාව අනුව අපි දැන් කටයුතු කිරීම ආරම්භ කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

අපි පෙබරවාරි මාසයේ "උරුමය" ඔප්පු ලබා දීමේ ජාතික වැඩසටහන ආරම්භ කළා. System එකට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ඔවුන් සතු "ජය භූමි" සහ "ස්වර්ණ භූමි" ඔප්පු 75,000කට ආසන්න ප්‍රමාණයක් දැනට ලබා දීලා තිබෙනවා. ඒවායෙන් 65,000ක වාගේ ප්‍රමාණයක් තමයි අපි පළමු අදියරේදී සූදානම් කරන්න කටයුතු කරමින් ඉන්නේ. හැබැයි, ඒත් එක්කම අප ගනු ලබන යම් යම් නීත්‍යනුකූල තීන්දු තීරණ නිසා සමහර අය "උරුමය" ඔප්පු ගන්න බලාපොරොත්තුවක් නැහැ කියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට දන්වා තිබෙන අවස්ථාත් තිබෙනවා. එහි අපි සමහර නිර්ණායක දමලා තිබෙනවා, එක් පුද්ගලයෙකුට රජයේ ඉඩම් ගොඩක් දෙන්න බැහැ, එක ඉඩමයි දෙන්න පුළුවන් ආදි වශයෙන්. මෙන්න මේ තීන්දුවත් එක්ක දැන් "උරුමය" ඔප්පු ලබා ගන්න කැමැති නැති අය ඉන්නවා. එම නිසා ඉඩම් අමාත්‍යාංශය විධියට අපි ප්‍රාදේශීය ලේකම්වරුන්ට දැනුම් දීලා තිබෙනවා, එහෙම අකමැත්ත පළ කරපු අය ඉන්නවා නම්, එයාලා ඒ system එකෙන් අයින් කරලා, ඒ තමන් භාර දුන් ලිපි ලේඛන නැවත ඔවුන්ට භාර දෙන්න කියලා. තවදුරටත් "උරුමය" ඔප්පු බලාපොරොත්තු වන සියලුදෙනාට ඔප්පු ලබා දීම සඳහා මේ වන විටත් අමාත්‍යාංශය විධියට අපි වැඩ කටයුතු සූදානම් කරමින් ඉන්නවා, ගරු මන්ත්‍රීතුමනි. එසේ සූදානම් කරපු ඔප්පු තව ටික කාලයක් ඇතුළත සමහර දිස්ත්‍රික්කවලට බෙදා දීමටත් අපට පුළුවන්කම ලැබෙයි.

ඒ අනුව "උරුමය" වැඩසටහන ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙනවා. ඇති වෙලා තිබෙන ගැටලු නිරාකරණය කර ගනිමින් වේගවත් වැඩ පිළිවෙළක් ඔස්සේ අපි ඔප්පු බෙදාදීමේ කටයුතු කරන්න සූදානම් වෙලා සිටිනවා.

## තැපැල් දෙපාර්තමේන්තුව: පුරප්පාඩු
## தபால் திணைக்களம்: வெற்றிடங்கள்
## DEPARTMENT OF POSTS: VACANCIES

1681/2025

**3. ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුව පිහිටුවන ලද වර්ෂය කවරේද;

(ii) මේ වනවිට මෙරට පිහිටි ප්‍රධාන හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම දෙපාර්තමේන්තුවේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තැපැල් සේවකයන්ට තැපැල් බෙදාහැරීම සඳහා යතුරුපැදි ලබාදිය යුතු බවට ඉල්ලීමක් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම ඉල්ලීම සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தபால் திணைக்களம் தாபிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;

(ii) தற்போது இந்நாட்டில் அமைந்துள்ள பிரதான மற்றும் உப தபால் அலுவலகங்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) தற்போது தபால் திணைக்களத்தில் பணிபுரியும் ஊழியர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி திணைக்களத்தில் தற்போது நிலவும் பதவி வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) மேற்படி பதவி வெற்றிடங்களை நிரப்புவதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அஞ்சல் விநியோகத்துக்காக தபால் ஊழியர்களுக்கு உந்துருளிகள் வழங்கப்பட வேண்டும் என்றொரு கோரிக்கை காணப்படுவதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி கோரிக்கை தொடர்பில் அரசாங்கத்தின் நிலைப்பாடு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the year in which the Department of Posts was established;

(ii) separately, the number of main post offices and sub-post offices currently located in the country;

(iii) the number of employees currently serving in the Department of Posts;

(iv) the number of vacancies currently existing in the said Department; and

(v) the measures taken to fill those vacancies?

(b) Will he also inform this House -

(i) whether he is aware that there is a request to provide motorcycles to postal employees for the delivery of mail; and

(ii) if so, the Government's stance regarding the said request?

(c) If not, why?

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 1798 වර්ෂයේ.

| | | | |
|---|---|---|---|
| (ii) | අධි ශ්‍රේණි තැපැල් කාර්යාල | - | 52 |
| | පළමු පෙළ තැපැල් කාර්යාල | - | 249 |
| | දෙවන පෙළ තැපැල් කාර්යාල | - | 301 |
| | **මුළු තැපැල් කාර්යාල සංඛ්‍යාව** | **-** | **647** |
| | උප තැපැල් කාර්යාල සංඛ්‍යාව | - | 3,282 |
| (iii) | ස්ථිර සේවකයන් සංඛ්‍යාව | - | 17,830 |
| | ලියාපදිංචි ආදේශකයන් සංඛ්‍යාව | - | 1,660 |
| | **මුළු සේවක සංඛ්‍යාව** | **-** | **19,490** |
| (iv) | ස්ථිර සේවක පුරප්පාඩු සංඛ්‍යාව | - | 4,753 |
| | ලියාපදිංචි ආදේශක පුරප්පාඩු සංඛ්‍යාව | - | 3,128 |
| | **මුළු පුරප්පාඩු සංඛ්‍යාව** | **-** | **7,881** |

(v)
- විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ තැපැල් අධිකාරීන් 21 දෙනෙකු (අභ්‍යන්තර) බඳවාගෙන ඇත.
- තැපැල් සේවා නිලධාරීන් 461 දෙනෙකු විවෘත තරග විභාගයෙන් බඳවාගෙන ඇත.
- තැපැල් සහායකයන් 732 දෙනෙකු සඳහා ස්ථිර පත්වීම් ලබා දී ඇත.
- රියදුරන් 40ක් විවෘත තරග විභාගයෙන් බඳවාගෙන ඇත.
- උප තැපැල් ස්ථානාධිපතීන් 367ක් සඳහා ස්ථිර පත්වීම් ලබා දී ඇත.
- ලියාපදිංචි ආදේශකයන් 1,000ක් බඳවා ගැනීම සඳහා මේ වන විට දිවයින පුරා සම්මුඛ පරීක්ෂණ ආරම්භ කර ඇත.

(ආ) (i) ඔව්.

(ii) 2026 වර්ෂය සඳහා විද්‍යුත් යතුරු පැදි - e-motorbikes - 165ක් සහ විද්‍යුත් ත්‍රිරෝද රථ - e-three-wheelers - 20ක් මිලදී ගැනීමට නියමිතය. ඉදිරියේදී අදියර වශයෙන් ඉතිරි යතුරු පැදි අවශ්‍යතාව සපුරා ගැනීමට නියමිතයි.

(ඇ) අදාළ නොවේ.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே!

எங்களுடைய மாவட்டத்திலே உள்ள பல தபால் அலுவலகங்களுக்கும் நாங்கள் விஜயம் செய்தவேளை அங்கே அவர்கள் பல பிரச்சினைகளை எதிர்நோக்குவதை அவதானித்திருக்கின்றோம். குறிப்பாக, இன்று எல்லா அஞ்சல் அலுவலகங்களிலும் பணப் பற்றாக்குறை காணப்படுகின்றது. அதுபோல், ஊழியர் பற்றாக்குறையும் காணப்படுகிறது. ஓர் அஞ்சல் அலுவலகத்தில் இருக்கவேண்டிய ஊழியர்களைவிட மிகவும் குறைந்தளவிலான ஊழியர்களே அவ்வலுவலகங்களில் கடமை புரிகின்றார்கள். அதைவிட, அங்கு substituteஆக வேலைசெய்கின்றவர்களுடைய நிரந்தர நியமனமும்

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

பிரச்சினையானதாகக் காணப்படுகின்றது. ஏற்கனவே substituteஆக இருப்பவர்கள் நிரந்தரமாக்கப்படாததன் காரணமாக புதிதாக substituteஆகச் சேருகின்றவர்களுடைய எண்ணிக்கைகூட குறைவாகக் காணப்படுகின்றது. ஆகையால், அங்குள்ள வெற்றிடங்களை நிரப்புகின்றபோது ஏற்கனவே substituteஆக வேலை செய்தவர்களை நிரந்தரமாக்குவதற்கான ஏதாவது நடவடிக்கைகள் முன்னெடுக்கப்படுகின்றதா? என்பதையும்;

திருகோணமலையிலே அதிகூடிய வருமானங்களை ஈட்டுகின்ற தபால் அலுவலகங்களில்கூட எந்தவொரு கட்டிட அமைப்புகளோ அல்லது வேறெந்த அபிவிருத்திச் செயற் பாடுகளோ மேற்கொள்ளப்படாத நிலை காணப்படுவதால் உங்களுடைய அரசின்கீழ் அந்த அஞ்சல் அலுவலகங்களுக்கு ஊழியர்களை நியமிக்கின்ற, கட்டிடங்களைப் புனரமைக் கின்ற வேலைத்திட்டங்கள் ஏதாவது முன்னெடுக்கப்படுமா? என்பதையும்

என்னுடைய முதலாவது மேலதிக வினாவாக நான் கேட்க விரும்புகின்றேன்.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
එම ප්‍රශ්නය ඇසීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඇත්තටම ආදේශකයන් බඳවා ගැනීමේදී අපි කාරණා දෙකක් සලකා බලන්න අවශ්‍යයි. එකක් තමයි, ඔවුන් ඒ ප්‍රදේශයේ පදිංචිකරුවන් වෙන්න ඕනෑ. අනෙක් එක තමයි, අදාළ වයස සම්පූර්ණ කරලා අවුරුදු 40ට වඩා අඩුවෙන් වයස තිබෙන්න ඕනෑ. ඒ ප්‍රශ්නය නිසා ආදේශකයන් ලියාපදිංචි කර ගැනීමේදී දැනට වැඩ කරමින් සිටින අය සම්බන්ධයෙන් කිසියම් ගැටලුවක් ඇති වුණා. නමුත් ගරු කථානායකතුමනි, ඒ සියල්ල සිදු වන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මතයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු විධියට ගොඩනැඟිලි ප්‍රශ්නය විසඳීම සඳහා අපි මේ අවුරුද්දේ රුපියල් මිලියන 1,200ක් වැය කරලා ගොඩනැඟිලි හදමින් යනවා. ඒ වාගේම අපි ලබන අවුරුද්දේත් ඒ වෙනුවෙන් මුදල් වෙන් කරලා නව ගොඩනැඟිලි ඉදිකිරීමට සහ ප්‍රතිසංස්කරණ කිරීමට බලාපොරොත්තු වෙනවා. නිශ්චිත තැපැල් කාර්යාල සඳහා ඔබතුමාගේ ඉල්ලීම් තිබේ නම් ඒවා අපට ඉදිරිපත් කරන්න. අපට ඒවාට අවධානය යොමු කරන්න පුළුවන්.

ඒ වාගේම ඔබතුමා තැපැල් බෙදන්නන්ට තිබෙන ප්‍රශ්න ගැන කථා කරපු නිසා මම මේ කාරණය කියන්න ඕනෑ. මේ දක්වා දිගටම තිබුණේ රුපියල් 200ක පාපැදි දීමනාවක්. අපි ඒක පාපැදි සහ යතුරුපැදි අලුත්වැඩියා කර ගැනීමේ කටයුතු දීමනාව නමින් මේ වසරේ සිට මාසයකට රුපියල් 2,000ක් කළා. ඒ වාගේම තවත් විවිධ ආකාරයේ incentives, ඒ කියන්නේ දිරිගැන්වීමේ දීමනා අපි දෙන්න බලාපොරොත්තු වෙනවා.

ඔබතුමා ප්‍රශ්න ගොඩක් ඇහුවා. ඔබතුමා අහපු අනෙක් ප්‍රශ්නය තමයි ලාභ ඉපැයීමේ ප්‍රශ්නය. ඒ සඳහා අපි තැපැල් කාර්යාලවලට ඉලක්ක දීලා තිබෙනවා. ඇත්තටම මේ වෙනකොට ලිපි බෙදීමේ අඩුවක් තිබුණත්, ගොඩක් තැපැල් කාර්යාලවල Cash on Delivery සහ Speed Postවලින් තමයි ඒ අඩුවන ආදායම උපයා ගන්නේ. නමුත්, අපි දුන් ඉලක්ක සපිරීමේ target එකක් තිබෙනවා, හැම තැපැල් කාර්යාලයකටම.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ பிரதி அமைச்சர் அவர்களே!

நீங்கள் சொன்னதுபோல் Speed Postஇன் மூலமாக கூடுதலாக வருமானம் கிடைக்கின்றது. இப்போது தொழில்நுட்ப ரீதியாக உலகம் அபிவிருத்தியடைந்து செல்கின்றபொழுதும்கூட, தபால் அலுவலகம் அல்லது தபால் திணைக்களத்தின்மீது இன்றும் மக்கள் மத்தியில் நன்மதிப்பு காணப்படுகின்றது. அந்த அடிப்படையில், நீங்கள் சொன்னதைப்போன்று வருமானம் ஈட்டுகின்ற அலுவலகங்களாக அவை காணப்படுகின்றன.

அதேபோன்றுதான் இன்று postmen, குறிப்பாக கிராமப் பகுதிகளில் கடமையாற்றுகின்றவர்கள், பல கிலோமீற்றர் தூரம் சென்று தபால்களை வழங்க வேண்டியவர்களாக இருக்கிறார்கள். இப்பொழுது உள்ள தொழில்நுட்ப வளர்ச்சியோடு ஒப்பிட்டுப் பார்க்கின்றபோது, motorbike system அல்லது charging motorcycle system போன்ற ஒரு வேலைத்திட்டத்தைக் கொண்டுவந்து அவர்களுடைய வேலைகளை இலகுபடுத்த வேண்டிய ஒரு கட்டாயத்தில் நாம் இருக்கின்றோம். ஏனென்றால், குறித்த நாட்களுக்குள், குறித்த நேரத்திற்குள் பொதிகளை அல்லது கடிதங்களை உரியவர்களுக்கு விநியோகிக்க வேண்டிய பொறுப்பு அவர்களுக்கு இருக்கின்றது. அதிலும், ஓர் அலுவலகத்திலே ஒருவர் மாத்திரம்தான் அந்த முழுப் பிரதேசத்தையும் கவனிக்க வேண்டி நிலை காணப்படுகின்றது. ஆகையால், உங்களுடைய Metro bus திட்டம் போன்று அவர்களுக்கும் motorbike system அல்லது charging motorcycle systemஐ கொண்டுவருவதற்கான நடவடிக்கைகளை அரசாங்கம் முன்னெடுக்குமா?

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මම කලින් කිව්වා වාගේ, e-bike system එක මේ අවුරුද්දේ ඉඳලා ක්‍රියාත්මක වෙනවා. මේ අවුරුද්දේ ලබා දෙන ප්‍රමාණය ප්‍රමාණවත් නැහැ කියලා අපි දන්නවා. නමුත් ඉදිරි කාලයේදී එය තවදුරටත් ව්‍යාප්ත කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් Cash on Deliveryවලදී - CODවලදී - පාර්සල් බෙදීමක් කරන නිසා, ඉදිරි කාලයේදී මුළු ලංකාව පුරාම ඒක ව්‍යාප්ත කිරීම තමයි අපේ අපේක්ෂාව.

## වගා කරන පලතුරු වර්ග: විස්තර
பயிரிடப்படும் பழ வகைகள்: விபரம்
VARIETIES OF FRUITS CULTIVED: DETAILS

1910/2026

**4. ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන පලතුරු වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම පලතුරු වර්ගවල නම් කවරේද;

(iii) එම පලතුරු වර්ග අතරින් අපනයනය කිරීම හේතුවෙන් දේශීය වෙළඳපොළ තුළ හිඟව පවතින පලතුරු වර්ග කවරේද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා පලතුරු අපනයනය කිරීම තුළින් උපයන ලද ආදායම කොපමණද;

(v) මෙරට පලතුරු වගාව ප්‍රවර්ධනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் பயிரிடப்படுகின்ற பழ வகைகளின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) மேற்படி பழ வகைகளின் பெயர்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி பழ வகைகளுள் ஏற்றுமதியின் காரணமாக உள்நாட்டு சந்தையில் பற்றாக்குறையாகவுள்ள பழ வகைகள் யாவை என்பதையும்;

(iv) 2015ஆம் ஆண்டிலிருந்து இதுவரையில் பழ ஏற்றுமதியினூடாக ஈட்டப்பட்ட வருமானம் எவ்வளவு என்பதையும்;

(v) இந்நாட்டில் பழப் பயிர்ச்செய்கையை மேம்படுத்துவதற்காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) number of varieties of fruits cultivated in Sri Lanka;

(ii) names of such fruit varieties;

(iii) names of the fruit varieties among the aforesaid fruits that are in short supply in the local market due to exportation;

(iv) income earned from exporting fruits from 2015 to date; and

(v) measures that will be taken to promote fruit cultivation in the country?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) පලතුරු වර්ග 30ක් පමණ තිබෙනවා. (වාණිජව/ගෙවතු) - ප්‍රභේද 130ක් තිබෙනවා.

(ii) කෙසෙල්, අන්නාසි, පැපොල්, පේර, අඹ, කොමඩු, පැෂන් ෆෘට්, මිදි, දෙළුම්, දූරියන්, රඹුටන්, මැංගුස්, ස්ට්‍රෝබෙරි, පෙයාර්ස්, කොස්, මැන්ඩරීන්, දෙහි, ලෙමන්, ඩ්‍රැගන්ෆෘට්, දිවුල්, අනෝදා

ගෙවතු - නෙල්ලි, උගුරැස්ස, ලොවි, මසං, වෙරළු, මොර, සැපතිල්ලා.

(iii) කිසිවක් නැත.

(iv)

| වර්ෂය | ප්‍රමාණය (MT) | වටිනාකම (රුපියල් මිලියන) |
|---|---|---|
| 2015 | 25506 | 3824 |
| 2016 | 26681 | 3811 |
| 2017 | 23386 | 4903 |
| 2018 | 27605 | 4739 |
| 2019 | 38999 | 6836 |
| 2020 | 33289 | 5077 |
| 2021 | 38557 | 5660 |
| 2022 | 35744 | 8722 |
| 2023 | 37644 | 10899 |
| 2024 | 37758 | 9221 |
| 2025 | 38199 | 10290 |

(v)
- පලතුරු පැළ නිෂ්පාදනය දේශීයව සිදු කිරීම.

  පලතුරු ප්‍රභේද විශාල සංඛ්‍යාවක පැළ දේශීයව නිෂ්පාදනය කරයි. ස්වල්ප ප්‍රමාණයක් පමණක් විදේශයන්ගෙන් ගෙන්වීම සිදු කරයි.

  කොමඩු, පැපොල් වාගේ බීජ පිටරටින් ගේනවා. ස්ට්‍රෝබෙරි, බ්ලූබෙරි වාගේ පැළ **සෘජුව** ආනයනය කරනවා. අනෙක් බීජ අපි මෙහේ නිෂ්පාදනය කරනවා.

- ඉහළ අස්වනු හා ගුණාත්මක පලතුරු ප්‍රභේද හඳුනා ගැනීම සඳහා අඛණ්ඩව පර්යේෂණ සිදු කිරීම හා ඒවා වගාකරුවන් අතර ව්‍යාප්ත කිරීම සිදු කරනවා.

- නව වගා සඳහා ඉදිරිපත් වන මධ්‍යම හා විශාල ප්‍රමාණයේ වගාකරුවන් සඳහා ඔවුන්ගේ ඉල්ලීම අනුව අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික දායකත්වය ලබා දෙනවා.

- නව පලතුරු වගා තාක්ෂණයන් සඳහා පර්යේෂණ සිදු කිරීම හා තාක්ෂණයන් වගාකරුවන්ට ව්‍යාප්ත කිරීම කරනවා.

- රෝග, පළිබෝධ, පාංශු ගැටලු හා ශාක නඩත්තුව පිළිබඳව වගාකරුවන්ගේ හා ගොවීන්ගේ ගැටලුවලට නිරන්තරයෙන්ම කටයුතු කිරීම. ඒ සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දී තිබීම වැනි කටයුතු සිද්ධ කරනවා.

[ගරු නාමල් කරුණාරත්න මහතා]

- ඒ වාගේම අලුත් වන තාක්ෂණික දැනුම වගාකරුවන් අතර ප්‍රවේශ කිරීම සඳහා මාධ්‍ය භාවිත කරමින් වැඩසටහන් සංවිධානය කරනවා.
- අලුතින් පලතුරු වගාව සඳහා ප්‍රදේශ හඳුනා ගැනීම, අවාරයේ අස්වනු ලබා දෙන ප්‍රදේශ හඳුනා ගැනීම සහ වගාව ප්‍රචලිත කිරීම සඳහා වූ ඉදිරි ක්‍රියාමාර්ග කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය සමඟ ඒකාබද්ධව සිදු කරනවා.
- අපනයන ඉඩ ප්‍රස්ථා වැඩි කර ගැනීම සඳහා GAP සහතිකකරණය කරන ලද ක්ෂේත්‍ර වැඩි කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ හා එක්ව කටයුතු කරනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරට අනුව මේ කාරණය මම සඳහන් කරන්න ඕනෑ. අපේ රටේ වී ගොවිතැන හා සමානවම පලතුරු වගාව ගැනත් විශේෂයෙන්ම සැලකිල්ල යොමු කරන්න වෙනවා. මා ජීවත් වන්නේ ඇඹිලිපිටිය ප්‍රදේශයේ. මොනරාගල දිස්ත්‍රික්කය ඇතුළු ඒ අවට දිස්ත්‍රික්කවල කෙසෙල්, අඹ, ගස්ලබු හා කොමඩු වගා කරනවා. ඒවා වගා කරන ගොවීන්ට මේ වෙනකොට කිසියම් සාධාරණයක් ඉටු වෙලා තිබෙන බවක් අපි දකින්නේ නැහැ. මොකද, ගොවියාට මේ පලතුරු වගා කරලා ලැබෙන්නේ ඉතාම සොච්චම් මුදලක්. ඒ වගා කරන පලතුරුවල අස්වැන්න නෙළන්න මාස 3ක්, 4ක් විතර යනවා. ඒ වාගේම මේවායින් ආදායම ලෙස ලැබෙන්නේ ඉතා පොඩි මුදලක්. බොහෝ වෙලාවට අතරමැදියන් අතර තමයි මේ මිල තීරණය වෙන්නේ. පාරිභෝගිකයා පලතුරු මිලදී ගන්නකොට විශාල මුදලක් වැය කරන්න සිදු වෙනවා. උදාහරණයක් ගත්තොත්, කොමඩු කිලෝවකට ගොවියාට ලැබෙන්නේ රුපියල් 20ක් නම්, පාරිභෝගිකයා රුපියල් 100කට තමයි මිලදී ගන්නේ. ඒ අතර ලොකු මුදලක් අතරමැදියා අතට යනවා.

අපි දන්නවා, පලතුරු ඉදවන්න රසායනික ද්‍රව්‍ය යොදන බව. අඹ ගෙඩියක් මාස 3කින් පැහිලා ඉදෙනවා නම්, ඒක මාස 2න් කඩලා රසායනික ද්‍රව්‍ය යොදලා වෙළෙඳ පොළට ඉදිරිපත් කරනවා. ඒ තුළ පලතුරු විශාල වශයෙන් විනාශයට පත් වෙනවා. මේ නිසා අද අපේ රටේ සියයට 40කට වැඩි පලතුරු ප්‍රමාණයක් විනාශ වෙලා යනවා. කෙසෙල් වගා කරන ගොවියා වෙළෙඳ පොළට කෙසෙල් කැන ලබා දීමෙන් පසුව එතැනදී තමයි රසායනික ද්‍රව්‍ය යොදන්නේ කියන එක අපි දන්නවා. ඒ කෙසෙල් කැන අරගෙන කොළඹට එනකොට ඒක ඉදිලා. එතකොට දවස් 5ක් තියාගන්න පුළුවන් කෙසෙල් ගෙඩිය දවස් දෙකෙන්, තුනෙන් විනාශ වෙලා යනවා. ඒ වාගේ තත්ත්වයක් තමයි තිබෙන්නේ. මේවා වළක්වාගන්න ආණ්ඩුව ගන්නා පියවර මොකක්ද කියලා මම මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, මෙම වෙළෙඳ පොළ ප්‍රශ්නය පලතුරු, ධාන්‍ය වර්ග, එළවලු ඇතුළු හැම එකක් සම්බන්ධයෙන් තිබෙන ගැටලුවක්. දශක ගණනාවක සිට මේවාට විසඳුම් ලබා දීලා නැහැ. නමුත්, අපි දැන් වී, ධාන්‍ය වර්ග ඇතුළු අනෙකුත් සෑම දෙයක් සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්න එකින් එක, එකින් එක විසඳා ගෙන එනවා. විශේෂයෙන්ම පලතුරු පැත්තෙන් ගත්තොත්, ඇඹිලිපිටිය ප්‍රදේශයේ වගා කරන කෙසෙල්, කොමඩු ආදිය ගැන ඔබතුමා කථා කළා.

ලංකාවේ වැඩියෙන්ම කෙසෙල් වගා කරන කලාපය තමයි, වලව කලාපය. ඒ ගොවියා තනි කෙසෙල් ගස් විධියට තමයි වගා කරන්නේ. අඩි 5ක, 6ක වාගේ දුර ප්‍රමාණයෙන් කෙසෙල් වවනවා. ඒ තත්ත්වය තුළ ලොකුම කෙසෙල් පොළ තමයි, බරවකුඹුක කෙසෙල් පොළ. ඒ වාගේ කෙසෙල් පොළවල් ගණනාවක් තිබෙනවා. සූරියවැව මොරකැටිය ප්‍රදේශයෙත් කෙසෙල් පොළක් තිබුණා. ඇත්තටම ගොවි ජනතාව ලොකු ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. පසුගිය කාලයේ අපිත් ඒවාට මැදිහත් වුණා. හැබැයි, පසුගිය කාල පරාසය තුළ මේවාට විසඳුම් දෙන්න අසමත් වෙලා තිබෙනවා.

නමුත්, අපි මේ වනකොට ඒ සඳහා උත්තර හොයමින් ඉන්නවා. ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඔබතුමා නියෝජනය කරන මොරකැටිය ප්‍රදේශය පදනම් කරගෙන කෙසෙල් අපනයන සැකසුම් මධ්‍යස්ථානයක වැඩ මේ වනකොට ආරම්භ කර තිබෙනවා. මේ තුළින් ඇත්තටම ගොවියාට ලොකු වටිනාකමක් එකතු වනවා. මේ වගා බිම්වලින් කෙසෙල් කඳන් ඉවත් කර ගන්න එක අද වන විට ඇත්තටම කෙසෙල් ගොවියාට ගැටලුවක් වෙලා තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී කෙසෙල් කඳටත් ආර්ථිකමය වටිනාකමක් එන ව්‍යාපෘති මේ වනකොට අපි යෝජනා කර තිබෙනවා. ඊට අදාළ ව්‍යවසායකයින් හඳුනාගෙන, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු මේ වනකොට කරමින් තිබෙනවා. ඔබතුමා නියෝජනය කරන ප්‍රදේශයේදීම ඒවාට අදාළ වටිනාකම් ඉදිරියේදී එකතු වනවා.

ඒ වාගේම අනෙකුත් පලතුරු සම්බන්ධයෙන් අපි කටයුතු කරන ආකාරයත් කියන්න ඕනෑ. අපි ඒ පලතුරුවලටත් අගය එකතු කරලා, ඒ පලතුරුවල වෙළෙඳ පොළ සුරක්ෂිත කිරීමත්, අපතේ යන එක, නාස්ති වන එක අවම කර ගැනීමටත් අදාළ වැඩසටහන් මේ වනකොට සැලසුම් කරමින් තිබෙනවා.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු කථානායකතුමනි, කෙසෙල් ගොවියා සම්බන්ධයෙන් තටයුතු කරන ආකාරය ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. මේ වන විට ඇඹිලිපිටිය ප්‍රදේශයේ සාමාන්‍ය කෙසෙල් කිලෝග්‍රෑම් එකක් රුපියල් 120ක විතර මිලකට අළෙවි වනවා. කෝලිකුට්ටු කිලෝග්‍රෑම් එකක් රුපියල් 300ක විතර මිලකට අළෙවි වනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළ ආකාරයට පුවාලු සහ කෝලිකුට්ටු තමයි තනි ගහක් විධියට හදන්නේ. සීනි කෙසෙල් සහ ඇඹුල් කෙසෙල් පඳුරු වශයෙන් තමයි ගොවීන් වවන්නේ. මේ කෙසෙල්වලින් ආදායමක් ලබන්න ගොවියා අවුරුද්දක් පුරා විශාල වෙහෙස මහන්සියක් ගන්නවා. ගරු කථානායකතුමනි, අවුරුද්දකට මාස දෙකක්, තුනක් තමයි කෙසෙල්වලට මිලක් තිබෙන්නේ. මේ දවස්වල කෙසෙල්වලට සාමාන්‍ය මිලක් තිබෙනවා. පසුගිය දවස්වල සාමාන්‍ය කෙසෙල් කිලෝග්‍රෑම් එකක් රුපියල් 10කට වත් විකුණා ගන්න බැරි තත්ත්වයක් තිබුණා. ඒ වාගේම මේ අයට පොහොර සහනාධාරයක් ලබා දෙන්න ඕනෑ. මොකද, ගස්ලබු, කොමඩු, අඹ, කෙසෙල් වැනි පලතුරු සඳහා අවශ්‍ය පොහොර මිලදී ගැනීමට නොහැකි තත්ත්වයකට අද ගොවියා පත්වෙලා තිබෙනවා. ගොවියාට පොහොර හොණ්ඩරයක් මිලදී ගන්න රුපියල් 18,000කට වැඩි මුදලක් වැය වනවා. නමුත්,

කෙසෙල් අස්වැන්න නෙළා ගත්තාට පස්සේ මේ අයට ලැබෙන්නේ සොච්චම් මුදලක්. නමුත්, විශාල මුදලක් පොහොර සඳහා වැය වනවා. එම නිසා ඒ අයටත් පොහොර සහනාධාරයක් ලබා දෙන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කෙසෙල් අපනයනය කරන වැඩසටහනක් මොරකැටිය ප්‍රදේශයේ පටන් ගන්නවා කියලා ඔබතුමා සඳහන් කළා. ඒක ඉතා වැදගත් කටයුත්තක්. ඒ වාගේ වැඩසටහනක් සාර්ථකව ක්‍රියාත්මක කරලා, ඒ ප්‍රදේශයේම ඉඳලා කෙසෙල් අපනයනය කරන සැලසුමකුත් සකස් කරන්න කියලා මම මේ අවස්ථාවේදී යෝජනා කර සිටිනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, පොහොර සහනාධාරය ගැනත් මම යමක් කියන්න ඕනෑ. අපේ ආණ්ඩුව ආ පසු වී වගාව වෙනුවෙන් ලබා දෙන පොහොර සහනාධාර ප්‍රමාණය දෙගුණයක් කරලා තිබෙනවා. ඒ වාගේම වී වගා කරන ඉඩම්වල අතිරේක භෝග වගා කරනවා නම්, පොහොර සහනාධාරය කලින් ශතපහක්වත් ලැබුණේ නැහැ. නමුත් ඒ ගොවීන්ට අපි ගිය කන්නයට, ඊට කලින් කන්නයට සහ මේ කන්නයට පොහොර සහනාධාරය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඔය කියන භෝග සම්බන්ධයෙනුත් ගොවි ජනතාවට ලබා දිය හැකි - නිෂ්පාදනය වැඩිකර ගැනීමට අදාළව - උපරිම සහන ලබා දීමට මැදිහත්වෙන්න පුළුවන් ක්‍රමවේද පිළිබඳව අපි සොයා බලමින් ඉන්නවා. ඒ අනුව ඇඹිලිපිටියේ විතරක් නොවෙයි, රටේම ඉන්න කෙසෙල් ගොවියාගේ ගැටලුවලට සාධනීය පිළිතුරක් ඉදිරි කාලය තුළ අනිවාර්යයෙන්ම ලැබෙනවා කියන එක මේ වෙලාවේදී මට කියන්න පුළුවන්. ශාන්ත පද්මකුමාර මන්ත්‍රීතුමාත්, ඇඹිලිපිටියේ උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාත් ඇතුළුව සියලුදෙනා ඒ සඳහා මැදිහත් වනවා. ඒ අනුව කෙසෙල් කඳටත් අගය එකතු කරන නිෂ්පාදන කර්මාන්තයක් ඇඹිලිපිටියේ හදන්න යෝජනා කරලා තිබෙනවා. අපි ඉදිරියේදී බලාපොරොත්තු වනවා, ඒ කර්මාන්තශාලාව ඇඹිලිපිටිය තුළ ස්ථාපිත කරන්න. ඒ වාගේම කෙසෙල් ගෙඩියට අගය එකතු කරන තවත් නිෂ්පාදන කර්මාන්තයක් හදන්නත් යෝජනා වෙලා තිබෙනවා. එය, සෙවනගල ප්‍රදේශයේ ඉදිකරන්න තමයි කල්පනා කරලා තිබෙන්නේ. ඒ හරහා ගොවි ජනතාවට යම්කිසි සාධනීය පිළිතුරක් ලැබෙයි කියන විශ්වාසය අපට තිබෙනවා. මේ වනකොට ඊට අදාළ කටයුතුවලට අපි මැදිහත්වෙමින් ඉන්නවා.

## ලියාපදිංචි සමුපකාර සමිති: කෑගල්ල දිස්ත්‍රික්කය

பதிவுசெய்யப்பட்ட கூட்டுறவுச் சங்கங்கள்: கேகாலை மாவட்டம்

REGISTERED CO-OPERATIVE SOCIETIES: KEGALLE DISTRICT

2027/2026

**5. ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ ප්‍රථම සමුපකාර සමිතිය ලියාපදිංචි කරන ලද වර්ෂය කවරේද;

(iii) එම සමුපකාර සමිතිවලට අයත් සමුපකාර ග්‍රාමීය බැංකු සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට සක්‍රිය හා අක්‍රිය සමුපකාර ග්‍රාමීය බැංකු සහ සමුපකාර ප්‍රාදේශික වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) බුලත්කොහුපිටිය සහ යටියන්තොට සමුපකාර සමිති ලියාපදිංචි කරන ලද වර්ෂ වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම සමිතිවලට අයත් ප්‍රාදේශික, ග්‍රාමීය බැංකු සහ කෝප්සිටි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වන විට එම සමිතිවලට අයත් සක්‍රිය සහ අක්‍රිය ප්‍රාදේශික කවරේද;

(iv) එම ප්‍රාදේශික අක්‍රිය වීමට බලපාන ලද හේතු කවරේද;

(v) පසුගිය වර්ෂ 10 තුළ එම සමුපකාර සමිතිවල වාර්ෂික විගණන නිසි පරිදි සිදුකර තිබේද;

(vi) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கேகாலை மாவட்டத்தில், கூட்டுறவு அபிவிருத்தித் திணைக்களத்தில் பதிவுசெய்யப் பட்டுள்ள கூட்டுறவுச் சங்கங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி மாவட்டத்தில் முதலாவது கூட்டுறவுச் சங்கம் பதிவுசெய்யப்பட்ட ஆண்டு யாது என்பதையும்;

(iii) மேற்படி கூட்டுறவுச் சங்கங்களுக்குச் சொந்த மான கூட்டுறவுக் கிராமிய வங்கிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) அவற்றுள் தற்போது செயற்படும் நிலையிலுள்ள மற்றும் செயற்படாத நிலையிலுள்ள கூட்டுறவுக் கிராமிய வங்கிகளும் கூட்டுறவுக் கடைகளும் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) புளத்கொஹுபிட்டிய மற்றும் யட்டியாந் தோட்டை கூட்டுறவுச் சங்கங்கள் பதிவுசெய்யப் பட்ட ஆண்டு வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி சங்கங்களுக்கு உரிய கூட்டுறவுச் சங்கக் கடைகள், கிராமிய வங்கிகள் மற்றும் 'கோப்சிட்டி'களது எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) தற்போது மேற்படி சங்கங்களுக்குச் சொந்தமான செயற்படும் மற்றும் செயற்படாத நிலையிலுள்ள கூட்டுறவுச் சங்கக் கடைகள் யாவை என்பதையும்;

(iv) மேற்படி கடைகள் செயற்படாத நிலைக்கு தள்ளப்பட்டமைக்கான காரணிகள் யாவை என்பதையும்;

(v) கடந்த 10 வருட காலப்பகுதியில் மேற்படி கூட்டுறவுச் சங்கங்களின் வருடாந்த கணக் காய்வுகள் உரிய முறையில் மேற்கொள்ளப் பட்டுள்ளனவா;

[ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා]

(vi) இன்றேல், மேற்படி விடயம் தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) the number of co-operative societies in Kegalle District registered with the Department of Co- operative Development;

(ii) the year in which the first co-operative society in the said district was registered;

(iii) the number of Co-operative Rural Banks (CRBs) belonging to those co-operative societies; and

(iv) the active and inactive Co-operative Rural Banks (CRB) and co-operative outlets separately, at present?

(b) Will he also inform this House -

(i) the years in which the Bulathkohupitiya and Yatiyantota Co-operative Societies were registered, separately;

(ii) the number of outlets, rural banks and Co-op City outlets belonging to those societies, separately;

(iii) the active and inactive outlets belonging to those societies, at present;

(iv) the reasons that led to the said outlets becoming inactive;

(v) whether the annual audits of those co-operative societies have been properly conducted during the last 10 years; and

(vi) if not, measures that will be taken in that regard?

(c) If not, why?

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කැගල්ල දිස්ත්‍රික්කයේ ලියාපදිංචි සමුපකාර සමිති සංඛ්‍යාව - 589යි.

| සමිති වර්ගය | ක්‍රියාකාරී |
|---|---|
| විවිධ සේවා සමුපකාර සමිති | 10 |
| සණස සමිති | 236 |
| වතු නිවාස සමුපකාර සමිති | 46 |
| ජනෝද්‍යාන සමුපකාර සමිති | 0 |
| නිෂ්පාදන සමුපකාර සමිති | 12 |
| වෙනත් සමිති | 18 |
| එකතුව | **322** |

- අක්‍රිය සමුපකාර සමිති 267ක් තිබෙනවා.

(ii) කාර්යාලීය මූලාශ්‍ර තොරතුරු අනුව පළමුවැනි වරට සමුපකාරයක් ලියාපදිංචි කර තිබෙන්නේ 1942දී.

(iii) 108යි.

(iv) • සක්‍රිය සමුපකාර ග්‍රාමීය බැංකු ඇමුණුම 01 ලෙස පහතින් දක්වා ඇත.

ඇමුණුම 01

**සක්‍රීය සමූපාකාර ග්‍රාමීය බැංකු - කැගල්ල දිස්ත්‍රික්කය**

| අනු අංකය | සමූපකාර සමිතියේ/ග්‍රාමීය බැංකුවේ නම |
|---|---|
| **1** | **සි/ස දැරණියගල පනාවල වි.සේ.ස. සමිතිය** |
| 1 | දැරණියගල ග්‍රාමීය බැංකුව |
| 2 | පනාවල ග්‍රාමීය බැංකුව |
| 3 | මානියංගම ග්‍රාමීය බැංකුව |
| 4 | ගොඩගම්පල ග්‍රාමීය බැංකුව |
| 5 | දොඩාවත්ත ග්‍රාමීය බැංකුව |
| 6 | මාලිබොඩ ග්‍රාමීය බැංකුව |
| 7 | අංහෙට්ටිගම ග්‍රාමීය බැංකුව |
| 8 | බොරලංකඩ ග්‍රාමීය බැංකුව |
| 9 | මියනවිට ග්‍රාමීය බැංකුව |
| 10 | දෙල්ඔළුව ග්‍රාමීය බැංකුව |
| 11 | කැන්දලන්ද ග්‍රාමීය බැංකුව |
| **2** | **සි/ස රඹුක්කන වි.සේ.ස. සමිතිය** |
| 1 | රඹුක්කන ග්‍රාමීය බැංකුව |
| 2 | යටිවල්දෙණිය ග්‍රාමීය බැංකුව |
| 3 | මංගලගම ග්‍රාමීය බැංකුව |
| 4 | කුඩාගම ග්‍රාමීය බැංකුව |
| 5 | හිරිවඩුන්න ග්‍රාමීය බැංකුව |
| 6 | පරපේ ග්‍රාමීය බැංකුව |
| 7 | හේවාදිවෙල ග්‍රාමීය බැංකුව |
| 8 | ඉඹුල්ගස්දෙණිය ග්‍රාමීය බැංකුව |
| 9 | තල්දැව ග්‍රාමීය බැංකුව |
| **3** | **සි/ස රුවන්වැල්ල වි.සේ.ස. සමිතිය** |
| 1 | රුවන්වැල්ල ග්‍රාමීය බැංකුව |
| 2 | දෙහිඕවිට ග්‍රාමීය බැංකුව |
| 3 | නාපාවල ග්‍රාමීය බැංකුව |
| 4 | අමිතිරිගල ග්‍රාමීය බැංකුව |
| 5 | ගලපිටමඩ ග්‍රාමීය බැංකුව |
| 6 | වහරක ග්‍රාමීය බැංකුව |
| 7 | තල්දූව ග්‍රාමීය බැංකුව |
| 8 | අටුළුගම ග්‍රාමීය බැංකුව |
| 9 | බටුවිට ග්‍රාමීය බැංකුව |
| 10 | කන්නත්තොට ග්‍රාමීය බැංකුව |
| **4** | **සි/ස වරකාපොල වි.සේ.ස. සමිතිය** |
| 1 | අඹේපුස්ස ග්‍රාමීය බැංකුව |
| 2 | අල්ගම ග්‍රාමීය බැංකුව |
| 3 | තෙළුන්දෙණිය ග්‍රාමීය බැංකුව |
| 4 | මහපල්ලේගම ග්‍රාමීය බැංකුව |
| 5 | තල්ගම ග්‍රාමීය බැංකුව |
| 6 | නියදුරුපොල ග්‍රාමීය බැංකුව |
| 7 | රාගල්කන්ද ග්‍රාමීය බැංකුව |
| 8 | කිවුල්දෙණිය ග්‍රාමීය බැංකුව |
| 9 | වරකාපොල නගර බැංකුව |
| 10 | දැදිගම ග්‍රාමීය බෑංකුව |
| 11 | දොරවක ග්‍රාමීය බැංකුව |
| 12 | බෝපිටිය ග්‍රාමීය බැංකුව |
| 13 | උඩුකුඹුර ග්‍රාමීය බැංකුව |

| | |
|---|---|
| 5 | සී/ස ගලිගමුව වි.සේ.ස. සමිතිය |
| 1 | බල්ලපාන ග්‍රාමීය බැංකුව |
| 2 | දේවාලේගම ග්‍රාමීය බැංකුව |
| 3 | කොටියාකුඹුර ග්‍රාමීය බැංකුව |
| 4 | කබගමුව ග්‍රාමීය බැංකුව |
| 5 | දමුණුපොල ග්‍රාමීය බැංකුව |
| 6 | බටුවත්ත ග්‍රාමීය බැංකුව |
| 7 | අරන්දර ග්‍රාමීය බැංකුව |
| 8 | අරුග්ගම්මන ග්‍රාමීය බැංකුව |
| 9 | හත්නාගොඩ ග්‍රාමීය බැංකුව |
| 10 | ගලිගමුව ග්‍රාමීය බැංකුව |
| 11 | ඇදුරාපොත ග්‍රාමීය බැංකුව |
| 12 | කනන්ගමුව ග්‍රාමීය බැංකුව |
| 6 | සී/ස යටියන්තොට වි.සේ.ස. සමිතිය |
| 1 | යටියන්තොට ග්‍රාමීය බැංකුව |
| 2 | කිතුල්ගල ග්‍රාමීය බැංකුව |
| 3 | බෙරන්ණාව ග්‍රාමීය බැංකුව |
| 4 | පූණුගල ග්‍රාමීය බැංකුව |
| 5 | තැලිගම ග්‍රාමීය බැංකුව |
| 6 | ගල්පාත ග්‍රාමීය බැංකුව |
| 7 | මත්තමගොඩ ග්‍රාමීය බැංකුව |
| 7 | සී/ස බුලත්කොහුපිටිය වි.සේ.ස. සමිතිය |
| 1 | බුලත්කොහුපිටිය ග්‍රාමීය බැංකුව |
| 2 | පත්නල ග්‍රාමීය බැංකුව |
| 3 | දේදුගල ග්‍රාමීය බැංකුව |
| 4 | නෙවිස්මියර් ඉහල ග්‍රාමීය බැංකුව |
| 5 | එරබදුවල ග්‍රාමීය බැංකුව |
| 6 | නාරංගල ග්‍රාමීය බැංකුව |
| 8 | සී/ස අරණායක වි.සේ.ස. සමිතිය |
| 1 | උස්සාපිටිය ග්‍රාමීය බැංකුව |
| 2 | දිප්පිටිය ග්‍රාමීය බැංකුව |
| 3 | දෙබත්ගම ග්‍රාමීය බැංකුව |
| 4 | වෙරගොඩ ග්‍රාමීය බැංකුව |
| 5 | උඩුවෙවල ග්‍රාමීය බැංකුව |
| 6 | තල්ගස්පිටිය ග්‍රාමීය බැංකුව |
| 7 | අඹලකන්ද ග්‍රාමීය බැංකුව |
| 8 | අරණායක ග්‍රාමීය බැංකුව |
| 9 | අස්මඩල ග්‍රාමීය බැංකුව |
| 10 | ගැවිලිපිටිය ග්‍රාමීය බැංකුව |
| 11 | රහල ග්‍රාමීය බැංකුව |
| 12 | හත්ගම්පල ග්‍රාමීය බැංකුව |
| 13 | ඇරැව්පල ග්‍රාමීය බැංකුව |
| 9 | සී/ස මාවනැල්ල හෙම්මාතගම වි.සේ.ස. සමිතිය |
| 1 | මාවනැල්ල ග්‍රාමීය බැංකුව |
| 2 | හෙම්මාතගම ග්‍රාමීය බැංකුව |
| 3 | අලුත්නුවර ග්‍රාමීය බැංකුව |
| 4 | මාකඩවර ග්‍රාමීය බැංකුව |
| 5 | කැප්පෙටිපොල ග්‍රාමීය බැංකුව |
| 6 | අල්පිටිය ග්‍රාමීය බැංකුව |
| 7 | උඩමුල්ල ග්‍රාමීය බැංකුව |
| 8 | වැගන්තලේ ග්‍රාමීය බැංකුව |
| 9 | අත්තනගොඩ ග්‍රාමීය බැංකුව |
| 10 | රන්දිවල ග්‍රාමීය බැංකුව |
| 11 | දෙහිමඩුව ග්‍රාමීය බැංකුව |
| 12 | කෙහෙල්පත්නල ග්‍රාමීය බැංකුව |

| | |
|---|---|
| 10 | සී/ස කෑගල්ල වි.සේ.ස. සමිතිය |
| 1 | කෑගල්ල ග්‍රාමීය බැංකුව |
| 2 | හෙට්ටිමුල්ල ග්‍රාමීය බැංකුව |
| 3 | මොරොන්තොට ග්‍රාමීය බැංකුව |
| 4 | උදුගොඩ ග්‍රාමීය බැංකුව |
| 5 | කරඩුපන ග්‍රාමීය බැංකුව |
| 6 | ගංතුන ග්‍රාමීය බැංකුව |
| 7 | බෝගල ග්‍රාමීය බැංකුව |
| 8 | අලපලාවල ග්‍රාමීය බැංකුව |
| 9 | රන්දෙණිය ග්‍රාමීය බැංකුව |
| 10 | දිවෙල ග්‍රාමීය බැංකුව |
| 11 | වැලිමන්නාතොට ග්‍රාමීය බැංකුව |
| 12 | අතුරුපාන ග්‍රාමීය බැංකුව |
| 13 | බුළුගහදෙණිය ග්‍රාමීය බැංකුව |
| 14 | පරගම්මන ග්‍රාමීය බැංකුව |
| 15 | රංවල ග්‍රාමීය බැංකුව |

- අක්‍රිය සමුපකාර ග්‍රාමීය බැංකු නොමැත.
- සමුපකාර ප්‍රාදේශික ඇමුණුම 02 ලෙස පහතින් දක්වා ඇත.

ඇමුණුම 02

**වි.සේ.ස සමිති වල ප්‍රාදේශික - කෑගල්ල දිස්ත්‍රික්කය**

| අනු අං | සමිතියේ නම | | සක්‍රිය | | අක්‍රිය |
|---|---|---|---|---|---|
| | | මුළු ප්‍රාදේශික කාරක සභා ගණන | ප්‍රාදේශික ගණන | ප්‍රාදේශික නම | ප්‍රාදේශික ගණන |
| 1 | සී/ස ගලිගමුව වි.සේ.ස සමිතිය | 54 | 16 | කබගමුව | 38 |
| | | | | පිටල්ගල්දෙණිය | |
| | | | | කනන්ගමුව | |
| | | | | අරුග්ගම්මන | |
| | | | | එළගල්ල | |
| | | | | හීන්වැල්ල | |
| | | | | බෝයගොඩ | |
| | | | | පලපොලුව | |
| | | | | මකුද්දල | |
| | | | | පොතුකොළදෙණිය | |
| | | | | ඇපලතොටුව | |
| | | | | යටටෝගොඩ | |
| | | | | කොටියාකුඹුර | |
| | | | | දේවාලේගම | |
| | | | | බල්ලපාන-ගලිගමුව සහන | |
| | | | | ගලිගමුව | |
| 2 | සී/ස මාවනැල්ල හෙම්මාතගම වි.සේ.ස සමිතිය | 47 | 5 | කැප්පෙටිපොල | 42 |
| | | | | අල්පිටිය | |
| | | | | මාකඩවර | |
| | | | | මාවනැල්ල | |
| | | | | රුකුලගම(ප්‍රතිව්‍යුහගත කර ඇති) | |
| 3 | සී/ස රඹුක්කන වි.සේ.ස සමිතිය | 52 | 9 | ගොඩගන්දෙණිය | 43 |
| | | | | වැලිකන්ද | |
| | | | | මුවපිටිය | |
| | | | | හලාගිරිය | |
| | | | | කිවුල්පන | |
| | | | | යටිවල්දෙණිය | |
| | | | | ගබ්බල | |
| | | | | කොටවැල්ල | |
| | | | | රඹුක්කන නගර ප්‍රාදේශිකය | |
| 4 | සී/ස කෑගල්ල වි.සේ.ස සමිතිය | 60 | 4 | බුළුරුප්ප | 56 |
| | | | | මලවිට | |
| | | | | තලෙයිමලවිට(ප්‍රතිව්‍යුහගත කර ඇති) | |
| | | | | මොරොන්තොට(ප්‍රතිව්‍යුහගත කර ඇති) | |
| 5 | සී/ස දැරණියගල පනාවල වි.සේ.ස සමිතිය | 41 | 1 | දැරණියගල | 40 |
| 6 | සී/ස වරකාපොල වි.සේ.ස සමිතිය | 41 | 16 | අඹේපුස්ස | 25 |
| | | | | තෙළුන්දෙණිය | |
| | | | | වරකාපොල | |
| | | | | අල්ගම | |
| | | | | උඩුකුඹුර | |
| | | | | දැදිගම | |
| | | | | පල්ලේගම | |
| | | | | තුංතොට | |
| | | | | කිවුල්දෙණිය | |
| | | | | ගණිතපුර | |
| | | | | කෝනගොඩ | |
| | | | | එලිපන්ගමුව | |
| | | | | ගොඩවෙල | |
| | | | | බටුවන | |
| | | | | තලංගම | |
| | | | | බෝදාවල | |
| 7 | සී/ස රුවන්වැල්ල වි.සේ.ස සමිතිය | 46 | 9 | වහරක | 37 |
| | | | | උතුරු අම්තිරිගල | |
| | | | | කරවනැල්ල | |
| | | | | අගුරුවැල්ල | |
| | | | | රුවන්වැල්ල | |
| | | | | කඹුරාපොල | |
| | | | | බටුවිට | |
| | | | | සියබලාවල | |
| | | | | දෙහිඕවිට | |
| 8 | සී/ස යටියන්තොට වි.සේ.ස සමිතිය | 27 | 3 | යටියන්තොට උතුර | 24 |
| | | | | කිතුල්ගල | |
| | | | | වැලිහෙලතැන්න | |
| 9 | සී/ස අරණායක වි.සේ.ස සමිතිය | 33 | 5 | උස්සාපිටිය | 28 |
| | | | | හත්ගම්පල | |
| | | | | දෙබත්ගම | |
| | | | | දිප්පිටිය | |
| | | | | අරම | |
| 10 | සී/ස බුලත්කොහුපිටිය වි.සේ.ස | 18 | නැත | නැත | 18 |

[ගරු වසන්ත සමරසිංහ මහතා]

(ආ) (i) බුලත්කොහුපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය - 1971.12.19 (ලි.අං. කැ 383)

යටියන්තොට විවිධ සේවා සමුපකාර සමිතිය - 1971.02.19 (ලි.අං. කැ 385)

(ii)

| සමිතියේ නම | ප්‍රාදේශික ගණන | ග්‍රාමීය බැංකු ගණන | කෝප් සිටි සංඛ්‍යාව |
|---|---|---|---|
| සී/ස බුලත්කොහුපිටිය වි.සේ.ස. | නැත | 06 | නැත |
| සී/ස යටියන්තොට වි.සේ.ස. | 01 | 07 | 02 |

(iii) සක්‍රිය හා අක්‍රිය ප්‍රාදේශික ඇමුණුම 03 ලෙස පහතින් දක්වා ඇත.

ඇමුණුම 03

**සී/ස යටියන්තොට වි.සේ.ස සමිතිය හා සී/ස බුලත්කොහුපිටිය වි.සේ.ස සමිතියේ සක්‍රිය හා අක්‍රිය ප්‍රාදේශික**

| අනු අං | සමිතියේ නම | | සක්‍රිය | | අක්‍රිය | |
|---|---|---|---|---|---|---|
| | | මුළු ප්‍රාදේශික කාරක සභා ගණන | ප්‍රාදේශික ගණන | ප්‍රාදේශික නම | ප්‍රාදේශික ගණන | ප්‍රාදේශික නම |
| 1 | සී/ස යටියන්තොට වි.සේ.ස සමිතිය | 27 | 3 | යටියන්තොට උතුර | 24 | යටියන්තොට දකුණ |
| | | | | කිතුල්ගල | | පරුස්සැල්ල |
| | | | | වැලිහෙලතැන්න | | පිදුරුවැල්ල |
| | | | | | | අමනාවල |
| | | | | | | හල්ගොල්ල |
| | | | | | | ඌරාගල |
| | | | | | | ඉංගිරියාවත්ත |
| | | | | | | ගනේපල්ල |
| | | | | | | තැලිගම |
| | | | | | | බෙරන්නාව |
| | | | | | | මහබාගේ |
| | | | | | | මල්වත්ත |
| | | | | | | මලල්පොල |
| | | | | | | බිබිළිඹය |
| | | | | | | ගරාගොඩ |
| | | | | | | හක්බෙල්ලාවක |
| | | | | | | කළුකොහුතැන්න |
| | | | | | | ගල්පාත |
| | | | | | | මත්තමගොඩ |
| | | | | | | කිරිකොහුතැන්න |
| | | | | | | අම්පේ |
| | | | | | | සීපෝත් |
| | | | | | | ජයවින්දගම |
| | | | | | | මීගස්තැන්න |
| 2 | සී/ස බුලත්කොහුපිටිය වි.සේ.ස සමිතිය | 18 | නැත | නැත | 18 | එරබදුවල |
| | | | | | | පනාපිටිය |
| | | | | | | බුලත්කොහුපිටිය |
| | | | | | | උඩුව |
| | | | | | | දේදුගල |
| | | | | | | පැලැම්පිටිය |
| | | | | | | අඹමල්ල |
| | | | | | | පූනහැල |
| | | | | | | හාකාගොඩ |
| | | | | | | නෙවිස්මියර් පහළ |
| | | | | | | රංගල්ල |
| | | | | | | උඩපත |
| | | | | | | තුම්බාගේ |
| | | | | | | ඌරුමීවල |
| | | | | | | කැත්දව |
| | | | | | | වැගල්ල |
| | | | | | | පන්නල |
| | | | | | | නෙවිස්මියර් ඉහළ |

(iv)
- පෞද්ගලික සුපිරි වෙළෙඳ සැල් ජාලය, පෞද්ගලික සිල්ලර වෙළෙඳ සැල් සමඟ තරග කිරීමේදී මතුවන ගැටලු
- තාක්ෂණය (POS පද්ධති/ online ගනුදෙනු ආදිය) භාවිතයට ගැනීම ප්‍රමාද වීම හා සම්පූර්ණයෙන් නොසලකා හැරීම.
- පාරිභෝගිකයින් සඳහා නවීන වෙළෙඳ පොළට ගැළපෙන ලෙස භාණ්ඩ හා සේවා ලබා නොදීම.
- සමුපකාර ව්‍යාපාරයේ මූලික පදනම වන සාමාජික ජනතාවගේ සක්‍රිය දායකත්වය ක්‍රමයෙන් ගිලිහීම.
- සමුපකාර ව්‍යාපාරයේ ප්‍රාදේශික හරහා ක්‍රියාත්මක වූ රාජ්‍ය සහනාධාර ක්‍රම ක්‍රියාත්මක නොවීම.
- සමිති අභ්‍යන්තර පරිපාලන හා මූල්‍ය ගැටලු නිසා ප්‍රාදේශික දිගින් දිගටම පාඩු ලැබීම.
- නවීන ව්‍යාපාර ක්‍රමවේද, මූල්‍ය කළමනාකරණ තාක්ෂණය පිළිබඳ නිලධාරින්ගේ හා සේවකයින්ගේ දැනුම ප්‍රමාණවත් නොවීම.

(v)
- සී/ස බුලත්කොහුපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය - 2023.12.31න් අවසන් වර්ෂය දක්වා විගණනයන් නිම කර විගණන වාර්තා සමිතියට නිදහස්කොට ඇත.

  2024.12.31න් අවසන් වර්ෂය සඳහා විගණනය සිදු කරමින් පවතී. 2025 වර්ෂයට අදාළ විගණන සඳහා නිලධාරින් පත් කර ඇත.
- සී/ස යටියන්තොට විවිධ සේවා සමුපකාර සමිතිය - 2024.12.31න් අවසන් වර්ෂය දක්වා විගණනයන් නිම කර විගණන වාර්තා සමිතියට නිදහස්කොට ඇත.

  2025.12.31න් අවසන් වර්ෂය සඳහා විගණනය සිදු කරමින් පවතී.

(vi) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ගරු අමාත්‍යතුමනි, පිළිතුර ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා සඳහන් කළ ආකාරයට, කාර්යාලයීය මූලාශ්‍ර තොරතුරු හරහා ලැබුණු පිළිතුරුවල සමුපකාර අක්‍රිය වීමට බලපෑ හේතු ලෙස 2023 වර්ෂයෙන් මෙහා විගණනවලින් අනාවරණය වුණු කරුණු පිළිබඳව තමයි සඳහන් වෙන්නේ. නමුත්, 2023 වර්ෂයට කලින් කරන ලද විගණන කටයුතු ඇතුළු විශේෂයෙන් නාස්තිය, අල්ලස, දූෂණය සහ අකාර්යක්ෂමතාව වාගේ එම ආයතනවල ඉහවහා ගිය ගැටලු විශාල ප්‍රමාණයක් පැවතිලා තිබෙනවා. එම ගැටලු බලපා තිබෙනවා, සමුපකාර සමිති එක පැත්තකින් පාඩු ලබන්නත්, අනෙක් පැත්තෙන් සමුපකාර ප්‍රාදේශික විශාල ප්‍රමාණයක් වැහිලා යන්නත්, ඒ වාගේම සමුපකාරයකින් ලබා දෙන සේවාවන් නිසි පරිදි මිනිසුන්ට ලබා දීමට නොහැකි වෙන්නත්. අදත් මට කෙනෙකු telephone call එකකින් දැනුම් දුන්නා, දැනට

බුලත්කොහුපිටිය සමුපකාර සමිතියේ ක්‍රියාත්මක වෙන්නේ ෂෙඩ් එකක් විතරයි, ඒ ෂෙඩ් එකේ තෙල් තිබියදීත් තෙල් ගහන එක නවත්වා තිබෙනවා, ඔවුන්ගේ අභ්‍යන්තරිකව තිබෙන යම් යම් ආරාවුල් සහ ගැටලු සහගත තත්ත්වයන් හේතුකොටගෙන කියලා. ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම කෑගල්ල දිස්ත්‍රික්කයේ සමුපකාර ව්‍යාපාරය තුළ දකින්න තිබෙන මෙන්න මේ කියන ගැටලු වළක්වා ගැනීම සඳහා ආණ්ඩුව විධියට ගනු ලබන ක්‍රියාමාර්ග මොනවාද කියන එක පළමුවන අතුරු ප්‍රශ්නය හැටියට මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු මන්ත්‍රීතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව සමුපකාර ව්‍යාපාරය පළාත් සභා විෂයයක් ලෙස ක්‍රියාත්මක කරන්න පටන් ගත්තාට පස්සේ ඔබතුමා මතු කළා වාගේම අපි මුහුණ දුන් ගැටලු ගණනාවක් තිබෙනවා. පසුගිය දශක දෙක තුනකට ආසන්න කාලය තිස්සේ සමුපකාර ව්‍යාපාරය අත්හැර දාලා, සමුපකාර දේපළ පවා එවකට සිටි දේශපාලනඥයන් විසින් කොල්ල කාලා තිබෙන්නේ. එලෙස කොල්ල කාපු දේපළ ඔවුන් බලයේ සිටි කාලයේ සමහර රාජ්‍ය ආයතන පාවිච්චි කරලා, අධ්‍යක්ෂ මණ්ඩලවල තීරණ අරගෙන, එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හරහා ඔවුන්ගේ පෞද්ගලික දේපළ කරගෙනයි තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ විශේෂයෙන් ඉන්ධන පිරවුම්හල් ඔවුන්ගේ දේපළ කරගෙන තිබෙන්නේ. ඒ වාගේම විවිධ සේවා සමුපකාර සමිතිවල පාලනයට මැදිහත් වුණු පිරිස විසින් ඉතා විශාල ලෙස දේපළ අවභාවිතය වාගේම සමුපකාරයේ වත්කම් අවභාවිත කිරීම හරහා සමුපකාර ව්‍යාපාරය අඩපණ කරලා තිබෙන්නේ. ඒ ගැටලු හඳුනා ගත් අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව සමුපකාර ව්‍යාපාරය අපේ රටේ ආර්ථිකයේ ශක්තිමත් කුලුනක් ලෙස ගොඩනැඟීමට තීරණය කරලා තිබෙනවා. ඒ අනුව තමයි රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය වාගේම සමුපකාර අංශයත් ශක්තිමත්ව ගොඩනැඟීම වෙනුවෙන් අපි කටයුතු කරමින් තිබෙන්නේ.

ඔබතුමා ඇහුවා, දිස්ත්‍රික් සමුපකාර ව්‍යාපාරයේ තිබෙන ගැටලු විසඳීම සඳහා අපි මොකක්ද කරන්නේ කියලා. දිස්ත්‍රික් හැටියට නොවෙයි, රටක් හැටියට සිතා සමුපකාර පනතේ තිබෙන දුර්වලතා අපි හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව සමුපකාර පනත නැවත සකස් කරන්න කැබිනට් අනුමැතිය සහිත කමිටුවක් පත් කරලා තිබෙනවා. අපි පසුගිය සතියේ සිකුරාදා සහ සෙනසුරාදා දිනවල සියලු ආණ්ඩුකාරවරු, පළාත් ලේකම්වරු, කොමසාරිස්වරු හා දිස්ත්‍රික් කොමසාරිස්වරු ඒකාබද්ධ කරගනිමින් සාකච්ඡා කර නව සමුපකාර පනතක් ගොඩනැඟීමට අවශ්‍ය කටයුතු අවසන් කර තිබෙනවා. අපි ඒ පනත කඩිනමින් සකස් කර නීතිමය පැත්තෙන් අදාළ කරන ශක්තිමත් කිරීම සිදු කරනවා. ඒ වාගේම සමුපකාර ව්‍යාපාරය ගොඩනැඟීමට අවශ්‍ය කරන ශක්තිමත් අඩිතාලමක් දමන්න රජයක් හැටියට අපි උදවු කරන්න ඕනෑ. මම කිව්වා, සමුපකාර ව්‍යාපාරය කඩා වැටීමට ඒක එක හේතුවක් බව. නිෂ්පාදන සමුපකාර සමිති ශක්තිමත් කිරීම සඳහා පසුගිය වසරේ අපි රුපියල් මිලියන 100ක් ලබා දුන්නා, ගරු මන්ත්‍රීතුමනි. මේ අවුරුද්දේ සමුපකාරවලට අපි මධ්‍යම රජයෙන් රුපියල් මිලියන 600ක් වෙන් කර තිබෙනවා. මේ වනවිට වී වේළන මැෂින් ලබා දීම සඳහා විවිධ සේවා සමුපකාර සමිතිවලට රුපියල් මිලියන 500ක් ලබා දෙනවා. ගබඩාවක් තිබෙනවා නම්, වී මෝලක් තිබෙනවා නම් ඒ සඳහා ප්‍රමුඛතාව ලැබෙනවා. ඒ ප්‍රමුඛතාව අනුව සමුපකාර ව්‍යාපාරය ශක්තිමත් කිරීම සඳහා විවිධ සේවා සමුපකාර සමිතිවලට රුපියල් මිලියන 500ක වටිනාකමින් යුක්ත වී වේළන මැෂින් අරගෙන දෙන්න රජයෙන් කටයුතු කරනවා. ඒ වාගේම තව රුපියල් මිලියන 100ක් අපි නිෂ්පාදන සමුපකාර සමිති සඳහා වෙන් කර තිබෙනවා. ඒ හරහාත් නිෂ්පාදන කටයුතුවලට දායක වන අයට යන්ත්‍රෝපකරණ ලබා දෙනවා. මේ සියල්ල ආධාර හැටියටයි දෙන්නේ, ණය හැටියට නොවෙයි. ඒ වාගේම සමුපකාර අරමුදල් පාවිච්චි කරලා සමුපකාර සමිති ගොඩනඟන්නත්, මධ්‍යම රජයේ අරමුදල් සහ පළාත් අරමුදල් පාවිච්චි කරලා Mega Co-op City, Mini Co-op City ගොඩනැඟීම සඳහාත් වැඩ කරන්න අපි කටයුතු කරමින් සිටිනවා. ඒ සඳහා අපි සැලසුම් සකස් කරමින් සිටිනවා.

ඒ විතරක් නොවෙයි, සමුපකාර ව්‍යාපාරයට ආදරය කරන සමුපකාරිකයන්ගේ සමුපකාර ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අවශ්‍ය නීති සකස් කරද්දී විශේෂයෙන් බැංකු පැත්තට අවධානය යොමු කරමින් බැංකු නියාමන පනතක් සකස් කිරීමට අවශ්‍ය කටයුත්ත අපි මේ හා සමගාමීව සිදු කරමින් තිබෙනවා. ඒ සියල්ල සිදු කරන ගමන් සමුපකාර ව්‍යාපාරයේ නියැළී ඉන්න සියලුදෙනා ඇගැයීමට ලක් වන ආකාරයට එලදායිතා දිනයක්ද අපි නම් කර තිබෙනවා. ඒ එලදායිතා දිනය වෙනුවෙන් සියලුම විවිධ සේවා සමුපකාර සමිති ඇතුළු categories හතරක සමුපකාර සමිතිවලට අපි තරගාවලියක් පවත්වනවා. තමන්ගේ සමුපකාරය පවත්වා ගෙන යන ආකාරය, එනම් විගණනය කිරීම්, ගිණුම් තැබීම්, සේවකයන්ගේ මැදිහත්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල දායකත්වයන් යන මේ සියලු කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු අවසන් කරලා, දෙසැම්බර් මාසයේදී අපේ ජාතික එලදායිතා දිනයේදී මේ categories හතරටම අදාළ සමුපකාර සමිතිවලට සම්මාන සහ සහතික ලබා දෙමින් ඒ අය උනන්දු කරන ක්‍රියාවලියක් සිදු කරන්න බලාපොරොත්තු වෙනවා. මේ සියල්ල කරමින් බිඳ වට්ටපු සමුපකාර ව්‍යාපාරය අපේ රටේ ආර්ථිකයේ ශක්තිමත් කුලුනක් ලෙස නැවත ගොඩනඟන්න අවශ්‍ය ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගන්න අපි කටයුතු කරනවා කියන කාරණය මේ පාර්ලිමේන්තුවේදී ඉතාම සතුටින් මම දැනුම් දෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

පිළිතුරු ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඔබතුමාගේ පිළිතුරෙන් මම අහන්න ඉන්න දෙවැනි අතුරු ප්‍රශ්නයටත් යම් ප්‍රමාණයක පිළිතුරක් ලැබුණා. කොහොම වුණත් ගරු අමාත්‍යතුමනි, ආණ්ඩුවේ මේ කියන ආකර්ෂණීය වැඩ පිළිවෙළ නිසා බොහෝ විට නව සමුපකාර සමිති ලියාපදිංචි කිරීම සඳහා සමාජය උනන්දුවක් දක්වනවා. ඒ අනුව විශේෂයෙන් කිරි ගොවි සමුපකාර සමිති, අපනයන කෘෂිකර්ම සමුපකාර සමිති වාගේ ඒවා තිබෙනවා. අපි කෑගල්ලේ පටන් ගත්තා, බුලත් ගොවි සමුපකාර සමිතියක්.

ගරු ඇමතිතුමනි, මේ සමුපකාර සමිති කෑගල්ලට විශේෂිත නම්, සබරගමුවට විශේෂිත නම් මේ ගැන විශේෂයෙන් හොයා බලන්න. මේ සමිති ආරම්භ කරලා, අදාළ කරන ලියාපදිංචි කිරීම් කටයුතු ආරම්භ කරලා මේ වනවිට වර්ෂයක කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත් ඒ ලියාපදිංචිය ලබා දීමට තවම අසමත් වෙලා තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවේ ආකර්ෂණීය වැඩ පිළිවෙළක් වන සමුපකාර සමිති දහසේ වැඩ පිළිවෙළට අනුගත වෙන්න උත්සාහ කරන අය ටිකක් අධෛර්යවත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගැන සොයා බලා යම් කටයුත්තක් කරන්න කියා ඉල්ලමින්, ඒ වෙනුවෙන් යම් පිළිතුරක් මා අපේක්ෂා කරනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට ඉතා කෙටියෙන් මම පිළිතුරු ලබා දෙන්නම්. ගරු මන්ත්‍රීතුමා විශේෂයෙන් සඳහන් කළ

[ගරු වසන්ත සමරසිංහ මහතා]

පරිදි කැගල්ල දිස්ත්‍රික්කයේ යම් ප්‍රමාදයක් තිබෙනවා නම් අපි ඒ පිළිබඳව සොයා බලන්නම්. සමුපකාරයක් ලියාපදිංචි කරන්න මාස හයක කාලයක් ගත වනවා. නමුත් අපි නිෂ්පාදන සමුපකාර සමිති මාස තුනකින් ලියාපදිංචි කිරීම අවසන් කරන්න අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන ඒ පිළිබඳව පළාත් සමුපකාරවලටත් දැනුම් දීම කරලා තිබෙනවා. ඒ ගැන මම විශේෂයෙන් හොයා බලන්නම්.

ඔබතුමා විශේෂයෙන් කිව්ව කැගල්ලේ බුලත්වලින් ඩයි එකක් හදන නිෂ්පාදන සමුපකාරයට අපි මෙවර උදවු කරනවා. මේ ප්‍රමාදය වළක්වා ගන්න අපි කටයුතු කරනවා. මේ අවුරුද්දේ නිෂ්පාදන සමුපකාර 200ක් ලියාපදිංචි කරන්න අපි කටයුතු කරනවා. ඔබතුමා කියපු කාරණය ගැන විශේෂයෙන් හොයා බලා, ඒ පිළිබඳව දැනුම් දෙන්නම්.

## කොළඹ දිස්ත්‍රික්කයේ රැකවරණය හෝ ජීවනෝපාය නොමැති වැඩිහිටියන්: සුබසාධනය සහ ආරක්ෂාව

கொழும்பு மாவட்டத்தில் பராமரிப்போ, வாழ்வாதாரமோ இல்லாத முதியவர்கள்: நலன்புரி மற்றும் பாதுகாப்பு

ELDERS WITHOUT CARE OR LIVELIHOOD IN COLOMBO DISTRICT: WELFARE AND PROTECTION

2094/2026

**6. ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමීප ඥාතීන් නොමැති, ස්ථිර ජීවනෝපායක් නොමැති සහ කුලී නිවාසවල ජීවත් වන කොළඹ දිස්ත්‍රික්කය තුළ සිටින වයෝවෘද්ධ පුද්ගලයන් හඳුනා ගැනීම සඳහා ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, මේ දක්වා හඳුනාගෙන ඇති එවැනි වැඩිහිටියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වැඩිහිටියන්ගේ සුරක්ෂාව සඳහා කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන සඳහා රජය විසින් දක්වන අනුග්‍රහය කවරේද;

(v) සමස්තයක් ලෙස වැඩිහිටියන්ගේ සුරක්ෂාව සම්බන්ධ ගැටලුව වාර්ෂිකව වර්ධනය වන ප්‍රවණතාවක් පවතින බව දන්නේද;

(vi) වැඩිහිටියන්ගේ සුරක්ෂාව සහ සුභසාධනය උදෙසා යෝජිත ඉදිරි සැලසුම් තිබේද;

(vii) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பு மாவட்டத்தில் வாடகை வீடுகளில் வசிக்கும், நெருங்கிய உறவினர்கள் மற்றும் நிலையான வாழ்வாதாரம் இல்லாத முதியோர்களைக் கண்டறிவதற்கான முறையொன்று உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், இதுவரை அடையாளம் காணப்பட்ட அத்தகைய முதியோர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) அம்முதியோர்களின் பாதுகாப்பிற்காக கொழும்பு மாவட்டத்தில் நிறுவப்பட்டுள்ள நிறுவனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iv) அந்நிறுவனங்களுக்கு அரசாங்கம் வழங்கும் உதவி யாதென்பதையும்;

(v) முதியோர்களின் பாதுகாப்பு தொடர்பான பிரச்சினையானது ஒட்டுமொத்தமாக ஆண்டுதோறும் அதிகரித்து வரும் போக்கு காணப்படுவதை அறிவாரா என்பதையும்;

(vi) முதியோர்களின் பாதுகாப்பு மற்றும் நலன்களுக்காக முன்மொழியப்பட்ட எதிர்காலத் திட்டங்கள் உள்ளனவா என்பதையும்;

(vii) ஆமெனில், அந்தத் திட்டங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he state -

(i) whether a mechanism is available to identify elderly persons in the Colombo District who have no close relatives, no permanent livelihood and who live in rented houses;

(ii) if so, the number of such elderly persons identified so far;

(iii) the number of institutions established within the Colombo District for the protection of the said elderly persons;

(iv) the support extended by the Government to the said institutions;

(v) whether he is aware that, on the whole, issues relating to the protection of elderly persons show a growing annual trend;

(vi) whether future plans have been proposed for the protection and welfare of elderly persons; and

(vii) if so, such proposed plans?

(b) If not, why?

**ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) දැනට නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) ආයතනගත රැකවරණය වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන,

- රජය මඟින් සෘජුව පාලනය වන වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන - නැත
- පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් සෘජුව පාලනය වන වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන - නැත
- පෞද්ගලික මට්ටමින්, රාජ්‍ය නොවන සංවිධාන හා සිවිල් සංවිධාන මට්ටමින්, ආගමික සංවිධාන විසින් හා වෙනත් වැඩිහිටියන් වෙනුවෙන් නේවාසික සත්කාර සපයන ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන,
    1. ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ 2026.07.28 දිනට ලියාපදිංචි වී ඇති සංඛ්‍යාව - 10
    2. ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ 2026.07.28 දිනට ලියාපදිංචි නොවී පවත්වා ගෙන යන බවට වාර්තා වී ඇති සංඛ්‍යාව - 114

(iv) ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචිව නොමිලේ පවත්වා ගෙන යනු ලබන වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රමිතිගත කිරීම වෙනුවෙන් අවශ්‍ය අලුත්වැඩියාවන් සහ උපකරණ ලබා ගැනීමට එක් සුරැකුම් මධ්‍යස්ථානයක් සඳහා රුපියල් මිලියන දෙකක මුදලක් ලබා දෙන අතර, 2025 වර්ෂයේ සුරැකුම් මධ්‍යස්ථාන 14කට එම ආධාර ලබා දී තිබෙනවා.

(v) ඔව්.

(vi) ඔව්.

(vii)
- වැඩිහිටි තැනැත්තන් සඳහා ආයතනගත රැකවරණය සපයනු ලබන මධ්‍යස්ථාන නියාමනයට අදාළ නියෝග හා මාර්ගෝපදේශ කෙටුම්පත් සකස් කර අවසන් අතර, එය නීතිගත කළ පසු වැඩිහිටි සුරැකුම් මධ්‍යස්ථාන විධිමත්ව අධීක්ෂණය කරනු ලැබේ.
- ව්‍යාපාරික මට්ටමින් පවත්වාගෙන යනු ලබන රැකවරණ මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය දිරිගැන්වීම් සිදු කිරීම. (ණය යෝජනා ක්‍රම යනාදි)
- නොමිලේ පවත්වා ගෙන යනු ලබන රැකවරණ මධ්‍යස්ථාන සඳහා රජය මඟින් අවශ්‍ය අනුග්‍රහය ලබා දීම.
- වයස අවුරුදු 70 සම්පූර්ණ වැඩිහිටියන් වෙනුවෙන් ලබා දෙන ජීවනාධාර ගෙවීම් සියල්ල සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලයේ සමාජ ආරක්ෂණ දත්ත පද්ධතිය හරහා විධිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම.
- එම වැඩිහිටියන් සඳහා වැඩිහිටි සුවසරණ සෞඛ්‍ය රක්ෂණාවරණය, ජාතික රක්ෂණ භාර අරමුදල හා එක්ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- නිවාස තුළ වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සැපයීම සහ ප්‍රජා මූලික වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සැපයීම සහ ප්‍රජා මූලිකව වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක වන ග්‍රාමීය වැඩිහිටි සමිති සවිබලගැන්වීම වෙනුවෙන් අවශ්‍ය නීති රීති සම්පාදනය කිරීම.
- 2025 වර්ෂයේදී එළි දක්වන ලද ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් උපාය මාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සියලු පාර්ශ්වයන්ගේ දායකත්වය ලබා ගනිමින් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම.
    - ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘතිය යටතේ වවුනියාව, කිලිනොච්චිය, මඩකලපුව, කෑගල්ල, මාතලේ යන දිස්ත්‍රික්ක පහ ආවරණය වන පරිදි ආදර්ශ වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉදිකිරීමට අවශ්‍ය මූලික කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී.
    - දැනට ක්‍රියාත්මක වන වැඩිහිටි දිවා මධ්‍යස්ථාන 200ක් විධිමත් වැඩිහිටි දිවා මධ්‍යස්ථාන මට්ටමින් රජයේ අනුග්‍රහයෙන් පවත්වා ගෙන යාමට අවශ්‍ය නිර්ණායක සකසා ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මෙම ප්‍රශ්නයේ (v) වන කොටසට ලබා දුන් පිළිතුර අනුව මම නැවත ප්‍රශ්න කරනවා, විශේෂයෙන්ම අපේ රටේ වැඩිහිටි ජනගහනය සම්බන්ධයෙන්. අපේ වැඩිහිටි ජනතාව කියන්නේම අපේ රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක වුණු පිරිසක්. අද වනවිට අපිට දැනී තිබෙනවා, මහජන දිනවලට විශේෂයෙන්ම වැඩිහිටි පිරිස් සම්බන්ධ වන ප්‍රමාණය වැඩියි කියන කාරණය. එසේ එන අයගේ කථා අහනකොට අපට දැනී යන්නේ ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික වශයෙන් ඔවුන් අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙන බවයි. ඒ තුළ අපි දකිනවා, ප්‍රමාණවත් පරිදි සුරැකුම් මධ්‍යස්ථාන නොමැතිකම. එම වැඩිහිටියන් සම්බන්ධයෙන් රාජ්‍ය අනුග්‍රහය ඇතිව දිවා සුරැකුම් මධ්‍යස්ථාන ප්‍රමාණවත් පරිදි වැඩි කළ යුතුයි කියන හැඟීම තමයි අපට තිබෙන්නේ. ඒ නිසා ජනතාවාදී ආණ්ඩුවක වගකිව යුතු නියෝජ්‍ය ඇමතිවරයෙක් විධියට කටයුතු කරන ඔබතුමාගෙන් මම අහන්න කැමැතියි, ඒ සම්බන්ධයෙන් ඉදිරි වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා.

**ගරු වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ)
(The Hon. Wasantha Piyathissa)
ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම දිවා සුරැකුම් මධ්‍යස්ථාන වැඩි කිරීම හරහා මේ රටේ වැඩිහිටියන් රැකබලා ගැනීම පිළිබඳ කාරණය අවසන් කරන්න බැහැ. අපි සුපිළිපන් සමාජයක් හදන්න

[ගරු වසන්ත පියතිස්ස මහතා]

ඕනෑ. අපි සමස්ත දරු පරපුරටම උගන්වන්න ඕනෑ, තමන්ගේ ආදරණීය අම්මා, තමන්ගේ ආදරණීය තාත්තා, තමන්ගේ ආදරණීය වැඩිහිටියා රැකබලා ගත යුතුයි කියලා. මේ සංකීර්ණ සමාජ වටපිටාව තුළ එවැනි සංස්කෘතියක් ගොඩනැඟෙනවා දකින්න අපට හරි අමාරුයි. අද මොකක්ද වෙන්නේ? අම්මාගේ දේපළ තිබෙනවා, තාත්තාගේ දේපළ තිබෙනවා; ඒවා ලියා ගන්නවා; ඒ වුණත් ඒ අම්මා, තාත්තා නිවැරදි ලෙස රැකබලා ගැනීමක් සිද්ධ වෙන්නේ නැහැ. තමන්ට හැකියාව තිබියදීත් අම්මා, තාත්තා රැකබලා ගැනීම සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා අපේ පළමුවැනි ප්‍රයත්නය, මූලික පරමාර්ථය වෙන්න ඕනෑකම තිබෙන්නේ තමන්ගේ ආදරණීය අම්මා, තාත්තා, තමන්ගේ ආදරණීය වැඩිහිටියා තමන් විසින්ම රැකබලා ගනිමින්, ආරක්ෂා කර ගනිමින්, පෝෂණය කරමින් ඔවුන් සතුටින් තැබීමයි.

මේ වෙනකොට අපේ රට තුළ වැඩිහිටි නිවාස 496ක් තිබෙනවා. ඒවායෙන් ලියාපදිංචි වෙලා තිබෙන්නේ එකසිය ගණනක්. ඒ වැඩිහිටි නිවාස බොහෝ වෙලාවට අදාළ ප්‍රමිතියෙන් තොරයි. ඒවායෙන් ලැබෙන ආරක්ෂාව, ආහාර පාන ලබා දීම පිළිබඳවත් බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා ඒ පිළිබඳව දැඩි අවධානය යොමු කරලා, අපි අමාත්‍යාංශයක් විධියට මේ වෙනකොට ඒ සඳහා අදාළ නීති-රීති සම්පාදනය කරලා ඊට අදාළ මැදිහත්වීම් කරනවා. අනිවාර්යයෙන්ම ලියාපදිංචි වෙන්න ඕනෑකම තිබෙනවා, ඒ අදාළ නිවාසය තුළ ඒ දෙමාපියන් රැක බලා ගැනීම වෙනුවෙන්, මේ මේ කියන නිර්ණායක යටතේ එය පවත්වා ගෙන යනවා කියලා. ඊට අදාළ මූල්‍යමය පහසුකම් අපේ පැත්තෙන් අපි ලබා දෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයට සෘජුව දෙන්න තිබෙන උත්තරය තමයි, ඇත්තටම මේ දායකත්වය ප්‍රමාණවත් මදි කියන එක. ඒ නිසා අපි සෑම දිස්ත්‍රික්කයක් තුළම රජයේ මැදිහත්වීමෙන් එවැනි වැඩිහිටි සුරැකුම් නිවාසයක් ආරම්භ කරන්නත්, පෞද්ගලිකව ඒවා පවත්වා ගෙන යන්න උත්සාහ කරන අයට අඩු කොන්දේසි යටතේ ණය ලබා දෙමින්, අපේ නිර්ණායක පද්ධතියට යටත්ව වඩා හොඳ වැඩිහිටි නිවාස, එහෙම නැත්නම් සුරැකුම් මධ්‍යස්ථාන පවත්වා ගෙන යෑම වෙනුවෙන් ඔවුන් දිරිගැන්වීම සිදු කිරීමත් ආරම්භ කරලා තිබෙනවා.

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයෙන් මේ වෙනකොටත් සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරමින්, ඒ වාගේම අලුත් විධියට මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය අපේ රටේ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක නොවන්නන් ළඟට යන්න වැඩසටහන් සකස් කරලා තිබෙනවා. අද වන විට මේ රටේ වැඩිහිටි ජනගහනය වැඩි වෙන බව අපි දන්නවා. නමුත්, සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හරහා මේ මොහොතේ ඉදිරිපත් කරලා තිබෙන සංඛ්‍යාලේඛන අනුව, දැනට වයස අවුරුදු 60ට ඉහළ අයට මේ සඳහා දායකවීමට ප්‍රමාණවත් ක්‍රය ශක්තියක් නැහැ, මූල්‍ය ශක්තියක් නැහැ. ඇත්තටම ගත්තොත්, දිනෙන් දින ඒ ප්‍රමාණය වැඩි වෙන නිසාමයි, මම මේ ප්‍රශ්නය ඔබතුමාට යොමු කරන්නේ. ඒ නිසා එවැනි වයස අවුරුදු 60ට වැඩි වයෝවෘද්ධයන්ට සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ඇතුළු වෙන්න සහනදායී ක්‍රමවේදයක් සකස් කරන්න පුළුවන්ද, බැරිද කියන එක තමයි මගේ අතුරු ප්‍රශ්නය වන්නේ.

**ගරු වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ)
(The Hon. Wasantha Piyathissa)

ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය හරහා අපි මේ වන විටත් ඒ පිළිබඳව සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම, ඊට අදාළ application එකක් සකස් කරලා, සමාජ සේවා නිලධාරින්, වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරින් හරහා ඊට අදාළ කටයුතු ආරම්භ කර තිබෙනවා. ඇත්තටම දැනටමත් අඩු ආදායම්ලාභී සියලු වැඩිහිටියන් සඳහා ඒ දීමනාව ලබා දීමේ කටයුතු සිද්ධ කරමින් තිබෙනවා.

ඒත් එක්කම, අපි ඇත්තටම විශ්වාස කරනවා විශ්‍රාම වැටුපක් නොලැබෙන, නිසි ආදායමක් නොමැති, එවැනි අනාරක්ෂිත තත්ත්වයේ සිටින සියලු වැඩිහිටියන් එම සමාජ ආරක්ෂණ රක්ෂණ ක්‍රියාවලියට සම්බන්ධ කර ගන්නට හැකි වේවි කියලා. ඒ අනුව මෙය ලංකාවේ දැවැන්තම රක්ෂණ ආවරණය සහිත ව්‍යාපාරය බවට පත් කරන්න, ඒ ආකාරයට වැඩිහිටියන් සඳහා අපේ ප්‍රමුඛතාව ලබා දෙන්න අපි කටයුතු කරනවා. අස්වැසුම ප්‍රතිලාභී කණ්ඩායම් විධියට 621,631දෙනෙකුටත්, අස්වැසුම II අදියර යටතේ 77,324දෙනෙකුටත්, තැපැල් කාර්යාල හරහා 225,657දෙනෙකුටත් වශයෙන්, සමස්ත එකතුව ලෙස 924,619දෙනෙකුට වැඩිහිටි දීමනාව ලබා දීමට අපි මේ වන කොට කටයුතු කරමින් ඉන්නවා. අප බලයට එනකොට 600,000කට ආසන්න ප්‍රමාණයකට විතරයි වැඩිහිටි දීමනාව ලබා දුන්නේ.

ඒ වාගේම අපි මේ වෙලාවේ රටේ අඩු ආදායම්ලාභී සමස්ත පුරවැසියන්ට සඳහන් කරන්න ඕනෑ, "වැඩිහිටි දීමනාව ලබා ගැනීම සඳහා තිබූ quota එක දැන් ඉවරයි, තව කෙනෙක් මියැදෙන කල් ඉන්න, ඊට පසුව තමයි ඔයගොල්ලන්ට මේක දෙන්න පුළුවන් වෙන්නේ" කියලා කවුරු හරි නිලධාරියෙකු කියනවා නම්, ඒක සම්පූර්ණයෙන් අසත්‍ය කථාවක් බව. අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම මේ දීමනාව ලැබීමට සුදුසු අඩු ආදායම්ලාභී අම්මා කෙනෙකු, තාත්තා කෙනෙකු ඉන්නවා නම්, ඒ සියලු දෙනාට මේ වැඩිහිටි දීමනාව ලබා දීම සඳහා අදාළ මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන බව. ඒ සඳහා වන පියවර වහාම අනුගමනය කරන්න කියන ඉල්ලීමත් මා කරනවා.

වැඩිහිටි පරපුර කියන්නේ මේ රට ගොඩනගපු, ලේ, දහඩිය, කඳුළු වගුරපු අපේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්. ගරු මන්ත්‍රීතුමනි, ඔවුන් වෙනුවෙන් ඔබ කියපු ආකාරයේ රක්ෂණ ක්‍රමවේදයක් ඉතා වේගවත්ව ක්‍රියාත්මක කරන්න අපි පියවර ගන්නා බවත් මම සඳහන් කරන්න කැමැතියි.

## LRC ඉඩම්වල ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘති: රත්නපුර දිස්ත්‍රික්කය

LRC காணியில் நடைமுறைப்படுத்தப்பட்டுள்ள வீடமைப்புக் கருத்திட்டங்கள்: இரத்தினபுரி மாவட்டம்

HOUSING PROJECTS IMPLEMENTED ON LRC LANDS: RATNAPURA DISTRICT

2108/2026

7. **ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට සහ වැවිලි සමාගම්වලට අයත්ව තිබූ ඉඩම් අත්පත් කරගෙන ක්‍රියාත්මක කර ඇති නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ව්‍යාපෘතිවලට අයත් නිවාස සංඛ්‍යාව ව්‍යාපෘතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් ව්‍යාපෘතිය යටතේ නිවාස සහ භූමිය සඳහා ඔප්පු නිකුත් කර ඇති සහ නිකුත් කර නොමැති ප්‍රතිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙතෙක් ඔප්පු ලබා නොදුන් ප්‍රතිලාභීන්ට ඔප්පු ලබා දීමට කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்கும் பெருந்தோட்டக் கம்பனி களுக்கும் சொந்தமாக இருந்த காணிகளை கையகப்படுத்தி நடைமுறைப்படுத்தப்பட்டுள்ள வீடமைப்புக் கருத்திட்டங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி வீடமைப்புக் கருத்திட்டங்களில் உள்ள வீடுகளின் எண்ணிக்கை கருத்திட்ட வாரியாக வெவ்வேறாக யாது;

(iii) ஒவ்வொரு கருத்திட்டத்தின் கீழும் வீடுகளுக்கும் காணிகளுக்கும் உறுதிகள் வழங்கப்பட்டுள்ள அத்துடன் வழங்கப்படாதுள்ள பயனாளிகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(iv) இதுவரை உறுதிகள் வழங்கப்படாதுள்ள பயனாளிகளுக்கு உறுதிகளை வழங்க நடவடிக்கை எடுக்கப்படும் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House the -

(i) number of housing projects that were implemented by acquiring lands that belonged to the Land Reform Commission and plantation companies in the Ratnapura District;

(ii) number of houses that belong to each housing project;

(iii) number of beneficiaries who have and have not been issued deeds for the houses and lands under each project, separately; and

(iv) date on which deeds will be issued to the beneficiaries who have not yet received them?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)

(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත්ව අත්පත් කරගෙන ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 26කි.

වැවිලි සමාගමට අයත් ඉඩම් කිසිවක් නොමැත.

(ii) රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත්ව තිබූ ඉඩම් අත්පත් කරගෙන නිවාස ව්‍යාපෘති 26ක් ක්‍රියාත්මක වී ඇති අතර, ඒ සඳහා අයත් සම්පූර්ණ නිවාස සංඛ්‍යාව 916කි.

මෙම ව්‍යාපෘතිවලට අදාළ නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 01

| අනු අංකය | නිවාස ව්‍යාපෘතියේ නම | නිවාස සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ගිරිපාගම ආදර්ශ ගම්මානය | 53 |
| 2 | කිරණෝදාගම ආදර්ශ ගම්මානය | 102 |
| 3 | පලන්සූරියගම ආදර්ශ ගම්මානය | 32 |
| 4 | සුසිරිගම ආදර්ශ ගම්මානය | 30 |
| 5 | කලවාන මැති 30 (ගලතුර මැති 30) | 29 |
| 6 | කලවාන මැති 20 (නාගහහේන) | 20 |
| 7 | කලවාන මැති 10 (රජ්ජුරුවත්ත) | 10 |
| 8 | දිවුරුම්පිටිය අත්කම් | 25 |
| 9 | පුන්සිරිගම ආදර්ශ ගම්මානය | 31 |
| 10 | පැරඩයිස් අත්කම් | 50 |
| 11 | මාටුවාගල මැති 20 | 20 |
| 12 | රක්වාන මැති 30 | 28 |
| 13 | රක්වාන මැති 10 | 10 |
| 14 | රක්වාන මැති 20 | 20 |
| 15 | උක්වත්ත අත්කම් | 39 |
| 16 | විදාගම ආදර්ශ ගම්මානය | 50 |
| 17 | බලංගොඩ මැති 20 | 20 |
| 18 | බලංගොඩ මැති 05 (අළුත්නුවර) | 5 |
| 19 | කෝපිවත්ත | 33 |
| 20 | සඳුන්තැන්නගම | 30 |
| 21 | නැණසිහගම | 25 |
| 22 | සිරිපාගම ආදර්ශ ගම්මානය | 54 |
| 23 | සඳසිළුගම | 100 |
| 24 | සමනලගම ආදර්ශ ගම්මානය | 50 |
| 25 | පැල්මඩුල්ල මැති 30 (රීල්හේන) | 30 |
| 26 | පැල්මඩුල්ල මැති 20 | 20 |
| එකතුව | | 916 |

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

(iii) ඉහත සඳහන් කරන ලද නිවාස ව්‍යාපෘති 26හි ඔප්පු නිකුත් කර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 796ක් වන අතර, ඔප්පු නිකුත් කර නැති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 120කි.

මෙම එක් එක් ව්‍යාපෘතියෙහි නම් සහ ප්‍රතිලාභීන් වෙත නිකුත් කර ඇති ඔප්පු සංඛ්‍යාව පිළිබඳ වෙන් වෙන් වශයෙන් විස්තර ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 02

| අනු අංකය | නිවාස ව්‍යාපෘතියේ නම | ඔප්පු නිකුත් කර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ඔප්පු නිකුත් කර නැති ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ගිරිපාගම ආදර්ශ ගම්මානය | 37 | 16 |
| 2 | කිරණෝදාගම ආදර්ශ ගම්මානය | 82 | 20 |
| 3 | පලන්සූරියගම ආදර්ශ ගම්මානය | 29 | 3 |
| 4 | සුසිරිගම ආදර්ශ ගම්මානය | 27 | 3 |
| 5 | කලවාන මැති 30 (ගලතුර මැති 30) | 28 | 1 |
| 6 | කලවාන මැති 20 (නාගහහේන) | 19 | 1 |
| 7 | කලවාන මැති 10 (රජ්ජුරුවත්ත) | 9 | 1 |
| 8 | දිවුරුම්පිටිය අත්කම් | 24 | 1 |
| 9 | පුන්සිරිගම ආදර්ශ ගම්මානය | 26 | 5 |
| 10 | පැරඩයිස් අත්කම් | 48 | 2 |
| 11 | මාටුවාගල මැති 20 | 18 | 2 |
| 12 | රක්වාන මැති 30 | 21 | 7 |
| 13 | රක්වාන මැති 10 | 9 | 1 |
| 14 | රක්වාන මැති 20 | 19 | 1 |
| 15 | උක්වත්ත අත්කම් | 29 | 10 |
| 16 | වීදාගම ආදර්ශ ගම්මානය | 48 | 2 |
| 17 | බලංගොඩ මැති 20 | 18 | 2 |
| 18 | බලංගොඩ මැති 05 (අළුත්නුවර) | 4 | 1 |
| 19 | කෝපිවත්ත | 30 | 3 |
| 20 | සඳුන්තැන්නගම | 25 | 5 |
| 21 | නැණසිහගම | 20 | 5 |
| 22 | සිරිපාගම ආදර්ශ ගම්මානය | 47 | 7 |
| 23 | සඳසිළුගම | 86 | 14 |
| 24 | සමනලගම ආදර්ශ ගම්මානය | 49 | 1 |
| 25 | පැල්මඩුල්ල මැති 30 (රීල්හේන) | 28 | 2 |
| 26 | පැල්මඩුල්ල මැති 20 | 16 | 4 |
| එකතුව | | **796** | **120** |

(iv) නිවාසලාභීන් 115දෙනෙකු මේ වන විට මුදල් ගෙවා අවසන් කර ඇති අතර, ඔප්පු ලබා දීමට අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කර සින්නක්කර ඔප්පු ලබා ගන්නා ලෙස ඔවුන්ට දන්වා ඇත. මුල් නිවාසලාභියා මිය ගොස් අයිතිය තහවුරු කර ගැනීමේ ගැටලුව, පදිංචිය නොමැති වීම, පදිංචිකරුවන්ට පසු උරුමකරුවන්ගේ කැමැත්ත නොලැබීම, පසු උරුමකරුවන් සොයා ගැනීම ආදි ගැටලු පැවතීම හා පදිංචිකරුවන් දැනුවත් කළත් ඔප්පු ලබා ගැනීමේ උනන්දුවක් නොමැති වීම වැනි ගැටලු ඔප්පු ලබා දීම ප්‍රමාද වීමට හේතු වී ඇත. අදාළ තොරතුරු ලබා දීමෙන් අනතුරුව 8(1) අනුමැතිය ලබාගෙන මාස 2ක් වැනි කාලයක් තුළ ප්‍රතිලාභීන් වෙත ඔප්පු නිකුත් කිරීමේ හැකියාව ඇත.

මේ වන විට ප්‍රතිලාභීන් 13දෙනෙකුගේ ඔප්පු 8(1) අනුමැතිය සඳහා යොමු කර ඇති අතර, තවදුරටත් මුදල් ගෙවා නොමැති ප්‍රතිලාභීන් 5දෙනෙකු වෙත මුදල් ගෙවන ලෙස දන්වා ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු කථානායකතුමනි, යම්කිසි පුද්ගලයෙකුට ඉඩම් ඔප්පුවක් කියන්නේ හුදෙක් එක්තරා සහතිකයක් හෝ ලියවිල්ලක් පමණක් නොවෙයි. තමාට ඉඩම් ඔප්පුවක් තිබෙන විට 'මට ඉන්න තැනක් තිබෙනවා' කියලා හිතට දැනෙනවා; ආරක්ෂණයක් තිබෙනවා. ඒ වාගේම තමන්ගේ ආර්ථික කටයුතු සඳහාත්, තමන්ගේ දූ දරුවන්ගේ අධ්‍යාපනය ආදි දේවල් සඳහාත් ඉඩම් ඔප්පුව බලපානවා. මම පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගැන සොයා බැලුවා. ඒ ඇතැම් නිවාස ව්‍යාපෘති පටන් අරගෙන තිබෙන්නේ 1976දී; ඇතැම් ඒවා 1995දී. ඒ කියන්නේ, සෑහෙන කාලයක් වෙනවා. දැනට අවුරුදු 30ක් ඉක්මවා ගිහිල්ලාත් ඒ නිවාසවලට ඔප්පු ලැබී නැහැ. ගරු ඇමතිතුමා කියපු විධියට සමහර ඒවායේ පළමුවැනි අයිතිකරුත් නොවෙයි ඉන්නේ. පරම්පරාවෙන් පරම්පරාවට ගිහිල්ලා, දෙවැනි පරම්පරාවේ අය, තුන්වැනි පරම්පරාවේ අයත් ඉන්න පුළුවන්. ඇතැම් අය දැන් ඒක බිස්නස් එකක් කරගෙනයි තිබෙන්නේ. ඒ කියන්නේ සැබෑ වශයෙන් ලැබිය යුත්තාට නොවෙයි ඒවා ලැබී තිබෙන්නේ. එවැනි කාට හරි දුන්නා නම්, ඒ අය ඒවා විකුණලා ගිහින් තිබෙනවා. සැබෑ වශයෙන් ඉඩම් සහ නිවාස ඕනෑ අය ඒවා අරගෙන තිබෙන්නේ, සල්ලිවලට. දැන් ඒ නිවාසවල පදිංචි වෙලා ඉන්නේ මුල් අයිතිකරුවන් නොවෙයි; දෙවැනි පාර්ශ්වය, තුන්වැනි පාර්ශ්වය විධියට ඉඩම් මිලට ගත්තු අයයි. අන්න දැන් ඒ අයගේ ළමයෙකු පාසලට ඇතුළත් කරන කොට, පදිංචියට ලබා දෙන ලකුණු සංඛ්‍යාව අඩු වෙනවා; ආසන්න පාසලට ළමයා ඇතුළත් කර ගැනීම සම්බන්ධව ගැටලුවක් මතු වෙනවා. තමන්ගේම කියලා ව්‍යාපාරයක් ආරම්භ කරන්න අපි සියයට 5 පොලියට loan එකක් දෙනවා. නමුත් සමහරුන්ට තම ව්‍යාපාරය ලියාපදිංචි කර ගන්න විධියක් නැහැ, ඔප්පුව නැති හින්දා. ඔප්පු ලබා දීම නම් ප්‍රමාද වෙන්න පුළුවන්. නමුත්, ළමයා ඉස්කෝලෙට ඇතුළත් කරන එක පරක්කු කරන්න බැහැ. තමන්ගේ බිස්නස් එකත් කර ගන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සඳහා විකල්ප වැඩ පිළිවෙළක් යෝජනා කරනවාද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ජනතාවට ලබා දිය යුතු ඔප්පු සංඛ්‍යාව 35,000කට වැඩියි කියලා තමයි ආයතනික වශයෙන් වාර්තා වෙන්නේ. නමුත්, 35,000කට වැඩි ප්‍රමාණය මේකයි කියා නිවැරදි ඉලක්කමක් නැහැ. අපි උත්සාහ දරමින් ඉන්නවා, කඩිනම් වැඩ පිළිවෙළක් තුළ එම ඔප්පුවලින් සැලකිය යුතු කොටසක් ලබා දෙන්න. නමුත්, එහි ගැටලු තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, පසුගිය මාස කිහිපය තුළ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය COPE එකට කැඳවා එම අධිකාරිය තුළ ඇති ගැටලු පිළිබඳව සාකච්ඡා කළ බව. අක්‍රමවත් විධියට ලබා දුන් දේපළ

සම්බන්ධයෙන්, ඒ වාගේම ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දේපළ අවභාවිත කිරීම් ආදිය සම්බන්ධයෙන් ගොඩක් සාකච්ඡා ඇති වෙලා තිබෙනවා.

ඔප්පු 300ක් අත්සන් කරන්න කියලා දැන් මගේ office එකට ඇවිල්ලා තිබෙනවා. ඇත්තටම ඒ ඔප්පු අත්සන් කරන්න බයයි. ඒ කියන්නේ, එම ඔප්පුවලින් සමහර ඒවා දීලා තිබෙන්නේ කාටද, මොන තේරීම යටතේද කියලා නැහැ. ඒවායේ විවිධ ගැටලු තිබෙනවා. ඒවා විවිධ විධියට අවභාවිත වෙලා තිබෙනවා. ඉතින් මම දැන් අමාත්‍ය කාර්යාලයේ මගේ කාර්ය මණ්ඩලය යොදවා ඒ ඔප්පු එකින් එක නැවත check කරනවා. එහෙම check කරද්දී එක එක වංචා ගහලා තිබෙන සමහර ඔප්පු අහු වෙනවා. හරිම පරිස්සමින් අත්සන් කරන්න ඕනෑ, මේකේ අන්තිම වග උත්තරකරුවා මම වන නිසා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා හරි, 1995 වර්ෂයේ ඉඳලා නොවෙයි, ඊට ඉස්සෙල්ලා අන්තිමට කරපු "ගම් උදාව" ව්‍යාපෘතියේ ඔප්පු පවා මීට මාස හතඅටකට ඉස්සෙල්ලා බෙදුවේ මමයි. ඒ තරම් කාලයක් - පරම්පරා ගණනක් - ගිහිල්ලා තිබෙනවා. මෙතැන සංකීර්ණ ප්‍රශ්නයක් තිබෙනවා. මේ සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් හදන්න යද්දී පෙනෙනවා, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තුළ ගැටලු ගොඩක් තිබෙන බව. අවශ්‍ය කරන නිලධාරින් නැහැ. ඒ වාගේම, එය දේශපාලනික වශයෙන් විනාශ කරපු ආයතනයක් නේ, ගරු මන්ත්‍රීතුමා. එය දේශපාලනික වශයෙන් සම්පූර්ණයෙන් විනාශ කරලා, වට්ටලායි තිබෙන්නේ. අප විශේෂ මෙහෙයුමක් හදා ගන්න ගියාට, ඒ ආයතනය ඇතුළේ capacity එක නැහැ. එම නිසා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අවශ්‍ය මූලික නිලධාරින් බඳවා ගැනීම සඳහා අපි පුවත් පත් දැන්වීමක් පළ කරලා දැන් එහි කාලය අවසන් වෙලා තිබෙනවා. හැකි ඉක්මනින් නිලධාරින් බඳවා ගෙන, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තුළ තිබෙන ධාරිතාව වැඩි කරලා, අවුරුදු එකහමාරක්, දෙකක් ඇතුළත විශේෂ මෙහෙයුමක් හරහා ඔප්පු 25,000ක්වත් ලබා දෙන සූදානමක තමයි අප ඉන්නේ. අපි ඒ සඳහා උත්සාහ දරනවා. ඒක හරිම අමාරුයි. මොකද, ඒ තරමට ඒ ආයතනය වට්ටලායි තිබෙන්නේ.

ඇත්තටම මිනිසුන්ට තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා අපට තේරෙනවා. නිවස හදලා, පදිංචි වෙලා අවුරුදු 30ක්, 40ක් ගත වෙලාත් ඔප්පුවක් නැහැ. ඉතින් මොකවත් කර ගන්න බැහැ. එම නිසා අපි ඒ සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් හදන්න උපරිම උත්සාහ දරමින් ඉන්නවා. අපි බලාපොරොත්තු වෙනවා, ලබන අවුරුද්ද, එකහමාර ඇතුළත ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා ඔප්පු 25,000ක්වත් ලබා දෙන්න.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
පිළිතුර ලබා දුන්නාට ස්තුතියි, ගරු ඇමතිතුමනි. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය යොමු කරන්නේත් නිවාස සම්බන්ධයෙන්මයි. නිවාස ව්‍යාපෘතියක් කියන්නේ හුදෙක් එක ළඟ තිබෙන ගෙවල් ටිකක් විතරක් නොවෙයි, ඒවාට අවශ්‍ය පොදු පහසුකම් ටිකත් ඕනෑ, ක්‍රීඩා පිටිය, ප්‍රජා ශාලාව, මාර්ග, ජලය, කසළ කළමනාකරණ වැඩ පිළිවෙළ ආදි වශයෙන්. මේ සමහර ව්‍යාපෘතිවල පොදු පහසුකම් සඳහා වෙන් කළ ඉඩම් පවා දැන් ඇතැම් අය බල පුළුවන්කාරකම් යොදාගෙන තමන්ගේ පෞද්ගලික පරිහරණයට ගන්නවා. ඒ නිසා අර කියපු පොදු පහසුකම් ස්ථාපනය ගැටලුවක් වෙලා තිබෙනවා. අන්න ඒවා නිරවුල් කිරීම සඳහා තිබෙන වැඩසටහන මොකක්ද? ඒ කට්ටිය ඒ තැන්වලින් අයින් කරලා දෙනවාද, එහෙම නැත්නම් ඒ කට්ටියටත් ඔප්පු දෙනවාද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ජාතික නිවාස සංවර්ධන අධිකාරියට තිබෙන ඊළඟ ප්‍රශ්නය තමයි ඒක. නිවාස සංවර්ධන අධිකාරිය යටතේ හදාපු බොහෝ නිවාස ව්‍යාපෘතිවල - housing schemesවල - පොදු කටයුතු සඳහා ඉඩම් වෙන් කරලා තිබෙනවා. ඒවා විවිධ දේශපාලන හේතු මත, දේශපාලන බලය මත, එහෙමත් නැත්නම් ක්‍රියා නොකිරීම මත අල්ලා ගෙන ඉන්නවා. මම එකක් කියන්නම්. නිවාස සංවර්ධන අධිකාරියේ කිසිම ඉඩමක් අනවසරයෙන්, බලයෙන්, අනීතික ලෙස භුක්ති විඳින්න ඉඩ දෙන්නේ නැහැ. කිසිම කෙනෙකුට ඒවා එවැනි ආකාරයට භුක්ති විඳින්න ඉඩ දෙන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නවා. අප දැනටමත් හඳුනා ගත්තු එවැනි සමහර තැන් තිබෙනවා.

මට මතක විධියට නිවාස සංවර්ධන අධිකාරිය යටතේ රට පුරා නිවාස ව්‍යාපෘති - housing schemes - 116ක් තිබෙනවා. ඔය කියන ගැටලුව ඔබතුමාගේ බල ප්‍රදේශයේ තිබෙන ගැටලුවක් නම්, ඔය කියන විධියට ඒවා අනවසරයෙන් අල්ලාගෙන ඉන්නවා නම් දිස්ත්‍රික්කයේ සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියට ඔබතුමා ඒ සම්බන්ධයෙන් සොයා අපට නිශ්චිතව වාර්තා කරන්න.

පොදු පහසුකම් සඳහා වෙන් කළ ඉඩම් පොදු පහසුකම් සඳහා යොදවන්නේ නැතිව වෙනත් පුද්ගලයන් අනවසරයෙන් භුක්ති විඳිනවා නම් ඒවා නිරවුල් කරලා දෙන්න ආයතනයක් විධියට අපි සූදානම්. ඇත්තටම ඒවා නිරවුල් කරන්න ඕනෑ පොදු පාවිච්චිය සඳහා. ඔබතුමන්ලා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී ඒවා හඳුනාගෙන අපව දැනුවත් කරන්න. එතකොට අපි ආයතනයක් විධියට මැදිහත් වෙන්නම්. රට පුරා මෙවැනි ගැටලු තිබෙනවා. ඒවා විසඳන්න අපි කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -2116/2026- (1), ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු වසන්ත පියතිස්ස මහතා**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ)
(The Hon. Wasantha Piyathissa)
ගරු කථානායකතුමනි, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවය: අනුමත කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු

### இலங்கை தொழில்நுட்ப சேவை: அங்கீகரிக்கப்பட்ட ஆளணியும் வெற்றிடங்களும்

### SRI LANKA TECHNOLOGICAL SERVICE: APPROVED CADRE AND VACANCIES

2172/2026

**9. ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවය යටතේ ගැනෙන රැකියා කවරේද;

(ii) එම සේවයේ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු රාජ්‍ය ආයතනවල කටයුතුවලට බාධාවක් වී තිබෙන බව පිළිගන්නේද;

(v) එසේ නම්, පුරප්පාඩු පිරවීමට සහ වෘත්තීය ගැටලු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை தொழில்நுட்ப சேவையின்கீழ் உள்ளடங்கும் தொழில்கள் யாவை என்பதையும்;

(ii) அச்சேவையில் அங்கீகரிக்கப்பட்ட பணியாளர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) தற்போது நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) மேற்படி வெற்றிடங்கள் அரச நிறுவனங்களின் செயற்பாடுகளுக்குத் தடையாக அமைந்துள்ளது என்பதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(v) ஆமெனின், வெற்றிடங்களை நிரப்புவதற்கும் தொழில்சார் பிரச்சினைகளைத் தீர்ப்பதற்கும் எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the occupations coming under the Sri Lanka Technological Service;

(ii) the approved cadre for the said service;

(iii) the number of vacancies existing at present;

(iv) whether he admits that the said vacancies have become a hindrance to the activities of State institutions; and

(v) if so, the measures that will be taken to fill the vacancies and resolve the professional issues?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
**(**The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අංක 1930/12 දරන 2015.09.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ 6 වගන්තිය අනුව එක් එක් අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ, ආයතනයේ ශීර්ෂය යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරු ලෙසින් අනුමත කරන ලද තනතුරු මෙම සේවයට අයත් වේ.

ශ්‍රී ලංකා තාක්ෂණ සේවය යටතේ ගැනෙන තනතුරු නාම ඇතුළත් උපලේඛනයක් අංක 1930/12 දරන 2015.09.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ ඇතුළත් නොවේ. කෙසේ වෙතත්, අංක 1426/34 දරන 2006.01.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද පූර්ව සේවා ව්‍යවස්ථාවේ ඇතුළත්ව තිබූ තනතුරු උපලේඛනය ඇමුණුම වශයෙන් දැන ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

(ii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරු එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන යටතේද, පළාත් සභා සහ පළාත් පාලන අංශය සඳහාද වෙන් වෙන්ව අනුමත කරනු ලබන අතර මෙම අමාත්‍යාංශය වෙත එම තොරතුරු වාර්තා නොවේ.

(iii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරු අනුමත කරන ලද එක් එක් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව, ආයතනය යටතේ පවතින පුරප්පාඩු පිරවීම සිදු කරනු ලබන්නේද ඒ ඒ බඳවා ගැනීමේ පටිපාටිවලට අනුකූලව අදාළ ආයතන මඟින් වන බැවින් මෙම අමාත්‍යාංශය වෙත එම තොරතුරු වාර්තා නොවේ.

(iv) ඕනෑම සේවාවකට අදාළ පුරප්පාඩු පැවතීම එම පුරප්පාඩු පවතින ආයතනවල සේවා සැපයීමට බාධාවක් වන බව නිරීක්ෂණය වේ.

(v) පුරප්පාඩු සහ වෘත්තීය ගැටලු පවතින අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හෝ ආයතන විසින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට සහ වෘත්තීය ගැටලු විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට අදාළ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ එම සේවයේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සහ විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ

විභාග පැවැත්වීම පමණක් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් ඉටු කරනු ලැබේ.

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් තනතුරු සම්බන්ධයෙන් පත් කිරීම් බලධාරීත්වය සහ පරිපාලන බලධාරීත්වය එම තනතුරු අනුමතව පවතින දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරු වෙත පැවරී ඇත.

එබැවින් එක් එක් ආයතනවල පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අදාළ තනතුරු සඳහා බඳවා ගැනීම් ඒ ඒ ආයතනවල පවතින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ තනතුරුවලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිවල විධිවිධාන ප්‍රකාරව පත් කිරීම් බලධාරීත්වය හා පරිපාලන බලධාරීත්වය දරන දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් සිදු කරනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම **සභාගත*** කරමි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමාගේ පිළිතුරේ තිබූ සමහර කරුණු ගැන සෑහීමකට පත් වෙන්න අමාරුයි. එතුමාගේ අමාත්‍යාංශයට ඒවා අදාළ නැහැ කිව්වා. නමුත්, පැහැදිලිවම කාරණයක් කියන්න ඕනෑ. තාක්ෂණ සේවයේ Technical Officersලා -TO මහත්වරු - ප්‍රාදේශීය සභාවල, පළාත් සභාවල වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉන්නවා. විෂය භාර අමාත්‍යවරයා වන ඔබතුමා යටතේ තමයි ප්‍රාදේශීය ලේකම් කාර්යාල තිබෙන්නේ. සාමාන්‍යයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල - ගොඩක් තැන්වල - cadre එකේ ඒ නිලධාරීන් දෙදෙනෙක්, තුන්දෙනෙක් ඉන්න ඕනෑ. නමුත්, හැම තැනම ඉන්නේ එක්කෙනායි. අද ප්‍රාදේශීය සංවර්ධනයට සම්බන්ධ හැම අංශයක්ම බැලුවොත්, විශේෂයෙන්ම කාර්මික නිලධාරීන් නැතුව ඒ කටයුතු කරන්න බොහොම අමාරුයි. ඒක ඉස්සරත් තිබුණු ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය දැන් උග්‍ර වෙලා තිබෙන්නේ. Technical Officersලාගේ හිඟය නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාමීය මට්ටමින් සිදු කරන සංවර්ධන ව්‍යාපෘති විශාල වශයෙන් ඇනහිටලා තිබෙනවා. අද වනකොට ප්‍රාදේශීය සභාවලටත් මේ ප්‍රශ්නය ඇවිල්ලා තිබෙනවා. ඔබතුමන්ලා ඒ සඳහා ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කරපු කාරණය නිවැරදියි. 2020 අවුරුද්දෙන් පස්සේ මේ බඳවා ගැනීම් කරලා තිබුණේ නැහැ. ඊට පසුව පැවැති ආර්ථික අර්බුදය අවස්ථාවේදී විශේෂයෙන්ම මේ සේවාවල හිටපු නිලධාරීන් පිරිසක් රට අත් හැරලා ගියා; විදේශගත වුණා. නමුත්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අදාළව අලුතින් බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට අපි පියවර ගත්තා. 8,000ක් පමණ අයදුම්පත් ඉදිරිපත් කර තිබුණත්, 128දෙනායි අපට බඳවා ගන්න පුළුවන් වුණේ. මොකද, ඒ පිරිස තමයි අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරමින් සම්මුඛ පරීක්ෂණයේදී අනුමත වුණේ. ජූලි මස 15වන දා වනකොට ඒ 128දෙනාගෙනුත් සේවයට වාර්තා කර තිබුණේ 90දෙනෙක් පමණයි. එම නිසා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. එකක්, සුදුසුකම් සම්පූර්ණ කරපු අයගේ හිඟයක් තිබීම. අනෙක් එක, ඒ අයට රාජ්‍ය සේවයට පැමිණෙන්නේ නැතිව වෙනත් ක්ෂේත්‍රවල රැකියා ලබා ගැනීමේ අවස්ථාවක් සහ විදේශගත වීමේ අවස්ථාවක් තිබෙන එක. නමුත්, අපි ඉතා කඩිනමින් මේ පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගන්නවා.

එතුමා සඳහන් කරපු කාරණය ගැන කියන්න ඕනෑ. අපි රජය හැටියට සංවර්ධන කටයුතු කරන්න ප්‍රතිපාදන විශාල වශයෙන් වෙන් කරලා තිබෙනවා. නමුත් ඒ නිලධාරීන්ගේ හිඟය නිසා ඒ කටයුතු අඩාලවීමක් අපට දකින්න පුළුවන්. ඒක නිසා අපි කඩිනමින් ඒ පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගන්නවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, මේ ක්ෂේත්‍රයේ පුරප්පාඩු 3,000ක් විතර තිබෙනවා. ඒවාට ඉල්ලුම්කරුවන් බොහොම අඩුයි කියලා. ගරු ඇමතිතුමනි, ඒකට හේතුව මෙයයි. ඒක දීර්ඝ කාලයක් තිස්සේ එන ප්‍රශ්නයක්. ඔබතුමන්ලාගේ කාලයේ වූ දෙයක්ම නොවෙයි. කාලයක ඉඳන් මේ ප්‍රශ්නය එනවා. නමුත් අපි ඒකට විසඳුමක් ලබා දෙන්න ඕනෑ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉන්න TOsලාට දෙන දීමනාව - ගමන් වියදම් සහ ඉන්ධන දීමනාව - රුපියල් 1,500ක්. නමුත් ඒ අයට රුපියල් 15,000ක් විතර වියදම් වෙනවා. ඒ මුදල දීර්ඝ කාලයක ඉඳලා වැඩි කරලා නැහැ. ඒක වැඩි වෙන්න ඕනෑ. ඒක, එක කාරණයක්.

අනෙක් එක මෙයයි. උසස් පෙළ Maths කරපු අය, එහෙම නැත්නම් ඉංජිනේරු ඩිප්ලෝමාවක් කරපු අය තමයි මේ තනතුරට සුදුසු අය හැටියට දාලා තිබෙන්නේ. ඒ සුදුසුකමෙන් එන නිලධාරීන් බඳවා ගන්නේ MN 3 category එකට. නමුත් එවැනි සුදුසුකමක් තිබෙන අය MN 3 වාගේ පහළ තනතුරකට එන්න සූදානම් නැහැ. ඒක නිසා තමයි ඒ අය බැඳෙන්නේ නැත්තේ. මෙකට විකල්ප ක්‍රමයක් හදලා නැත්නම් කවදාවත් ඒ Technical Officersලා බඳවා ගන්න හැකියාවක් නැහැ. ඔබතුමා කියපු එක හරි. ඒ අය වෙනත් රැකියාවලට පෞද්ගලික ක්ෂේත්‍රයට යනවා. එහෙම නැත්නම් විදේශගත වෙනවා. ඒක නිසා ඒ තනතුර මීට වඩා ඉහළ තැනක තියන්න ඕනෑ. අන්න ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කරපු කාරණයට එකඟයි. ඒ නිසාම තමයි දැනට රාජකාරියේ ඉන්න නිලධාරීන්ට 2025 ජනවාරි 1වැනි දා, 2026 ජනවාරි 1වැනි දා සහ 2027 ජනවාරි 1වැනි දා වශයෙන් අදියර තුනකින් වැටුප් වැඩි කරලා තිබෙන්නේ. නමුත් ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධාරීන් වන එතුමන්ලාගේ දීමනා සම්බන්ධ ගැටලුවක් තිබෙන බව අපි පිළිගන්නවා. ඒක නිවැරදි කිරීම සඳහා අපි කටයුතු කරනවා. ඒ වාගේම, MN 3 category එකට බැඳෙනවාය කියන එකේත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ පිළිබඳව අපේ අවධානය යොමු වෙලා තිබෙනවා. මේ ක්ෂේත්‍රයට නිලධාරීන් බඳවා ගැනීම සහ බඳවා ගන්න නිලධාරීන් රඳවා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නවා. රජය මේ ප්‍රශ්නයට විසඳුමක් හැටියට කාර්මික විද්‍යාල යම්

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

ප්‍රමාණයකින් වැඩි කිරීම සඳහා කටයුතු කරමින් තිබෙනවා. එතකොට NVQ levelsවලට යන පිරිසක් මේ තනතුරුවලට බඳවා ගන්න පුළුවන්. මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය ඇත්තටම ගැටලුවක් හැටියට අපිත් හඳුනාගෙන තිබෙනවා. ඔබතුමා කියන කාරණාවලට විසඳුම් ලබා දීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### යෝජිත විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ බලපෑම
### அரசியலமைப்புக்கான உத்தேச இருபத்திரண்டாம் திருத்தத்தின் தாக்கம்
### IMPACT OF PROPOSED TWENTY SECOND AMENDMENT TO THE CONSTITUTION

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, වත්මන් රජය විසින් යෝජිත විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් විනිසුරුවන්ගේ විශ්‍රාම වයස් සීමාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් දේශීය හා ජාත්‍යන්තර පාර්ශ්ව ගණනාවක් කනස්සල්ල පළ කර තිබෙනවා. ත්‍රෛනිකායික මහා නායක මාහිමිපාණන් වහන්සේලා, ශ්‍රී ලංකා නීතිඥ සංගමය, එක්සත් ජාතීන්ගේ විශේෂ දූත නිලධාරිනිය සහ ජාත්‍යන්තර නීති ආයතන ඒ අතර වෙනවා. මෙම පාර්ශ්ව මතු කර ඇති කරුණු සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය පැහැදිලි කර ගැනීමට අපි ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරනවා.

ගරු අධිකරණ ඇමතිතුමනි, ඇත්ත වශයෙන්ම අපේ මතය නම්, මේ ගෙන එන වෙනස්කම් - ව්‍යවස්ථා සංශෝධනය - අධිකරණයේ නිදහසටත්, ස්වාධීනත්වයටත්, ප්‍රජාතන්ත්‍රවාදයටත් මරු පහරක් කියන එකයි. ඔබතුමාට මතක ඇති, මීට අවුරුදු 39කට පෙර හරියටම අද වාගේ දවසක මේ පාර්ලිමේන්තුවට බෝම්බ ගැහුවා; ග්‍රෙනේඩ් ගැහුවා. ඒ, ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීම සඳහා. අද මේ න්‍යාය පත්‍රයේ තිබෙනවා, විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කරනවා කියලා. ඒකත් ප්‍රජාතන්ත්‍රවාදයට විරෝධ කාල බෝම්බයක්. ඒ බව සඳහන් කරමින් මම මේ ප්‍රශ්න ටික අහන්න කැමැතියි.

1. 2025.12.31 දිනට මෙරට අධිකරණයන්හි විනිශ්චය කිරීමට ඉතිරිව ඇති නඩු සංඛ්‍යාව අධිකරණ ධුරාවලිය අනුව පිළිවෙළින් වෙන් වෙන්ව දක්වන්නේද?

2. ත්‍රෛනිකායික මහානායක හිමිවරුන් ජනාධිපතිතුමන් වෙත යොමු කළ ලිපියෙන් පෙන්වා දෙන්නේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව මහජන විශ්වාසය රඳා පවතින්නේ අධිකරණයේ සැබෑ ස්වාධීනත්වය මත පමණක් නොව එය කිසිදු සැකයකින් තොරව මහජනතාව හමුවේ විද්‍යාමාන වීම මත බවත්, විනිසුරුවන්ගේ විශ්‍රාම වයස ඉහළ නැංවීම එම ස්වාධීනත්වයම මුලිනුපුටා දැමීමට හේතු විය හැකි බවත්ය.

   මේක ගෞරවනීය මහානායක මාහිමිපාණන් වහන්සේලා ඉදිරිපත් කරන අදහස. ගරු ඇමතිතුමනි, රජය මේ අදහසට එකඟ වන්නේද, එකඟ වන්නේ නැද්ද කියලා මම ඔබතුමාගෙන් කෙළින්ම අහන්න කැමැතියි. එසේ නොවන්නේ නම් ඒකට හේතු වෙන කරුණු කාරණා ඉදිරිපත් කරන්න.

3. එක්සත් ජාතීන්ගේ විනිසුරුවන්ගේ ස්වාධීනත්වය පිළිබඳව විශේෂ දූත නිලධාරිනිය පෙන්වා දෙන්නේ මේ අදහස් කරන සංශෝධනය හරහා ප්‍රතිලාභ ලබන විනිසුරුවන් විසින්ම මෙම සංශෝධනයේ ව්‍යවස්ථානුකූලභාවය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව යටතේ තීරණය කිරීමට සිදු වීමේදී ඒ තුළ බැඳියාවේ ගැටුමක් - a conflict of interest - ඇති වීමේ අවදානමක් මතු වන බවයි.

   ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම තමන්ගේ නඩුව තමන්ටම ඇසිය නොහැකියි - *nemo judex in causa sua* - කියන මූලධර්මයට, ප්‍රතිපත්තියට අනුව ගරු විනිශ්චයකරුවෙකුට නඩුවේ පාර්ශ්වයන් හෝ විෂය කරුණු සමඟ පෞද්ගලික සම්බන්ධයක් නොතිබිය යුතුයි කියන මූලධර්මය නීතිඥවරයෙක් හැටියට ඔබතුමාත් හොඳින් දන්නා කාරණාවක්. ඒ නිසා බැඳියාවේ ගැටුමක් - a conflict of interest - ඇතිවීමේ අවදානමක් මතු වෙනවා නේද? රජය මේ අදහසට එකඟ වෙනවාද? එසේ නොවන්නේ නම් ඒ මන්ද?

4. පොදු රාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංගමය - CLA එක - පෙන්වා දෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තෝරාගත් කොටසක් සංශෝධනය කිරීම තුළ එහි ගෞරවනීයත්වයට හානි කළ හැකි බවත්, එවැනි ප්‍රතිසංස්කරණයකට පෙර ප්‍රමාණවත් මහජන සහ පාර්ශ්වකරුවන්ගේ සාකච්ඡාවක් අවශ්‍ය බවත්ය. රජය මේ අදහසට එකඟද?

   ඇත්තවශයෙන්ම මෙතෙක් සිදු වුණු ක්‍රියාදාමයන් තුළ වැඩේ කරලා ඉවර වෙලා තමයි එක එක පාර්ශ්ව එක්ක කථා කරන්න ඔබතුමන්ලා යොමු වෙලා තිබෙන්නේ. ඒක ඉතාම දුර්වල ක්‍රියාවක් හැටියට අපි දකිනවා. ඒ නිසා රජය මේ අදහසට එකඟද, එසේ නොවෙන්නේ නම් ඒ මන්ද කියා මම අහන්න කැමැතියි.

5. මෙම යෝජනාව ප්‍රමාණවත් පූර්ව මහජන සාකච්ඡාවකින් සහ උපදේශනයකින් තොරව ක්ෂණිකව ගෙන එනු ලබන පක්ෂග්‍රාහී ක්‍රියාමාර්ගයක් ලෙස පෙනී යාමේ අවදානම ඇති බවත්, එය අධිකරණය කෙරෙහි මහජන විශ්වාසය බිඳ දැමිය හැකි බවත් කියන කාරණාව LAWASIA forum එක ඉදිරිපත් කරනවා. රජය මේ අදහසට එකඟ වන්නේද? එසේ නොවන්නේ නම් ඒ මන්ද?

6. ශ්‍රී ලංකා නීතිඥ සංගමය - BASL - පෙන්වා දෙන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණය විසින්ම 2022, SC SD 64/71-2022 දරන විශේෂ තීරණයේදී දැනට සේවයේ නියුතු විනිසුරුවන්ගේ විශ්‍රාම වයස වෙනස් කිරීමට අදාළ ඕනෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් අධිකරණ ස්වාධීනත්වයට බලපාන අතර ජනතාවගේ ජනමත විචාරණයක් අවශ්‍ය බව නියම කරන ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 83වැනි ව්‍යවස්ථාව උල්ලංඝනය කරනු ඇති බවත් ය.

   ගරු මුර්දු ප්‍රනාන්දු, ගරු බුවනෙක අලුවිහාරේ, ගරු ජනක් ද සිල්වා යන විනිසුරුවරුන්ගේ ඒ නිගමනය, තීන්දුව මම ඔබතුමාට මීට පෙරත් ඉදිරිපත් කළා, ගරු ඇමතිතුමනි. මම දන්නවා, ඔබතුමා කියයි මේක අධිකරණයට අයිති කාරණාවක් කියලා. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82 (3) සහ (4) කියන අනුව්‍යවස්ථාවන් එකට

කියවලා ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා මෙය කරන්නටම බලහත්කාරයෙන් කටයුතු කරනවා නම්, ජනමත විචාරණයක් අවශ්‍යයි නේද කියලා මම ඔබතුමාගෙන් ප්‍රශ්න කරන්න කැමැතියි.

ඒ අදහසට ඔබ එකඟ වනවාද? එසේ නොවන්නේ නම්, ඒ මන්ද?

7. ප්‍රංශයේ ජාතික නීතිඥ කවුන්සලය - CNB - විසින් 2026 ජූලි 03 දින සම්මත කළ යෝජනාව මඟින්, ශ්‍රී ලංකාවේ හා ප්‍රංශය අතර නීතිය හා අධිකරණ ක්ෂේත්‍රයේ වර්ධනය වෙමින් පවතින ද්විපාර්ශ්වික වෘත්තීය සහයෝගීතාවන්ට, විශේෂයෙන් නීතිඥ සංගම් අතර යෝජිත අවබෝධතා ගිවිසුම් වැනි වැඩසටහන්වලට ද බලපෑම් ඇති කළ හැකි බව පෙන්වා දී තිබෙනවා.

රටවල් දෙකක් අතර තිබෙන වැඩ කටයුතුවලටත් මේ වාගේ සංශෝධන ක්‍රියාත්මක කිරීම සෘණාත්මකව බලපානවා කියන එක මේ ඉදිරිපත් කරන්නේ. රජය මෙම තත්ත්වය පිළිබඳව එකඟ වන්නේද? නොඑසේ නම්, ඒ මන්ද?

8. මෙරට අධිකරණ විනිශ්චයකරුවන්ගේ වයස දීර්ඝ කිරීම මඟින් නඩු කටයුතු ඉක්මන් කිරීම සිදුවේ යන්න රජයේ ස්ථාවරයද?

ඒ කියන්නේ, විශ්‍රාම වයස වෙනස් කළාම නඩු කටයුතු මීටත් වඩා ඉක්මනින් ඉදිරියට යනවා කියන එක ඔබගේ විශ්වාසයද? නැතහොත් ඒ සම්බන්ධයෙන් රජයේ ඇගැයීම කෙබඳුද? ගරු ඇමතිතුමාගෙන් මම මේ ප්‍රශ්නවලට උත්තර බලාපොරොත්තු වෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නවලට උත්තර දීමට පෙර මම කෙටියෙන් කාරණයක් කියන්නම්. මවන තරම් යකෙක් මෙතැන නැහැ. නොයෙකුත් සංවිධාන විසින් තොරතුරු විකෘති කිරීමෙන්, තොරතුරු අඩුවෙන් ලබා දීමෙන් මෙහි යම් අන්තර්ජාතික සහ දේශීය පාර්ශ්වකරුවන්ව නොමඟ යැවීමක් කර තිබෙනවා. ඒ නිසා තමයි මේ තරම් කළුවට යකෙක් නිර්මාණය කරන්නේ.

ඒ කෙසේ වෙතත්, ගරු විපක්ෂ නායකතුමා අසන ලද ප්‍රශ්නවලට මම දැන් උත්තර දෙන්නම්.

1. 2025.12.31 දින වන විට පවතින නඩු

| අධිකරණය | පවතින නඩු |
|---|---|
| මහෙස්ත්‍රාත් අධිකරණ | 753,093 |
| දිස්ත්‍රික් අධිකරණ | 263,472 |
| අපරාධ මහාධිකරණ | 28,134 |
| සිවිල් අභියාචනා මහාධිකරණ | 6,763 |
| වාණිජ මහාධිකරණ | 4,302 |
| අභියාචනාධිකරණ | 5,038 |
| ශ්‍රේෂ්ඨාධිකරණය | 4,724 |
| එකතුව | 1,065,526 |

2. ගෞරවනීය ත්‍රෛනිකායික මහා නායක හිමිවරුන් ජනාධිපතිතුමන් වෙත යොමු කරන ලද ලිපියේ අන්තර්ගතය මෙම අමාත්‍යාංශය වෙත ලබා දී නොමැත. ඒ අනුව, එම ලිපියේ අන්තර්ගතයේ කුමක් පිළිබඳව සඳහන් වන්නේද යන්න සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කළ නොහැක.

කෙසේ වෙතත්, 2026.08.03 වන දින මමත්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමාත් මහානායක හිමිවරුන් බැහැදැකීමට ගිය අවස්ථාවේදී උන්වහන්සේලාගේ අදහස්වලින් හා සාකච්ඡාවලින් පැහැදිලි වූයේ මෙම සංශෝධන පිළිබඳව වඩාත් නිවැරදි තොරතුරු උන්වහන්සේලා වෙත නොලැබී තිබුණු බවයි. එනම්, උන්වහන්සේලා අදහස් කරගෙන සිටියේ මෙම සංශෝධනය ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන්ගේ වයස පමණක් අරමුණු කරගෙන කරන ලද සංශෝධනයක් ලෙසයි. උන්වහන්සේලාට අවබෝධයක් තිබුණේ නැහැ, මේ තුළින් සියලු විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස් සීමාවන් වැඩි කිරීමක් සිදු වන බවට. ඒ වාගේම අපි දීර්ඝ වශයෙන් පැහැදිලි කරන්නට යෙදුණා, මෙය සමස්ත අධිකරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේම කොටසක්, අධිකරණ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ගන්නා වූ සමස්ත ක්‍රියාවලියේ කොටසක් පමණක් වන බව. ඒ කියන්නේ, උන්වහන්සේලාටත් කවුරු හරි ගිහිල්ලා වැරදි තොරතුරු දීලා තිබුණා. එහෙම වැරදි තොරතුරු දුන්නේ කවුද කියලා අපි පොඩ්ඩක් හොයලා බලන්නට ඕනෑ. භාගෙට තොරතුරු ලබා දුන්නාම උන්වහන්සේලාටත් වැරදි විධියට තමයි මතයක් ගන්න වෙන්නේ. කෙසේ වෙතත්, අවසානයේදී කරුණු පැහැදිලි කිරීමෙන් පසුව උන්වහන්සේලා මා වෙත දන්වා සිටියේ රටේ ජනතාවට සුදුසු, අවශ්‍ය දෙයක් කිරීම සඳහා උන්වහන්සේලාගේ විරෝධතාවක් නොමැති බවත්, ඒ සඳහා ආශිර්වාද කරන බවත්ය.

තවද, විනිසුරුවන්ගේ විශ්‍රාම වයස ඉහළ දැමීම කිසිදු ආකාරයකින් අධිකරණයේ ස්වාධීනත්වයට කිසිදු බලපෑමක් නොවන අතර, මෙය හුදෙක් තෝරාගත් විනිසුරුවරුන්ගේ වයස් සීමාව ඉහළ දැමීමක් නොවේ. මෙම සංශෝධනය මඟින් සියලු උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ මෙන්ම අනෙකුත් අධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස ඉහළ දැමීමක් සිදු වේ.

3. විනිසුරුවන්ගේ ස්වාධීනත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ දූත නිලධාරියා විසින් එවන ලද ලිපියක් මා වෙත ලැබී ඇති අතර, එහි ඇති අන්තර්ගතය අනුව ද ඔවුන් සතුව වඩාත් නිවැරදි තොරතුරු පවතින්නේ දැයි සැකයක් මතු වනවා. මොකද, ඒ තිබෙන සමහර වාක්‍ය අනුව ඔවුන්ටත් තොරතුරු දීලා තිබෙන්නේ, ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස වැඩි කිරීමක් සම්බන්ධයෙන්. කෙසේ වෙතත්, මේ වන විට විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් මෙම විශේෂ දූත නිලධාරියා වෙත අදාළ සියලුම කරුණු දැක්වීමට කටයුතු කරන අතර, ඉදිරියේදී එම නිලධාරියාට එය ලැබීමට සලස්වනු ඇත.

ඒ අනුව අසා තිබෙන මෙම ප්‍රශ්නයටත්, ඊට ආනුෂංගික වූ අනෙකුත් සියලුම කරුණුවලටත් රජය විසින් එක්සත් ජාතීන්ගේ විශේෂ දූතයා වෙත මෙම කරුණු වාර්තා කරනු ඇති. එම නිසා මා එම පිළිතුරේ තිබෙන කරුණු දීර්ඝ වශයෙන් මෙතැනදි සඳහන් කරන්න යන්නේ නැහැ. නමුත්, පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූලභාවය නිර්ණය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 සිට 125 දක්වා ව්‍යවස්ථාවලින් බලය දීලා තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයටයි. ඒක ශ්‍රේෂ්ඨාධිකරණයේ පෞද්ගලික නඩු කටයුත්තක් නොවෙයි. තමන්ගේ නඩුව තමන් අහනවා නොවෙයි. මක්නිසාද, ළඟදියාවන් අතර ගැටුම් - conflicts of interest - සම්බන්ධයෙන් විනිශ්චිත

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

නඩු තීන්දුවල පැහැදිලිව උදාහරණ වශයෙන් දීලා තිබෙනවා, කොයි ආකාරයේ ඒවාද ළබැඳියාවන් අතර ගැටුම් වෙන්නේ කියලා. යම් හෙයකින් සමස්ත අධිකරණය නැතිව යම් පුද්ගලයෙක් තෝරාගෙන කටයුතු කරනවා නම් ඔය කියන කතන්දරය ඇත්ත වෙන්න පුළුවන්. ඒ නිසා ළබැඳියාවන් අතර ගැටුම කියන නීතිමය සංකල්පය පිළිබඳ අවබෝධය තිබුණා නම් මෙතැන එසේ වෙන්නේ නැහැ. කොහොමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 සිට 125 දක්වා ව්‍යවස්ථා අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට තමයි මේක කරන්න වෙන්නේ. මොකද, මීට කලිනුත් නඩුකාරතුමන්ලාට විරුද්ධ නඩු Supreme Court එකේත්, Court of Appeal එකේත් ඇති වෙන්න අහලා තිබෙන නිසා.

4. පොදු රාජ්‍ය මණ්ඩලීය නීතිඥ සංගමය විසින් අධිකරණ අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර නොමැති අතර, ඒ අනුව එහි අන්තර්ගතයන් සම්බන්ධයෙන් කරුණු දැක්වීමට හැකියාවක් නොමැත.

ව්‍යවස්ථාව පූජනීය ලියවිල්ලක් වුවද, එය නීතියේ මුදුන් මල්කඩ වුවද, එය සමාජ අවශ්‍යතා, රටේ අවශ්‍යතා අනුව වෙනස් කළ හැකි ලේඛනයකි. නමුත්, එය එසේ සිදු කිරීමේදී ව්‍යවස්ථාව වෙනස් කරන ක්‍රමය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවතින ප්‍රතිපාදනවලට අනුකූලව සංශෝධන ඉදිරිපත් කිරීම මඟින් ව්‍යවස්ථාවේ ගෞරවයට හානියක් වන බව පිළිගත නොහැක. එමෙන්ම, මෙම සංශෝධනය ගෙන ඒම පිළිබඳව දිගු කාලයක සිට සාකච්ඡාවක් පැවති බවත්, මෙම සංශෝධනය ගෙන ඒම සඳහා අවශ්‍ය ප්‍රමාණයේ තොරතුරු කැබිනට් මණ්ඩලය සතුව පැවතුණු බවත්, ඒ සම්බන්ධයෙන් සාකච්ඡා සිදු වූ බවත් සඳහන් කරන අතර, මෙම ප්‍රතිපත්තිමය තීන්දුව කැබිනට් මණ්ඩලය ගත යුතු බවත්, ඊට අදාළ සියලුම කටයුතු ජනතා වරම අනුව සිදු වන බවත් වැඩිදුරටත් සඳහන් කරමි.

5. LAWASIA එක විසින් අප අමාත්‍යාංශයට ලිපියක් යොමු කර නොමැත. මෙය 2016, 2017 යන කාලයේ සිට නීතිඥ ක්ෂේත්‍රය තුළ සාකච්ඡාවට බඳුන් වූ කරුණකි. මෙය කිසිසේත්ම ක්ෂණිකව ගෙනෙන ලද සංශෝධනයක් නොවේ. තවද, මෙය කිසිදු ආකාරයක පක්ෂග්‍රාහී ක්‍රියාමාර්ගයක් ලෙස නිර්වචනය කළ නොහැක. මක්නිසාද, මෙමඟින් තෝරා ගත් විනිසුරුවරයකුගේ හෝ විනිසුරුවරුන් කණ්ඩායමකගේ විශ්‍රාම වයස වැඩි නොකරයි. මෙමඟින් අධිකරණය කෙරෙහි මහජන විශ්වාසය බිඳ දැමීමක් සිදු නොවන අතර මෙම විශ්‍රාම වයස සංශෝධනය කිරීම අධිකරණ ප්‍රතිසංස්කරණය කිරීමට, එනම් නඩු ඇසීම කාර්යක්ෂම කිරීම සඳහා ගෙන එන්නා වූ පුළුල් වැඩ පිළිවෙළේ එක් කොටසක් වන බැවින් මෙය කෙරෙහි ජනතා විශ්වාසය වැඩි වනු ඇත. ඒ අනුව මේ තුළින් අධිකරණ පද්ධතිය කෙරෙහි ජනතාවගේ විශ්වාසය වැඩි වනු ඇති බව තමයි රජයේ අපේක්ෂාව වන්නේ.

6. රජය විසින් මේ පනත් කෙටුම්පත ගෙන ඒම කිසිදු හදිසියකින් තොරව ව්‍යවස්ථාවේ සහ අනෙකුත් නීති රීතිවල සියලුම ප්‍රතිපාදන අනුව සිදු කර ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මේ සම්බන්ධයෙන් ජන මත විචාරණයකට යන්නේද, නැද්ද කියන එක සම්බන්ධයෙන් තීරණය කිරීමෙන් පසු ඉදිරි පියවර ගත හැකිය. මක්නිසාද, යම් නීතිමය සංශෝධනයකට ජන මත විචාරණයක් පවත්වන්නේ ද යන කාරණාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාව ප්‍රකාරව එහි කරුණු අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දු කරනු ඇත. එම ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව ක්‍රියා කිරීමට රජය මෙන්ම සියලුදෙනා ද බැඳී සිටී.

7. ප්‍රංශයේ ජාතික නීතිඥ කවුන්සලය විසින් අධිකරණ අමාත්‍යාංශය වෙත ලිපියක් ඉදිරිපත් කර නොමැත. ඒ අනුව එහි අන්තර්ගතය පිළිබඳ කරුණු දැක්වීමට හැකියාවක් නොමැත. කෙසේ වෙතත්, නීතියේ ආධිපත්‍යයට ගරු කරමින් රටේ ව්‍යවස්ථාවට යටත්ව සියලුම නීත්‍යනුකූල ක්‍රමවේදයන්ට අනුකූලව රටක නීතියක් සංශෝධනය කිරීම හෝ නව නීතියක් ගෙන ඒම එම රාජ්‍යයේ ස්වෛරී අයිතියයි. එය එම ආණ්ඩුව පත් කළ මහජනතාවගේ අභිලාෂයයි. නීත්‍යනුකූලව මහජන අභිලාෂ මෙහෙයවන රජයකට ඔබගේ ප්‍රශ්නයේ සඳහන් කරන ආකාරයේ ද්විපාර්ශ්වික වෘත්තීය සහයෝගිතාවන්ට අගතියක් වේ යැයි සිතිය නොහැක.

8. විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීමෙන් ම පමණක් අධිකරණ පද්ධතියේ නඩු ඇසීම කාර්යක්ෂම වන බව රජයේ ස්ථාවරය නොවේ. කිසිසේත්ම, මුල ඉඳලාම අපි එහෙම කියලාත් නැහැ. අපි කියන්නේ, පූර්ණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් යටතේ පරිණත, අත්දැකීම් ඇති, ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරුන් තබා ගැනීම, අනෙකුත් ප්‍රතිසංස්කරණ කටයුතු සමඟ සම්බන්ධ වූ විට අධිකරණයේ කාර්යක්ෂමතාව වැඩිවන බවයි.

උදාහරණයක් වශයෙන් මේ වන විට නව උසාවි 7ක් කොළඹත්, කොළඹින් බැහැරව තවත් උසාවි ගණනාවකුත් පිහිටුවා තිබෙනවා. එම උසාවිවලට අලුතින් විනිශ්චයකාරවරුන් බඳවා ගැනීම කරනවා. සමහර විට ඔබ දන්නවා ඇති, අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් විතරක් පුරප්පාඩු 2,647ක් සඳහා පුද්ගලයින් බඳවා ගන්න මේ වන විට කටයුතු කරනවා කියලා. ඒ වාගේම අධිකරණ අමාත්‍යාංශයෙනුත් තවත් 1,000ත්, 1,200ත් අතර පිරිසක් බඳවා ගන්න කටයුතු කරනවා. ඒ, මෑත ඉතිහාසයේ අධිකරණයට බඳවා ගන්නා වූ වැඩිම සේවක සංඛ්‍යාවයි. මේ දෙය කරන්න හේතුව තමයි, නඩු කල් යන්න ප්‍රධාන හේතුවක් වන කාර්ය මණ්ඩල හිඟය වළක්වා ගන්නට වුවමනා වීම. ඒ වාගේම රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට ඊයේත් 8දෙනෙක් recruit කළා, on contract basis. ඒ අනුව දැන් 70කට ආසන්න පිරිසක් බඳවාගෙන තිබෙනවා. ඒ වාගේම අලුත් යන්ත්‍රසූත්‍රත් ගේනවා. ඒ, ඇයි? රස පරීක්ෂක වාර්තා ප්‍රමාදය අපි address කරන්න ඕනෑ. Target එක තිබෙන්නේ මාසයකට 7,500ත් 9,000ත් අතර රස පරීක්ෂක වාර්තා ප්‍රමාණයක් ගේන්න. ඒ වාගේම දැන් "e-Court" ව්‍යාපෘතිය Court of Appeal එකේත්, Supreme Court එකේත් ආරම්භ කර තිබෙනවා. ඒක පහළ උසාවිවලත් ආරම්භ කරනවා. ඒ හරහාත් නඩු ඇසීම වේගවත් වනවා. ඒ වාගේම අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය අපි දැන් කාර්යක්ෂම කර තිබෙනවා. ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම යනාදී සියලුම කරුණු සහ අප විසින් ගෙන එන ලද නව පනත් සහ සංශෝධන, විශේෂයෙන්ම අපරාධ නඩු විධාන සංග්‍රහයට ගෙන එන ලද සංශෝධනයක් වන මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සාක්ෂි දීම හරහාත් නඩු ඇසීම කාර්යක්ෂම වනවා.

ඉතින්, මම පැහැදිලි කරන්නට යෙදුණේ මෙයයි. නඩු කටයුතු ඉක්මන් කිරීම යනු, සමස්ත අධිකරණ පද්ධතියේම සිදු කරන්නා වූ ප්‍රතිසංස්කරණයකි. එම ප්‍රතිසංස්කරණයේ එක් කොටසක් වනුයේ, අග විනිසුරුවරයාගේ විශ්‍රාම කාලය දීර්ඝ කිරීමයි. සමස්ත අධිකරණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට අත්දැකීම් බහුල, පරිණත විනිසුරුවරුන් සිටිය යුතු වේ. එසේ හෙයින් තමයි අපි විශ්‍රාම වයස දීර්ඝ කරනු ලබන්නේ.

ගරු කථානායකතුමනි, මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, අපේ රජය බලයට ආවේ කුමන කාරණා ඉෂ්ට කිරීමටද යන්න පිළිබඳව. මහජනතාවට අභිලාෂයක් තිබුණා. ඒ මොකක්ද?

උසාවිවල රස්තියාදු වෙන්න බැහැ, නඩු කල් යන්න බැහැ, දූෂිතයින් සහ වංචනිකයින් අධිකරණය ඉදිරියට එන්න ඕනෑ කියන එක. මිනිස්සු අධිකරණවල අවුරුදු 10-15 රස්තියාදු වෙමින්, තමන්ට තිබෙන දේපළ උකස් කරමින් නීතිඥයින්ට ගාස්තු ගෙවනවා වෙනුවට කාර්යක්ෂමව නඩු අසා ඉවර කරන්න ඕනෑ. මේක අපි පටන් ගත්තේ කවදාද? 2024 නොවැම්බර් මාසයේ. ඒ කියන්නේ, අපි ආණ්ඩුවේ වැඩ පටන් ගත්ත දවසේ ඉඳලා. මේ බඳවා ගැනීම් සියල්ලම කරන්නේ ඒ නිසායි. මම අවසාන වශයෙන් කියන්න ඕනෑ, ඔය මවන යක්කු එකෙක්වත් මේකේ නැහැ කියලා. තමන්ගේ දේශපාලනය වෙනම කරන්න, නීතිය විනාශ කරන්නේ නැතිව.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, කෙටි පැහැදිලි කරගැනීමකට ඔබතුමාට අවස්ථාව තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේක සංකීර්ණ ප්‍රශ්නයක් නිසා මට පොඩ්ඩක් අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විනාඩි 3කින් කරුණු පැහැදිලි කරගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම විශේෂයෙන්ම ඇහුවා, 2025 දෙසැම්බර් 31වැනි දා වනකොට තිබෙන නඩු ප්‍රමාණය ආදී කරුණු ගැන. ඒකට ඔබතුමන්ලා කියන එක් හේතුවක් තමයි, නඩු ලක්ෂ 11ක් හිරවෙලා තිබෙන නිසා විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස දීර්ඝ කිරීම වැදගත් කියන එක. හැබැයි, ඒ නඩුවලින් ලක්ෂ 10ක්ම තිබෙන්නේ, දිසා අධිකරණවල, මහෙස්ත්‍රාත් අධිකරණවල සහ කම්කරු විනිශ්චය සභාවල. එතකොට ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස වැඩි කිරීම ඒකට බලපාන්නේ කොහොමද? මෙතුමා කියනවා, මවන තරම් යකෙක් නැහැලු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියන්නේ පූජනීය ලියවිල්ලක්ලු. ඒ වාගේම ඔබතුමාත්, නලින්ද ජයතිස්ස ගරු ඇමතිතුමාත් මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා හමුවෙලා කරුණු පැහැදිලි කළාලු. එහෙම නම් ගෞරවනීය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ඉදිරිපත් කරපු ලියුම ඉවත් කරගන්නට - withdraw කරගන්නට - ඕනෑ, ඔබතුමන්ලාගේ කරුණු පැහැදිලි කිරීම තුළ නිවැරදිභාවයක් සිදුවුණා නම්. නමුත් කිසිම නිවැරදිභාවයක් සිදුවෙලාත් නැහැ, ඒ ලියුම withdraw කරගෙනත් නැහැ.

ඒ වාගේම මම ඔබතුමාගෙන් මේ කාරණයත් අහන්න කැමැතියි. ඔබතුමා කියනවා, තමන් පිළිබඳ තමන් තීන්දු කර ගැනීමේ conflict of interest එක ගැන. ඒ අනුව ඔබතුමා මට කියන්න, ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙය විභාග වෙනකොට, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 65 සිට 67 දක්වා දීර්ඝ කරන එක ගැන තීන්දුව ගන්නේ අපිද කියන එක. ඒ ගෞරවනීය ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් තමයි තීන්දු කරන්නේ වයස අවුරුදු 65 සිට 67 දක්වා දීර්ඝ කරන එක සම්බන්ධයෙන් අවශ්‍ය වන්නේ තුනෙන් දෙකක් පමණද, එහෙම නැත්නම් තුනෙන් දෙකක් ඇතුළත ජනමත විචාරණයකට යනවාද කියලා. තමන් පිළිබඳව තමන් තීන්දු ගැනීමක් සිදු වෙන්නේ නැහැ, conflict of interest එකක් ඇති වෙන්නේ නැහැ, බැඳියාවන් පිළිබඳ ගැටුමක් නැහැ කියලා කොහොමද කියන්නේ?

ඒ වාගේම මම ඔබතුමාගෙන් මේ කාරණයත් අහන්න කැමැතියි. පැහැදිලිවම ඔබතුමා විවිධ අවස්ථාවලදී කිව්වා, ලක්ෂ 11ක් නඩු තිබෙනවා, ඒවා ඉක්මන් කරගන්නට, විශේෂයෙන්ම ජනතාවට සාධාරණත්වයක් ඉෂ්ට කරගන්නට තමයි මේ විශ්‍රාම වයස වැඩි කරන්නේ කියලා. එහෙම කියන ගමන් ඔබතුමා වචනයක්වත් කිව්වේ නැහැ, රස පරීක්ෂක වාර්තා ටික කොහොමද ඉක්මන් කරවන්නේ කියන එක ගැන. ඒ ගැන විධිමත් උත්තරයක් දුන්නේ නැහැ. විධිමත් කාලසටහන් සහිතව ඔබතුමා ඒ සම්බන්ධයෙන් උත්තරයක් දුන්නේ නැහැ. මේ විනිසුරුවන්ගේ විශ්‍රාම යන වයස දීර්ඝ කරගැනීම සඳහා අවශ්‍ය වෙනස්කම් ටික කර ගැනීමත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයටත්, Judicature Act එක වෙනස් කිරීමත් පිළිබඳව තමයි ඔබතුමන්ලාගේ ලොකුම උනන්දුව තිබෙන්නේ. ඔබතුමන්ලාගේ ලොකුම ආසාව ඒකයි.

මම ඔබතුමාගෙන් අවසාන වශයෙන් මේ කාරණයත් අහන්න කැමැතියි. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ, ගරු අධිකරණයේ ගරු විනිසුරුවන්ගේ විශ්‍රාම යන වයස වැඩි කිරීම ක්‍රියාත්මක කරනවා, ඒ තුළින් මේ අධිකරණ පද්ධතිය කාර්යක්ෂම කරනවාය කියලා මොන පිටුවේද සඳහන් කර තිබෙන්නේ? මේ කරුණු කිහිපය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් කරන්නය කියලා මම බොහොම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු ඇමතිතුමනි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු විපක්ෂ නායකතුමනි, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පඩි වැඩි කරනවා කියලාත් නැහැ. හැබැයි, අපි පඩි වැඩි කළා. ඒ කියන්නේ, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ආරම්භයේදීම අපි ලියනවා, අධිකරණ කාර්යක්ෂම කිරීමට ගන්න ඕනෑ පියවර. ප්‍රතිපත්ති ප්‍රකාශනයක එකින් එක ලියන්නේ නැහැ, ව්‍යවස්ථා සංශෝධන. එහෙම ලියන්න ගියොත් ප්‍රතිපත්ති ප්‍රකාශනය libraries 8ක විතර දමන්න හදන්න වෙනවා. එහෙම ප්‍රතිපත්ති ප්‍රකාශන ලියන්නේ නැහැ. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු 5ක්ද, 10ක්ද නේ තිබුණේ. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තමයි පිටු 73ක් තිබුණේ.

ගරු විපක්ෂ නායකතුමනි, ඊළඟට ඔබතුමා ප්‍රශ්න කළා, මහෙස්ත්‍රාත් අධිකරණවල සහ දිසා අධිකරණ නඩු වැඩියි, ඒ නිසා විශ්‍රාම වයස වැඩි කළාම විතරක් මේක කාර්යක්ෂම වෙන්නේ කොහොමද කියලා. ඔබතුමා කිව්වා, මහෙස්ත්‍රාත් අධිකරණවල සහ දිසා අධිකරණවල නඩු වැඩියි කියලා. ඒ කියන්නේ, ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට මගේ කථාවේ ඉතිරි ටික ඇහිලා නැහැ. මම පැහැදිලිව කිව්වා, මේ හැමෝගේම වයස වැඩි කරන්නේ පරිණත දැනුම තබා ගන්න කියලා. එතකොට මහෙස්ත්‍රාත් උසාවියේ විනිසුරුවන්ගේ විශ්‍රාම යන වයස් සීමාවත් වැඩි වෙනවා. ඒකෙන් විතරක් කාර්යක්ෂම වෙන්නේ නැහැ. ඒ නිසායි අලුතින් නඩුකාරතුමන්ලා අරගෙන අලුත් මහෙස්ත්‍රාත් අධිකරණ, අලුත් මහාධිකරණ පිහිටුවන්න හදන්නේ. එහෙමයි කාර්යක්ෂම වෙන්නේ. ඒක තේරුම් ගන්නට ඕනෑ. එතකොට ඒ හරහා ඉහළට යනවා.

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

ඒ වාගේම ගරු විපක්ෂ නායකතුමා කියන්නට යෙදුණා, මේකේ conflict of interest එකක් තිබෙනවාය කියලා. අපි එහි නීතිමය තත්ත්වය පිළිබඳව වෙන වෙනම කථා කරමු; we can discuss the case authorities over a cup of tea. දැනට මම මෙහෙම කියනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පනතක ව්‍යවස්ථානුකූලභාවය බලන්න පුළුවන් කාටද? ඒ ගැන බලන්න ඔබතුමාටත් බැහැ, මටත් බැහැ, ජපාන අධිකරණයටත් බැහැ. ඒක බලන්නේ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය. ඒක තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන්නේ. ඒ වාගේම, මේ විශ්‍රාම යන වයස වැඩි කිරීම එක් නඩුකාරතුමෙක් එල්ල කරගෙන හෝ එක් කොටසක් එල්ල කරගෙන කරනවා නම් සමහර වෙලාවට ඔය විවේචනය සාර්ථක හෝ සාධාරණ වෙන්න පුළුවන්. නමුත්, මෙය සමස්ත අධිකරණ පද්ධතිය සඳහා කරන්නේ. එතකොට කිසි කෙනෙකුට විශේෂ treatment නැහැ. උදාහරණයක් වශයෙන් ගත්තොත්, contempt of court නඩු තිබෙනවා නේ. Contempt of court නඩු අහන්නේ අධිකරණයට අපහාස කළාට. අධිකරණයෙන්ම තමයි ඒ නඩු අහන්නේ.

මෑතකදී PAYE Tax අඩු කිරීම සම්බන්ධයෙන් ගරු විනිශ්චයකාරතුමන්ලා නඩුවක් පැවරුවා, Court of Appeal එකේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ. මට ඒක හරියට මතක නැහැ. කෙසේ හෝ වේවා ඒ නඩු අහන්නෙත්, නඩුකාරතුමන්ලාට අගතියක් වුණා කියලා නඩු අහන්නෙත් උසාවියේම තමයි. විශ්‍රාම ගිය උපාලි අබේරත්න මැතිතුමාගේ පාරිතෝෂික දීමනා අඩු කිරීම සම්බන්ධයෙන් ගත්තොත්, ඒ දීමනා අඩු කරන්න බැහැ කියලා ඔහුගේ නඩුව අහන්නෙත් අධිකරණයේම තමයි. ඒකෙන් අදහස් වෙන්නේ නැහැ නේ, අධිකරණය පක්ෂග්‍රාහී වෙනවා කියලා. ඒක නිසා ඒ එකක්වත් පිළිගන්න පුළුවන් තර්ක නොවෙයි. හැබැයි, සියලු දෙනාටම අයිතිය තිබෙනවා, වැරදි තිබෙනවා නම් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා මේක අභියෝගයට ලක් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මහතා.

## II

## විදේශ සංචිතවල තිරසරභාවය
අந்நியச் செலாவணிக் கையிருப்பின் நிலைத்தன்மை
SUSTAINABILITY OF FOREIGN RESERVES

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන 2026 දෙසැම්බර් මාසයේදී අවසන් වීමට ආසන්නව පවතින අවස්ථාවක, ආර්ථික අර්බුදයෙන් පසුව ශ්‍රී ලංකාව සිය දළ නිල විදේශ සංචිතය - Gross Official Reserves - නැවත ගොඩනඟා ඇත.

කෙසේ වෙතත්, විශේෂයෙන්ම විදේශ විනිමය හුවමාරු ගනුදෙනු - swaps, ඉදිරි ගිවිසුම් - forwards - මත ඇති වගකීම් සහ අනාගත විදේශ ණය සේවා වගකීම් සැලකිල්ලට ගනිමින්, මෙම සංචිතවල සංයුතිය, භාවිතයට ඇති හැකියාව සහ තිරසරභාවය පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කළ යුතුය.

ඒ අනුව, මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් මම පහත ප්‍රශ්නවලට පිළිතුරු අපේක්ෂා කරමි.

1. 2022 සිට 2026 දක්වා සෑම වසරකම ජූනි 30 සහ දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ දළ නිල විදේශ සංචිත ප්‍රමාණය කොපමණද?

   ඒ කියන්නේ, 2024 සැප්තැම්බර් වනකොට ඇමෙරිකානු ඩොලර් 6,100ක් තිබුණු සංචිත ප්‍රමාණය අද ඇමෙරිකානු ඩොලර් 6,491ක් බව සඳහන්ව තිබෙනවා. එම නිසා ඇත්ත තත්ත්වය මොකක්ද? එම කාලය තුළ සංචිතවල සිදු වූ වැඩි වීමෙන් කොපමණ ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය විසින් සිදු කළ ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් හේතුවෙන් ඇති වූයේද?

2. ශ්‍රී ලංකාවේ විදේශ සංචිත මට්ටම තීරණය කිරීම සහ එම සංචිත ගොඩනැඟීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවටද, මුදල් අමාත්‍යාංශයටද පැවරී තිබේද? ඒ සම්බන්ධයෙන් එම ආයතන දෙකෙහි ව්‍යවස්ථාපිත හා ප්‍රතිපත්තිමය වගකීම් මොනවාද? What is the responsibility and where does it lie? Is the creation of reserves a part of the Central Bank or the Ministry of Finance, Planning and Economic Development? At the moment, I do not think anybody is taking responsibility for that, Sir.

3. වර්තමාන දළ නිල විදේශ සංචිතවලින් වහාම භාවිත කළ හැකි විදේශ මුදල් සංචිතය කොපමණද? එය මාස කීයක ආනයන වියදම් ආවරණය කිරීමට ප්‍රමාණවත්ද?

4. 2026, 2027, 2028 සහ 2029 වසර සඳහා ප්‍රක්ෂේපිත දළ නිල විදේශ සංචිත - Gross Official Reserves - සහ ශුද්ධ ජාත්‍යන්තර සංචිත - Net International Reserves - ප්‍රමාණය කොපමණද? ඒවායේ අපේක්ෂිත සංයුතිය සහ වාර්ෂික ගොඩනැඟීම කෙසේද? IMF එක සමඟ එකඟ වී ඇති සංචිත ඉලක්ක මොනවාද? අනාගත සංචිත ගොඩනැඟීමේ ක්‍රමවේදයේ කොටසක් ලෙස නැවත

   ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර වෙළෙඳ පොළට පිවිසීමට රජය අපේක්ෂා කරන්නේද? Is there a relook at the International Sovereign Bonds owing to the depletion of the Gross Official Reserves of the country?

5. ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය swaps, forwards සහ අනෙකුත් කෙටි කාලීන විදේශ මුදල් වගකීම්වල මුළු වටිනාකම කොපමණද? දේශීය බැංකු සමඟ සිදු කර ඇති ගනුදෙනුද ඇතුළුව ඒවායේ කල් පිරීමේ කාල සටහන කුමක්ද?

   ගරු කථානායකතුමනි, මේක පුදුම දෙයක්. අපේ රටේ සංචිත හදනවා කියලා බැංකු අයිරාවක් ගන්නවා වාගේ තිබෙන domestic swap එකක් මාස හයකට ගැනීම නිසා අපේ reserves හැදෙනවා. ඒ නිසා තමයි අපේ economy එක fragile කියලා කියන්නේ. මේක පුදුම මහ බැංකුවක්. ඕස්ට්‍රේලියාවේ එකක් කියනවා, එංගලන්තයේ එකක් කියනවා, ලංකාවේ තව එකක් කියනවා. රුපියලේ බර දරන්නේ ශ්‍රී ලාංකිකයන් වන අපි. ඒ සම්බන්ධයෙන් තමයි මම මේ ප්‍රශ්නය අහන්නේ.

6. අනාගත මුදල් ප්‍රතිපත්ති තීරණ උද්ධමනය, විනිමය අනුපාතයේ වෙනස්වීම්, ප්‍රාග්ධන ප්‍රවාහ, බාහිර කම්පන - external shocks - සහ පවතින ආර්ථික තත්ත්ව මත රඳා පැවතිය යුතු තත්ත්වයක, 2026 අගෝස්තු 12 දින මෙම වසර තුළ තවදුරටත් ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ නැංවීමක් අපේක්ෂා නොකරන බව මහ බැංකු අධිපතිවරයා ප්‍රකාශ කළේ කුමන ආර්ථික හා මුදල් ප්‍රතිපත්ති උපකල්පන මතද?

   Hon. Speaker, how can the Governor of the Central Bank say that there cannot be an interest rate increase for the rest of the year - this is a volatile scene, not a static operation - unless he has become an astrologer and not the Governor anymore?

7. අතිරික්ත රාජ්‍ය ආදායම් සහ පවතින රුපියල් හා විදේශ මුදල් ද්‍රවශීලතාව සැලකිල්ලට ගනිමින්, විදේශ සංචිත ගොඩනැඟීම, විදේශ ණය ආපසු ගෙවීම, පොලී පිරිවැය අඩු කිරීම සහ විනිමය අනුපාතයේ නම්‍යශීලීභාවය අතර සමතුලිතතාව පවත්වා ගැනීම සඳහා ඇති ප්‍රතිපත්තිය කුමක්ද? අනාගත ණය සේවා පිරිවැය අඩු කිරීම සහ වෙළෙඳ පොළ බලවේග අනුව රුපියල ශක්තිමත් වීමට ඉඩ සැලසීම සඳහා සක්‍රිය වගකීම් කළමනාකරණ පනත - Active Liability Management Act එක - භාවිත කිරීම ඇතුළු උපාය මාර්ගික ණය වගකීම් කළමනාකරණ ක්‍රියාමාර්ග රජය සලකා බලා තිබේද?

8. 2025 වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභය කොපමණද? එම ලාභයෙන් කොපමණ මුදලක් ලාභ බෙදාහැරීමක්, ලාභාංශයක් - dividend එකක්, බද්දක්/ අයබද්දක් - levy එකක් - හෝ වෙනත් ක්‍රමවේදයක් මඟින් රජයට මාරු කර තිබේද? එසේ නැත්නම් ඒ ඇයි?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා කල් ඉල්ලා සිටිනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, ඔබතුමාට සුබ උපන්දිනයක් වේවා!

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා.

## 2019-2026 දක්වා වී නිෂ්පාදනය, නිෂ්පාදන පිරිවැය සහ අවම සහතික මිල: කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## 2019-2026 வரை நெல் உற்பத்தி, உற்பத்திச் செலவு மற்றும் குறைந்தபட்ச உத்தரவாத விலை: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று
## PRODUCTION, COST OF PRODUCTION AND MINIMUM CERTIFIED PRICE FOR PADDY FROM 2019-2026: STATEMENT BY MINISTER OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු කථානායකතුමනි, 2026.06.23 වැනි දින ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ)

| වර්ෂය | වපසරිය (හෙක්ටෙයාර) | | වාර්ෂික එකතුව (හෙක්ටෙයාර) |
|---|---|---|---|
| | මහ | යල | |
| 2019 | 748,027 | 358,364 | 1,106,391 |
| 2020 | 752,248 | 456,205 | 1,208,453 |
| 2021 | 770,240 | 501,792 | 1,272,032 |
| 2022 | 775,846 | 481,669 | 1,257,515 |
| 2023 | 812,601 | 505,076 | 1,317,677 |
| 2024 | 806,672 | 481,316 | 1,287,988 |
| 2025 | 800,463 | 541,421 | 1,341,884 |
| 2026 | 869,617 | 557,132 | 1,426,749 |

(ආ)

| වර්ෂය | එකතුව (ටොන්) | සාමාන්‍ය අස්වැන්න (හෙක්ටෙයාරයකට කිලෝග්‍රෑම්) |
|---|---|---|
| 2019 | 4,540,116 | 4,100 |
| 2020 | 5,120,924 | 4,200 |
| 2021 | 5,149,880 | 4,000 |
| 2022 | 1,654,798 | 1,300 |
| 2023 | 4,513,431 | 3,400 |
| 2024 | 4,698,454 | 3,600 |
| 2025 | 5,053,698 | 3,800 |
| 2026 | 5,557,298 | 3,800 |

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

එතකොට 2019 සිට 2026 දක්වා වැඩිම අස්වැන්න ලබාගෙන තිබෙන්නේ 2020දී. 2020 වර්ෂයේ සාමාන්‍ය අස්වැන්න හෙක්ටෙයාරයකට කිලෝග්‍රෑම් 4,200යි. 2020න් පසුව ටික ටික කඩාගෙන වැටුණා. කඩාගෙන වැටිලා දැන් තමයි නැවත ටික ටික ඉදිරියට යමින් තිබෙන්නේ.

(ඇ) වී වගාවේ ඒකක පිරිවැය ඇස්තමේන්තු කිරීමේදී, පහත සඳහන් ක්ෂේත්‍රයේ සිදුකරන ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ශ්‍රමය, යන්ත්‍රෝපකරණ සහ යෙදවුම් සඳහා යන වියදම් සැලකිල්ලට ගෙන අක්කරයකට අදාළව පිරිවැය ගණනය කරනු ලැබේ.

- බිම් සකස් කිරීම
- පොහොර යෙදීම
- බීජ වැපිරීම
- ජල පාලනය
- වල් පැළ පාලනය
- අස්වනු නෙළීම හා සැකසීම
- ප්‍රවාහනය
- වියළීම සහ ඇසුරුම් කිරීම

පහත සඳහන් වර්ෂ සඳහා වී කිලෝග්‍රෑමයක් නිෂ්පාදනය කිරීමේ පිරිවැය:

| කන්නය | සම්මත තෙතමන මට්ටමේ (සියයට 14) වී නිෂ්පාදන පිරිවැය | | | |
|---|---|---|---|---|
| | නාඩු (සුදු) | නාඩු (රතු) | සම්බා | කීරි සම්බා |
| 2023/24 මහ | 79 | | 89 | 101 |
| 2024/25 මහ | 87 | 71 | 93 | 102 |
| 2025 යල | 92 | 75 | 98 | 108 |
| 2025/26 මහ | 101 | 83 | 105 | 116 |
| 2026 යල | 84 | 69 | 88 | 98 |

යල කන්නයට අදාළව මම කියපු ගණන් ටික තිබෙන්නේ පොහොර සහනාධාරය දීපු නිසා. පොහොර සහනාධාරය දීලා නැතිව තිබුණා නම්, 2026 යල කන්නයේ සුදු නාඩු කිලෝ එකක් නිෂ්පාදනයට රුපියල් 113ක් වැය වෙනවා. රතු නාඩු කිලෝ එකකට රුපියල් 92ක් වැය වෙනවා. සම්බාවලට රුපියල් 118ක් වැය වෙනවා. කීරි සම්බා කිලෝ එකක් නිෂ්පාදනයට රුපියල් 131ක් වැය වෙනවා. 2026 යල කන්නයේ නිෂ්පාදන පිරිවැය තීරණය කරන ලද්දේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්තාව (2026 ජූනි මාසය) පදනම් කර ගනිමින්.

මේ පිළිතුරේ ඉලක්කම් සහ වගු තමයි ගොඩක් තිබෙන්නේ.

(ඈ) මෙම ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ ඉහත සඳහන් එක් එක් වර්ෂය තුළ නාඩු, කීරි සම්බා සහ අනෙකුත් වී වර්ග සඳහා ගොවීන්ට ලැබුණු සාමාන්‍ය ගොවිපොළ මිල ගැනයි.

සම්මත වී කිලෝග්‍රෑමයක (සියයට 14ක තෙතමනයක් සහිත) අවම මිල දී ගැනීමේ මිල පහත වගුවේ දැක්වෙනවා.

| වර්ෂය | කන්නය | කිලෝවක මිල (රුපියල්) | | |
|---|---|---|---|---|
| | | කීරි සම්බා | සම්බා | නාඩු |
| 2019 | 2018/19 මහ | 41.00 | 41.00 | 38.00 |
| | 2019 යල | 41.00 | 41.00 | 38.00 |
| 2020 | 2019/20 මහ | 50.00 | 50.00 | 50.00 |
| | 2020 යල | 50.00 | 50.00 | 50.00 |
| 2021 | 2020/21 මහ | 52.00 | 52.00 | 50.00 |
| | | 54.00 | 54.00 | 52.00 |
| | | 56.50 | 56.50 | 56.50 |
| | 2021 යල | 55.00 | 52.00 | 50.00 |
| | | 55.00 | 52.00 | 55.00 |
| 2022 | 2021/22 මහ | 95.00 | 92.00 | 90.00 |
| | 2022 යල | 130.00 | 125.00 | 120.00 |
| 2023 | 2022/23 මහ | - | - | - |
| | 2023 යල | 110.00 | 100.00 | 95.00 |
| 2024 | 2023/24 මහ | 130.00 | 120.00 | 105.00 |
| | 2024 යල | 130.00 | 115.00 | 105.00 |
| 2025 | 2024/25 මහ | 132.00 | 125.00 | 120.00 |
| | 2025 යල | 132.00 | 125.00 | 120.00 |
| 2026 | 2025/26 මහ | 140.00 | 130.00 | 120.00 |
| | 2026 යල | 140.00 | 130.00 | 120.00 |

ඉහත වගුවට අනුව 2019 වර්ෂය ගත්තොත්, 2018/19 මාස් කන්නයේ කීරි සම්බා කිලෝවක මිල රුපියල් 41යි; සම්බා කිලෝවක මිල රුපියල් 41යි; නාඩු කිලෝවක මිල රුපියල් 38යි. 2019 යල කන්නයේ කීරි සම්බා කිලෝවක මිල රුපියල් 41යි; සම්බා කිලෝවක මිල රුපියල් 41යි; නාඩු කිලෝවක මිල රුපියල් 38යි. ඒ කියන්නේ, යල මහ දෙකේම එකම මිල ගණන්වලට තමයි මිල දී අරගෙන තිබෙන්නේ.

2020 වර්ෂය ගත්තොත්, 2019/20 මාස් කන්නයේ කීරි සම්බා කිලෝවක මිල රුපියල් 50යි; සම්බා කිලෝවක මිලත් රුපියල් 50යි; නාඩු කිලෝවක මිලත් රුපියල් 50යි. ඒ කියන්නේ, මාස් කන්නයේ සමාන මිලකටයි ගිහින් තිබෙන්නේ. 2020 යල කන්නයේත් එම මිලමයි. සමාන මිලකට තමයි ගිහින් තිබෙන්නේ. 2020 යල කන්නයේ කීරි සම්බා කිලෝවක මිල රුපියල් 50යි; සම්බා කිලෝවක මිලත් රුපියල් 50යි; නාඩු කිලෝවක මිලත් රුපියල් 50යි.

2021 වර්ෂය ගත්තොත්, 2020/21 මාස් කන්නයේ මුලින්ම කීරි සම්බා කිලෝවක මිල තිබිලා තියෙන්නේ රුපියල් 52ට; සම්බා රුපියල් 52ට; නාඩු රුපියල් 50ට. ඒ මිල ගණන් නැවතත් මාස් කන්නයේම පොඩ්ඩක් වෙනස් වෙලා තිබෙනවා. ඒ අනුව කීරි සම්බා රුපියල් 54ටත්, සම්බා රුපියල් 54ටත්, නාඩු රුපියල් 52ටත් මිල දී ගෙන තිබෙනවා. එකම කන්නයේ මිල ගණන් දෙකකට අරගෙන තිබෙනවා. මිල තුනකටත් ගිහින් තිබෙනවා, ඒ

කන්නයේම. ඒ අනුව 2020/21 මහ කන්නයේ කීරි සම්බා කිලෝවක් රුපියල් 56.50ට මිල දී ගෙන තිබෙනවා; සම්බා කිලෝවක් රුපියල් 56.50ට සහ නාඩු කිලෝවක් රුපියල් 56.50ට මිල දී ගෙන තිබෙනවා. එකම කන්නයේ එහෙම වෙලා තිබෙන එක ගැන වෙනම බලන්න ඕනෑ. ඒ කියන්නේ, එකම කන්නය තුළ මිල ගණන් තුනකට ගිහින් තිබෙනවා, සහල් වර්ග තුනම.

2021 යල කන්නයේ කීරි සම්බා කිලෝවක් මිලදී ගෙන තිබෙන්නේ රුපියල් 55ට, සම්බා 52ට, නාඩු 50ට. ඒ යල කන්නයේම ආයෙත් නාඩු මිලෙහි වෙනසක් වෙලා තිබෙනවා. කීරි සම්බා ගත්තොත්, කලින් ගණනමයි; රුපියල් 55යි. සම්බා ගත්තත්, කලින් ගණනමයි; රුපියල් 52යි. හැබැයි, නාඩු වෙනස් වෙලා තිබෙනවා එකම කන්නය ඇතුළත, රුපියල් 50 ඉඳන් 55ට.

2022 වර්ෂය ගත්තොත්, 2021/22 මහ කන්නය වන කොට ගණන වැඩි වෙලා තිබෙනවා. කීරි සම්බා රුපියල් 95යි; සම්බා රුපියල් 92යි; නාඩු රුපියල් 90යි. සෑහෙන්න කාලයකට පස්සේ, ඒ කියන්නේ, 2022 මාස් කන්නයේ වී මිල වැඩි වීමක් වෙලා තිබෙනවා. 2022 යල කන්නයේ ගොඩක් වැඩි වෙලා තිබෙනවා. කීරි සම්බා රුපියල් 130යි; සම්බා 125යි; නාඩු 120යි. මා හිතන විධියට, ඒ ගැන කාටත් අදහසක් තිබෙනවා. පොහොර ප්‍රශ්නය, ඒ කියන්නේ පොහොර තහනම් කිරීමත් එක්ක තමයි අස්වැන්න අඩු වෙලා වී කිලෝවක මිල විශාල වශයෙන් ඉහළ යන්නේ. ඒ වෙනස තමයි මෙතැන තිබෙන්නේ.

ඊළඟට, 2023 වර්ෂය. 2022/23 මහ කන්නයේ ඉලක්කම් නැහැ. 2023 යල කන්නයේ කීරි සම්බා රුපියල් 110යි; සම්බා රුපියල් 100යි; නාඩු රුපියල් 95යි.

2024 වර්ෂයේ ගත්තොත්, 2023/24 මාස් කන්නයේ කීරි සම්බා රුපියල් 130යි; සම්බා රුපියල් 120යි; නාඩු රුපියල් 105යි. 2024 යල කන්නයේ කීරි සම්බා රුපියල් 130යි. සම්බා මිල අඩු වෙලා තිබෙනවා; රුපියල් 115යි. නාඩු රුපියල් 105යි.

2025 වර්ෂය ගත්තොත්, 2024/25 මාස් කන්නයේ කීරි සම්බා රුපියල් 132යි; සම්බා රුපියල් 125යි; නාඩු රුපියල් 120යි. 2025 යල කන්නයේ ඒ ගණන්මයි. එනම්, කීරි සම්බා රුපියල් 132යි; සම්බා රුපියල් 125යි; නාඩු රුපියල් 120යි.

2026 අවුරුද්ද, ඒ කියන්නේ මේ අවුරුද්ද ගත්තොත්, 2025/26 මාස් කන්නයේ කීරි සම්බා රුපියල් 140යි; සම්බා රුපියල් 130යි; නාඩු රුපියල් 120යි. කීරි සම්බා හිඟයක් තිබුණු නිසා රුපියල් 132ට තිබුණු කීරි සම්බා මාස් කන්නයේදී රුපියල් 140 දක්වා වැඩි කළා. හැබැයි, ඇත්තටම ඒ වෙලාවේ වැඩි කරද්දී මාස් කන්නයේ වගා කරලා ඉවරයි. එතකොට ඒ මිල දී ගන්නා අවස්ථාව වෙද්දී වැඩි කිරීමේ අපේක්ෂාව සම්පූර්ණ කරන්න බැහැ. මොකද, එතකොට වගා කරලා ඉවරයි. ඇත්තටම ඒක වැඩි කළේ, යල කන්නයට කීරි සම්බා වගා කිරීම වැඩි කිරීමේ අරමුණින්. මාස් කන්නයේදීම මිල වැඩි කළා; මාස් කන්නයේ ඒවාටත් ඒ ගණනම ගෙව්වා. 2026 යල කන්නයේ කීරි සම්බා රුපියල් 140යි; සම්බා රුපියල් 130යි; නාඩු රුපියල් 120යි. ඇත්තටම දැන් ඉල්ලීමක් තිබෙනවා නේ, මිල වැඩි කරන්න කියලා. එකම කන්නයේ දෙවරක් මිල වැඩි කරන්න ටිකක් අමාරු තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඊළඟ ප්‍රශ්නය,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, පිළිතුර කෙටි කරන්න පුළුවන් නම් හොඳයි. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මේක සෑහෙන වැදගත් ප්‍රශ්නයක්. මේ උත්තර දෙන ආකාරය,- *[බාධා කිරීමක්]* ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් වන ඊළඟ ප්‍රශ්න දෙකට පිළිතුරු සභාගත කරන්න. ඔබතුමා මේ ප්‍රශ්නය විසඳන්න යන්නේ කොහොමද කියන එකයි, වියදම වැඩි වීම තුළ ගොවියාට සාධාරණ මිලක් ලැබෙන්නේ කොහොමද කියන එකයි කිව්වා නම් ඇති.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයේ ඉතිරි කොටස්වලට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:*
*Rest of the answer tabled:*

(ඉ) ශ්‍රී ලංකාවේ වී වගාව ආසන්නව වසරකට හෙක්ටෙයාර ලක්ෂ 13ක් පමණ වගා කර මේ වන විට වාර්ෂික නිෂ්පාදනය මෙට්‍රික්ටොන් මිලියන 5ක් පමණ ලැබේ. මෙම වී නිෂ්පාදනයෙන් සියයට 70ක් පමණ ලැබෙන්නේ මහාවාරි ජලාශ යටතේ සහ මහවැලි කලාපවල වගා කරන කුඹුරු ඉඩම්වලිනි. එමෙන්ම ඒවා වැඩි අස්වනු ලබා දෙන කුඹුරු වන අතර, වාණිජ මට්ටමේ ගොවීන් විසින් සිදු කරන වී වගාවයි.

මේවායේ සාමාන්‍ය අස්වැන්න එක් එක් ප්‍රභේදය අනුව පහත පරිදි වන අතර, වර්තමාන යෙදවුම් මිල අනුව අක්කරයක් වගා කිරීමට වැය කර ඇති මුදල සහ ඒ අනුව ප්‍රමිතිගත වී කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය ද දක්වා ඇත. ඒ අනුව රතු නාඩු, සුදු නාඩු, සම්බා සහ කීරි සම්බා වී කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය සඳහා පිළිවෙළින් රුපියල් 76ක්, රුපියල් 87ක්, රුපියල් 97ක් සහ රුපියල් 109ක් ලෙස වැය වී ඇත. රජයේ ප්‍රකාශිත අවම වී මිල දී ගැනීමේ මිල පිළිවෙළින් රුපියල් 120ක්, රුපියල් 120ක්, රුපියල් 130ක් සහ රුපියල් 140ක් වන බැවින්, වී කිලෝග්‍රෑම් එකකින් ගොවියාට පිළිවෙළින් රුපියල් 44ක, රුපියල් 33ක, රුපියල් 33ක සහ රුපියල් 31ක ලාභයක් ලැබෙන අතර, අක්කරයක් වගා කිරීමෙන් පිළිවෙළින් රුපියල් 101,860ක්, රුපියල් 66,528ක්, රුපියල් 58,707ක් සහ රුපියල් 49,259ක් ලෙස ලාභයක් ලැබේ.

| | රතු නාඩු | සුදු නාඩු | සම්බා | කීරි සම්බා |
|---|---|---|---|---|
| අක්කරයක වගා වියදම (රුපියල්) | 175,943 | 175,406 | 172,658 | 173,264 |
| ලැබෙන අස්වැන්න (අක්කරයට කිලෝග්‍රෑම්) | 2,315 | 2,016 | 1,779 | 1,589 |
| සියයට 14 තෙතමනය සහිත වී කිලෝග්‍රෑම් 1ක නිෂ්පාදන පිරිවැය | 76 | 87 | 97 | 109 |
| රජයේ අවම වී මිල දී ගැනීමේ මිල (රුපියල්) | 120 | 120 | 130 | 140 |
| වී කිලෝග්‍රෑම් 1ට ලාභය (රුපියල්) | 44 | 33 | 33 | 31 |
| අක්කරයකට ලාභය (රුපියල්) | 101,860 | 66,528 | 58,707 | 49,259 |

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

ඉහත මිල ගණන්වලට මිල දී ගනු ලබන වී සහල් බවට පත් කිරීමේදී සහල් කිලෝග්‍රෑම් 1ක් සඳහා වී කිලෝග්‍රෑම් 1.55ක් වැය වන අතර, ඒ අනුව සහල් කිලෝග්‍රෑම් 1ක් නිෂ්පාදනයේදී වැය වන වීවල මිල, සැකසුම් වියදම්, ඇසුරුම් කිරීමේ වියදම්, ප්‍රවාහනය, බෑම සහ පැටවීම, වී මෝල් හිමියාගේ ලාභය, තොග වෙළෙන්දාගේ ලාභය, සිල්ලර වෙළෙන්දාගේ ලාභය ආදිය එකතු කර අවසන් පාරිභෝගිකයාට අළෙවි කිරීමේ රජයේ සහල් පාලන මිල ගණනය කර ඇත. මෙම මිල ගණන් වී සැකසීමට සාධාරණව වැය වන ගාස්තු සලකා බලා ජාතික පසු අස්වනු තාක්ෂණ කළමනාකරණ ආයතනය -NIPHM- විසින් ඉදිරිපත් කර ඇත.

(ඊ) අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/2089/801/003 දරන කැබිනට් සන්දේශ හා 2024 දෙසැම්බර් 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ස්ථාපිත කරන ලද ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව මඟින් ගනු ලබන තීරණ අනුව අමාත්‍ය මණ්ඩලයේ තීරණයන්ට යටත්ව මේ දක්වා සහල් ආනයනය කිරීම සිදු කරනු ලැබ ඇත.

තවද, ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව නියෝජනය කරන අදාළ පාර්ශ්වකරුවන්ගෙන් ඉදිරිපත් වන කරුණු සලකා බලා අදාළ වර්ෂවල මහ සහ යල කන්නයෙහි ලැබීමට අපේක්ෂිත වී අස්වැන්න මෙන්ම වෙළෙඳ පොළ තුළ පවත්නා සුලභතාව, සහල් මිල, පාරිභෝගික රුචිකත්වය වැනි කරුණු ද සැලකිල්ලට ගෙන සහල් මිල ස්ථාවරව පවත්වා ගැනීමේ අරමුණින් අවශ්‍ය අවස්ථාවන්හිදී සහල් ආනයනය කිරීම සිදු කර ඇත.

2019 සිට 2026 ජුනි දක්වා කාලය තුළ බාස්මතී සහල් හැර ආනයනය කරන ලද අනෙකුත් සහල් ප්‍රමාණයන් පහත දැක්වේ.

| වර්ෂය | ආනයනික සහල් ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 2019 | 11,802.50 |
| 2020 | 5,512.70 |
| 2021 | 134,407.10 |
| 2022 | 779,249.10 |
| 2023 | 20,470 |
| 2024 | 113,548.80 |
| 2025 | 168,682.90 |
| 2026 ජුනි දක්වා | 159,000.10 |

(උ) 2019-2025 වාර්ෂික ඒක පුද්ගල සහල් පරිභෝජනය කිලෝග්‍රෑම් 101.3/පුද්ගලයෙකුට/වසරකට.

ක්‍රමවේදය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව - DCS - විසින් ලබා දී ඇති තොරතුරුවලට අනුව, ඇස්තමේන්තුගත වාර්ෂික ඒක පුද්ගල සහල් පරිභෝජනය පහත පරිදි ගණනය කරනු ලැබේ.

<u>අදාළ වර්ෂය සඳහා සහල් පරිභෝජනය</u>

එක් එක් වර්ෂයේ මැද භාගයේ ජනගහනය

(ඌ) ඉහත විස්තර i, ii, iii සඳහා වන පුරෝකථනයන් 2027, 2028 සහ 2029 වර්ෂ සඳහා ගණනය කර නොමැත.

iv. ප්‍රක්ෂේපිත සහල් ආනයන අවශ්‍යතාව එක් එක් වර්ෂවල අපේක්ෂිත වී අස්වැන්න මෙන්ම වෙළෙඳ පොළ සහල් සුලභතාව සහ සහල් මිල මත තීරණය වේ.

(එ) 2026 යල කන්නය සඳහා පොහොර සහනාධාරයට ලියාපදිංචි වූ මුළු ගොවීන් සංඛ්‍යාව 2026.07.15 වන විට 663,868ක් වන අතර, එම දිනය වන විට පොහොර සහනාධාර ගෙවීම් සිදු කර ඇති ගොවීන් සංඛ්‍යාව 611,930කි.

ඒ අනුව, මෙතෙක් පොහොර සහනාධාර මුදල් ගෙවීම් නොකරන ලද ගොවීන් සඳහා සහනාධාර මුදල් ගෙවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම මේ වන විටත් සිදු වෙමින් පවතින අතර, ගොවීන් විසින් දී ඇති දත්ත අනුමත කිරීමෙන් අනතුරුව slip පත සකස් කර ඊට අදාළ අක්මුදල් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයට තොරතුරු ලබා දීමෙන් අනතුරුව අදාළ ගොවීන්ගේ ගිණුම් වෙත මුදල් බැර කිරීම සඳහා දින 2-3 අතර කාලයක් ගත වන බව දන්වමි.

(ඒ)

| වර්ෂය | කන්නය | කිලෝවක මිල (රුපියල්) | | |
|---|---|---|---|---|
| | | කීරි සම්බා | සම්බා | නාඩු |
| 2019 | 2018/19 මහ | 41.00 | 41.00 | 38.00 |
| | 2019 යල | 41.00 | 41.00 | 38.00 |
| 2020 | 2019/20 මහ | 50.00 | 50.00 | 50.00 |
| | 2020 යල | 50.00 | 50.00 | 50.00 |
| 2021 | 2020/21 මහ | 52.00 | 52.00 | 50.00 |
| | | 54.00 | 54.00 | 52.00 |
| | | 56.50 | 56.50 | 56.50 |
| | 2021 යල | 55.00 | 52.00 | 50.00 |
| | | 55.00 | 52.00 | 55.00 |
| 2022 | 2021/22 මහ | 95.00 | 92.00 | 90.00 |
| | 2022 යල | 130.00 | 125.00 | 120.00 |
| 2023 | 2022/23 මහ | - | - | - |
| | 2023 යල | 110.00 | 100.00 | 95.00 |
| 2024 | 2023/24 මහ | 130.00 | 120.00 | 105.00 |
| | 2024 යල | 130.00 | 115.00 | 105.00 |
| 2025 | 2024/25 මහ | 132.00 | 125.00 | 120.00 |
| | 2025 යල | 132.00 | 125.00 | 120.00 |
| 2026 | 2025/26 මහ | 140.00 | 130.00 | 120.00 |
| | 2026 යල | 140.00 | 130.00 | 120.00 |

(ඔ) තෙත් වී - wet paddy - කිලෝග්‍රෑමයක අවම මිල දී ගැනීමේ මිල - MPP

| විස්තරය | නාඩු(සුදු/රතු) | සම්බා | කීරි සම්බා |
|---|---|---|---|
| සම්මත වී කිලෝග්‍රෑම් 1ක අවම මිල දී ගැනීමේ මිල -MPP- (රුපියල්) (සියයට 14ට වැඩි සහ තෙතමනය සියයට 22ට සමාන හෝ අඩු | 102 | 110 | 120 |

කිලෝග්‍රෑම් 1ක ප්‍රමිතියෙන් යුත් වී සඳහා වන අවම මිල දී ගැනීමේ මිල - MPP

| විස්තරය | නාඩු (සුදු/රතු) | සම්බා | කීරි සම්බා |
|---|---|---|---|
| සම්මත වී කිලෝග්‍රෑම් 1ක අවම මිල දී ගැනීමේ මිල -MPP- (රුපියල්) (තෙතමනය සියයට 14ක් අඩංගු වේ) | 120 | 130 | 140 |

මෙම වී අස්වැන්නෙන් සියයට 70ක් පමණ ලැබෙන්නේ ප්‍රධාන වාරිමාර්ග ජලාශ යටතේ සහ මහවැලි කලාප තුළ වගා කරන ලද කුඹුරුවලිනි. මේවා වාණිජ මට්ටමේ ගොවීන් විසින් කළමනාකරණය කරනු ලබන ඉහළ අස්වැන්නක් ලබා දෙන කුඹුරු වේ.

මෙම වී වර්ගවල සාමාන්‍ය අස්වනු ප්‍රමාණයන් පහත දැක්වේ. ඊට අමතරව, වත්මන් යෙදවුම් මිල ගණන් මත පදනම් වූ අක්කරයක වගා වියදම සහ ඒ අනුව ගණනය කළ වී කිලෝග්‍රෑමයක ප්‍රමිතිගත නිෂ්පාදන වියදම ද මෙහි දක්වා ඇත. ඒ අනුව, රතු නාඩු, සුදු නාඩු, සම්බා සහ කීරි සම්බා වී කිලෝග්‍රෑමයක නිෂ්පාදන වියදම පිළිවෙළින් රුපියල් 76ක්, රුපියල් 87ක්, රුපියල් 97ක් සහ රුපියල් 109ක් වේ. ඉන්පසු, ප්‍රමාණවත් ලාභ ආන්තිකයක් - profit margin එකක් - එකතු කිරීමෙන් අවසාන මිල දී ගැනීමේ අවම මිල - MPP - පිළිවෙළින් රුපියල් 120ක්, රුපියල් 120ක්, රුපියල් 130ක් සහ රුපියල් 140ක් ලෙස තීරණය කර ඇත.

වී අලෙවි මණ්ඩලය සහ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් මේ පිළිබඳව මාධ්‍ය වෙත දැනුම් දී ඇත.

මූලාශ්‍ර - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

වී අලෙවි මණ්ඩලය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයේ අන්තිම කොටස් තුනට උත්තර දෙන්න. අනෙක් ඒවා සභාගත කළාට කමක් නැහැ, ලාල් කාන්ත ඇමතිතුමා. ඔබතුමාගේ උපන් දිනය අද නේ. ඒකටත් අපි වෙලාවක් දෙමුකෝ.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ප්‍රශ්නයේ ඉතිරි කොටස් සියල්ලටම පිළිතුර මා සභාගත කළා, ගරු මන්ත්‍රීතුමා. තුන්වැනි එකේ ඉඳන් කියන්නේ, කී වෙනි එකේ ඉඳන්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඒ අන්තිම කොටස් තුනට උත්තර දෙන්න, ඒවාට කොහොමද විසඳුම ලබා දෙන්නේ කියලා. අනෙක් ඒවා සභාගත කරන්න. අද ඔබතුමාගේ උපන් දිනය නේ. ඉතින් අපි ඒකටත් සලකන්න ඕනෑ නේ. මොකද, ඔබතුමායි, නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමායි මේ ප්‍රශ්නයට මැදිහත් වෙලා දැන් ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා නේ. ඒකට විසඳුම දෙන්නේ කොහොමද කියන්නකෝ.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
මම කියන්නම්.

අද වාර්තා වුණා, වලව කලාපයේ එක ගොවි මහත්තයෙක් අක්කරයකින් බුසල් 240ක් අරගෙන තිබෙනවා කියලා. එයා තමයි මේ වෙනකොට ඉන්න number one. එතකොට එයාට මේ ගෙවන මිල හොඳටම ප්‍රමාණවත්. අපි හිතන විධියට, රුපියල් 120, *[බාධා කිරීමක්]* රුපියල් 130, රුපියල් 140 එතුමාට ප්‍රමාණවත්. *[බාධා කිරීමක්]* ඒ පිළිබඳව අපි කාටත් අවබෝධයක් තිබෙනවා නේ. ඒ ඉඩම්වල හැටියට, පසේ හැටියට. නමුත් අක්කරයකට බුසල් 80ක් ගන්නවා නම් ඒ ගොවි මහත්තයාට මේ මිල මදි. ඒකත් අපි පිළිගන්නවා. *[බාධා කිරීමක්]* එයාට මේ මිල මදි. හැබැයි, බුසල් 100 පන්නලා ගන්නවා නම්, 100ක් හෝ ඊට වැඩිය බුසල් 110, 120, 130 වාගේ ඒ පැත්තට යන්න යන්න ඒ ගොවීන්ට මේ මිල ප්‍රමාණවත්. මොකද එතකොට ඒ අයට කිලෝ එකක් සඳහා යන පිරිවැය අඩුයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමනි, අර කථානායකතුමාගේ මල්ලිගේ කුඹුරේ?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ඒක මම දන්නේ නැහැ. ඒක කථානායකතුමාගෙන් තමයි අහන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ඒක මම දන්නේ නැහැ. ඒ විස්තරේ මම දන්නේ නැහැ.*[බාධා කිරීමක්]* එහෙම නම්, ඒ මල්ලිගේ ඉඩමේ අස්වැන්න ගොඩක් අඩු ඇති. *[බාධා කිරීමක්]* අක්කරයට බුසල් 40ක් විතර ඇත්තේ. අක්කරයකින් බුසල් 40ක් අරගෙන එයාට වාණිජ මට්ටමට එන්න බැහැ නේ; වෙළෙඳපොළට එන්න බැහැ නේ. ඒ නිසා අපට මේකට තිබෙන උත්තරය අස්වැන්න වැඩි කිරීමම තමයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉරිඟු වගා කිරීම නොවෙයිද?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ඉරිඟු වගා කරනවා. මොකද, අපේ රටට මේ වෙද්දී, ඉරිඟු මෙට්‍රික්ටොන් ලක්ෂ 8ක් විතර ඕනෑ. නමුත් අපේ රටේ නිෂ්පාදනය කරන්නේ මෙට්‍රික්ටොන් ලක්ෂ 3යි. එහෙම නම් අපි ඉතුරු ටික ගේන්න ඕනෑ. හැබැයි, ඒත් මේ වෙලාවේ බඩ ඉරිඟු ගේන එක අපි නවත්වලයි තියෙන්නේ. අපි උත්සාහ කරනවා රට තුළ ඒ වගා වපසරිය වැඩි කරන්න. ඒ වාගේම සුළු වාරි මාර්ග පද්ධතිවල - සුළු හා මධ්‍ය පරිමාණ කිව්වත් කමක් නැහැ - වී වෙනුවට බඩ ඉරිඟු වගා කරන්න අපි උනන්දු කරවනවා. ඒ වාගේම මහා වාරිමාර්ග සහ මහවැලි කලාපවල හෙක්ටෙයාරයක අස්වැන්න වැඩි කරන්න "යාය වැඩසටහන" යනවා. අපි උත්සාහ කරන්නේ නැහැ පුරන් කුඹුරු අස්වද්දන්න. පුරන් කුඹුරු අස්වද්දනවා කියන සංකල්පයක් තිබුණා නේ. ඒක කියපු ගමන් එන්නේ වී වගා කරන්න ඕනෑ කියලා නේ. දැන් අපි පුරන් කුඹුරු වී වගාවට නොවෙයි, අනෙකුත් අතිරේක භෝග වගාවලට යොමු කිරීම තමයි කරන්නේ. මොකද, අපි වී වගාවට යට කරලා තිබෙන හෙක්ටෙයාර ප්‍රමාණය හොඳටම ප්‍රමාණවත්. අස්වැන්න වැඩි කිරීම තමයි අපට ඒ පැත්තෙන් තිබෙන කාර්යය. එවැනි පියවරවලින් තමයි අපි ඔබතුමා අහපු ප්‍රශ්නයට උත්තර හොයන වැඩ පිළිවෙළ යන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කෙටි පැහැදිලි කර ගැනීමක් කරන්න. එහෙම කරලා මේ ප්‍රශ්නය අවසන් කරමු.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, ගොවීන් තුළ ඉමහත් විශ්වාසයක් ඔබ සියලුදෙනා කෙරෙහි තිබුණා නේද? පසුගිය අවුරුදු 76කට බැණලා, ඒ කාලයේ ඩී.එස්. සේනානායක, ජේ.ආර්. ජයවර්ධන, රණසිංහ ප්‍රේමදාස, රනිල් වික්‍රමසිංහ කරපු වැඩ මදි කියලා ඔබතුමන්ලා ගොවියාගේ විශ්වාසය දිනාගෙන කටයුතු කරලා, ඔවුන්ගේ ඡන්දය ගත්තා. අද ඔබතුමාගෙන් ඒ ලැබුණ පිළිතුරට අනුව හෙක්ටෙයාරයකින් ලැබුණු කිලෝග්‍රෑම් 4,200ක වී අස්වැන්නේ ප්‍රමාණය දැන් කිලෝග්‍රෑම් 3,600ටත් වඩා අඩු වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කොහොමද මේක නැවත යථා තත්ත්වයට පත් කරන්නේ? ඒ ගොවියා මේ රටේ ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කරන්න ඉමහත් සේවයක් කරනවා. ගොවියා හැම අවස්ථාවේදීම කියන්නේ වියදමට සරිලන ආදායමක් ලැබෙන්නේ නැහැ කියලායි. ඔබතුමන්ලා ගොවීන් නියෝජනය කරන පුද්ගලයන් වශයෙන් ඇයි මේකට මීට වැඩිය විධිමත්, මානුෂික උත්තරයක් ලබා දෙන්න බැරි? මොකද, ඔබතුමා කියන පරිදි ලංකාවේ වී අස්වැන්න හෙක්ටෙයාරයකට කිලෝග්‍රෑම් 3,600ට අඩු වුණාට පසුව ඒක ලොකු ප්‍රශ්නයක්. එය, Laosවල 5,200යි. Vietnamවල හෙක්ටෙයාරයකින් කිලෝග්‍රෑම් 6,200ක් ලැබෙනවා. තායිලන්තයේ කිලෝග්‍රෑම් 4,900යි. ඉතින් ලංකාවේ යම් ප්‍රශ්නයක් තිබෙනවා. ඔබතුමා මේ ප්‍රශ්නයට උත්තර ලබා දෙන්නේ කොහොමද?

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මතක් කරපු නිසා මේ කාරණය කියන්න කැමැතියි. ඩී.එස්. සේනානායක මැතිතුමාගේ කාලයේ කෘෂිකර්මාන්තයට අලුත් පණක් දුන්නා.

නමුත් ඒ අවධිය වෙනකොට - ඒ කියන්නේ 60 දශකයට කලින් - අක්කරයට බුසල් 30යි,40යි, අපේ සම්ප්‍රදායික වී අස්වැන්න. දැන් තමයි මේ ගණනට ඇවිල්ලා තිබෙන්නේ. ඔබතුමාට මම- *[බාධා කිරීමක්]* ඒක හරි. *[බාධා කිරීමක්]* ඒක හරි, ඒක හරි. ඒකේ විවාදයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, පිළිතුර දීලා අවසන් කරන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ඊට කලින් ගත්තාම, අක්කරයට බුසල් 30යි, 40යි වී අස්වැන්න. මම දීපු උත්තරයෙන් ඔබතුමාට අදහසක් ගන්න පුළුවන්. මම පැහැදිලිව කිව්වා, කිලෝ 4,200ක් අරගෙන තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ 2020දී.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
2020දී. එතැනින් පස්සේ ක්‍රමානුකූලව අඩු වෙලා තිබෙනවා. අඩුවෙලා අඩුවෙලා, 2024 වෙනකොට කිලෝ 3,600ක් වෙලා තිබෙනවා. හැබැයි, දැන් 3,800යි. යම් වැඩිවීමක් තිබෙනවා, පොහොර ලබා දීම නිසා සහ වැඩසටහන් මඟින් කෘෂි තාක්ෂණය කුඹුරට ගෙන යන නිසා. ඒ අගය තවත් වැඩි කර ගන්න පුළුවන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කරුණාකරලා මට පැහැදිලි කරන්න, කොහොමද මේ ගොවියා නැවත ජයග්‍රහණය -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, පිළිතුර දීලා අවසන් කරන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - ඒ ඔක්කෝම - වහලා කරන්න පුළුවන් කිව්වාට කරන්න බැහැ. අපි කිසිසේත්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වහලා, එහෙම නැත්නම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වහලා -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාගේ ප්‍රගතිශීලී උත්තරය දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, ඉක්මනින් අවසන් කරන්න.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ඔබතුමා යෝජනා කරන්නේ, වහලා දමලා කරන්න පුළුවන් කියලාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇරලා වැඩක් නැහැ නේ.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ඇරලා වැඩක් තිබෙනවා. ඒවායේ ප්‍රතිඵල තමයි මේ තිබෙන්නේ. මම දන්නවා, ඔබතුමාගේ ආර්ථික ප්‍රතිපත්තිය රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ප්‍රතිපත්තිය නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ඒකට අනුව ඒවා වහන්න ඕනෑ තමයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වහන්න ඕනෑ, බඳවා නොගෙන ඉන්න ඕනෑ. හැම තැනම පුරප්පාඩු තිබෙන්නේ ඒක නේ. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියයට 40ක් කෘෂිකර්ම නිලධාරින් නැහැ. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේගේ පක්ෂ නායකයාගේ ප්‍රතිපත්තිය තමයි තමුන්නාන්සේ ගෙන යන්න හදන්නේ. අපේ ප්‍රතිපත්තිය ඒක නොවෙයි. අපි ඒ ආයතනත් දියුණු කරන ගමන්, පුරප්පාඩුවලට බඳවා ගන්න ගමන් අවශ්‍ය අනෙකුත් කටයුතුත් කරලා තමයි, ඒ කාරණය ඉෂ්ට කරන්නේ. මම හිතන විදියට, දීපු පිළිතුරේ ඔබතුමාට ඕනෑ උත්තරය තිබෙනවා. ඔය ඇති. *[බාධා කිරීම්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගොවියා ආරක්ෂා කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පනත් කෙටුම්පත් පිළිගැන්වීම

***[මේ අවස්ථාවේදී විපක්ෂයේ මන්ත්‍රීවරු පිරිසක් පුවරු ප්‍රදර්ශනය කරමින් නැගී සිටියහ.]***

*[இச்சந்தர்ப்பத்தில் எதிர்க்கட்சி உறுப்பினர்கள் சிலர் பதாகைகளை காட்சிப்படுத்தியவாறு எழுந்து நின்றனர்.]*

*[At this stage, some Hon. Members of the Opposition rose, displaying placards.]*

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත
### அரசியலமைப்புக்கான இருபத்திரண்டாம் திருத்தம் சட்டமூலம்
### TWENTY SECOND AMENDMENT TO THE CONSTITUTION BILL

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***

***2026 සැප්තැම්බර් 08වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 செப்ரெம்பர் 08, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப் பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon Harshana Nanayakkara, Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 08th September, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමනි, දෙවන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න. *[සෝෂා කිරීම්]*

### අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත
### நீதித்துறை (திருத்தம்) சட்டமூலம்
### JUDICATURE (AMENDMENT) BILL

"1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***

***2026 සැප්තැම්බර් 08වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 செப்ரெம்பர் 08, செவ்வாய்க்கிழமை இரண்டாம்முறை மதிப் பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 08th September, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා. - *[සෝෂා කිරීම්]*

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමා න්‍යාය පත්‍රයේ අංක 3, වරප්‍රසාද යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි ඔබතුමාගේ අවසරය ඇතිව, මෙම වරප්‍රසාද යෝජනාව සංශෝධනය කර නැවත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන නිසා අද දින ඉදිරිපත් කරන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

## ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
## இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாடு) சட்டம்: ஒழுங்குவிதிகள்
## IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ் சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளு மன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
Hon. Speaker, on behalf of the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education, I move,

"That the Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 read with Section 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 as amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 and published in Gazette Extraordinary No. 2496/38 of 10th July, 2026, which were presented on 07.08.2026, be approved.

(Cabinet approval signified.)"

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Nishantha Jayaweera to start the Debate. You have 11 minutes.

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, 1969 අංක 1 දරන, -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලා කොච්චර වෙලාවක් මේ පුවරු අල්ලා ගෙන ඉන්නවාද කියලා අපි බලාගෙන ඉන්නවා. අද දවසම මේවා අල්ලා ගෙන ඉන්න ඕනෑ. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, මෙතුමන්ලා මේකට ඇත්තටම විරුද්ධ නම් මේ සතියම මෙතුමන්ලා මෙහෙම පුවරු අල්ලා ගෙන ඉන්න ඕනෑ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය අමාත්‍යතුමා. *[බාධා කිරීම්]* Hon. Deputy Minister, you have 11 minutes. - *[Interruption.]*

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Member?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථානායකතුමා විසින්ම ඉදිරිපත් කරපු ප්‍රශ්නයක් පිළිබඳව, "කථානායකවරයා පිළිබඳ රහස්‍ය තොරතුරු මාධ්‍යට හෙළිදරව්වීම පිළිබඳ විමර්ශනයේ වාර්තාව" මේ වෙනකොට ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Member?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, පොඩ්ඩක් ඉන්න. My point of Order is this. මේ ක්‍රියාවලිය යටතේ ගරු කථානායකතුමාට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පැමිණිල්ලක් තිබෙනවා, කෝටි තුනකට වැඩි - *[බාධා කිරීමක්]* එම වාර්තාව මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි කාරණය මේකයි. ගරු කථානායකතුමාට අද මේ අවස්ථාවේ ඉන්න බැහැ. මොකද, එතුමාට ඉහළින් නීතිය නැහැ. ඒ නිසා එතුමා පොඩ්ඩක් අයින් වෙලා, - *[බාධා කිරීම්]*

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is not a point of Order, Hon. Member.

Shall we get on with Public Business?- *[Interruption.]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will allow the Hon. Leader of the Opposition. What is your point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Mike එකත් නැහැ, කැමරාවත් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අධිකරණයේ ස්වාධීනත්වයට එල්ල කරන මේ මරු පහරට විරුද්ධව අපි නැඟී සිටිනවා. අද දවස ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම, ප්‍රජාතන්ත්‍රවාදයේ මළගම!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is not a point of Order. - *[Interruption.*

]Hon. Nishantha Jayaweera, would you commence your speech? - *[Interruption.]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ලංකා ඉතිහාසයේ වැඩිම - *[බාධා කිරීමක්]* නිවාස හදනවා කියලා ලංකා ඉතිහාසයේ වැඩිම නිවාස නාස්තිය කරපු පුද්ගලයා; *[බාධා කිරීම්]* ඔබතුමා ඔය පුටුව අවුරුදු ගාණක් අල්ලා ගෙන ඉන්න ඕනෑ. *[බාධා කිරීම්]* හරිද? හැබැයි, අද දවසම ඉන්න ඕනෑ. කෝ, කෝ? දැන් ඕක අල්ලාගෙන ඉන්න. *[බාධා කිරීම්]* අන්න, මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඒක ප්‍රතික්ෂේප කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Shall we get on with the Business of the House now? Hon. Nishantha Jayaweera, you are called upon to speak.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1969 අංක 1 දරන ආනයන අපනයන (පාලන) පනත යටතේ -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No rumpus here! - *[Interruption.]* Hon. Nishantha Jayaweera, you carry on.

[අ.භා. 12.07]

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1969 අංක 1 දරන ආනයන අපනයන (පාලන) පනත යටතේ බලහත්කාර ශ්‍රමය පාවිච්චි කරලා නිෂ්පාදනය කරන භාණ්ඩ මෙරටට - ලංකාවට - ආනයනය කරන එක තහනම් කිරීමට අදාළ රෙගුලාසියක් තමයි අද පාර්ලිමේන්තුවේ සම්මතයට ඉදිරිපත් කර තිබෙන්නේ. එම රෙගුලාසිය සම්මතයට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේදී එහි පසුබිම ගැන අපි අවධානය යොමු කළොත්, - *[බාධා කිරීම්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, would you please listen to the Hon. Deputy Minister?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඇමෙරිකා එක්සත් ජනපදයේ වෙළෙඳ පනතේ 301 වගන්තිය යටතේ ඔවුන් කරන ලද විමර්ශනයකදී අනාවරණය කර ගන්නවා, ලෝකයේ රටවල් 60ක් බලහත්කාර ශ්‍රමය පාවිච්චි කරලා නිෂ්පාදනය කරන ලද භාණ්ඩ ආනයනය කිරීමට අදාළව, -

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, please hold on. What is your point of Order, Hon. Ajith P. Perera?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ඉදිරිපත් කරපු විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතේ, "බලපෑමේ වගන්තිය" නැහැ. යම් පනතක් ඉදිරිපත් කරනකොට බලපෑමේ වගන්තිය තිබෙන්න ඕනෑ. ඔබතුමා අධිකරණ සංවිධාන පනත බලන්න. අධිකරණ සංවිධාන පනත සංශෝධනයේදී බලපෑමේ වගන්ති විස්තර කරලා තිබෙනවා, මොකක්ද බලපෑම කියලා. හැබැයි, මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතත් පනතක්. එම නිසා ඒකේ බලපෑම මොකක්ද කියලා විස්තර කරන්න ඕනෑ. නමුත්, ඒක හිස්. ඒක අඩුපාඩුවක්; ඌනතාවක්. ඒ අඩුපාඩුව හදන්න. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, it has been noted.

Hon. Nishantha Jayaweera, would you please continue speaking?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, I have given enough time to the Opposition. I have given you time, Hon. Member. Please, let us now get on with the Business of the House. Let us stop the rumpus please.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
එක්සත් ජනපද වෙළෙඳ පනතේ 301වගන්තිය යටතේ අනාවරණය වෙනවා, රටවල් 60ක් බලහත්කාරයෙන් ශ්‍රමය පාවිච්චි කරලා සිදු කරනු ලබන නිෂ්පාදන තමන්ගේ රටවලට ආනයනය කරනකොට, -

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Najith Indika, what is your point of Order?

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගෙයි, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගෙයි පුවරු පෙනෙන්නේ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Nishantha Jayaweera, would you please carry on?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඒ අනුව අනාවරණය වෙනවා, ලෝකයේ රටවල් 60ක් බලහත්කාර ශ්‍රමය භාවිත කරමින් කරනු ලබන නිෂ්පාදන, - *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, could you please give me a little more time?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give you 30 seconds, Hon. Member, and not more than that. I will not give you any more time to speak on this subject. I am not going to give you any more time! - *[Interruption.]* Could we finish with this? This does not relate to the speech at all. - *[Interruption.]*

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
සමහර රටවල් එවැනි නිෂ්පාදන කළත්, තවත් සමහර රටවල් බලහත්කාර ශ්‍රමය පාවිච්චි කරලා කරනු ලබන එවැනි නිෂ්පාදන ආනයනය කිරීමට අදාළ නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමට අදාළ යන්ත්‍රණ ඒ රටවල ක්‍රියාත්මක නොවන බව. -

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, please give me some time.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, I am not going to. I have given you enough time.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
මෙහිදී ප්‍රධාන වශයෙන් එම රටවල් 60න් - *[බාධා කිරීම්]* විශේෂයෙන්ම මේ රටවල් 60න් රටවල් 14ක මේ අවස්ථාවේ නීතිමය ප්‍රතිපාදන තිබුණත්, ඒ නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේදී බාහිර බලවේග නිසා යම් යම් අඩුපාඩු තිබෙන බව හඳුනා ගන්නවා. එතකොට, මෙන්න මේ රටවල් 14ට අමතර සියයට 10ක තීරු බද්දක් පනවන බවත්, ඉතිරි රටවල් 46 සඳහා සියයට 12.5ක අතිරේක තීරු බද්දක් ඇමෙරිකාවට සිදු කරනු ලබන ආනයන සම්බන්ධයෙන් පනවන්න, - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, this is the last time I am going to allow a point of Order for the Opposition. Hon. Member, you have one minute. What is your point of Order, Hon. Member? With this, it stops!

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Dayasiri Jayasekara?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා මතු කරපු කාරණයට අමතරව මෙහි තිබෙන තවත් වැරැද්දක් මම පෙන්වා දෙන්නම්. මේකේ බොහොම පැහැදිලිව තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75වැනි ව්‍යවස්ථාවේ, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, make it short because there is a time constraint.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, would you refer to the Constitution, please? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75වැනි ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව තිබෙනවා, "අතීතයට ද බලපාන්නා වූ නීති සහ ආණ්ඩුකම ව්‍යවස්ථාවේ කවර හෝ ..." යනාදී වශයෙන්. 75 (අ) ව්‍යවස්ථාවේ බොහොම පැහැදිලිව තිබෙනවා, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ එහි යම් කොටසක හෝ ක්‍රියාකාරිත්වය අත්හිටුවන්නා වූ නීතියක් පැනවීම පාර්ලිමේන්තුව විසින් නොකළ යුත්තේ ය" කියලා. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 120වැනි ව්‍යවස්ථාවේ, "ශ්‍රේෂ්ඨාධිකරණයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය" යටතේ, "... දීර්ඝ නාමයේ විස්තර කර ඇති පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් වන විට" කියලා සඳහන්ව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමානයට බලපාන්න ඕනෑ නම්, මෙම පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ, වර්තමාන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ට සහ අනෙක් අයට මේක බලපානවාද කියලා මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඉතිහාසයට බලපාන පරිදි පනත් සම්මත කිරීමක් වෙන්නේ. ඒක කරන්න එපා, ගරු නියෝජ්‍ය කථානායකතුමා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member, that has been noted.

Hon. Nishantha Jayaweera, would you carry on please? I would not interrupt you again.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members of the Opposition, why do you not take your seats now since you all have already exhibited your placards?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ රටවල් 46 තුළට ශ්‍රී ලංකාවත් ඇතුළත් වෙනවා. ශ්‍රී ලංකාවට සියයට 12.5ක අතිරේක තීරු බද්දක් පැනවීමත් එක්ක ඇති වෙන බලපෑම මොකක්ද? අපේ අපනයන ආදායම ගත්තාම, අපේ අපනයන ආදායමෙන් සියයට 25ක වාගේ ප්‍රමාණයක්,- *[බාධා කිරීම්]* ඇමෙරිකා එක්සත් ජනපදය පදනම් කරගෙන තමයි සිද්ධ වෙන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No more points of Order. Hon. Nishantha Jayaweera, you may continue.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු කථානායකතුමනි, මේ සියයට 12.5ක තීරු බද්ද දිගින් දිගටම පැවතුණොත් අපේ අපනයනවලට විශාල බලපෑමක් ඇති කරන්න පුළුවන්. ඊටත් අමතරව සියයට 10ක තීරු බද්දක් පැනවූ රටවල් 14 අතර පාකිස්තානය, බංග්ලාදේශය, ඉන්දුනීසියාව, මැලේසියාව සහ කාම්බෝජය වාගේ මෙම කලාපයේ රටවල් තිබෙනවා. මෙන්න මේ කලාපයේ රටවල් එක්ක අපි අපනයනය සම්බන්ධයෙන් තරග කරද්දී දැඩි තරගකාරී තත්ත්වයකට පත් වෙනවා. මොකද, අපේ අපනයන අධෛර්වත් වෙන්න ඒක බලපානවා. මෙන්න මේ කරුණු පදනම් කරගෙන, මේ අර්බුදය

[ගරු නිශාන්ත ජයවීර මහතා]

විසඳාගන්නේ කොහොමද කියලා බලන්න විශේෂයෙන්ම රජය මැදිහත් වෙලා තාක්ෂණික කමිටුවක් පත් කරනවා. එම කමිටුව විසින් අධ්‍යයන සිද්ධ කරලා, නිර්දේශ ලබා දෙනවා. එම නිර්දේශ තුළ, ශ්‍රී ලංකාව තුළ බලහත්කාර ශ්‍රමය - මිනිස් ජාවාරම - සහ ඊට අදාළ වෙනස් ශ්‍රම සූරා කෑමේ ක්‍රමවේද තහනම් කිරීම සඳහා දේශීය නීතිමය නියාමන ආයතනික රාමුවක් ඒ වෙනකොට මේ රටේ පවත්වාගෙන ගියත්, බලහත්කාර ශ්‍රමය පාවිච්චි කර සිදු කරනු ලබන නිෂ්පාදන ආනයන තහනම් කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සහ එම නීතිමය ප්‍රතිපාදන බලාත්මක කිරීම සඳහා අභ්‍යන්තර ක්‍රමවේද නොපැවතීමේ අඩුපාඩුව ඔවුන් හඳුනා ගන්නවා. ඒ අනුව තමයි මේ ගැසට් නිවේදනය නිකුත් කරන්නේ.

බලහත්කාරයෙන් ශ්‍රමය භාවිත කරලා නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කරද්දී, ඒ ආනයන තහනම් කරන්න අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන තමයි මේ රෙගුලාසිවලට ඇතුළත් වන්නේ. මෙන්න මේ නීතිමය සංශෝධනත් එක්ක තාක්ෂණික කමිටුවේ නිලධාරින් සහ විශේෂයෙන් ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලයේ නිලධාරින්ගේ මැදිහත් වීමත් එක්ක, මේ වෙළෙඳ නියෝජිත ආයතන විසින් කරුණු ඉදිරිපත් කරලා, ඒ ඉදිරිපත් කරපු කරුණු තවදුරටත් සාකච්ඡා කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව ඇතුළු බොහොම සුළු රටවල් ප්‍රමාණයකට 12.5ක්ව තිබුණු තීරු බදු අනුපාතය 10ට අඩු කරන්න ඇමෙරිකාව එකඟ වනවා. මේක අපේ අපනයන වෙළෙඳ පොළ පැත්තෙන් ගත්තාම රටක් විධියට අපි ලබා ගත් විශාල ජයග්‍රහණයක්. මේ ජයග්‍රහණය ලබා ගන්න අපට හැකියාව ලැබෙන්නේ, රජය, රාජ්‍ය නිලධාරින් සහ තානාපති කාර්යාල නිලධාරින්ගේ සෘජු මැදිහත් වීමෙන් ක්‍රියාකාරීව වඩාත් කාර්යක්ෂමව මේ කරුණ වෙනුවෙන් මැදිහත් වීම නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය වසර ඇතුළේ අපි රටක් විධියට අපේ ආදායම් රැස් කිරීමේ යන්ත්‍රණය ඉතාම සාර්ථකව ක්‍රියාවට නැංවූවා. අපේ ආදායම් රැස් කිරීමේ යන්ත්‍රණය ප්‍රධාන කොටස් දෙකක් ලෙස අපට සඳහන් කරන්න පුළුවන්. ඒ කොටස් දෙක ගැන බලනකොට පළමුවැනි එක තමයි, දේශීය ආදායම් රැස්කිරීමේ යන්ත්‍රණය. 2025දී සහ 2026 අවුරුද්දේ මේ දක්වා වූ කාල පරිච්ඡේදය ඇතුළත දේශීයව ආදායම් රැස්කිරීමේ යන්ත්‍රණය හරහා රජයක් විධියට අපට හැකියාව ලැබුණා, ඉතාම කාර්යක්ෂමව, වඩාත් හොඳින් ඇස්තමේන්තු කරපු ඉලක්කවලට එහා යන්නට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒත් එක්කම රටකට විශේෂයෙන්ම වැදගත් වනවා, රටේ සංචිත ඉහළ නංවා ගැනීම, රටට අවශ්‍ය ආනයන වියදම සඳහා පුළුවන් තරම් අරමුදල් සපයා ගැනීම සහ රටක් ලබාගෙන තිබෙන විදේශ ණය මුදල් ගෙවන්න හැකියාව, ශක්තිය, ධෛර්යය ලබා ගැනීම. මෙන්න මේ සඳහා රටකට විදේශ විනිමය රැස්කර ගැනීමේ යන්ත්‍රණය ශක්තිමත් කර ගන්න අවශ්‍ය වනවා.

අපේ රටට ලැබෙන සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයට අමතරව විදේශීය විනිමය ලැබෙන ප්‍රධාන ක්‍රම තුනක් තිබෙනවා. පළමුවැනි එක, සංචාරක කර්මාන්තය. දෙවැනි එක, පිට රටවල ඉන්න ශ්‍රමිකයින්ගෙන් ලැබෙන ආදායම. තුන්වැනි එක, අපේ අපනයන ආදායම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 අවුරුද්දේදී සංචාරක ආදායම ගත්තාම, ඉතිහාසයේ පළමුවැනි වතාවට වැඩිම සංචාරකයින් පිරිසක් ලංකාවට එන ගමන්, වැඩිම සංචාරක ආදායම වන ඩොලර් බිලියන 3.2ක වාගේ ආදායමක් ලබා ගන්නත් අපි සමත් වනවා. ඒත් එක්කම විදේශ ශ්‍රමිකයින්ගෙන් ලැබෙන ආදායම විධියට ඩොලර් බිලියන 1.8ක වාගේ ප්‍රමාණයක් ලබා ගන්නත් අපට පුළුවන් වනවා. ඒ, ඉතිහාසයේ ලබා ගත් වැඩිම විදේශ ප්‍රේෂණ ප්‍රමාණය. ඊටත් අමතරව අපනයන ආදායම ගත්තාම ඩොලර් බිලියන 17.2ක වාගේ ඉහළ ප්‍රමාණයක් ලබා ගන්නත් අපි සමත් වනවා.

මේ දත්ත විශ්ලේෂණය කර බලනකොට අපිට පෙනෙනවා, අපනයන ආදායම කියන එක අපේ රටට විදේශ විනිමය ලබා ගන්න තිබෙන ප්‍රභව අතරින් ප්‍රධානම ප්‍රභවය බව. එතකොට ඒ සඳහා වන බාධා ඉවත් කර ගන්න රජය විධියට අපි කටයුතු කරන්න ඕනෑ. කාර්යක්ෂමව ඒ කටයුතු කරන ගමන්ම අපනයන ආදායම වැඩි කර ගන්නත් ඕනෑ. ඒක තමයි ප්‍රධානම ආදායම වන්නේ. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයන ආදායම වැඩි කර ගන්න පස් අවුරුදු අපනයන විවිධාංගීකරණ සැලැස්මක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ සැලසුම් එක්ක පසුගිය අවුරුදු එක්ක සංසන්දනය කරනකොට වඩාත් හොඳ අපනයන ආදායමක් ලබා ගන්න අපට හැකියාව ලැබිලා තිබෙනවා.

2024, 2025, 2026 කියන අවුරුදු තුනේ ලබා ගත් ජයග්‍රහණ මම ඉලක්කම් එක්ක කියන්නම්. එතකොට අපි ලබා ගත් ජයග්‍රහණ මෙතැනින් බලාගන්න පුළුවන්. සේවා අපනයනයෙන් ඩොලර් බිලියන 1.6කුත්, භාණ්ඩ අපනයනයෙන් ඩොලර් බිලියන 6.1කුත් විධියට අපට අපනයන ආදායම විධියට 2024 අවුරුද්දේ ලැබෙන්නේ ඩොලර් බිලියන 7.8යි. ඒ වාගේම 2025 අවුරුද්දේදී අපට හැකියාව ලැබෙනවා, සේවා අපනයන වෙනුවෙන් ඩොලර් බිලියන 1.8ක ආදායමක් උපයා ගන්නත්, භාණ්ඩ අපනයනය වෙනුවෙන් ඩොලර් බිලියන 6.4ක ආදායමක් උපයා ගන්නත්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Nishantha Jayaweera, you have four minutes left with two additional minutes.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ අනුව 2025 අවුරුද්දේදී සම්පූර්ණ භාණ්ඩ හා සේවා අපනයන ආදායම විධියට ඩොලර් බිලියන 8.2ක් ලබා ගන්න අපි සමත් වනවා. 2026 අවුරුද්දේ මේ දක්වා - පළමුවැනි මාස 6 ඇතුළේ - සේවා අපනයන ආදායම විධියට ඩොලර් බිලියන 1.9කුත්, භාණ්ඩ අපනයන ආදායම විධියට ඩොලර් බිලියන 7.1කුත් අපි උපයා ගන්නවා. ඒවායේ එකතුව ඩොලර් බිලියන 9ක් වනවා. ඒ කියන්නේ, 2025 අවුරුද්දේ පළමුවැනි මාස හයේදී අපි ලබාගත් අපනයන ආදායමට වැඩිය ඩොලර් මිලියන 664ක්, එහෙම නැත්නම් ඩොලර් බිලියන 0.6ක, එහෙමත් නැත්නම් ගිය අවුරුද්දේ පළමුවැනි මාස 6ට සාපේක්ෂව සියයට 7.9ක ප්‍රගතියක් ලබාගන්න රජයක් විධියට අපි මෙවර සමත් වනවා. රටක් විධියට අපි මෙන්න මේ ප්‍රගතිය ලබාගන්න සමත් වුණේ විශේෂයෙන්ම අභ්‍යන්තර සහ ගෝලීය වශයෙන් අර්බුදයන්ට මුහුණ දෙමිනුයි. ඒක තමයි විශේෂයෙන්ම අපි ලබපු ජයග්‍රහණය. මොකද අපි දන්නවා, "දිට්වා" සුළි කුණාටුව ඇති වූ වෙලාවේදී අපේ රටේ සමස්ත ආර්ථිකයම කඩා වැටීමකට ලක් වුණු බව. ඒ කඩා වැටීමකට ලක් වෙච්ච ආර්ථිකයට ආදායම් රැස් කිරීමෙන් අපි ලබා ගත් ජයග්‍රහණ තුළ යම් මුදලක් ඒ කියන්නේ, රුපියල් බිලියන 500ක මුදල් ප්‍රමාණයක් පොම්ප කරලා මේ ආර්ථිකය නඟාසිටුවන්න අපි සමත් වුණා. මෙන්න මේවායේ ප්‍රතිඵල විධියට තමයි අපි මේ ජයග්‍රහණ ලබාගන්න සමත් වන්නේ. ඊට අමතරව මැද පෙරදිග යුද්ධය අවස්ථාවේදී අපි අදාළ සහන දීලා කඩා වැටිච්ච ආර්ථිකය ගොඩනඟා ගැනීමට ගත් පියවරවල ප්‍රතිඵල විධියට තමයි මෙන්න මේ ජයග්‍රහණ ලබාගන්න සමත් වන්නේ.

තවත් සුවිශේෂී කාරණයක් මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ. විශේෂයෙන්ම ඇමෙරිකාව විසින් පනවපු සියයට 12.5ක

තීරු බද්ද සියයට 10කට අඩු කර ගැනීම තුළ අපේ අපනයන පංගුවෙන් විශාල ප්‍රමාණයකට - සියයට හතරෙන් එකකට වාගේ ප්‍රමාණයකට - දායක වන ඇමෙරිකාවට යන අපනයන වෙළෙඳ පොළ කඩාගෙන වැටෙන්නේ නැතුව ඒ අපනයන ආදායම රැකගෙන තවත් වැඩිදියුණු කරගන්න රටක් විධියට අපට හැකියාව ලැබෙනවා. ඊට අමතරව තවත් කාරණයක් තිබෙනවා.

විශේෂයෙන්ම බලහත්කාරයෙන් ශ්‍රමය යොදවා නිපදවන භාණ්ඩ අපනයනය කිරීමට අදාළ තහනම් නීති ගෙන ඒම තවත් සුවිශේෂී වැදගත්කමක් වනවා. මොකද, ඇමෙරිකාවෙන් පස්සේ දෙවැනි අපනයන ආදායම හම්බ වන්නේ අපි යුරෝපීය සංගමය වෙනුවෙන් කරන ඇඟලුම් ආශ්‍රිත නිෂ්පාදන වෙනුවෙන්. ඉදිරියේදී GSP Plus සහනය ලබා දෙනකොට මෙන්න මේ වාගේ නීතිමය කරුණු-කාරණා විශේෂයෙන්ම සලකා බැලීමකට ලක් වන බව අපට අනාවරණය වනවා. GSP Plus සහනය ලබා ගැනීමට ඒ කියන්නේ, අපනයන වෙළෙඳ පොළ තවත් වැඩිදියුණු කරගන්න ඒ සහනය ලබා ගැනීමට මේ නීතිමය සංශෝධන තුළ හැකියාව ලැබෙනවා. ඇත්තටම රටක් විධියට අපි ගන්න මේ තීන්දු-තීරණ ඇතුළෙදි එක පැත්තකින් දේශීය ආදායම් රැස් කිරීමේ යන්ත්‍රණය ශක්තිමත් කරන ගමන්ම විදේශ විනිමය රැස් කිරීමේ යන්ත්‍රණයත් ශක්තිමත් කර ගැනීම තමයි ඒවායේ ප්‍රධාන අරමුණ වන්නේ. රටක් විධියට ඒවාට මුහුණ දීලා ඒ ජයග්‍රහණ ලබාගන්න මේ වනකොට අපට හැකියාව ලැබිලා තිබෙන බව සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Member?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I am referring to Standing Order No. 141. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න, ස්ථාවර නියෝග 141 යටතේ පැහැදිලි කිරීමක් කරගන්න. මේක මගේ salary sheet එක. මට පැහැදිලිවම මේ රටට මේක කියන්න ඕනෑ. අපට Office Allowance කියලා Rs.100,000.00 දීලා තිබෙනවා. ඊට පස්සේ අපට Transport Allowance කියලා Rs. 15,000.00 දීලා තිබෙනවා. ඊට පස්සේ අපට Fuel Allowance කියලා දාලා තිබෙනවා, Rs. 244,000.00ක්. මට දැනගන්න ඕනෑ මේකයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is the point of Order there, Hon. Member? It is not a point of Order.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, Standing Order No. 141, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You can, first, sort it out with the Secretary-General's Office and then come back.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Let me explain, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Secretary-General's Office said you can sort it out with them. We are short of time, Hon. Member. The Hon. Ajith P. Perera is waiting to speak.

Hon. Ajith P. Perera, would you mind starting now? You have a total of 11 minutes. As requested by you, you can have five minutes now and six minutes, after lunch.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සහ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් අධිකරණ ඇමතිතුමා ඉතාම බරපතළ අසත්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළා. එතුමා සඳහන් කරන්නේ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විනිශ්චයකාරවරුන්ගේ ස්වාධීනත්වය සහ නීතිඥවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ නියෝජිතවරිය වැරදි කරුණු මත පදනම් වෙලා නිවේදනයක් නිකුත් කළා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 අගෝස්තු මාසයේ 07වැනි දා ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා වෙත Special Rapporteur එවා තිබෙන මේ ලිපිය ඉතාම වැදගත්. මම මේ රටේ මාධ්‍යවේදීන්, නීතිවේදීන්, සියලු වෘත්තිකයන් ඇතුළු සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, මේ ලිපිය අධ්‍යයනය කරන්න කියලා. මේක දේශපාලන ප්‍රකාශයක් නොවෙයි. අපි රටක් හැටියට එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට - ICCPR එකට - එකඟ වෙලා තිබෙනවා. මේ සම්මුතියේ 14. (1) වගන්තිය මඟින් දක්වා තිබෙනවා, අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව. අද දවස වනවිට ධුර දරන විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස වැඩි කිරීම, අපි එකඟ වෙලා තිබෙන, 1980දී අපි අත්සන් කරපු මේ එක්සත් ජාතීන්ගේ සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට පටහැනි බව ඉතාම පැහැදිලිව දක්වා තිබෙනවා.

අපේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XV වන පරිච්ඡේදයේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව ඍජුව සඳහන් වනවා. අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ පරිච්ඡේදයේ වගන්තියකට කොටසක් එකතු කළත්, වැඩි කළත්, අඩු කළත්, ඍජු වුණත්, වක්‍ර වුණත්, ඒ සියල්ල මඟින්ම අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑම් කරනවා. අකැමති විනිශ්චයකාරවරයෙක් ඉවත් කිරීම වැරදියි. ඒ වාගේම, කැමතියි කියලා ධුර දරන විනිශ්චයකාරවරයෙක් හෝ කණ්ඩායමක් වැඩි කල් තියා ගැනීමත් වැරදියි. වෙනස්කමක් කරනවා නම් පූර්ණ අධ්‍යයනයකින් යුතුව නිසි කරුණු සොයා බලා කළ යුතු බවත්, *ad hoc* කියලා අපි හඳුන්වන ක්ෂණිකව කරන ඒ ක්‍රමයට මේ සංශෝධන අරගෙන එන්න එපා කියාත් තමයි අපි කියන්නේ.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ඒ වාගේම දැන් අපේ අධිකරණ ඇමතිතුමා කියනවා, එතුමාට මේ ලිපිය එව්වේ නැහැ කියලා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විනිශ්චයකාරවරුන්ගේ ස්වාධීනත්වය සහ නීතිඥවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ නියෝජිතවරිය ජනාධිපතිතුමාට එවලා, ජනාධිපතිතුමා අධිකරණ ඇමතිට එම ලිපිය දුන්නේ නැත්නම් මොකක්ද ඒකේ තේරුම? අපි දැනගෙන හිටපු විධියටම අධිකරණ ඇමතිතුමා මේ වැඩේ දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට මාසයකට විතර කලින් විපක්ෂ නායකතුමා මේ පාර්ලිමේන්තුවේදී "මෙවැනි සංශෝධනයක් අරගෙන එනවාද?" කියලා අහනකොට, "මම එහෙම එකක් දන්නේ නැහැ" කියලා උදේ 11.00ට කියපු අධිකරණ ඇමතිවරයා, මේ. හවස ඇවිල්ලා, "ඔව්, ඔව්, එහෙම එකක් සාකච්ඡා වෙමින් තිබෙනවා" කියලා නැවත වරක් කිව්වා. ඒකට හේතුව තමයි, මේ හැම දෙයම සිද්ධ වෙන්නේ පැලවත්තෙන් මිසක් අධිකරණ අමාත්‍යාංශයෙන් නොවීම.

මේ කැබිනට් පත්‍රිකාව සඳුදා සම්මත වුණේ. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඉරිදා පත්තරේට සිකුරාදා හවස කියනවා, "මම එහෙම දෙයක් දන්නේ නැහැ" කියලා. අධිකරණ ඇමතිවරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, "මම එහෙම එකක් දන්නේ නැහැ" කියලා. මේ, එහෙම අධිකරණ ඇමතිවරයෙක් නේ. මේ අධිකරණ ඇමතිවරයා කියනවා, අනෙක් අයව නොමඟ යවලා කියලා. කාවද නොමඟ යවන්නේ? මහානායක ස්වාමීන් වහන්සේලා නොමඟ යවලා, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විනිශ්චයකාරවරුන්ගේ ස්වාධීනත්වය සහ නීතිඥවරුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ නියෝජිතවරිය නොමඟ යවලා, ලෝකයේ විනිසුරුවරුන්ගේ ජාත්‍යන්තර සංගමය නොමඟ යවලා, එංගලන්ත සභාව නොමඟ යවලා? මොකක් ගැනද නොමඟ යැව්වේ? මම එතුමාට අභියෝග කරනවා, ඔබතුමා දැන් හරි මොකක් ගැනද නොමඟ යවලා තිබෙන්නේ කියලා පාර්ලිමේන්තුවට කියන්න කියලා. නොමඟ යවන්න කිසි දෙයක් නැහැ. ධුර දරන විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස වැඩි කරනවා නම්, ඒක අපි එකඟ වෙලා තිබෙන ICCPR සම්මුතියේ 14 (1) වගන්තියට පටහැනියි. එච්චරයි. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිවරයා වෙත Special Rapporteur එවා තිබෙන මේ ලිපියේ තවත් වැදගත් දෙයක් සඳහන් කරනවා. මම ඒක උපුටා දක්වන්න කැමතියි.

> "In light of the foregoing, I respectfully recommend that any proposed amendment to the judicial retirement age be pursued through a transparent, inclusive, impartial, consultative and comprehensive justice reform process."

ඒ කියන්නේ, මේ පිළිබඳව සංවාද කරන්න, සාකච්ඡා කරන්න, විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන්න කියන එකයි. අද අධිකරණ ඇමතිතුමා කිව්වා, මේ ගැන අපි හොයා බැලුවා කියලා. මොන සාකච්ඡාවක්ද ඒ වෙනුවෙන් තිබුණේ? මොන විනිශ්චයකාරවරයාත් එක්කද සාකච්ඡා කළේ? ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුත් එක්ක කිසිම සාකච්ඡාවක් කළේ නැහැ කියන එක මම වගකීමෙන් කියනවා. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුත් එක්ක කිසිම සාකච්ඡාවක් කළේ නැහැ. අධිකරණ සේවා නිලධාරින්ගේ සංගමය සමඟ කිසිම සාකච්ඡාවක් කළේ නැහැ. මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංගමය සමඟ කිසිම සාකච්ඡාවක් කළේ නැහැ. ශ්‍රී ලංකා නීතිඥ සංගමය සමඟ කිසිම සාකච්ඡාවක් කළේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, your first five miniutes is up. You may continue after lunch.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ ජාත්‍යන්තර විවේචන එල්ල වෙන්නේ මෙවැනි ව්‍යවස්ථා සංශෝධනයකදී අනුගමනය කළ යුතු නිසි ක්‍රියාමාර්ග නොගෙන ඇති නිසා. ලෝක ධර්මයට, ආචාර ධර්මවලට සහ මානව හිමිකම් පිළිබඳ ප්‍රමිතීන්ට අනුකූල නොවන නිසා. ඒ නිසා, "අපි තමයි ඔක්කෝම දන්නේ" කියලා මේ රටේ ජනතාව රවටන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවා ආහාර විවේකය සඳහා සභාවේ වැඩකටයුතු අත්හිටුවන නිසා, මගේ කථාවේ පළමු වාරය අවසන් කරන්න කලින් මම මේ කාරණයත් කියන්න කැමතියි. අද දවස ඉතා වැදගත් දවසක්. අද දවස එසේ වැදගත් වෙන්නේ මේ නිසා. මේ රටේ ඉතිහාසය ගත්තාම, 1987.08.18වැනි දා තමයි මේ පාර්ලිමේන්තුවට ග්‍රෙනේඩ් ප්‍රහාරයක් එල්ල කළේ. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු වුණු කීර්ති අබේවික්‍රම මැතිතුමාව මරපු, මේ පාර්ලිමේන්තුවේ සේවකයෙකු මරපු, ඒ වාගේම ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාට බරපතළ තුවාල කරපු, පර්සි සමරවීර මැතිතුමාට බරපතළ තුවාල කරපු ඒ බෝම්බ ප්‍රහාරය එල්ල කරපු පක්ෂය තමයි අද බලයේ ඉන්නේ. එදා මේ පාර්ලිමේන්තුවට ග්‍රෙනේඩ් ගැහුවා. මේ රටේ අධිකරණය කියන්නේ අවුරුදු 200කට වඩා ස්වාධීනත්වය ආරක්ෂා කර ගත් තැනක්. ඒ ස්වාධීන අධිකරණයට අද ගහන මේ බෝම්බයේ ප්‍රතිඵල භුක්ති විඳින්න වෙන්නේ තව අවුරුදු ගණනකින් කියන එක ඒකට අත ඔසවන්න යන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මම මතක් කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***
*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, you have your remaining six minutes to speak.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ආර්ථිකය ගොඩ නඟන්න රටේ නීතියේ ආධිපත්‍යය තිබෙන්න ඕනෑ. ආර්ථිකය පිළිබඳව සිදුකරන මේ විවාදයේදී අමතක කරන්න බැරි, වැදගත්ම හරය පිළිබඳ කාරණය තමයි ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය තිබෙනවාද, ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය තහවුරු වෙනවාද, අනාගතයේදී දේශීය සහ විදේශීය ආයෝජකයන් මේ රටට ආකර්ෂණය වන වාතාවරණයක් රට තුළ ඇති වෙනවාද කියන එක. අද කවුරුත් හඳුනාගෙන තිබෙනවා, අපේ රටේ නීතියේ

තිබෙන දුර්වලතා නිසා, නීතිය ක්‍රියාත්මක වීමේ දුර්වලතා නිසා බොහෝ ආයෝජකයන් ශ්‍රී ලංකාවට පැමිණීමට මැළි වෙනවා කියලා.

අද ඉදිරිපත් කර තිබෙන විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත, එක පැත්තකින් අර්ථ ශූන්‍ය එකක්. ඒකට හේතුව තමයි අපේ රටේ තිබෙන නඩුවලින් - එකොළොස් ලක්ෂයකට ආසන්න නඩු ප්‍රමාණයක් තිබෙන බව තමයි අද අධිකරණ ඇමතිතුමා කිව්වේ- හරියටම සියයට 95ක් තිබෙන්නේ, මහෙස්ත්‍රාත් අධිකරණයේ සහ දිසා අධිකරණයේ වීම. මහෙස්ත්‍රාත්වරයෙක් කවදාවත් වයස අවුරුදු 60දී විශ්‍රාම ගිහිල්ලා නැහැ. මහෙස්ත්‍රාත්වරු එක්කෝ, වයස අවුරුදු 45, 47, 50 වෙනකොට උසස්වීම් ලබනවා. නැත්නම් වෙනත් රස්සාවකට යනවා. මේ රටේ මහෙස්ත්‍රාත්වරයෙක් වශයෙන් පත්වෙන කිසිම කෙනෙක් වයස අවුරුදු 60දී විශ්‍රාම ගියේ නැහැ. නීතිඥ වෘත්තියේ 34වැනි අවුරුද්ද සැපිරෙන මම ඒක දන්නවා. ඒක, අධිකරණ ඇමතිතුමා නොදැන ඉන්න හේතුවක් නැහැ; ගරු ජනාධිපතිතුමා නොදැන ඉන්න හේතුවක් නැහැ. ඒ වාගේම දිසා අධිකරණයෙන්, දිසා විනිසුරුවරයකු හැටියට කෙනෙක් විශ්‍රාම යන්නේත් ඉතාම කලාතුරකින්. එහෙම විශ්‍රාම යන්නේ, එක්කෝ හුඟක් පහුවෙලා වෘත්තියට ආපු කෙනෙක්, එහෙම නැත්නම් ඉතා සුවිශේෂ විනය කාරණාවක් නිසා රඳිලා ඉන්න කෙනෙක්. ඒ නිසා කලින් තිබුණු විශ්‍රාම යැමේ වයස - අවුරුදු 60 - යෝජිත අධිකරණ සංවිධාන පනත මඟින් අවුරුදු 62 කළාය කියලා නඩු අහන එක වේගවත් වෙන්නේ නැහැ. කොහොමත් ඒ හිස්තැන පුරවන්න තව විනිශ්චයකාරවරයෙක් එනවා.

මේ සාකච්ඡාව තුළ දිගින් දිගටම කිව්වා, මහෙස්ත්‍රාත්වරු වශයෙන් බඳවා ගැනීමේදී ගැටලුවක් තිබෙනවා කියලා. එහෙම එකක් නැහැ. මහෙස්ත්‍රාත්වරු වශයෙන් වැඩ කරන්න පළපුරුද්ද තිබෙන, අත්දැකීම් තිබෙන, මූලික සුදුසුකම් තිබෙන විශාල පිරිසක් අයදුම් කරනවා. ඒ අය රඳවා ගන්න අවශ්‍ය වාතාවරණය සකස් කරන එක ආණ්ඩුවේ වැඩක්. රාජ්‍ය සේවයේ වැටුප් අඩු නිසා, වරප්‍රසාද අඩු නිසා සමහර වෙලාවට - නීතිපති දෙපාර්තමේන්තුවේ කෙනෙක් වෙන්න පුළුවන්, මහෙස්ත්‍රාත්වරයෙක් වෙන්න පුළුවන්- එම තැනැත්තා ඒ රැකියාවෙන් ඉවත්වෙලා යනවා. ඒක වළක්වා ගන්න ඕනෑ. එහෙම නැතුව විශ්‍රාම යැමේ වයස අවුරුදු 62 කළා කියලා මේ රටේ නඩුවලින් සියයට 95ක් තිබෙන මහෙස්ත්‍රාත් අධිකරණයේ හෝ දිසා අධිකරණයේ නඩු ඉක්මන් වෙන්නේ නැහැ. පානදුර දිසා අධිකරණයේ තිබෙන බෙදුම් නඩුවක්, දිසා විනිසුරුතුමාගේ විශ්‍රාම යන වයස අවුරුදු 62 කළාය කියලා ඉක්මන් වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ත්‍රිකුණාමලයේ මහෙස්ත්‍රාත් අධිකරණයේ තිබෙන අපරාධ නඩුවක්, මහෙස්ත්‍රාත්තුමාගේ විශ්‍රාම යැමේ වයස අවුරුදු 62 කළාය කියලා ඉක්මන් වෙන්නේ නැහැ.

එදා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිතුමා, ගරු ජනාධිපතිතුමාට තේරෙන භාෂාවෙන් විනීත විධියට මේක තේරුම් කරලා දුන්නා. හැබැයි, ජනාධිපතිතුමා ඒකට පිළිතුරු දුන්නේ නැහැ. වැදගත් ප්‍රශ්න කිසිවකට පිළිතුරු දුන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ, එක් පුද්ගලයෙක් ආරක්ෂා කරගන්නයි; එක් පුද්ගලයෙක් තබා ගන්නයි. 2026 දෙසැම්බර් මාසයේ 01වැනි දා විශ්‍රාම යන වර්තමාන අග්‍ර විනිශ්චයකාරතුමා හොඳයි, එතුමා නියමයි, එතුමාගේ වැඩ හොඳයි කියලා එතුමා ආරක්ෂා කරගන්න තමයි මේ අදහස ඔළුවට ආවේ. ඊට පස්සේ ඒක ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු ඔක්කෝටම දෙන්න කල්පනා කළා. මොකද, නැත්නම් ලෝකය ඉස්සරහට මේ කාරණය අරගෙන යන්න බැරිවෙන නිසා. ඊට පස්සේ කිව්වා, අභියාචනාධිකරණයේ සියලු විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ වයස දීර්ඝ කරනවා කියලා. අන්තිමට ශ්‍රී ලංකාවේ මහෙස්ත්‍රාත්වරුන්ගෙන් සහ දිසා විනිසුරුවරුන්ගෙන් සමන්විත අධිකරණ සේවා නිලධාරින්ගේ සංගමය මේකට විරෝධය පළ කරලා විශේෂ රැස්වීමක් කැඳෙව්වාම, ඒ නිලධාරින් සතුටු කරන්න තමයි කිව්වේ, "අපි ඔක්කෝගේම විශ්‍රාම යැමේ වයස දීර්ඝ කරනවා" කියලා. මහෙස්ත්‍රාත්වරුන්ගෙන් සහ දිසා විනිසුරුවරුන්ගෙන් සමන්විත අධිකරණ සේවා නිලධාරින්ගේ සංගමය ඒකමතිකව තීන්දු කරලා කිව්වා, මෙය අපට එපා, මේක වැරදියි, මේක කරන්න එපා, අධිකරණ පද්ධතියේ දියුණුව උදෙසා සහ කාර්යක්ෂමතාව උදෙසා කිසිම අධිකරණයක විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස ඉහළ දැමීම අවශ්‍ය දෙයක් නොවෙයි කියලා.

මම ගරු ජනාධිපතිතුමාට කියනවා, ඔබතුමා එක් විනිශ්චයකාරවරයෙක් මත විශ්වාසය තැබුවොත්, අර ඔබතුමා කියපු අවදානම ඔබතුමාට පෞද්ගලිකව නොවෙයි, රටටයි එන්නේ කියලා. අපේ රටේ අධිකරණ පද්ධතිය තනි පුද්ගලයෙක් මත විශ්වාසය තැබිය යුතු තරම් දුර්වල පද්ධතියක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ රටේ අග්‍ර විනිශ්චයකාර තනතුර දරන්න සුදුසු තවත් බොහෝදෙනෙක් සිටිනවා. ජ්‍යෙෂ්ඨත්වයෙන් ඉන්න ඊළඟ කෙනා ගැන එතුමාට සතුටක් නැත්නම් වෙන කෙනෙක් යෝජනා කරන්න පුළුවන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒ ගැන සලකා බලයි. ජාතික විගණන කාර්යාලයේ පුරප්පාඩුව ඇති වුණාම ජ්‍යෙෂ්ඨත්වයේ ඊළඟට ඉන්න කෙනා පත් නොකර විකාර ගොඩක් කළා නේ. කැලණිය විශ්වවිද්‍යාලයේ තමන්ගේ යාළුවෝ, එකට දේශපාලනය කරපු අයගේ නම් යෝජනා කළා නේ. හැබැයි, අන්තිමට ජාතික විගණන කාර්යාලයේ ඊළඟට ජ්‍යෙෂ්ඨත්වයෙන් දෙවැනියාගේ නම යෝජනා කළාම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒ නම අනුමත කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මට ගරු ජනාධිපතිතුමාට කියන්න තිබෙන්නේ මෙච්චරයි. වර්තමාන අග්‍ර විනිශ්චයකාර සුරසේන මැතිතුමා කොච්චර හොඳ වුණත්, එතුමාට විශ්‍රාම අරගෙන යන්න දෙන්න. කැමැති කෙනෙක් අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් කරන්න. මේ රටේ විනිශ්චයකාරවරුන්ගේ හිඟයක් නැහැ. එතුමා තර්කයක් ඉදිරිපත් කළා, පාස්කු ප්‍රහාරය සම්බන්ධ නඩු විභාගය අන්තිම අවස්ථාවේ තිබෙන නිසා ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරතුමා ඒ නඩුව අහන නිසා අභියාචනාධිකරණ පත්වීම් ප්‍රමාද කරනවා කියලා. ඇයි, ශ්‍රේෂ්ඨාධිකරණයේ පත්වීම් ප්‍රමාද කරන්නේ? අධිකරණයේ පහළින්ම ආපු විශිෂ්ටතම විනිශ්චයකාරවරයෙක් තමයි ගනේපොල විනිශ්චයකාරතුමා. එතුමාට අභියාචනාධිකරණයෙන් විශ්‍රාම යන්න දුන්නා, ශ්‍රේෂ්ඨාධිකරණයට පත් නොකර. මොකක්ද, ඒකට ගෙනෙන තර්කය? ඒ පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිතුමා ඇහුවාම උත්තර දුන්නේ නැහැ. අවදානම් ගන්න මම කැමැතියි, දාලා යන්න මම කැමැතියි කියලා ජනාධිපතිතුමා කියනවා. මොකක්ද දාලා යන්නේ? ඔබතුමා පත් කළේ අවුරුදු 5කට. ඔබතුමා මොකටද අවුරුදු 5කට කලින් දාලා යන්නේ? දාලා යන වැඩ කරන්න ඕනෑ ද? අවදානම් සහිත වැඩ කරන්නේ නිසි අධ්‍යයනයක් නැති වුණාම සහ දවසින් දවස, පැයෙන් පැය, සතියෙන් සතිය ප්‍රතිපත්ති වෙනස් කරන නිසා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රටට ආදරෙයි; අධිකරණ පද්ධතියට ආදරෙයි; නීතිඥ වෘත්තියට ආදරෙයි. අපේ ජීවිත ගොඩනැඟිලා තිබෙන්නේ මේ රටේ මිනිස්සුන්ගේ ගැටලු සමඟ ගැටිලා, ඒ අය සමඟ ජීවත් වෙලා. අපේ දේශපාලන ජීවිත ගොඩනැඟිලා තිබෙන්නේ ඒ අයගෙන් ලැබුණු ප්‍රශංසා සහ ඒ අයගෙන් ලැබුණු අගය කිරීම් මත. සාමාන්‍ය ගම්වලින් ආවේ ජනාධිපතිතුමා විතරක් නොවෙයි. අපිත් ආවේ ගම්වලින්. අපිත් පුංචි තැන්වලින් ආපු මිනිස්සු. අපිත් ශිෂ්‍යත්ව විභාගය පාස් වෙලා කොළඹට ඇවිල්ලා ඉගෙනගෙන, විශ්වවිද්‍යාලයට ගිහිල්ලා, නීති

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

විද්‍යාලයට ගිහිල්ලා මෙතැනට ආපු මිනිස්සු. ඒ නිසා ජනාධිපතිතුමාට වාගේම අපටත් ඒ අයිතිය තිබෙනවා; ඒ හැඟීම තිබෙනවා. පුංචි මිනිස්සු මේ රටේ ඉහළ තැන්වල ඉන්න එක ගැන අපට සතුටුයි. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ පුංචි මිනිස්සුන්ගේ ආණ්ඩුවක් හදන්න ඕනෑ නම්, මේ රටේ පුංචි මිනිස්සුන්ගේ පාලනයක් අරගෙන එන්න ඕනෑ නම්, මේ රටේ පුංචි මිනිස්සු අධිකරණවල දුක් විඳින එක වළක්වන්න ඕනෑ නම් ඒ සඳහා කළ යුතු බොහෝ දේ තිබෙනවා. නමුත් අවුරුදු 2ක් ගත වෙලාත් ඒ කිසි දෙයක් කළේ නැහැ. බන්ධනාගාර ප්‍රශ්න විසඳුවේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ajith P. Perera, your time is up.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම කථාව ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

නීති සම්පාදනය පිළිබඳ ගත්තොත්, ප්‍රධාන නීති එකක්වත් අලුතින් අරගෙන ආවේ නැහැ. හැදුව පරණ නීති, අපි පටන් ගත් ඒවා අරගෙන ඇවිල්ලා අනුමත කරගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එසේ තිබියදී අර්ථයක් නැති, වැඩක් නැති, නඩු ඉක්මන් වීමට කිසිම සම්බන්ධයක් නැති මේ යෝජනා මාලාව මඟින් මේ රට ලෝකයේ ආපස්සට අරගෙන යනවා. එක්සත් ජාතීන්ගේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ Special Rapporteur කියනවා, මේ පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට වාර්තා කරනවා, ඔබගේ ප්‍රතිචාර එවන්න කියලා. සතියක් ගත වුණා. අද වෙනකල් ප්‍රතිචාර යැව්වේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙබ් අඩවියට ගිහිල්ලා බලන්න. ඔබතුමාත් මෙය දැන ගැනීම වැදගත්. එතුමිය කියනවා, "ආණ්ඩුවේ ප්‍රතිචාර පැය 48ක් ඇතුළත මම වෙබ් අඩවියේ දානවා. ආණ්ඩුවේ ප්‍රතිචාර ද සමඟ මම මේ පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට වාර්තා කරනවා" කියලා. මෙය සරල දෙයක් නොවෙයි. "සැක පිට, ඇප පිට ඉන්න අය මේකට විරුද්ධයි" කියන සරල තර්කවලින් මෙය වහන්න බැහැ. අපට තිබෙනවා ද නඩු? අපි ඉන්නේ සැක පිට ද, ඇප පිට ද? එක්සත් ජාතීන්ගේ Special Rapporteur ඉන්නේ ඇප පිටද? එතුමියට නඩු තිබෙනවාද? මහා නායක ස්වාමීන් වහන්සේලා ඉන්නේ ඇප පිට ද? උන් වහන්සේලාට නඩු තිබෙනවාද? නැහැ. මේවා ගැන කථා කරන සාවිත්‍රි ගුණසේකර ඉන්නේ ඇප පිට ද? නැහැ. මේවා ගැන කථා කරන සාලිය පීරිස් ඉන්නේ ඇප පිට ද, සැක පිටද? නැහැ. මේවා ගැන අවංකව කථා කරන මිනිසුන්ගේ අදහස් විමසලා, කරුණාකර මේ අන්තිම මොහොතේ හෝ මෙම යෝජනාව අස් කර ගන්න කියලායි අපි යෝජනා කරන්නේ, අපි රටට ආදරය නිසා.

ස්තුතියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, you explained to me that it concerns some disparity in tax cuts for doctors and Parliamentarians.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Yes, Sir. Can I have 30 seconds?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I shall produce your concern to the Director (Finance) of the Parliament.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Okay. Sir, can I explain this in 30 seconds?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I got your explanation, Hon. Member.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, give me only 15 seconds.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, 15 seconds.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Give me 30 seconds. Sir, you refer to Standing Order No. 141.

Total net salary එකට තමයි රාජකාරි කරන අනෙක් හැම කෙනාගේම tax කැපෙන්නේ. මම accountant එක්ක කථා කරලා ඒක confirm කර ගත්තා. හැබැයි, අපේ Parliamentariansලාට කැපෙන්නේ gross salary එකට. මගේ gross salary එක 484,000යි. Tax එකට 11,000යි කැපෙන්නේ. මගේ quartersවලට කැපෙන්නේ 2,000යි. කොළඹින් 2,000ක කුලියට ගෙයක් ගන්න බැහැ නේ. Speakerට කියන්න අපට උත්තර දෙන්න කියලා. Hospitalsවල doctorsලා ඔක්කෝම රස්සාව දාලා යනවා. මේක මගේ ප්‍රශ්නක් නොවෙයි. මෙතැන ඉන්නවා, නියෝජ්‍ය සෞඛ්‍ය ඇමති - Deputy Minister. අපට tax කැපෙන්නේ gross salary එකට. මම දැන් අපේ පේරාදෙනියේ Hospital එකේ accountantගෙන් confirm කර ගත්තා. Sir, අපේ tax කැපෙන්නේ gross salary එකට. Office allowance කියලා 100,000 තිබුණොත් ඒකටත් tax කැපෙනවා. Doctorsලාට දෙනවා DAT allowance එකක්. ඒකටත් tax කැපෙනවා. Directorsලාට වාහන තිබෙනවා නම් ඒකට පොඩ්ඩක් අඩු කරලා

Inland revenue Department එකෙන් දීලා තිබෙන chart එකට අනුව කපනවා. ඇයි, MPsලාට 11,000ක් කපන්නේ කියන එකට උත්තර දෙන්න කියන්න.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Ramanathan Archchuna, your concern has been noted. It will be referred to the Director (Finance).

Next, the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. You have 10 minutes and the Floor is yours.

[අ.භා. 1.11]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද උදේ මෙතැන තිබුණු කලබලයේ හැටියට මම හිතුවා විපක්ෂය අද දවසේම බෝඩ් ලෑලි උස්සාගෙන ඉඳීවි කියලා. නමුත්, දැන් ගරු සභාවේ විපක්ෂයේ ඇත්තටම ඉන්නේ මන්ත්‍රීවරු හතර පස්දෙනකු පමණයි. *[බාධා කිරීම්]* ඒ ගැන කනගාටුයි. මම බලාපොරොත්තු වුණා මීට වඩා ලොකු සද්දයක් එයි කියලා. කමක් නැහැ.

කොහොම වුණත්, මට කලින් කථා කළ ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතවරියගේ ලිපිය ගැන සඳහන් කළ නිසා මට හිතුණා, අද මාතෘකාවට යන්න කලින් ඒකට කෙටි ප්‍රතිචාරයක් දක්වන්න ඕනෑ කියලා. එතුමියගේ ලිපිය ලැබුණු තොරතුරු අනුව දීපු එකක් නොවෙයි කියලා එතුමා argue කළා. එතුමියගේ ලිපියේ තිබෙන ඇතැම් කාරණා මම quote කරන්න කැමැතියි.

> "…I would like to bring to the attention of your Excellency's Government information I have received concerning the reported proposal..."

එතුමිය හැම තැනම කියනවා, "මට ලැබුණු තොරතුරු" කියලා. ඒ වාගේම එතුමිය මෙසේ ද සඳහන් කරනවා:

> "... the mandatory retirement age would be extended to sixty-seven years for Supreme Court judges and sixty-five years for Court of Appeal judges."

ඒ නිසා තමයි අප සඳහන් කළේ, Cabinet Paper එක එන්න කලින් තමයි එතුමිය මේ ලිපිය යොමු කරලා තිබෙන්නේ කියලා. ඒ වාගේම, ඒ වන විට මාධ්‍යයේ හුවමාරු වෙලා තිබුණු තොරතුරු අනුවයි. උදෑසන අපේ ගරු අධිකරණ ඇමතිතුමා කියපු විධියට ගරු මහා නායක හිමිවරුන්ටත් දීලා තිබෙන තොරතුර තමයි, මේක Supreme Court and Court of Appeal judgesලාට විතරක් අදාළ වන යෝජනාවක් කියන එක.

එතුමිය පැහැදිලිව concerns ටිකක් මෙසේ සඳහන් කර තිබෙනවා:

> "…I do not intend to undertake an exhaustive assessment of the proposed amendment."

And also states, I quote;

> "Instead, I respectfully invite clarification on the measures taken…"

එසේ කියලා කාරණා ටිකක් සඳහන් කරලා තිබෙනවා. They include, any further information, any additional information and/or comments, information on the rationale and objective, information on the safeguards in place, information on any consultations, the potential impact of the proposed amendment and whether the Government intends to pursue broader and comprehensive constitutional or justice-sector reforms. එතුමියගේ එම ලිපියට Government එක පැහැදිලිව උත්තර යවනවා; the Government will respond to the letter in due course. And, I also oppose the misinterpretation of the letter in order to achieve their own personal, political agendas. Rather, we, the Government, would like to take this as an opportunity to broadly engage with the United Nations according to our international obligations. ඒ කාරණය ගැන මා සඳහන් කරන්නේ එපමණයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාද කරන රෙගුලාසි ගැන කථා කළොත්, ඇත්තටම මම දන්නේ නැහැ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් ඉතා වැදගත් වූ මෙම රෙගුලාසි ටික කියවලාවත් තිබෙනවාද කියලා. අද අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙන්නේ, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි. මෙම රෙගුලාසි, බලහත්කාරී ශ්‍රමය අපේ රටේ වෙළෙඳාම තුළට එන එක වළක්වන්න ගෙන ආ ඉතාම වැදගත් සහ කාලෝචිත එකක්. එහිදී සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් බලහත්කාරී ශ්‍රමය යොදවා කැණීම් කරන ලද, නිෂ්පාදනය කරන ලද හෝ නිමවන ලද භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කිරීම අපි තහනම් කරනවා. ඒ වාගේම, එම රෙගුලාසිවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන වග කිව යුතු නියාමන බලධාරියා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස නම් කරනවා. බලහත්කාර ශ්‍රමයෙන් කැණීම් කරන ලද, එහෙම නැත්නම් නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හෝ එම භාණ්ඩ සඳහා වන අමුද්‍රව්‍ය ලංකාවට ගෙන ඒම මෙමඟින් තහනම් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර කම්කරු සංවිධානය බලහත්කාරී ශ්‍රමය පිළිබඳ අර්ථ නිරූපණය කරන්නේ 1930 වාගේ ඈත කාලයේ, අංක 29 කියන සම්මුතියේදීයි. ILO එක අනුව නම් බලහත්කාරී ශ්‍රමය කියන්නේ, කිසියම් දඬුවමක තර්ජනයක් යටතේ - menace of any penalty - ලබා ගන්නා, එහෙම නැත්නම් ස්වේච්ඡාවෙන් හෙවත් ස්ව කැමැත්තෙන් තොරව - lack of voluntary consent - ලබා ගන්නා කිසියම් වැඩක් හෝ සේවාවක්. එය ශාරීරික හිංසනය වෙන්න පුළුවන්, සිරගත කිරීමක් වෙන්න පුළුවන්, වැටුප් රඳවා ගැනීමක් වෙන්න පුළුවන්, රාජ්‍ය ගමන් බලපත්‍රය හෝ ජාතික හැඳුනුම්පත රඳවා ගැනීමක් වෙන්න පුළුවන්, රැකියාව ප්‍රතික්ෂේප කිරීමට සේවකයාට අයිතියක් නොමැති වීම වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ළමා ශ්‍රමය වෙන්නත් පුළුවන්. මෙවැනි විවිධාකාරයේ බලහත්කාරී ශ්‍රමය භාවිත කර කරනු ලබන නිෂ්පාදන මෙයින් අදහස් වෙනවා. ඇත්තටම, අපි ආඩම්බරයෙන් කියන්න ඕනෑ අපේ රට එවැනි නිෂ්පාදන සිදු කරන රටක් ලෙස කොහේවත් වාර්තා වෙලා නැති බව. මොකද, අපේ රටේ ඉතාම හොඳ, ශක්තිමත් කම්කරු නීති පවතිනවා. ඒ වාගේම අප යම්කිසි දෙයක් නිෂ්පාදනය කරනවා නම්, ඒ සඳහා අප ගෙන්වන මූලද්‍රව්‍ය - අමුද්‍රව්‍ය - එලෙස බලහත්කාරී ශ්‍රමය යොදා නොගත් ඒවා බවටත් අපි මේ යටතේ තහවුරු කරනවා. මේක 1930 තීරු බදු පනත හැටියට ඇමෙරිකාවේ ක්‍රියාත්මක වුණා. එහිදී සමහර රටවල් යම් යම් ආකාරයට බලහත්කාරී ශ්‍රමය යොදා ගෙන නිෂ්පාදන සිදු

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

කරන බව හඳුනා ගත්තා. ඇමෙරිකා එක්සත් ජනපදය පවා ඒ කාලයේ දේශීය නිෂ්පාදනයට demand එක - ඒ කියන්නේ consumptive demand එක - fulfil කරන්න බැරි අවස්ථාවලදී බලහත්කාරී ශ්‍රමය පාවිච්චි කරපු අමුද්‍රව්‍ය ගෙන්නුවා. නමුත්, යම්කිසි කාලයක් යනකොට කම්කරු නීති ප්‍රතිසංස්කරණ, ගෝලීය ප්‍රතිසංස්කරණ එක්ක මෙය ඉතාම පුළුල් වශයෙන් ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමේ වගකීම අරගෙන තිබෙනවා. 2020දී එක්සත් ජනපදය, මෙක්සිකෝව සහ කැනඩාව එකතු වෙලා ගිවිසුමකට එළැඹුණා. එහිදී නෛතික රාමුවක් ස්ථාපනය කර ගත්තා. ඒ වාගේම 2024දී ඉතා වැදගත් සංවර්ධනයක් වුණා, අන්තර්ජාතික නීතියේ. ඒ තමයි, යුරෝපා පාර්ලිමේන්තුව විසින් යුරෝපා සංගමයේ බලහත්කාරී කම්කරු ශ්‍රමය පිළිබඳ රෙගුලාසිය - Forced Labour Regulation - සම්මත කර ගැනීම. එහිදී ලෝකයේ ඕනෑම තැනක බලහත්කාරී ශ්‍රමය පාවිච්චි කරලා නිෂ්පාදනය කරන භාණ්ඩ යුරෝපා සංගමයේ වෙළෙඳ පොළට ඇතුළත් කිරීම තහනම් කිරීමේ නීතියක් සම්පාදනය වුණා. ඇත්තටම, එහිදී කිසිදු රටක් ඉලක්ක කර ගත්තේ නැහැ. නමුත්, සාක්ෂි පදනම් කර ගත්තු විමර්ශන ඇසුරෙන්, කිසියම් රටක් බලහත්කාරී ශ්‍රමය හෝ ළමා ශ්‍රමය පාවිච්චි කරනවා කියලා දන්නවා නම්, ඒ රට නිෂ්පාදනය කරන භාණ්ඩ නොගෙන්වා සිටීමේ නීති සම්පාදනයට යුරෝපා සංගමය මේ වන විට මැදිහත් වෙලා තිබෙනවා. ඒ වාගේම යුරෝපා සංගමයට අපනයනය කරන භාණ්ඩවල නිෂ්පාදන මූලාශ්‍රය සහ ඒවා නිෂ්පාදනය වන්නේ කෙසේද කියන එක පිළිබඳ විනිවිදභාවයෙන් යුතු - transparent - ප්‍රකාශනයක් කරන්න ඒ රටවල් බැඳිලා ඉන්නවා. 2027 සිට මෙය අනිවාර්ය යන්ත්‍රණයක් ලෙස නීතිමය රෙගුලාසියක් යටතේ ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා මේ අවස්ථාවේ අප විසින් සම්මත කරනු ලබන මේ නීතිය ගෝලීය වශයෙන් ගත්තත්, ශක්තිමත් කම්කරු නීති ක්‍රියාත්මක වන, ආචාරධාර්මික - ethical - ශ්‍රමය පිළිබඳ වගකීම් දරන රටක් බව ලෝකයට කියාපාන ඉතා වැදගත් දර්ශකයක් යැයි අපි හිතනවා.

කැමැත්තක් නොමැතිව, බලහත්කාරී ලෙස ශ්‍රමය ලබා ගන්නවාද කියන එක සම්බන්ධයෙන් ILO එක විසින් ප්‍රධාන දර්ශක 3ක් හඳුන්වා දී තිබෙනවා. එකක් තමයි, අකමැත්තෙන් සේවයට බැඳීම හෝ රැඳී සිටීම. ඒ කියන්නේ, සේවකයකුගේ vulnerability එක abuse කිරීම, එහෙම නැත්නම් රැවටීමට ලක් කරලා හෝ ණය ගෙවීම සඳහා සේවකයකුගේ ශ්‍රමය ලබා ගැනීම ආදියයි. මා ඒ කිව්වේ, කැමැත්තක් නොමැති වීමේ දර්ශකය ගැනයි.

තවත් එකක් තමයි, දඬුවම පිළිබඳ දර්ශකය. මෙහිදී බලන්නේ, බල කරලා, දඬුවමක් ලබා දීලා කිසියම් ආකාරයකට ශ්‍රමය ලබා ගන්නවාද කියන එකයි. තුන්වැනි එක තමයි, අන්ත සූරාකෑමේ දර්ශකය. මේ අවස්ථාවේ ශ්‍රී ලංකාව රටක් හැටියට කම්කරු නීති ප්‍රතිසංස්කරණ සමඟ හොඳ ආචාරධාර්මික කම්කරු ප්‍රතිපත්ති මත වැඩ කරනවා. මා හිතන විධියට, එසේ වැඩ කිරීමත් එක්ක හොඳටම align වන තැනක් තමයි මෙය. මෙය, කම්කරු නීතිය පිළිබඳව සහ ශ්‍රමය පිළිබඳව අප දක්වන අයිතිය පිළිබඳ, වගකීම පිළිබඳ දර්ශකයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, අපේ රජය පත් වුණාට පසුව පෞද්ගලික අංශයේ අවම වැටුප රුපියල් 19,000 සිට රුපියල් 30,000 දක්වා වැඩි කළ බව. කාලයක් තිස්සේ පඩි පාලක සභා රැස් වෙලා තිබුණේ නැහැ. නමුත්, ලංකාවේ පඩි පාලක සභා දැන් රැස් වෙනවා. ඒ වාගේම සේවා ස්ථානයේ සිදු වන ලිංගික හිරිහැර පිළිබඳව තිබෙන ඉතා වැදගත් සම්මුතියක් වන ILO C190 එක ratify කළා; අපරානුමත කළා. කාන්තාවන් සේවයේ යෙදවීම සම්බන්ධ නීති ද වෙනස් කළා.

ඒ වාගේම, මේ සතියේ තවදුරටත් සම්මත වෙන්න නියමිතයි, ස්ත්‍රීන්, තරුණයන් සහ ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ නීති. විශේෂයෙන්, ළමා ශ්‍රමය ලබා ගැනීමට අදාළ දඩ මුදල් වැඩි කිරීම පිළිබඳ නීති. ඒ වාගේම ව්‍යුහාත්මක වෙනස්කම්, ඒ කියන්නේ වැටුප් නොලබන සූරාකෑම් ශ්‍රමය වැනි කාන්තාවන් සූරා කෑමට ලක් වන වෙනත් ව්‍යුහාත්මක පද්ධතිමය වෙනස්කම් පිළිබඳව අපි දැන් වැඩ කරමින් යනවා; ඒ පිළිබඳව ලංකාවේ ප්‍රථම වතාවට ජාතික ප්‍රතිපත්තියක් සකස් කරන්න යනවා. අපි ඒ ව්‍යුහාත්මක වෙනස්කම් කරමින් යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ වන විට අවධානය යොමු කර තිබෙනවා, මැන්පවර් ආයතනවල වැඩ කිරීම නිසා සිදු විය හැකි ශ්‍රම සූරාකෑම් පිළිබඳව. ලංකාවේ පෞද්ගලික ආරක්ෂක සේවාවන්හි නිරත අය, පවිත්‍රතා සේවාවන්හි නිරත අය, ගෘහස්ථ සේවකයන් - ගෙවල්වල වැඩ කරන අය - සම්බන්ධයෙන් වන ශ්‍රම සූරාකෑම් පිළිබඳ නීති සම්පාදනයේ අඩුවක් ලංකාවේ තිබෙනවා. මේ සියල්ල ගැන අපි දැනට සාකච්ඡා කරමින් යනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, your time is up.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
I will wind up, Sir.

ලබා දෙන ශ්‍රමයට නියම වටිනාකම ලැබෙන, වැටුපක් ලැබෙන, අයිතිවාසිකම් රැකෙන ශ්‍රම බලකායක් ඇති කරමින් ඒ අය රටේ සංවර්ධනයට දායක කර ගැනීම තමයි අපගේ බලාපොරොත්තුව.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is, the Hon. Kaveenthiran Kodeeswaran. You have seven minutes.

[பி.ப. 1.22]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று விவாதிக்கப்படுகின்ற இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டத்தின் கீழான ஒழுங்குவிதிகளை, உண்மையாக இந்த நாட்டின் கௌரவத்தை உயர்த்துகின்ற ஒன்றாக நாங்கள் பார்க்கின்றோம். விசேடமாக, அங்கீகரிக்கப் படாத ஊழியப் படைகள்மூலம் உற்பத்தி செய்யப்படுகின்ற பொருட்களை ஏற்றுமதி மற்றும் இறக்குமதி செய்கின்ற செயற்பாட்டுக்குத் தடை விதிக்கின்ற இந்த ஒழுங்கு விதிகளானவை வரவேற்கத்தக்க ஒரு விடயமாக இருக்கின்றது. இந்த நாடு அந்நியச் செலாவணியை ஈட்ட வேண்டும் என்றால், நாங்கள் எமது ஏற்றுமதி வருமானத்தைக் கூட்ட வேண்டும்; உற்பத்தி ஊக்குவிப்பினூடாக, உற்பத்திப் பொருளாதாரத்தை அதிகரிக்க வேண்டும். இன்று இந்த நாட்டிலே இளைஞர், யுவதிகள் வேலையற்றுத்

திண்டாடுகின்ற ஒரு நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்கள்; வேலையற்ற நிலையிலே அவர்கள் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். அவர்களுக்குரிய வேலைவாய்ப்பை வழங்குவதற்கான நடவடிக்கைகளை இந்த அரசு முன்னெடுக்க வேண்டும்; அதற்குரிய அடிப்படை வசதிகளை மேம்படுத்த வேண்டும் என்று இந்தச் சபையினூடாகக் கேட்டுக் கொள்கின்றேன்.

இலங்கை இன்று வளர்ச்சி அடைந்து வருகின்ற ஒரு நாடாக இருக்கின்றது; உண்மையாக அது வரவேற்கத்தக்கது. இலங்கையிலே அதிகளவான மூலப்பொருட்கள் இருக்கின்றன. அந்த மூலப்பொருட்களைக் கொண்டு உற்பத்திப் பொருளாதாரத்தை ஊக்குவித்து, ஏற்றுமதியைச் செய்து, அந்நியச் செலாவணியை ஈட்டக்கூடிய வகையிலான தொழில்நுட்ப வசதியை இந்த அரசு ஏற்படுத்த வேண்டும். ஆனால், இந்த அரசு நாட்டைப் பொறுப்பேற்றுத் தற்போது இரண்டு வருடங்களாகின்றபோதிலும் அதற்கான நடவடிக்கை என்பது மிகவும் மந்தகதியிலே இருக்கின்றது. அதனை இந்த அரசு துரிதமாக முன்னெடுக்க வேண்டும் என்று இந்த இடத்திலே வலியுறுத்திக் கேட்டுக் கொள்கின்றேன்.

விசேடமாக, இந்த இடத்திலே சுகாதார அமைச்சர் கௌரவ நளிந்த ஜயதிஸ்ஸ அவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். ஏனென்றால், அண்மைக் காலமாக கல்முனை ஆதார வைத்தியசாலையிலே நடந்த சீருடை சம்பந்தமான பிரச்சினைக்கு, நிரந்தரத் தீர்வாக இல்லாவிடினும் தற்காலிகமான ஒரு தீர்வையாவது அவர் வழங்கியிருக்கின்றார். அதற்காக எனது பாராட்டுக்களையும் கௌரவ அமைச்சர் அவர்களுக்குத் தெரிவிக்கின்றேன். ஏனென்றால், இந்த நாட்டைப் பிரிவடையச் செய்ய வேண்டும், இந்த நாட்டின் ஆட்சியை மாற்ற வேண்டும், இந்த நாட்டின் பொருளாதாரத்தைச் சீர்குலைக்க வேண்டுமென்ற எண்ணத்துடன் செயற்படுகின்ற சில வங்குரோத்து அரசியல்வாதிகள், இந்தச் சீருடை விடயம் பற்றிய விவகாரத்தில், அதாவது முஸ்லிம் பெண் தாதியர் 'அபாயா' அணிந்த விடயம் தொடர்பில் தத்தமது கருத்துக்களை முகநூல் வாயிலாக வெளிப்படையாகத் தெரிவித்திருந்தார்கள். இதன்மூலம் கிழக்கு மாகாணத்தின் கல்முனைப் பிரதேசத்திலே இனங்களுக்கிடையிலே ஒரு பிரிவினைவாதத்தை ஏற்படுத்தும் வகையில் ஒரு சர்ச்சையான நிலை ஏற்படுத்தப்பட்டிருந்தது.

தங்களுடைய இலாபத்துக்காக இனங்களுக்கிடையே ஒரு பிரச்சினையை, பிரிவினையை ஏற்படுத்துகின்ற செயற்பாட்டைப் பல பாராளுமன்ற உறுப்பினர்கள், முன்னாள் பாராளுமன்ற உறுப்பினர்கள் மட்டுமல்லாது, முகநூலைப் பயன்படுத்துகின்றவர்கள், YouTubers போன்றவர்களும் முன்னெடுத்து வந்திருந்தார்கள். தமிழ், முஸ்லிம்களுக்கு இடையேயான உறவைப் பிரிக்கின்ற ஒரு செயற்பாடாகத்தான் நாங்கள் இதனைப் பார்க்கின்றோம். தங்களது சுய இலாபத்திற்காக, தங்களது சுயநல நோக்கங்களுக்காக, அரசியலிலே பின்னடைந்து வங்குரோத்து நிலையிலிருக்கும் தங்களை முன்னோக்கி நகர்த்துவதற்காக, நிருவாக ரீதியான ஒரு பிரச்சினையை அரசியல் ரீதியான பிரச்சினையாக மாற்றி, இரண்டு சமூகங்களுக்கிடையிலே பிரிவினைவாதத்தை ஏற்படுத்தினார்கள். இது கவலைக்குரிய ஒரு விடயமாக இருக்கின்றது.

இந்த அரசு நாட்டைப் பொறுப்பேற்றபோது, "மூன்று சமூகங்களையும் ஒன்று சேர்த்து, அனைத்து மதங்களையும் ஒரே பார்வையில் பார்த்து, சகல விடயங்களையும் சமமாகச் செய்வோம்; அனைவருக்கும் முக்கியத்துவம் கொடுப்போம்" என்றுதான் சொல்லியிருந்தது. இங்கு சில விடயங்களில் ஒருவருக்கு அல்லது ஒரு சிலருக்கு முக்கியத்துவம் கொடுத்துச் செயற்படுவது என்பது வேறு விடயம். ஆனால், சட்டம் என்ன சொல்கின்றதோ, அதனையே நாங்கள் அமுல்படுத்த வேண்டும். உண்மையில் கல்முனை ஆதார வைத்தியசாலை யில் இந்த விடயங்கள் நடைபெற்றபோது அதன் பணிப்பாளர் டாக்டர் சுகுணன் அவர்கள் அங்கு இருக்கவில்லை. இருந்தாலும், அவருக்குப் பின்னிருந்தவர்கள் அந்த விடயத்தில் சட்டத்தைச் சரியாக அமுல்படுத்துவதற்கான நடவடிக்கையை மேற்கொண்டிருந்தார்கள். அது மட்டுமல்ல, இன்று அந்த விடயத்தில் சரியான நிலைப்பாட்டை அவர் கையாண்டிருந்தார். சட்டம் யாவருக்கும் சமம் என்ற வகையில் சட்டம் எதைச் சொல்கிறதோ அதைச் சரியாக அமுல்படுத்தும்படிதான் அவர் சொல்லியிருந்தார். அதேபோல், அங்கிருக்கின்ற hospital committee தலைவர் சந்திரசேகரம் ராஜன் அவர்களும் சட்டத்தை அமுல்படுத்தும்படிதான் தனது கருத்தைச் சொல்லியிருந்தார்.

விசேடமாக, டாக்டர் சுகுணன் அவர்கள் கல்முனை ஆதார hospitalஐப் பொறுப்பேற்ற பின்னர், அங்கு அவர் சில விடயங்களைச் செய்திருந்தார். மீலாத் விழா மற்றும் நோன்பு துறக்கும் நிகழ்வுகளை நடத்துவதற்கும், அதேபோன்று முஸ்லிம் ஊழியர்கள் தங்களது மதக் காரியங்களைச் செய்வதற்காக அல்லது மத வழிபாடுகளைச் செய்வதற்காக அந்த இடத்தில் ஒரு தொழுகை அறையைக்கூட ஒழுங்கமைத்துக் கொடுப்பதற்கும் நடவடிக்கை எடுத்திருந்தார்.

சட்டத்துக்கப்பால் அவர்கள் வேறு விடயத்தைக் கையாளவில்லை. இனவாதத்தை ஏற்படுத்த வேண்டுமென்றோ அல்லது மதவாதத்தை ஏற்படுத்த வேண்டுமென்றோ அல்லது இரண்டு இனங்களுக்கிடையில் பிரச்சினையை ஏற்படுத்த வேண்டுமென்றோ அவர்கள் அறிக்கை விடவில்லை. அவர்கள் சொன்ன விடயம் என்னவென்றால், இலங்கையில் இருக்கின்ற சட்டம் எதுவோ, அதனை நடைமுறைப்படுத்த வேண்டு மென்பதுதான். வைத்தியசாலைகளில் குறிப்பாக தாதியர்கள், சுகாதார உதவியாளர்கள், midwives, PHIs போன்றோருக்குத் தனித்துவமான சீருடைகள் இருக்கின்றது. அதேபோல, doctors, நிருவாகம் செய்பவர்கள், pharmacists போன்றோர் தங்களது கலாசார உடைகளை அணிந்து வர முடியும். அங்கு அவர்களுக்கு எந்தவித தடையும் விதிக்கப்படவில்லை. ஆனால், அங்கு பெண் சுகாதார உதவியாளர்கள் 'அபாயா' அணிந்துவந்த விடயம் தொடர்பாக அந்த hospital நிருவாகம் எடுத்த முடிவு என்பது சட்டத்துக்கு அமைய நடைபெற்ற ஒரு விடயம்; சுற்றுநிருபத்துக்கு அமைய அவர்கள் அந்த முடிவை எடுத்தார்கள்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
Sir, give me one more minute.

கௌரவ அமைச்சர் அவர்கள்தான் இதற்கான முடிவை எடுக்க வேண்டும். மற்றைய அரசியல்வாதிகள் அல்லது doctors

[ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා]

அதை முடிவுசெய்ய இயலாது. அமைச்சுக்குத்தான் அந்தக் கடமை இருக்கின்றது. இதில் அமைச்சு தனது பொறுப்பைச் சரிவரச் செய்திருக்கின்றது என்று நாங்கள் நம்புகின்றோம். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Champika Hettiarachchi. You have eight minutes.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is it again, Hon. (Dr.) Ramanathan Archchuna?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! Standing Order No. 91(i) இன்கீழ் குறிப்பிடுகிறேன். சற்று முன்னர் உரையாற்றிய கௌரவ உறுப்பினர் கோடீஸ்வரன் அண்ணா அவர்கள் ஒரு சுற்றுநிருபம் தொடர்பாகக் கதைத்தார்; இன்றைய தினம் நடைபெறுகின்ற விவாதத்துடன் தொடர்புபடாத விடயம் ஒன்றைக் கதைத்திருக்கின்றார். அது தொடர்பாக நான் ஒரு நிமிடம் முக்கியமாகக் கதைக்க வேண்டும். ஏனென்றால், இது மதங்கள், இனங்கள் தொடர்பான பிரச்சினை. எங்களுக்குத் தெரியும், பயங்கரவாத தடைச் சட்டம் இந்த நாட்டில் அமுலில் இருக்கிறது. ஆனால், அது தமிழ், முஸ்லிம் மக்களைப் பாதிக்கிறது. அதேமாதிரி-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, it is not a point of Order.

Hon. Champika Hettiarachchi, you may commence your speech now.

[අ.භා. 1.31]

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින අප සාකච්ඡා කරනු ලබන්නේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි පිළිබඳවයි. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, Hon. (Dr.) Archchuna. Sit down and listen to the Hon. Champika Hettiarachchi, please.

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
පසුගිය කාලයේ ඇමෙරිකාව විසින් ලෝකයේ විවිධ රටවල්වලට විවිධ විධියේ බදු - tariffs - පැනවූ බව, තීරු බදු අය කළ බව අපි දන්නවා. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Archchuna, he did not mention your name. Would you please sit down?

Hon. Champika Hettiarachchi, you may proceed.

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
එහිදී, විශේෂයෙන්ම ලංකාවට පළමුවැනි වටයේදී සියයට 20ක වාගේ ප්‍රමාණයකින් තීරු බදු පැනෙව්වා. පසුව එය සියයට 12.5ක් දක්වා අඩු කළා. ඊට පසුව ඇමෙරිකානු අධිකරණයකින් ලැබුණු තීන්දුවක් අනුව ද්විපාර්ශ්වික ගිවිසුමක් මඟින් එම බදු ප්‍රමාණය තීන්දු කරන්නය කිව්වාට පසුව, එය සියයට දහය දක්වාත් අඩු කරනු ලැබුවා.

අපි දන්නවා, ලෝකයේ ඇති වුණු තත්ත්වය අනුව බලහත්කාරයෙන් ශ්‍රමය - forced labour - ලබා ගැනීම සම්බන්ධ සාකච්ඡාවක් තිබෙන බව. ඒ නිසා එම බදු ප්‍රමාණය සියයට දහයක ප්‍රමාණයට ගෙනෙන්න නම්, forced labour භාවිතය ඉවත් කළ යුතුයි කියා ඇමෙරිකාව විසින් යෝජනා කළා. අපි දන්නවා, ලංකාව තුළ ළමා ශ්‍රමය සහ forced labour භාවිතය සඳහා බොහොම අඩු ඉඩකඩක් තිබෙන බව. නමුත් ලෝකයේ පවතින ප්‍රවණතාව වන්නේ කාර්මික නිෂ්පාදනයක් හෝ වෙනත් මොනයම් හෝ නිෂ්පාදනයක් කරනකොට ඒවා අදියර වශයෙන් විවිධ රටවල නිපදවා අවසන් නිෂ්පාදනය සිදු කිරීමයි. ඒ අනුව බලනකොට, එහෙම වෙනත් රටකින් ගෙනෙන භාණ්ඩයක් හෝ අර්ධ නිමි භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට forced labour භාවිත කර තිබෙනවා නම්, එයද අපේ රටට සියයට දහය දක්වා තීරු බදු අඩුවීමේ අවස්ථාව නොලැබීමට හේතුවක් වෙනවා. ඒ නිසා වර්තමාන රජය විධියට අපේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්වරයා සහිතව පත් කළ කමිටුව සහ US Trade Act එකේ Section 301ට අනුව බලහත්කාරයෙන් ශ්‍රමය භාවිත කිරීම වැළැක්වීමට අදාළව ඇමෙරිකාවේ තිබෙන නියෝජිත ආයතන එක්ව සාකච්ඡා කරලා මෙම බදු ප්‍රමාණය සියයට දහයක් දක්වා ගෙනැවිත් තිබෙනවා. මෙම බදු ප්‍රමාණය සියයට දහය දක්වා ගෙනෙන ක්‍රියාවලියට සමාන්තරවම මෙම පනත යටතේ වන රෙගුලාසි අපි පාර්ලිමේන්තුවේදී සම්මත කරනවා. ඒ අනුව ඉදිරියේදී forced labour භාවිත කර නිපදවන නිමි භාණ්ඩ හෝ අර්ධ නිමි භාණ්ඩ ලංකාවට ගෙනෙනවා නම්, ඒවා තහනම් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි තිබෙන වැදගත්කම මෙකයි. මේක ලෝකයේ අලුත් trend එකක්. ඉදිරියේදී පරිසර හිතකාමී අණ පනත් ගෙනෙන බව අපි දන්නවා. අපි ජාතික පරිසර පනත සංශෝධනය කළා. ඒ වාගේම කාබන් තිර කිරීමට සහ මානව හිමිකම් සහිත ethical productsවලට තමයි ලෝකය තුළ ඉඩ තිබෙන්නේ. ඇමෙරිකාව විතරක් නොවෙයි, යුරෝපා සංගමය පවා Regulation (EU) 2024/3015 යටතේ forced labour භාවිතය වැළැක්වීමට කටයුතු කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට GSP Plus සහනය ලබා ගැනීමේදී කොන්දේසි - සම්මුති - 32කට මුහුණ දෙන්න වෙනවා. එම

සම්මුති 32 තුළ තිබෙන එක සම්මුතියක් තමයි forced labour භාවිතය වැළැක්වීම කියන්නේ. ඒ නිසා ලෝකය ඒ දිශාවට ගමන් කරනකොට, ඒ සඳහා අවශ්‍ය නීති අපිත් මෙම පනත් හරහා සම්මත කර ගන්න ඕනෑ.

ඒ වාගේම කැනඩාව වාගේ රටවල් පවා මේ නීති ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න සැලසුම් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අපනයනය වැඩිපුර සිදු වන්නේ යුරෝපා සංගමය, කැනඩාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙතයි. 2026 වසරේ ජනවාරි සිට මැයි දක්වා වූ කාලය තුළ යූඑස් ඩොලර් බිලියන 7.3ක් අපි අපනයනය තුළින් රට තුළට ගෙනැවිත් තිබෙනවා. ඒ අනුව ගත්තාම, 2025 වර්ෂයට සාපේක්ෂව අපනයන ආදායමේ සියයට 7.63ක වර්ධනයක් පෙන්නුම් කර තිබෙනවා. හැම ක්ෂේත්‍රයකම මේ තත්ත්වය අපට දකින්න පුළුවන්. ඇඟලුම්, මැණික් සහ අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය සහ සේවා ආදි සෑම ක්ෂේත්‍රයකම අපනයන ආදායමේ වර්ධනයක් අපට දකින්න පුළුවන්.

මේ අවස්ථාවේ විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි අපනයනය කරන ප්‍රධාන රටවල් 15ක් විතර අපනයන වෙළෙඳ පොළ තුළ තිබෙනවා. ඒ ප්‍රධාන රටවල් 15 අතරින් ඇමෙරිකාව ප්‍රධාන වෙනවා. එහි වර්ධනයකුත් ඇති වෙලා තිබෙනවා. අපේ සමස්ත අපනයනයෙන් සියයට 22ක් යවන්නේ ඇමෙරිකාවට. පසුගිය මැයි මාසයේ විතරක් ඇමෙරිකාවට යවපු අපනයනවල සියයට 10.87ක වර්ධනයක් පෙන්නුම් කරනවා. ඒ වාගේම අපි මැයි මාසය ඇතුළත ඇමෙරිකානු ඩොලර් මිලියන 240.23ක් ගෙනැවිත් තිබෙනවා.

අපේ ඊළඟ ප්‍රධාන වෙළෙඳ පොළ වෙන්නේ යුරෝපා සංගමයයි. පසුගිය කාලයේ අපේ අපනයනයෙන් සියයට 25.5ක් යවලා තිබෙන්නේ යුරෝපා සංගමය වෙතයි. අපි ඒ මඟින් මැයි මාසයේ සියයට 6.62ක වර්ධනයක් පෙන්නුම් කර තිබෙනවා. ජාත්‍යන්තර වෙළෙඳාමත් එක්ක රැඳී ඉන්න ඕනෑ නම්, ජාත්‍යන්තරයත් එක්ක ඉන්න ඕනෑ නම් අපට මේ අණපනත් සම්මත කරන්න සිද්ධ වෙනවා. වර්තමාන රජය 2030 වෙද්දී ඇමෙරිකානු ඩොලර් බිලියන 36ක ආදායමක් අපනයනයෙන් ලබාගන්න බලාපොරොත්තු වෙනවා. ඊට අවශ්‍ය වැඩ පිළිවෙළ තමයි මේ සැකසිලා තිබෙන්නේ. ජාත්‍යන්තරයේ තිබෙන නීතිත් එක්ක, ඒවාට ගැළපෙන නීති පද්ධතියක් එක්ක අපි මේ රටේ ආර්ථිකය ගැට ගහගෙන යන ගමනක් තමයි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම වර්තමානය වනවිට මේ රජය විසින් ආර්ථිකය වෙනුවෙන් විශාල ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා කියලා අපි දන්නවා. ඒවාට එරෙහිව මේ විපක්ෂය හැම වෙලාවේම හඬ නඟනවා. පාර්ලිමේන්තුව ඇතුළේ සද්ද දාලා ඒකට අවධානය එන්නේ නැති වුණාම, පාර්ලිමේන්තුවේ කරන කථාව එළියේ කියලා ඇඩ් එක දාලා එනවා. අද දයාසිරි ජයසේකර මහත්මයා පාර්ලිමේන්තුවේ විශේෂ හෙළිදරව්වක් කරනවා කියද්දී, අර පරණ කාලයේ වාගේ සෙනඟ පාර දෙපැත්තේ TV තියාගෙන, කන්න මොනවා හරි හදාගෙන බලාගෙන ඉඳියි කියලා අපි හිතුවා දයාසිරිගේ විශේෂ හෙළිදරව්ව මොකක්ද කියලා බලන්න. එතුමා එහෙම හිතන්න ඇති, ඒ ප්‍රකාශය කරන වෙලාවේ. දැන් එතුමන්ලා පාර්ලිමේන්තුවේ කියන ඒවාට අවධානය දෙන්නේ නැහැ. එතුමන්ලා පාර්ලිමේන්තුවේ නොවෙයි, එළියේ කිව්වත් ජනතාව අවධානය දෙන්නේ නැහැ. ඒ වාගේම මෙහි විශේෂත්වය වන්නේ මේකයි. ඒවා එළියේ කියන්න බැහැ. නමුත් පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට මුවා වෙලා, ඒ වරප්‍රසාද පාවිච්චි කරලා මේක ඇතුළට ඇවිල්ලා බොරු කියන්න තමයි මේ වාගේ විවිධ උපක්‍රම එතුමන්ලා පාවිච්චි කරන්නේ. ඒ නිසා එතුමන්ලා කරන හැම දෙයකටම විරුද්ධව දැන් ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා.

අද අපේ රටේ ඓතිහාසික දවසක්. මොකද, අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරමින්, අධිකරණයේ විභාග වන ලක්ෂ 11කට ආසන්න නඩු ප්‍රමාණය ගැන අපි අද තීරණයක් ගන්නවා. ඒ නඩු ඉක්මන් කරලා ජනතාවට ඒවායෙන් මිදෙන්න අවස්ථාව සලසා දෙන්න ඕනෑ. ඒ සඳහා රස පරීක්ෂකවරු, පොලිස් නිලධාරින් ඇතුළු මානව සම්පත් සහ යටිතල පහසුකම් සියල්ලත් ඇති කරමින් තමයි, අපි අද ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත ගෙනැල්ලා තිබෙන්නේ. හැබැයි, විපක්ෂය විසින් ඒ සියල්ලම කඩාකප්පල් කරනවා.

ගරු කෞෂල්‍යා ආරියරත්න නියෝජ්‍ය ඇමතිතුමිය දැන් කිව්වා විපක්ෂයේ තුන්හතරදෙනෙක් පමණක් ඉන්නවා කියලා. මේ වෙනකොට විපක්ෂයේ කිසිම කෙනෙක් නැහැ. අර බෝඩ්ලෑල්ල පැත්තකට දාලා දැන් ඔවුන් ඒ සටන අමතක කරලා. එතුමන්ලාගේ ප්‍රධාන අරමුණ, පරමාර්ථය තමයි ජනතාවට බොරු සිග්නල් එකක් දෙන එක. නමුත් ජනතාව වෙනුවෙන් සැබෑ වුවමනාවෙන් සටන් වදින කණ්ඩායමක් නොවන බවට අද විපක්ෂය පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ වාගේ විපක්ෂයක් රටට විපත්තියක් කියන එක මම විශේෂයෙන් මතක් කරනවා. ඒ නිසා ඉදිරියේදී ඒ වෙනුවෙන් තීරණ ගන්න කියලා අපි ජනතාවගෙන් ඉල්ලනවා. මට මේ කාලවේලාව ලබා දීම වෙනුවෙන් මූලාසනයට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Naina Thambi Marrikkar Mohamed Thahir. You have seven minutes.

Order, please! Before he starts, the Hon. Deputy Chairperson of Committees will take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 1.39]

**ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

අද විවාදයට ගැනෙන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබාදීම ගැන මුලින්ම මූලාසනයට මගේ ස්තුතිය පුද කරනවා.

ආනයන හා අපනයන ගත්තාම, ආනයනයට වඩා අපි අපනයනය කරන්න ඕනෑ. කලින් පොල් අපනයනයෙන් අපේ රටට සැහෙන ආදායමක් ලැබුණා. ඒ වාගේම, අපේ රටේ පලතුරු හා එළවලුවලට හැම රටකින්ම ඉල්ලුමක් තිබෙනවා. අපේ රටට ඩොලර් ගෙනෙන ව්‍යාපෘතියක් හැටියට සියලු අපනයනකරුවන්ට රජයක් හැටියට විශාල ශක්තියක් දෙන්න ඕනෑ.

[ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා]

අද අපේ රටේ ඉස්සෝ කර්මාන්තය තිබෙනවා, ලුණු කර්මාන්තය තිබෙනවා. ඒ වාගේම වී වගා කරන ගොවීන් ඉන්නවා. පිට රටින් හාල් ගෙනාපු නිසා අද වී ගොවීන් අසරණ වෙලා තිබෙනවා. අපේ රට හාල්වලින් ස්වයංපෝෂිත වෙච්ච රටක්. ඒකට නාඩුද, සම්බාද කියලා ප්‍රශ්නයක් නැහැ. පිටරටින් හාල් ආනයනය කරනකොට අපනයනය පැත්තෙන් අපට විශාල පාඩුවක් සිද්ධ වෙනවා. ඒ වාගේම ඉස්සෝ අපනයනය කිරීමේ කර්මාන්තයේ යෙදෙන අයට හොඳ ශක්තිමත් ආර්ථිකයක් ගොඩනඟා ගන්න ආණ්ඩුව උදවු කරන්න ඕනෑ. අපේ රටේ ආර්ථිකයට ශක්තියක් දෙන්න පුළුවන් හොඳ ලුණු ලේවායන් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඒ කර්මාන්තකරුවන්ට හදලා දුන්නා නම්, අපට ලුණු පිටරටින් ගෙනෙන්න ඕනෑ නැහැ. අපේ රටේ හම්බන්තොට, පුත්තලම, පාලවිය, එලිෆන්ට්පාස් ලුණු ලේවායන්වල ඕනෑ තරම් ලුණු හදන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. ආණ්ඩුව ඒ කර්මාන්තය දියුණු කරන්න ඕනෑ කියලා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම අපනයනයට වඩා ආනයන වැඩි නම්, අපි වාගේ පොඩි රටකට ශක්තිමත් වෙන්න බැහැ. ආනයනය කරනකොට අපේ සල්ලි පිටරටට යනවා. අපනයනය කරනවා නම් අපට ඩොලර් ගන්න පුළුවන්. ඒ නිසා ආණ්ඩුවක් හැටියට මේකට විශේෂ වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. විශේෂයෙන් අපනයන කරන අයට ආණ්ඩුවෙන් ශක්තිමත් වැඩ පිළිවෙළක් හදන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුව රටටම බලපෑවා. ඒකට පක්ෂ භේදයක් තිබුණේ නැහැ. සියලුදෙනාම ඒකට මුහුණ දුන්නා. පුත්තලම-කල්පිටිය පාරත් ලොකු ගංවතුරකට යට වුණා. ඒ අවස්ථාවේ මහාමාර්ග විෂය භාර ගරු ඇමතිතුමා මැදිහත් වෙලා ඒකට ලොකු මුදලක් වෙන් කළා. විශේෂයෙන්ම වයික්කාල-තලවිල පුබ්බිලි මාවත හදන්න. ඒකට tender call කරලා ඒ වැඩේ පටන් ගන්නකොටම නැවතිලා තිබෙනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ, මෙතැන පක්ෂ භේදයක් නැහැ, ජාති භේදයක් නැහැ කියලා. ඒ නිසා ගරු ඇමතිතුමා මැදිහත් වෙලා ඒ ගැන සොයා බලන්න. තාක්ෂණික පැත්තෙන් ඉංජිනේරු මහත්වරු කථා කරලා තමයි මේ වැඩේ කළේ. නමුත් ඒ ටෙන්ඩර් එක ගත්ත මිනිහා බය කරපු නිසා, ඒ මිනිහා ඒක දාලා ගියා. ඒ කාලයේ වයික්කාල ප්‍රදේශයට ආපු ගංවතුර ගැන මුළු රටම දන්නවා. මාස තුන හතරක් යනතෙක් වතුර බැස්සේ නැහැ. ඒ තාක්ෂණික පැත්ත ගැන ඉංජිනේරු මහත්වරු කථා කරලා, ඒකට අවශ්‍ය මුදල් රජය වෙන් කරලා දුන්නා. ඒ වාගේම tenders call කරන වැඩේත් කළා. නමුත් අද ඒ වැඩේ කරන්නේ නැහැ. මේක ඇත්ත සිද්ධියක්. මම මෙතැන දේශපාලනය කථා කරනවා නොවෙයි. විශේෂයෙන්ම තලවිල, පුබ්බිලි මාවතේ කතෝලික පල්ලියක් තිබෙනවා. ඒ, තලවිල පල්ලිය. මේ, ඒකට යන පාර. ඒ පාර වතුරට යට වුණා. ඒක හදන්න කටයුතු කරන ලෙස මහාමාර්ග විෂය භාර ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ පුත්තලම දිස්ත්‍රික්කයේත් රේල් පාරක් තිබෙනවා. ඒ රේල් පාර පනිනකොට දැන් ආරක්ෂාවක් නැහැ. මොකද, ඉස්සර හිටපු මුරකරු දැන් එතැන නැහැ. මුරකරු නැති නිසා එතැන විශාල අනතුරක් සිද්ධ වෙන්න පුළුවන්. මහාමාර්ග විෂය භාර අමාත්‍යතුමා හැටියට ඒ පිළිබඳවත් කටයුතු කරන මෙන් එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සියලු ආගම්වලට සංස්කෘතියක් තිබෙනවා. ඒ සංස්කෘතිය ඒ ආගම වෙනුවෙන් රැකෙන්න ඕනෑ. විශේෂයෙන්ම නැඟෙනහිර පළාතේ කල්මුනේ ප්‍රදේශයේ වෙච්ච සිදුවීම ගැන මම කනගාටුව ප්‍රකාශ කරනවා. එතැනදී යම්කිසි කෙනෙක් වරදක් කෙරුවා නම්, ඒ කෙනාට දඬුවම් දෙන්න ඕනෑ. මුස්ලිම් ආගම, කතෝලික ආගම, හින්දු ආගම, බෞද්ධ ආගම කියන හැම ආගමක්ම අදහන මිනිස්සු සන්සුන්ව සාමකාමීව ඉන්න ඕනෑ. විශේෂයෙන්ම ගුරුවරු ගත්තොත්, කතෝලික පාසල්වලට එනවා, මුස්ලිම් පාසල්වලට එනවා, හින්දු පාසල්වලට එනවා, බෞද්ධ පාසල්වලට එනවා. එතකොට ඒ අයට හිජාබ් අඳින්න දෙනවා. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. කල්මුනේ විතරක් මෙවැනි සිදුවීමක් වෙන්නේ ඇයි? මේ ලංකාවේ ඔක්කෝම එකයි. එහාට එක නීතියක්, මෙහාට එක නීතියක් තියෙන්න බැහැ. මේ කාරණයේදී ගරු සෞඛ්‍ය ඇමතිතුමා මැදිහත් වුණා. මැදිහත් වෙලා සාමකාමීව සියලු ජනතාවට සමගියෙන් ඉන්න පුළුවන් වැඩසටහනක් යොදන ලෙස ඉල්ලා සිටියා. විශේෂයෙන්ම ගත්තොත්, ඇත්තටම අද අපේ රට සන්සුන්ව සාමකාමීව යන රටක්. ඒ වගකීම ඉටු කරන්න ඕනෑ ආණ්ඩුව. ඇත්තටම අපි ගරු ඇමතිතුමා හමු වුණා. මේ ගැන කටයුතු කරනවා කිව්වාට ඇමතිතුමාට ස්තුතියි. සියලු ජනතාවට, සියලු ආගම්වලට ගරුත්වයක් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුති කරමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.46]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද විවාදයට ගැනෙන්නේ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි පිළිබඳවයි. අපි අද යම් යම් දේවල් පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්නේ විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක කරන ආනයන හා අපනයන පිළිබඳවයි. 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි අනුමත කර ගැනීම තමයි අපි අද බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙවැනි පනත් යටතේ රෙගුලාසි අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අනුමත කර ගන්න අපට සිද්ධ වුණේ ඇයි ද කියලා අපි බලන්න ඕනෑකම තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අපේ අපනයන ආදායමෙන් හතරෙන් එකක් විතර ඇමෙරිකා එක්සත් ජනපදයෙන් තමයි අපි උපයා ගන්නේ. ඒ වාගේම අපනයන ආදායම් සොයා ගන්නා අනික් රටවල් අතර, යුරෝපා සංගමයට අදාළ රටවල් තිබෙනවා. ඒ වාගේම භාණ්ඩ ආනයනය ගත්තොත්, ලෝකයේ විවිධ රටවලින් අපි භාණ්ඩ ආනයනය කරනවා. ඒ ආනයනය කරන භාණ්ඩ පිළිබඳව එකින් එකට සැලකිලිමත් වෙලා ආනයනය කළත් අද වනකොට සාකච්ඡාවක් තිබෙනවා, ලෝකයේ භාණ්ඩ නිෂ්පාදනයේදී සැලකිය යුතු ප්‍රමාණයක් බලහත්කාරයෙන් ශ්‍රමය යොදවා නිෂ්පාදනය කරනවාය කියලා. බලහත්කාරයෙන් ශ්‍රමය යොදවා භාණ්ඩ නිෂ්පාදනය කරන රටවල්, ඒ භාණ්ඩ පරිභෝජනය කරන රටවල්, ඒ භාණ්ඩ ආනයනය කරන රටවල් මොනවාද කියලා විශේෂ විමර්ශන ක්‍රියාවලියක් තුළින් ඇමෙරිකා එක්සත් ජනපදය හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව රටවල් 60ක් විතර ඒ මැදිහත්වීම්

කරන බව සොයාගෙන තිබෙනවා. ඒ රටවල් අතරිනුත් රටවල් 14ක් විශේෂණය කරලා තිබෙනවා. නීති රීති, ප්‍රසම්පාදන ක්‍රියාවලි කිසිවක් අදාළ කර නොගෙන බලහත්කාරයෙන් ශ්‍රමය යොදවා නිෂ්පාදනය කරන භාණ්ඩ පරිභෝජනයෙන් ඉවත් වීම සඳහා, නැත්නම් ආනයනය කිරීමෙන් වැළකීමට කටයුතු නොකරනවාය කියන අදහස මත ඒ රටවල්වලට යම් යම් බදු පැනවීම් කරන්න ඇමෙරිකාව තීරණය කරනවා. අපි දන්නවා, මේ ඇති වෙච්ච යුද තත්ත්වයත්, වෙනත් කටයුතුත් පදනම් කරගෙන ලංකාව ඇතුළු රටවල් ගණනාවකට විශාල බද්දක් පැනවීම පිළිබඳව සංවාදයක්, සාකච්ඡාවක් සිද්ධ වුණු බව. ඒ වෙලාවේ අපට සියයට 20ක බද්දක් පැනෙව්වා. ඒ පනවන ලද විශාල බද්ද අවම කර ගැනීම වෙනුවෙන් අපි ඇමෙරිකාවත් එක්ක සාකච්ඡා කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් අපි දන්නවා, පසුගිය දවස්වල ඒ බද්ද සියයට 10ට අඩු වෙලා නැවත සියයට 12.5ක් දක්වා වැඩි කිරීම සඳහා නැවත සාකච්ඡාවක් ඇති වූ බව. ඒ, ශ්‍රී ලංකාවත් බලහත්කාරයෙන් ශ්‍රමය යොදවා නිෂ්පාදනය කරන භාණ්ඩ ආනයනය කරනවාද කියන අදහස පැවතීම නිසා. ඉතින් වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යවරයාත් මැදිහත් වෙලා, අමාත්‍යාංශයේ ලේකම්වරයා මූලික කරගෙන ආයතන ගණනාවක නිලධාරීන් ගණනාවකගෙන් සමන්විත විශේෂ කමිටුවක් පත් කළා, ඒ පිළිබඳව ඇමෙරිකාවේ අදාළ ආයතන එක්ක සාකච්ඡා කරලා තීන්දු තීරණ ගන්න. එහෙම සාකච්ඡා කරලා, එකඟතාවෙන් වැඩ කරන්න පුළුවන්ද කියලා බලා, ඒ ලබා ගත් තොරතුරු මත පදනම් වෙලා, කැබිනට් මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කරලා, දැන් මේ පනත යටතේ රෙගුලාසි හැටියට එම කරුණු ඉදිරිපත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කල්පනා කරලා බලන්න ඕනෑ, අපේ රට ශ්‍රමයට දෙන වටිනාකම මොකක්ද කියලා. ශ්‍රමයට ඉතා හොඳ වටිනාකමක් ලබා දෙන ආණ්ඩුවක් තමයි දැන් තිබෙන්නේ. නීති රීති අලුතෙන් හදන්න ඕනෑ නම් ඒවා හදලා හරි කම්කරුවාගේ අයිතිවාසිකම් රකින්න මැදිහත් වන ආණ්ඩුවක් තමයි වර්තමානයේ තිබෙන්නේ. ඒ අනුව ඔවුන් වගුරන ශ්‍රමයට සාධාරණ වටිනාකමක් ගෙවීම වෙනුවෙන් පසුගිය දවස්වල අපි ඔවුන්ගේ වැටුප් වැඩි කළා. ඒ වැටුප් වැඩි කිරීම හරහා ඔවුන්ට සාධාරණය, යුක්තිය ඉෂ්ට කරන්න අප බලාපොරොත්තු වනවා.

ඒ වාගේම රාත්‍රි කාලයේදී කාන්තාවන් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් පසුගිය දවස්වල නැවත අපි සාකච්ඡා ආරම්භ කළා. ඒ, කාන්තාවන් රාත්‍රි කාලයේ සේවයේ යොදවනකොට ඇති වන පීඩා මොනවාද කියලා හඳුනා ගැනීම සඳහා. ඒ වාගේම බාල වයස්කාර දරුවන් සේවයේ යෙදවීම සම්බන්ධයෙනුත් අපි අලුතෙන් නීති රීති, අණ පනත් සම්මත කළා. සමහර නීති රීතිවල තිබුණු අඩුපාඩු සකස් කරන්න මැදිහත් වෙලා, බලහත්කාරී ශ්‍රමය යොදවා නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගන්නා යම් තත්ත්වයක් තිබුණා නම්, නීති රීති මඟින් විතරක් නොවෙයි, යම් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම හරහාත් ඒ තත්ත්වය වෙනස් කරන්න කටයුතු කරන්න අපි මැදිහත් වෙලා තිබෙනවා වාගේම තවදුරටත් ඒ වෙනුවෙන් සාකච්ඡා කරමින් තිබෙනවා.

ආනයන හා අපනයන (පාලන) පනත යටතේ මේ රෙගුලාසි ගෙන එන්න අපි කටයුතු කරලා තිබෙන්නේ ඇයි? අපේ අපනයන ආර්ථිකයට ප්‍රධානම දායකත්වය සපයන්නේ ඇමෙරිකාව සහ යුරෝපා සංගමයේ රටවල්. ඉතින් අපට GSP Plus සහනය ලබා දීමේදී ලෝකයේ නව ප්‍රවණතා සැලකිල්ලට අරගෙන අපට යම් බාධා එල්ල වන්න පුළුවන්කමක් තිබෙනවා නම්, ඒවා වළක්වා ගැනීම වෙනුවෙන් මෙවැනි නීති රීති සම්මත කිරීම රටට වැදගත් වනවා.

දෙවැනි කාරණය මේකයි. රටක් හැටියට ඉස්සරහට යන්න නම්, ආර්ථික වශයෙන් ඉස්සරහට යන්න නම් වැඩිම අපනයන ආදායමක් හොයන රටවල බදු ක්‍රියාවලිය පිළිබඳව අපි සොයා බලන්න ඕනෑ. නැත්නම් ලෝකයේ රටවල පවතින බදුවලට වඩා වෙනස් බද්දක් අපෙන් අය කරන්න යම් තීන්දුවක් ගත්තොත් ඒක අපේ අපනයන කර්මාන්තයට විශේෂයෙන් බලපානවා. ඒ හරහා අපි අපනයනය කරන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන වෙනත් රටවලට අවස්ථාවක් හැදෙනවා. ඒ කියන්නේ, අපේ රටට හිමි වෙලා තිබෙන අවස්ථා වෙනත් රටවලට හිමි වෙනවා. අපේ ආර්ථිකයට අපනයන ක්‍රියාවලියෙන් උපයා ගන්නා ආදායම් මාර්ග අහිමි වෙනවා නම්, ලෝකයේ වෙනත් රටවල් කරා ඒවා ගමන් කරනවා නම් ඒක වළක්වා ගැනීම වෙනුවෙන් මේ රෙගුලාසි සම්මත කර ගැනීම වැදගත් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂයේ සමහර කට්ටිය මේ රෙගුලාසි සම්බන්ධව මොනවත් කිව්වේ නැහැ. මේ රෙගුලාසි ගැන හිතනවා වෙනුවට එතුමන්ලාට දැනෙන දේ කියන්න පටන් අරගෙන තිබෙනවා. මේ සභාවේදී මන්ත්‍රීවරයෙක් කියනවා මම අහගෙන හිටියා, හාල් ආනයනය කළ නිසා තමයි වී විකුණා ගන්න බැරි ප්‍රශ්නය ඇවිල්ලා තිබෙන්නේ කියලා. අපි පසුගිය දවස්වල පාර්ලිමේන්තුව තුළ ඕනෑ තරම් සාකච්ඡා කළා, ඒ ආනයනය කළ හාල් මොනවාද කියලා. ඒ හාල් ආනයනය කළේ මොකටද කියාත් අපි කිව්වා. හාල් ආනයනය කළාට පස්සේ වී විකුණා ගන්න බැරි වුණා නොවෙයි, ඒකේ ඇත්ත ප්‍රශ්නයක් තිබුණා. ඒ ඇත්ත ප්‍රශ්නය මොකක්ද කියාත් අපි කිව්වා.

ඇත්තටම මීට කලින් පැවති රජයන් වී මිලදී ගත්තේ නැහැ. අපි ආණ්ඩුව භාර ගන්නකොට කවුරුවත් වී මිලදී ගත්තේ නැහැ. ආණ්ඩු වී මිලදී ගන්න ක්‍රියාවලියක් තිබුණේ නැහැ. වී මිලදී ගන්න පටන් ගත්තේ පසුගිය අවුරුද්දේ. 2024දී අපි වී මිලදී ගන්න පටන් ගත්තාට ගොවියෝ අපට වී ඇටයක්වත් දුන්නේ නැහැ. මොකද, සහල් මිල වැඩි වෙලා තිබුණා. සහල් හිඟයක් තිබුණා. ඒ හිඟය පාවිච්චි කරලා හිතුණු හිතුණු ගණන්වලට වී මිලදී ගත්තා, සහල් වික්කා. එදා ඒ තත්ත්වය පාලනය කරන්න රජය වී මිලදී ගන්න පටන් ගත්තාට කවුරුවත් වී දුන්නේ නැහැ. හැබැයි, අපි 2025දී වී මෙට්‍රික් ටොන් 150,000කට ආසන්න ප්‍රමාණයක් මිලදී ගෙන තිබෙනවා. මේ අවුරුද්දේ මේ වනකොට අපි වී මෙට්‍රික් ටොන් 66,000කට වැඩි ප්‍රමාණයක් මිලදී ගෙන තිබෙනවා. ඒ විධියට අපි වී මිලදී ගැනීම කරනවා. හැබැයි, නිෂ්පාදනය වෙළෙඳ පොළට ඉදිරිපත් වනකොට ඒක අතිරික්තයක් බවට පත් වෙලා තිබෙනවා, 2025 මහ කන්නයේ සිට. වෙළෙඳ පොළට අතිරික්තයක් ආවාම ඉල්ලුම සහ සැපයුම අනුව හැම දාමත් වෙන දේ තමයි කවුරු මිලදී ගත්තත් වෙළෙඳ පොළේ මිල ගණන් පහත වැටීම. අපි තවම හාල් අපනයනය කරන්නේ නැහැ. අපි හාල් ලෝකයේ රටවලට යවන්නේ නැහැ. ඒ නිසා රට ඇතුළේ ඒවා විකුණන්න ඕනෑ.

රට ඇතුළේ අතිරික්තයක් තිබෙනකොට අනිවාර්යයෙන්ම වෙන්න පුළුවන් දේ තමයි තරගකාරී වෙළෙඳ පොළ තුළ මිල ගණන් පහත වැටීම. අපි දන්නවා, දැන් ගෙවල්වලත්, මෝල්වලත්, ගබඩාවලත් - හැම තැනම - වී තිබෙන බව. එතකොට මිල පහත බහිනවා. මේකට උත්තරයක් වශයෙන් සහල් පරිභෝජන ක්‍රියාවලිය වෙනස් කරන්න පසුගිය දවස්වල තීන්දු තීරණ ගත්තා. මේ රෙගුලාසි ඉතාම වැදගත් බව ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.55]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරලා, අද දවසේ ඒ පිළිබඳව සාකච්ඡා කරනවා. නමුත් විපක්ෂයේ මෙතෙක් කථා කළ මන්ත්‍රීවරු මේ රෙගුලාසි ගැන නොවෙයි කථා කළේ. සමහරු මේ රෙගුලාසි ගැන වචනයක්වත් කථා කළේ නැහැ. හැබැයි, ඒගොල්ලන්ගේ නමට ඉස්සරහින් "නීතිඥ", "අධිනීතිඥ" වාගේ එක එක ජාතියේ නම් පට බැඳිලා තිබෙනවා. හැබැයි, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි ගැන වචනයක්වත් කථා කළේ නැහැ. හරියට සොහොනක් ළඟින් යද්දී වාගේයි. අපි දන්නේ නැහැ, රෙගුලාසිවලට බයේද, එහෙම නැත්නම් මේ ආණ්ඩුව මේ දිනවල රටේ නීතිය අකුරට ක්‍රියාත්මක කරමින්, හැමටම සමානව නීතිය ක්‍රියාත්මක කරමින් යන එකට බයේද කියලා. *[බාධා කිරීමක්]* **பொய் சொல்ல வேண்டாமப்பா; கரைச்சல் வேண்டாம்.** ඔබතුමන්ලා අද උදේත් මේ සභාවේ නාඩගමක් නැටුවා. අපි බොහොම ස්තුතිවන්ත වෙනවා, විපක්ෂ නායකතුමාටත්, එතුමාගේ කණ්ඩායමටත්. අපි දන්නේ නැහැ, කවුද ඒගොල්ලන්ට උපදෙස් දෙන්නේ කියලා. පසුගිය දවස්වල නම් රනිල් ළඟට ගිහින් උපදෙස් ගන්නවා කියලා ඡායාරූප පළ වෙලා තිබුණා. රනිල් වික්‍රමසිංහ උපදෙස් දෙනවාද, කවුරු උපදෙස් දෙනවාද කියන්න මම දන්නේ නැහැ. හොඳ උපදේශ දෙනවා. ඒක බොහොම හොඳයි. ඔය විධියට දිගටම කරගෙන යන්න. චිරාත් කාලයක් අපේ විපක්ෂ නායකතුමා විපක්ෂයේ යෙහෙන් වැජඹේවා! කියලා අපි ප්‍රාර්ථනා කරනවා. ඔය විධියටම ඒ උපදෙස් අරගෙන කටයුතු කරගෙන යන්න කියාත් අපි ඉල්ලනවා. එතුමා හදපු හුණ්ඩු ගෙවල් ටිකක් තිබුණා නේ. අපි දන්නේ නැහැ, දැන් ප්‍රදර්ශනය කළේ ඒ ගෙවල්වල ආකෘතියක්ද කියලා. ඒ කොහොම වුණත්, ඒ වැඩේ ඒ විධියටම කරගෙන යනවා.

ඒගොල්ලන් මතු කරපු කරුණු කිහිපයක් තිබෙනවා. අද මාතෘකාව ගැන කථා කරන්න කලින් මම ඒවාට උත්තර දෙන්න ඕනෑ. හර්ෂණ නානායක්කාර ඇමතිතුමා කොතැනකදීවත් කිව්වේ නැහැ, මහානායක හිමිවරුවත්, නැත්නම් අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවත් නොමඟ යවලා කියලා. එතුමා මොකක්ද කිව්වේ? එතුමා කිව්වේ උන්වහන්සේලාට එක්කෝ කරුණු බාගෙට කියලා, නැත්නම් වැරදි කරුණු කියලා කියන එකයි. එම නිසා හර්ෂණ නානායක්කාර ඇමතිතුමාත්, නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් දෙදෙනා උන්වහන්සේලා හමුවට ගිහිල්ලා අපි මේ කරන්න යන්නේ මොකක්ද කියලා නිවැරදි කරුණු ඉදිරිපත් කළා. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන්නේ මොකක්ද, ඒ තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියලා එතුමන්ලා කිව්වා. ඒ වාගේම, ඉතාම පැහැදිලිව විධායක ජනාධිපතිවරයා පත් කරලා, මන්ත්‍රීවරු 159දෙනෙක් පත් කරලා, ඉන් අනතුරුව පළාත් පාලන ආයතන බහුතරයකත් බලය දීලා මේ රටේ ජනතාව අපට ජන වරමක් දීලා තිබෙනවා. ඒ අනුව ජනතා අභිලාෂය ඉටු කරන්න අපට වගකීමක් තිබෙනවා. ඒ ජනතා අභිලාෂය ඉටු කරන්න තමයි අපි ගන්නා හැම තීන්දුවක්ම ගන්නේ. මේ ආණ්ඩුව මෙතෙක් ගත් සියලුම තීන්දු අරගෙන තිබෙන්නේ ඒ ජනතා අභිලාෂයන් ඉටු කිරීම වෙනුවෙනුයි. එහෙම නැතුව අපි, අපි වෙනුවෙන් තීන්දු ගත්තේ නැහැ. අපි, අපි වෙනුවෙන් ගත් තීන්දු මොනවාද? මන්ත්‍රී විශ්‍රාම වැටුප අහෝසි කිරීම, පාර්ලිමේන්තුවේ කෑම වේලේ මිල වැඩි කිරීම, මන්ත්‍රීවරුන්ගේ වාහන පර්මිට් එක නතර කිරීම, මන්ත්‍රී රක්ෂණාවරණය රුපියල් මිලියනයේ ඉඳලා රුපියල් ලක්ෂ දෙකහමාර දක්වා අඩු කිරීම, ජනාධිපතිවරයාගේ බොහෝ වරප්‍රසාද කප්පාදු කිරීම වාගේ තීන්දු තමයි ගත්තේ. හැබැයි, එලෙස ගත්ත හැම තීන්දුවක්ම අපි ගත්තේ රටේ ජනතාව වෙනුවෙනුයි. කුඩා කල්ලියක් මොන විරෝධතා දැක්වුවත් ඉදිරියටත් අපි යන ඒ ගමන ආපසු හරවන්නේ නැහැ කියන කාරණය මම අවධාරණය කරනවා.

ඒ වාගේම, ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යයක් තිබෙනවාද කියලා අහනවා. ඒ නීතිඥ මහත්මයා කථා කරද්දී අහනවා, රටේ නීතියේ ආධිපත්‍යය ගැන. නීතියේ ආධිපත්‍යය නිසි ලෙස ක්‍රියාත්මක වන නිසා තමයි ඒගොල්ලන්ගේ කඳවුරේ හිටපු රාජිත සේනාරත්නගේ මල්ලි වන මහීල් සේනාරත්නව අද අත්අඩංගුවට පත් වෙන්නේ. ඒ, නීතියේ ආධිපත්‍යයට කිසිදු ලෙසක බලපෑමක් සිදු නොවන නිසායි. ඒ විතරක් නොවෙයි, කෙහෙළිය රඹුක්වැල්ල අදත් අත්අඩංගුවට අරගෙන. මට හිතෙන්නේ එතුමා හරියට නඩු භාණ්ඩයක් වාගේයි. කුණ්ඩසාලේ පුරාවිද්‍යා වැඩ බිමක සඳකඩ පහනක් උස්සලා. මගේ අම්මේ! ඒ මහත්තුරු බෞද්ධාගම ගැන පුදුම බුද්ධාලම්බන ප්‍රීතියකින් කථා කරන්නේ. හැබැයි, පුරාවිද්‍යා වැඩ බිමේ සඳකඩ පහනත් හොරකම් කරලා. ඒ වාගේම, රූපවාහිනී සංස්ථාවට cadre එක ඉක්මවා සේවකයින් බඳවාගෙන තිබෙනවා. ඉතින්, අදත් නඩු.

අධිකරණය ප්‍රතිසංවිධානය කරනවාට, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා අධිකරණ පද්ධතියේ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කරනවාට, අධිකරණ ප්‍රමාණය වැඩි කරනවාට, මහාධිකරණ විනිසුරුවරු සංඛ්‍යාව 110 සිට 120 දක්වා වැඩි කරනවාට, අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ ප්‍රමාණය වැඩි කරනවාට විරුද්ධ වෙන්නේ ඇයි කියලා අපි දන්නේ නැහැ. එතුමන්ලාගෙන් සමහරු කියනවා, අපි විරුද්ධ වුණත් අපි හොරු නොවෙයි, ඇප පිට සහ සැක පිට ඉන්න අයලු, මේකට විරුද්ධ වෙන්නේ කියලා ආණ්ඩුවේ අපි කියනවාය කියලා. ඔව්, අපි එහෙම කියනවා. ඇප පිට සහ සැක පිට සිටින අය විරුද්ධ වෙනවා. ඇප පිට සහ සැක පිට සිටින අයට උඩ ගෙඩි දෙන, ඒගොල්ලන් ආරක්ෂා කරන, ඒගොල්ලන් වටා පවුරක් ලෙස ඉඳගෙන "අපි හොරු නොවෙයි" කියලා කියන, "අපි සුදනෝ" කියලා කියන කට්ටියත් මේකට විරුද්ධ වෙනවා. අපට තේරුම් ගන්න බැරි උභතෝකෝටිකය ඒකයි.

දැන් නාමල් රාජපක්ෂලා විරුද්ධ වන එක ගැන අපට හිතා ගන්න පුළුවන්. නාමල් රාජපක්ෂ පසුගිය දවස්වලත් ඇවිල්ලා ඇඟිල්ල දිගු කරලා, "අපි කවුද කියලා දන්නවා නේ" කියලා අහනවා මම දැක්කා. අපි දන්නවා, නාමල් කවුද කියලා. නාමල්ලා, රාජපක්ෂලා කවුද කියලා අපි දන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. තාජුඩීන් මරපු විධිය අපට අමතක නැහැ. ලසන්ත වික්‍රමතුංග ඝාතනය කරපු විධිය අපට අමතක නැහැ. මේ රටේ ජනතාව පිටුපස සුදු වෑන් ආපු විධිය අපට අමතක නැහැ. ඉතින්,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගැන අපට මතකයි.

පස්ස දොරෙන් යන්නේ නැද්ද මොකක්ද කියලාත් කිව්වා. ඔව්, ඉස්සරහා දොරෙන් පැනලා ගිහිල්ලා ත්‍රිකුණාමලයේ හැංගිච්ච විධියත් අපට මතකයි. ඒගොල්ලන්ව ආරක්ෂා කළේ රනිල් වික්‍රමසිංහ. රනිල් වික්‍රමසිංහ තමයි ඒගොල්ලන්ගේ ආරක්ෂකයා බවට පත් වුණේ. ඒක නේ, ඒ කාලයේ රනිල්-රාජපක්ෂ ආණ්ඩුව කියලා කිව්වේ. ඒගොල්ලන්ව ආරක්ෂා කළේ රනිල්.

රනිල් ආරක්ෂා කරපු ශිරාන් බාසික් මතකද? 2024දී රනිල්ගේ ආණ්ඩුව කාලයේ ඔහු නිදොස් කොට නිදහස් වුණා. දැන් නැවත ලංකාවට ගෙනැල්ලා අන්න, දින 90ක් රඳවුම් නියෝග ගහලා, විමර්ශන කරගෙන යනවා. ඔන්න නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක කරන විධිය. 2024දී නාමල්ලා ගේ රැකවලා - ආරක්ෂකයා - වන රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුව කාලයේ ශිරාන් බාසික් නිදොස් කොට නිදහස් වෙනකොට, මේ ආණ්ඩුව යටතේ ඔහු නැවත ගෙනැල්ලා දින 90ක් රඳවුම් නියෝග ගහලා නීතියේ ආධිපත්‍යය අකුරට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හොඳයි, මට තවත් විනාඩියක් දෙන්න.

අද දවසේ වැදගත්ම කාරණය තමයි, මේ ඉදිරිපත් කර තිබෙන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි පිළිබඳව කථා කිරීම. ඒ නිසා මේ පනත පිළිබඳව යමක් කියන්නට ඕනෑකම තිබෙනවා.

විශේෂයෙන්ම මේ පනත අපේ රටට අතිශය වැදගත් පනතක්. ඒ, වෙන කිසිවක් නිසා නොවෙයි, අද ඉදිරිපත් කර තිබෙන මේ රෙගුලාසි මඟින්, බලහත්කාරයෙන් ශ්‍රමය යොදවා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් කැණීම් කරන, නිෂ්පාදනය කරන ඒ වාගේම නිමවන ලද භාණ්ඩ ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කරනවා; forced labour යොදවා නිෂ්පාදනය කරන භාණ්ඩ ආනයනය තහනම් කෙරෙනවා. ඒ නිසා මෙය අතිශය වැදගත් පනතක්.

විශේෂයෙන්ම ජාත්‍යන්තර කම්කරු සංවිධානය -ILO- මඟින් හැම වසරකම ජුනි මාසයේ සති දෙකක් පුරා ජාත්‍යන්තර කම්කරු සම්මේලනය පවත්වනවා. එහිදී මේ කරුණු පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කරනු ලබනවා. පසුගිය වසරේත් අපි, අපේ රටේ ළමා ශ්‍රමය පිළිබඳව දාලා තිබෙන වාර්තාවක් සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කළා. එහිදී අපේ රටේ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව අපි පැහැදිලි කළා. එම නිසා අපට ඒක ලොකු ගැටලුවක් බවට පත් වුණේ නැහැ.

ලෝකයේ තිරසර සංවර්ධන ඉලක්කවල - Sustainable Development Goalsවල, SDGsවල - Alliance 8.7 කියලා එකක් තිබෙනවා. මේ වසරේ ජුනි මාසයේදී ඒ Alliance 8.7හි, නැත්නම් ඒ එකතුවේ උප සභාපතිත්වය ලංකාවට ලැබුණා. Alliance 8.7 කියන්නේ මොකක්ද? බලහත්කාරී ශ්‍රමය, නූතන වහල්භාවය, මිනිස් ජාවාරම හා ළමා ශ්‍රමය 2030 වන විට තුරන් කිරීම ඉලක්ක කර ගෙන ගොඩනඟන ලද සන්ධානයක් තමයි, Alliance 8.7 කියන්නේ. එහි උප සභාපතිත්වය අපේ අමාත්‍යාංශයට, එහෙම නැත්නම් කම්කරු අමාත්‍යාංශයට ලබා ගන්න අපි සමත් වුණා. එහි සභාපතිත්වය බ්‍රසීලය දරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හොඳයි, මම ඉක්මනින් අවසන් කරනවා. මට තත්පර 30ක් දෙන්න.

එම සන්ධානයේ උප සභාපතිත්වය අපි ලබා ගත්තා. අපේ කම්කරු කොමසාරිස් ජනරාල්තුමිය වන නදීකා වටලියද්ද මහත්මිය ඒ තනතුර සඳහා අපි නම් කරලා තිබෙනවා. ආසියාවට මෙවැනි තනතුරක් ලැබුණු පළමුවැනි අවස්ථාවයි මේ. එවැනි තනතුරක් ලැබුණේ කුමක් වෙනුවෙන්ද? ඒ වෙන කිසිවක් නිසා නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් ආණ්ඩුවක් ලෙස අපි ක්‍රියාත්මක වීමත්, ඒ තිරසරභාවයත් නිසා තමයි අපේ රටට මේ තනතුර ලබා ගන්න අපි සමත් වුණේ.

අද දවසේ විවාදයට ගන්න මේ පනත ඉතාම වැදගත්. එම නිසා විපක්ෂය වෙන වෙන කථා කියමින් නන් දෙඩෙව්වාට අපි විශ්වාස කරනවා, අපේ රටේ ආර්ථිකය තව තවත් ශක්තිමත් කරන්නට, අපි යන ගමන තව තවත් ශක්තිමත් කරන්නට මේ පනත ඉවහල් වෙන බව. ඒ කාරණයත් අවධාරණය කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තුරෙයිරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ස්ථාවර නියෝග 91 (ඉ) යටතේ මම කියන්නේ. මම කථා කරද්දි මාව හැමදාම නවත්වනවා. මෙතුමාගේ කථාවේ භාගෙට භාගයක් හැන්සාඩ් වාර්තාවෙන් ගලවන්න වෙනවා. මොකද, පනතේ නැති ඒවා තමයි කථා කරලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තුරෙයිරාසා රවිකරන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[பி.ப. 2.06]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய விவாதத் தலைப்பின் அடிப்படையில்,

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

வலுக்கட்டாயமாக உழைப்பைப் பகுதியாகவோ, முழுமையாகவோ கொண்டு அகழ்ந்தெடுக்கப்படும், உற்பத்தி செய்யப்படும் அல்லது தயாரித்து முடிக்கப்படும் எந்தவொரு பொருளும் இலங்கைக்கு இறக்குமதி செய்யப்படுவதை முற்றிலும் தடை செய்தல் வரவேற்புக்குரியது. தண்டனை அல்லது மிரட்டலுக்கு உட்படுத்தப்பட்டு, கட்டாயப்படுத்திப் பெறப்படும் வேலை, மனித உரிமை மீறலுக்குரியது என்ற வகையில், அவ்வாறானவற்றுக்கு எதிரான அரசின் நடவடிக்கைகள் எப்போதும் வரவேற்புக்குரியன.

கட்டாய உழைப்பாளிகள் அடங்கலாக, நவீன அடிமை முறைக்கு உட்பட்ட கிட்டத்தட்ட 139,000 பேர் இலங்கையிலேயே உள்ளதாக 2021ஆம் ஆண்டின் Walk Free அமைப்பின் புள்ளிவிபரம் குறிப்பிடுகிறது. இலங்கையில், நவீன அடிமைமுறை சார்ந்த பாதிப்பு 56% அளவில் காணப்படுகிறது. இது ஆசிய - பசுபிக் பிராந்திய சராசரியைவிட அதிகமாகும். இவ்வாறான கட்டாய உழைப்பாளிகளைக் கட்டுப்படுத்தும் பதிலீட்டு நடைமுறையில் இலங்கை 50%இலும் குறைவான துலங்கலையே வெளிப்படுத்துவதாக குறித்த அறிக்கை சுட்டிக்காட்டுகிறது. மேலும், கட்டாய உழைப்பாளிகளில் அடங்கும் சிறுவர்களின் மோசமான முறையிலான உழைப்புத் தொடர்பாக அமெரிக்கத் தொழில் திணைக்களத்தின் இலங்கைக்குரிய 2022ஆம் ஆண்டின் கண்டறிதல், இலங்கையில் உள்ள சிறுவர்கள் வணிக ரீதியான பாலியல் சுரண்டல் மற்றும் கட்டாய வீட்டு வேலைகள் உள்ளிட்ட பாதிப்புகளுக்கு உட்படுத்தப்படுவதையும், அகழ்ந்தெடுத்தல் மற்றும் கட்டுமானப் பணிகளிலும்கூட சிறுவர்கள் தொழிலில் ஈடுபடுத்தப்படுவதையும், ஆய்வாளர்களுக்கான போதியளவு ஆளணி வளம் இல்லாததால் வட, கிழக்கு மாகாணங்களில் இது தொடர்பில் முழுமையான ஆய்வு மேற்கொள்ளப்படாதிருப்பதையும் அறிக்கைப்படுத்துகிறது.

தீவுக்குள்ளேயே தேயிலைத் தோட்டங்களிலும் கடலோரப் பகுதிகளிலும் அகழ்வுப் பணிகளிலும் விவசாயத் துறையிலும் கட்டாயத் தொழிலாளிகளின் உழைப்பு விரவியிருக்கின்றபோது, அவற்றைக் கண்காணிக்கவும் கட்டுப்படுத்தவும் போதுமான கட்டமைப்புகள் இன்றிய நிலையில், இவ்வரசாங்கம் இன்றைய விவாதப்பரப்பில் காட்டுகின்ற மனித உரிமைசார் இறக்குமதிக் கொள்கையைச் சமநேரத்தில் ஏற்றுமதிகள் தொடர்பிலும் செயற்படுத்த உறுதிபூண வேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, தீவளாவிய சமத்துவ நிலையில் மிகவும் தூரமாயிருக்கும் முல்லைத்தீவு மாவட்டத்துக்குரிய வளப் பற்றாக்குறை தொடர்பான சில விடயங்களை முன்வைக்க விரும்புகிறேன். தீவளாவிய வகையில் கடவுச்சீட்டுகளுக்கான அதிகாரம் அளிக்கப்பட்ட 1,420 கலையகங்கள் காணப்படுகின்றபோதும், முல்லைத்தீவு மாவட்டத்தில் ஒரேயொரு கலையகம் மட்டுமே பதிவுசெய்யப்பட்டுள்ளது. குறித்த கலையகமும் கடந்த மூன்று ஆண்டு காலமாக இயங்காதுள்ளது. இதனால் முல்லைத்தீவு மாவட்ட மக்கள் கடவுச்சீட்டுகளுக்கான புகைப்படங்களை எடுப்பதற்காக வெளிமாவட்டங்களுக்குச் செல்லவேண்டிய துர்ப்பாக்கிய நிலை ஏற்பட்டுள்ளது. இது அரச சேவை வழங்கலின் சமத்துவ நிலையை மிகவும் கேள்விக்குள்ளாக்குகிறது. இது தொடர்பில் குடிவரவு மற்றும் குடியகல்வுத் திணைக்களத்தின் கட்டுப்பாட்டாளர் நாயகத்துக்கு முல்லைத்தீவு மாவட்டச் செயலகத்தினூடாகக் கடந்த 2026.05.04ஆம் திகதியன்றும், எம்மூடாக கடந்த 2026.07.31ஆம் திகதியன்றும் கடிதங்கள் அனுப்பப்பட்டுள்ளன. மேற்படி வசதியீனம் தொடர்பில் விரைவில் விசேட தலையீட்டை மேற்கொள்ளவேண்டுமென குறித்த திணைக்களத்துக்குப் பொறுப்பான பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர் அவர்களிடமும், தீவளாவிய சமத்துவத்துக்கு மிகவும் அச்சுறுத்தலாகும் இவ்வசதியீனம் மிக விரையில் தீர்க்கப்பட வேண்டுமென அரசாங்கத்திடமும் இப்பேரவை ஊடாகக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்த விடயம் மிக முக்கியமானது. செம்மணி படுகொலை உள்ளிட்ட தமிழினப் படுகொலைச் சம்பவங்களுக்குச் சர்வதேச விசாரணை தேவை. செம்மணி மனிதப் புதைகுழியின் மூன்றாங்கட்ட அகழ்வுப் பணிகளின் 54ஆம் நாள் அகழ்வு நேற்று - 2026.08.17 - இடம்பெற்றது. இதன்போது புதிதாக 10 எலும்புக்கூட்டுத் தொகுதிகள் அடையாளம் காணப்பட்டுள்ளதுடன், 8 மனித எலும்புக்கூட்டுத் தொகுதிகள் அகழ்ந்து எடுக்கப்பட்டுள்ளன. அந்த வகையில், இதுவரை செம்மணி மனிதப் புதைகுழியிலிருந்து மொத்தமாக 572 மனித எலும்புக்கூட்டுத் தொகுதிகள் அடையாளம் காணப்பட்டுள்ளதுடன், அவற்றிலிருந்து 565 மனித எலும்புக்கூட்டுத் தொகுதிகள் அகழ்ந்தெடுக்கப்பட்டுள்ளன. இவ்வாறாக செம்மணியில் தோண்டத் தோண்டத் தமிழ் மக்களுடைய மனித எலும்புக்கூட்டுத் தொகுதிகள் வெளிப்பட்டுக்கொண்டே இருக்கின்றன. சிறார்கள், பெண்கள், முதியவர்கள் என்ற எந்த வேறுபாடுகளுமின்றி எலும்புக்கூடுகள் வெளிப்படுகின்றன. தடயப் பொருட்களாகச் சிறார்களின் பால் போத்தல்கள், பாடசாலைப் பைகள் என்பன வெளிப்படுகின்றன. பச்சிளம் பாலகர்களும் பாடசாலைச் சிறார்களும் தாய்மாரும் என்ன பாவம் செய்தார்கள்? ஆயுதங்களோடு இருந்தார்களா, அவர்களைப் பிடித்துக் கொலை செய்வதற்கு? எனவே, இந்தப் படுகொலைக் குற்றவாளிகளும் இப்படுகொலைகளுக்குப் பின்னாலுள்ள அப்போதைய ஆட்சியாளர்களும் சர்வதேச நீதி விசாரணைக்கு உட்படுத்தப்பட வேண்டும். அதுவே பாதிக்கப்பட்ட எமது தமிழ் மக்களின் எதிர்பார்ப்பாகவும் இருக்கின்றது.

யாழ்ப்பாணத்தில் நேற்றைய தினம் - 17.08.2026 - 'நீதியின் ஓலம் - 02 அணையா விளக்கு' தொடர் போராட்டத்தின் இறுதி நாளில் வடக்கு, கிழக்கைச் சேர்ந்த தமிழ் மக்கள் இணைந்து மாபெரும் ஆர்ப்பாட்டப் பேரணியொன்றினை நடத்தியிருந்தனர். செம்மணிப் படுகொலை உள்ளிட்ட, தமிழ் மக்கள்மீது மேற்கொள்ளப்பட்ட படுகொலைகளுக்குச் சர்வதேச நீதி விசாரணையைக் கோரியே குறித்த மாபெரும் ஆர்ப்பாட்டப் பேரணி மேற்கொள்ளப்பட்டது. தற்போதைய ஆட்சியாளர்களே, தயவுசெய்து எமது மக்களின் வலிகளையும் அவலங்களையும் புரிந்து கொள்ளுங்கள்! எமது தமிழ் மக்கள்மீது நிகழ்த்தப்பட்ட படுகொலைகளுக்குச் சர்வதேச நீதி விசாரணை மேற்கொள்வதற்கு நடவடிக்கை மேற்கொள்ளுங்கள்! சர்வதேச நீதி விசாரணைக்கு ஒத்துழையுங்கள்! அதன்மூலம் தமிழினப் படுகொலைக் குற்றவாளிகள் தண்டிக்கப்பட வேண்டுமென இப்பேரவையைக் கோருகின்றேன். நன்றி! வணக்கம்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නන්දන මිල්ලගල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.13]

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන ලද ඉතාම යහපත් රෙගුලාසි කිහිපයක් පිළිබඳව සංවාදයේ යෙදෙන, කථාබහ කරන මේ මොහොතේ විපක්ෂයේ සමහර නීති විශාරදයන් යැයි කියා ගන්නා අය උත්සාහ කළා, ආණ්ඩුව විධියට අපි මේ රටේ නීතිය අශුද්ධ වුවමනාවන් වෙනුවෙන් භාවිත කරන්න උත්සාහ කරන බවක් කියන්න. නමුත් මට මතක් වෙනවා, පසුගිය පාර්ලිමේන්තු වාරයේදී කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අපේ ගරු කංචන වැලිපිටිය මැතිතුමා ඉදිරිපත් කළ කාරණයක් පිළිබඳව. එතුමා සඳහන් කළා, අද මේ කථා කරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ඉදිරිපත් කරපු රෙගුලාසි හරහා බලගැන්වෙන රේගු ආඥා පනතේ නීති දූෂ්‍ය වුවමනාවන් වෙනුවෙන් භාවිත කරලා ලංකාවට නීති විරෝධී අරක්කු, සිගරැට් ආනයනය කරලා පොහොසතුන් බවට පත් වෙච්ච අය පිළිබඳව.

එක වරෙක යටියන්තොට මහබාගේ ප්‍රදේශයේදී රුපියල් 4,900,000ක් වටිනා තහනම් සිගරැට්, අරක්කු ආනයනය කරලා උසාවිය ඉදිරියේ වැරැදිකරු වුණු, කෑගල්ල ප්‍රදේශයේදී නැවත 6,000,000කට අධික සිගරැට්, අරක්කු ප්‍රමාණයක් නීති විරෝධී ලෙස ආනයනය කරලා උසාවිය ඉදිරියේ වැරැදිකරු වුණු පුද්ගලයෙක් හිටියා. එහෙම තමයි සමහරු ඒ කාලයේ රේගු ආඥා පනත ඉතාම දූෂ්‍ය ලෙස තමන්ගේ වුවමනාවන් වෙනුවෙන් භාවිත කළේ. නීතිය දූෂ්‍ය නැහැ. නීතිය දූෂ්‍ය වුවමනාවන් වෙනුවෙන් භාවිත කරලා වැරැදිකරුවන් වෙච්ච අය මා කටයුතු කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ සංවිධායකවරුන් විධියට පත් කර තිබෙනවා.

අප ඉදිරිපත් කර තිබෙන විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සලිත වෙලා, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ අප ඉදිරිපත් කර තිබෙන මේ ඉතාම යහපත් රෙගුලාසි යටපත් කරන්න විපක්ෂයේ සමහරු උත්සාහ කරනවා. විශේෂයෙන් අද මේ ඉදිරිපත් කර තිබෙන ආනයන හා අපනයන (පාලන) පනතේ රෙගුලාසි මඟින් අපට, අපේ රටට සහ අපේ ජනතාවට ලැබෙන ප්‍රතිලාභ ක්ෂේත්‍ර 4ක් ඔස්සේ ඉදිරිපත් කරන්න මා කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එයින් පළමුවෙනි කාරණය මේකයි. එය අපේ රටේ ආර්ථිකයට සිදු කරන ඉතා යහපත් බලපෑමක්. මා එහෙම කියන්නේ ඇයි? ආර්ථිකය කියන්නේ රුපියල් ශත හෝ ඩොලර්වලින් විතරක් මැනෙන සාධකයක් නොවෙයි කියන කාරණාව මෙහිදී ඉතාම හොඳින් මතු කරනවා; මානවීයත්වය, මිනිස් ශ්‍රමයේ තිබෙන වටිනාකම, අගය එතැනට එකතු වෙන්න ඕනෑ කියන කාරණාවත් මතු කරනවා. ඒක තමයි අපේ රටේ ආර්ථිකයට කරන යහපත් බලපෑම. ඒ නිසා තමයි ඇමෙරිකාව ආදි රටවල්, එහෙම නැත්නම් ලෝකයේ යුරෝපාකරය වාගේ කලාප අපේ රටේ ආර්ථික සංවර්ධනය පිළිබඳ යහපත් ආකාරයකින් දකින්නේ. මම දෙවනුව මේ සංශෝධනය දකින්න කැමැතියි, අපේ රටේ ජාත්‍යන්තර ප්‍රතිරූපය ගොඩනැඟීමට සිදු කරන යහපත් බලපෑමක් විධියට.

පසුගිය කාලසීමාව තුළ ඔය විවේචන ගෙන එන මහත්වරු අපේ රටේ ප්‍රතිරූපයට සිද්ධ කරලා තිබුණු හානිය අපට වචනවලින් කියලා නිම කරන්නත් බැහැ. ඒ වාගේම, වෙනත් මොනවා හරි මිනුම් දඬු තිබෙනවා නම් ඒ මිනුම් දඬුවලින් මැනලා අවසන් කරන්නත් බැරි තරම්. බිඳ වැටුණු රාජ්‍යයක්, මිනිස් අයිතීන් සුන්නද්දූලි වෙලා ගිය රාජ්‍යයක් විධියටත් තමයි අපේ රට හැඳින්වුවේ. අන්න ඒ විධියට තමයි ඔවුන් අපේ රට ගොඩනැඟුවේ. හැබැයි මේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ ගෙනෙන රෙගුලාසි හරහා අපේ රටේ ජාත්‍යන්තර ප්‍රතිරූපය ඉහළට ගොඩනඟන්න සමත් වෙන බව අපට පේනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා තුන්වෙනුව මතු කරන කාරණය මෙයයි. අප රටක් විධියට ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ දක්වන යහපත් ප්‍රතිචාරය කුමක්ද කියන එක මේ රෙගුලාසිවලින් මනාව පැහැදිලි වෙනවා. මිනිසෙක් විධියට ඉපදිලා ඔහුගේ කායික ශ්‍රමය වේවා, මානසික ශ්‍රමය වේවා ආයෝජනය කරනකොට කාගේවත් අයහපත් බලපෑම් මත ඒක කරනවාට වඩා ඉතාම යහපත් ආකාරයකට ඒ ශ්‍රමය භාවිත කරන්න තිබෙන ඉඩකඩ පිළිබඳව මෙතැනදී කථා කරනවා. මේවා මානව හිමිකම් ඉතා අපූරු දෘෂ්ටියකින් දකිමින් ඉදිරිපත් කරන රෙගුලාසි විධියට මා අර්ථකථනය කරන්නේ ඒ නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේවා වඩාත්ම වැදගත් වෙන්නේ මේ නිසායි. අනාගතයේ අපේ රට ආර්ථිකමය වශයෙන් ප්‍රශස්ත තැනකට ඔසවා තබන්න තමයි අපි ආණ්ඩුවක් විධියට කටයුතු කරමින් ඉන්නේ. එසේ කටයුතු කරන අවස්ථාවේදී අපට වැදගත් වෙනවා ළමා ශ්‍රමය, තරුණ ශ්‍රමය, කාන්තා ශ්‍රමය භාවිත කරන්නේ කොහොමද කියන එක. ඒ අතරින් මා විශේෂයෙන් මේ කාරණය මතු කරන්න කැමැතියි. ඔබ දන්නවා, පසුගිය කාලවල මේ රටේ වතු කම්කරු ජනතාවගේ ශ්‍රමය මොන විධියටද භාවිත කළේ කියලා. ඒ නිසා ඒ මලෙයහම් ජනතාව මේ රටේ සාමාන්‍ය ජනතාව විධියට, ශ්‍රී ලාංකිකයන් විධියට ගොඩනඟමින් ඔවුන්ගේ වාසස්ථානයේ ඉඳලා, ඔවුන්ගේ වැටුපේ අයිතියේ ඉඳලා ඔවුන්ගේ ශ්‍රමයට නව වටිනාකම් දෙමින්, ඔවුන් මේ රටේ පුරවැසියන් විධියට අගයමින් කටයුතු කරන්න අපි ආණ්ඩුවක් විධියට ක්‍රියාත්මක වෙනවා. මෙන්න මේ ක්ෂේත්‍ර හතරෙන්ම මා මේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි හඳුන්වා දෙමින් ඒවා අපේ රටේ ආර්ථිකයටත්, ඒ වාගේම ආර්ථිකය ගොඩනඟන්න දායක වන ශ්‍රමයටත් ලබා දෙන නව වටිනාකමක් කියලා පෙන්වා දෙමින් මේ අවස්ථාවේදී ඒ ගැන වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව සලසා දීම පිළිබඳව මූලාසනයට ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.21]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම අද දවසේ ගෙනාපු මේ රෙගුලාසිවලට අපේ සහයෝගය දෙන ගමන්, මේ රටේ අවුරුදු ගණනක් අරගෙන ආපු වැඩ පිළිවෙළක අවසානය දකින්න ලැබීම ගැන අපි කනගාටු වෙනවා. විශේෂයෙන් 2025.07.24වන දා මේ රටේ ඇති වුණු තත්ත්වය මෙයයි. එක්ස්ප්‍රස් පර්ල් නෞකාව නිසා අතිවිශාල පරිසර හානියක් සිද්ධ වුණා. ඒ හානියට අදාළව නඩු පැවරුවා, පාර්ශ්ව

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ගණනාවක්. ඒ පාර්ශ්ව ගණනාව නඩු පැවරුවාට පස්සේ ඒ නඩුව විභාගයට ගත්තා, එවකට අග්‍ර විනිශ්චයකාරවරිය වූ මුර්දු ප්‍රනාන්දු මැතිනිය ඇතුළු විනිශ්චයකාරවරුන් 5දෙනෙකුගේ මණ්ඩලයක් මඟින්. එතුමන්ලා ඒ තීන්දුව දුන්නා, 2025.07.24වන දා. එතුමියගේ නඩු තීන්දුවේ පිටු තුන්සිය හැට ගණනක් තිබෙනවා. පිටු 14ක ඉතාම කෙටි Summary එකකුත් එතුමිය ඉදිරිපත් කරලා තිබුණා, එතුමියගේ නායකත්වයෙන්. එහි බොහොම පැහැදිලිව මෙසේ සඳහන් කර තිබුණා.

> " 'Proceedings relating to these Applications are not terminated, and the Registrar of the Supreme Court is directed to Mention this matter on 25th September, 2025 for the purposes stated herein and for the Court to take cognizance of the status of implementation of the several orders contained in this judgment. The Registrar is directed to constitute a bench comprising the present Divisional Bench for such purpose. As the Honourable Chief Justice who has presided over this Divisional Bench will retire soon, the Registrar is directed to bring this matter to the attention of the succeeding Honourable Chief Justice, and draw his attention to the need to make an appointment to fill the vacancy that will arise.' "

ඒ කියන්නේ, අලුතින් එන අග්‍ර විනිශ්චයකාරතුමාට මේකේ බලය පවරනවා. මේ ක්‍රියාදාමයත් එක්ක මේ විධියට ගිහිල්ලා ඊට පස්සේ මාස 3ක් ඇතුළත ඩොලර් බිලියන එකක්, ඒ කියන්නේ රුපියල් බිලියනවලින් ගත්තොත්, රුපියල් බිලියන 300ක්, එහෙම නැත්නම්, කෝටි 30,000ක්. මොකද, මේකෙන් ධීවරයන් 19,000කට විතර විශාල විනාශයක් සිද්ධ වුණා. අපේ පරිසර පද්ධතිය, මුහුදු පරිසර පද්ධතිය සම්පූර්ණයෙන් විනාශ වුණා. ඒකට මූලික ගෙවීමක් වශයෙන් බිලියනයක් ගෙවන්න කියලා මේ කොම්පැනියට කිව්වා. මාස 3ක් ඇතුළත ඩොලර් මිලියන 250ක් මූලික වශයෙන් තැන්පත් කරන්න කියලා මේ තීන්දුව දීලා තිබෙනවා. ඒ journal එක ගත්තාට පස්සේ, රුපියල් මිලියන 300ක්. 2025.09.22 දින 13වන වින්තිකරු විසින් රුපියල් මිලියන 250ක් ගෙවලා තිබෙනවා. ඒ කියන්නේ, ඩොලර් මිලියන 250ක් ගෙවන්න කියලා තීන්දු කළාට ඩොලර් මිලියනයක් තමයි මූලික වශයෙන් මේ අය ගෙවලා තිබෙන්නේ. එතැනින් පස්සේ මේ ක්‍රියාවලියට තව කරුණු ගණනාවක් ඇතුළත් වෙනවා.

විශේෂයෙන්ම MV X-Press Pearl Compensation Commission කියලා Commission එකක් හදනවා. ඒකට independent expertsලා පස්දෙනෙක් ඇතුළත් කරනවා. State independent expertsලා කියලා තව 6දෙනෙකු වෙනම පත් කරනවා. මේ කොමිසම පත් කරලා Justice Amarasekera හිටපු විනිශ්චයකාරතුමා යටතේ මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙනියන්න පවරනවා. එතකොට Commission එකක් පත් කරන්න ඕනෑ. ඒ Commission එකට දෙපැත්තේම Expertsලා එන්න ඕනෑ. ඇවිල්ලා ඒ අය එකතු වෙලා මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙනියන්න ඕනෑ. මේක නවතින ක්‍රියාදාමයක් නොවෙයි. හැබැයි, අවසානයේ මොකක්ද වෙන්නේ?

2026.01.26 දින නැවත මේ නඩුව කැඳවනවා. ඇත්ත වශයෙන්ම නීතිපතිතුමා තමයි ඉස්සෙල්ලාම මෝසමක් මඟින් මේ නඩුව කැඳවූයේ. ඒ දවසේම මේකට සම්බන්ධ වෙලා සිටින කොම්පැනියේ අයත් ඇවිල්ලා මේ සඳහා අවශ්‍ය කටයුතු ටික කළා. මේ සම්බන්ධව ඉන්නේ The London P&I Club කියන company එක. මීට පෙරාතුව ඔවුන් ලිපි කිහිපයක් එව්වා. ඒ ගැන මම කියන්නම්. 2025 සැප්තැම්බර් 19වැනි දා, "His Excellency, The President of Sri Lanka, President's House, Janadhipathi Mawatha, Colombo 01" කියලා පළමුවෙනි ලිපිය එව්වා. එහි මෙසේ සඳහන් වෙනවා:

> "In response to this incident, over US $ 170,000,000 (one hundred and seventy million dollars) was spent by X-Press Feeders, our member and the former operator of the ship, in respect of clean-up costs, and compensation to impacted local communities, despite having no legal liability to do so."

නීතිමය වගකීමක් නැතුවත් මේගොල්ලන් මේක කලා කියලා කියනවා. හැබැයි, ඊට පස්සේ මේ ලිපිය ජනාධිපතිතුමාට එවනවා. එතකොට වර්තමාන ජනාධිපතිතුමා නොවෙයි හිටියේ. එතුමාට සාධාරණයක් වෙන්න ඒක කියන්න ඕනෑ. එතුමා පත් වෙන්නේ සැප්තැම්බර් 21වැනි දා. නැවත සැප්තැම්බර් 24වැනි දා The London P&I Club කියන company එක Rachel Reeves MP, Chancellor of the Exchequerට - Londonවල ඉන්න Treasury Secretaryට - ලිපියක් යැව්වා, මේ නඩු තීන්දුවට මැදිහත් වෙන්න කියලා. ඇත්ත වශයෙන්ම මේක සම්පූර්ණයෙන් වැරදියි. අපේ රටේ අධිකරණයේ ස්වාධීනත්වයට මැදහත්වීමක් මේ කොම්පැනිය කරලා තිබෙන්නේ. තුන්වැනි ලිපිය 2025 නොවැම්බර් 14වැනි දා, ජනාධිපතිතුමාට එව්වා. එතකොට වර්තමාන ජනාධිපතිතුමා තමයි ඉන්නේ. ඒකෙන් මෙහෙම ඉල්ලනවා:

> "In your role as President, and mindful of your responsibility for ensuring the constitutional separation of powers, I would humbly ask that you continue to advocate, Your Excellency, for non-custodial measures, in the case of the agents and the master, whilst this matter continues."

ඊළඟට ඒකත් එක්කම මෙසේ කියනවා:

> "…we have struggled to open a dialogue with the Attorney-General in relation to the July judgment, and humbly request your support in facilitating a discussion."

මේකට සහයෝගය දෙන්න කියනවා මේ අයත් එක්ක සාකච්ඡා කරන්න. මම දන්නේ නැහැ, එතැනින් පස්සේ මොකක්ද වුණේ කියලා.

හැබැයි, ඊට පස්සේ මේ සම්බන්ධව ලංකාවේ නීතිපති - Attorney-General - මෝසමක් ගොනු කරනවා. එවැනි මෝසමක් ගොනු කළාම සාමාන්‍යයෙන් පැමිණිලිකරුවන්ට ඒ මෝසමේ පිටපතක් serve කරන්න ඕනෑ. නමුත්, මේ වනතුරු - අද වනතුරු - එහෙම එකක් කරලා නැහැ. හැබැයි, ඊට පස්සේ මොකක්ද වෙන්නේ? විනිසුරු ශිරාන් ගුණවර්ධන මැතිතුමා, අචල වෙන්ගප්පුලි මැතිතුමා සහ ප්‍රියන්ත ප්‍රනාන්දු මැතිතුමා මේක නැවත කැඳවනවා. ඒ අනුව මේ මෝසම ෆයිල් කළාට පස්සේ, මේ මෝසම අනුව කටයුතු කරමින් මේ නඩුව terminate කරනවා. මේ termination එක දෙන්නේ කවදාද? 2026.01.26වන දා. On that day, the proceedings were terminated. හැබැයි, මේ සම්බන්ධයෙන් කරුණු දක්වන්න පැමිණිලිකරුවන්ට කිසිදු අයිතියක් නැහැ. නීතිපති දෙපාර්තමේන්තුව - Attorney-General's Department - ගෙනාපු මෝසම මොකක්ද කියලා ඔවුන් අද වනතුරු දන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් මේ නඩුව නතර වෙලා තිබෙන්නේ. පංච පුද්ගල විනිසුරු මණ්ඩලයක් විසින් දුන් තීන්දුවක් කිසියම් විධියකට වෙනස් කරනවා නම් හත් දෙනෙකුගෙන් යුක්ත විනිසුරු මඩුල්ලක් එන්න ඕනෑ. නමුත්, දැන් මෙතැන මොකක්ද කරන්නේ? පංච පුද්ගල විනිසුරු මඩුල්ලක් දුන් තීන්දුව, තුන් දෙනෙකුගෙන් යුක්ත විනිසුරු මඩුල්ලක් විසින් සම්පූර්ණයෙන්ම terminate කරනවා; මේ නඩුව සම්පූර්ණයෙන්ම දැන් නතර කරලා තිබෙන්නේ. මේක සම්පූර්ණයෙන්ම වැරදියි. දැන් මේ සම්බන්ධයෙන් නාගානන්ද කොඩිතුවක්කු මැතිතුමා ඇතුළු විනිවිද පදනම විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත් පැමිණි ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා

මේක ඉතාම seriously බලන්න ඕනෑ කාරණාවක්. ලංකාවට එන්න තිබුණු රුපියල් කෝටි තිස්තුන්දහසකට අධික මුදලක්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගත් යම් තීන්දුවක් මත දැන් සම්පූර්ණයෙන්ම නතර වෙලා තිබෙනවා.

ඊළඟට අපි මෙන්න මේ කාරණය ගැනත් අහන්න කැමැතියි. අද මේ ගෙනාපු විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තමයි අපට තිබෙන ප්‍රධාන අර්බුදය. එම සංශෝධනය තුළ තිබෙන්නේ පරිණත විනිශ්චයකාරතුමන්ලා මේකට සම්බන්ධ වෙන්න කියලායි. ඒ අයගෙන් වැඩ ගන්න කියලායි මේකේ තිබෙන්නේ. හැබැයි, අපට මේ කාරණා මත තේරෙන්නේ මොකක්ද? ඇත්ත වශයෙන්ම අපට ලැබෙන්න තිබිච්ච තවත් රුපියල් කෝටි තිස්තුන්දහසක මුදලක් රටට අහිමි වෙන වැඩ පිළිවෙළක් තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. මොකද, මේ Commission එක Justice Amarasekera යටතේ දැම්මා නම්, ඇත්ත වශයෙන්ම ඒක දිගටම ක්‍රියාත්මක වෙන්න තිබුණා. ඒකට expertsලා දාලා තිබෙනවා. ඒ අනුව මේ නෞකා අනතුරින් මුහුදට සිද්ධ වුණු පරිසර හානිය පිළිබඳව විශාල එකතු කිරීම් කරන්න තිබුණා. මේක ධීවරයන් 19,000කට විතර සහන සලසන්න තිබුණු අවස්ථාවක්. ඔවුන්ට ධීවර රැකියාව අහිමි වෙලා තිබෙනවා; මාළු අස්වැන්න අහිමි වෙලා තිබෙනවා; පරිසරය විනාශ වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපේ කාදිනල් උතුමාණනුත් කථා කළා. අපි එතුමාටත් කියන්න කැමැතියි, මේකට මැදිහත් වෙන්න කියලා. හේතුව, මේ සම්බන්ධයෙන් දැන් විශාල අර්බුදයක් මතුවෙලා තිබෙනවා. මොකද හේතුව, ලංකාවේ කවදාවත් මේ වාගේ තත්ත්වයක් ඇති වුණේ නැහැ. මේ වාගේ ගෙනාපු මෝසමක copies පැමිණිලි පාර්ශ්වයන්ට serve කරන්නේ නැතිව ඉතිහාසයේ කවදාවත් මෙහෙම කටයුතු කරලා නැහැ. මේ සම්බන්ධයෙන් සියලු කරුණු මම ඉදිරිපත් කරනවා.

විශේෂයෙන්ම මේකේ 899 වන ඡේදයේ මුර්දු ප්‍රනාන්දු මැතිතුමිය බොහොම පැහැදිලිව කියනවා, "මෙම නඩු කටයුතු අවසන්ව නොමැති බවත්, එම විනිසුරුවරුන් පස්දෙනාගේ මණ්ඩලය මඟින් ඉදිරියට යා යුතු බවත්,..." යනුවෙන්. ඒ පත්වන අග්‍ර විනිශ්චයකාරතුමා සම්බන්ධයෙන් Registrarවරයාට සම්පූර්ණ වගකීම පවරනවා, මේ සම්බන්ධයෙන් අවශ්‍ය කරන කටයුතු ටික කරන්න; අග්‍ර විනිශ්චයකාරතුමාට කියන්න කියලා මෙන්න මේ ක්‍රියාවලිය තුළින් ඉස්සරහට යන්න කියලා. හැබැයි, අද ඒක එහෙම සිද්ධ වෙන්නේ නැහැ. දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මේ රටට එන්න තිබුණා රුපියල් කෝටි තිස්තුන්දහසක මුදලක් - ඒ කියන්නේ US Dollars 1 billion, ඉස්සෙල්ලා - සහ දෙවනුව, ඒ රුපියල් කෝටි තිස්තුන්දහසට අමතරව තව තිබෙන damagesවලට collect කර ගන්න තිබුණා. මේ කොමිෂන් සභාව පත් කළා නම්, මේ කොමිෂන් සභාවෙන් තව තිබෙන damagesවලට collect කර ගන්න තිබුණා. හැබැයි මේ තිබෙන company එක, insurance company එකක්. එක පැත්තකින් ජනාධිපතිවරයාට ලියුම් යවනවා. ඊළඟට, එකම දවසේ නීතිපතිවරයා සහ මේ කොම්පැනිය එකතු වෙලා Motions file කරනවා.

මේවාට සහයෝගය දුන්නේ කවුද, මේකට වග කියන්නේ කවුද කියලා අපි අහන්න කැමතියි. මේ රුපියල් කෝටි තිස්තුන්දහසට මේකේ කවුරු හරි වග කියන්න ඕනෑ. මේකට මැදිහත් වෙන්න කියලා නීතිපතිවරයාට උපදෙස් දුන්න කෙනා කාගේ කවුද? අපි අහන්නේ ඒකයි. මේ මැදිහත්වීම මත තමයි නීතිපතිවරයා ගිහිල්ලා මේ මෝසම ඉදිරිපත් කරන්නේ. එතකොට ඔහු කියනවා, "කිසි ප්‍රශ්නයක් නැහැ, මේක terminate කරන්න සහයෝගය දෙනවා" කියලා. දැන් මාස ගණනාවක් වෙනවා, ඒකේ තිබුණු කරුණු මොනවාද කියලා මේකේ ඉන්න නීතිඥවරු අද වනතුරු දන්නේ නැහැ. පැමිණිලිකරුවෝ දන්නේ නැහැ. ඒ අයට serve කරලා නැහැ, මේකේ තිබිච්ච මෝසම. ඒ මෝසමේ තිබිච්ච කරුණු දන්නේ නැහැ. ඔවුන්ට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් කථා කරන්න බැරි වුණා. ඒ නිසා තමයි මේක ඉතා දැවැන්ත දූෂණයක් විධියට අපි හඳුන්වන්නේ. මේකට වග කියන්නේ කවුද කියලා අපි අහන්න කැමතියි. අපේ රටට එන්න තිබිච්ච රුපියල් කෝටි තිස්තුන්දහසක මේ වැඩ පිළිවෙළ නැවැත්තුවේ කවුද?

ඊළඟට, මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න කැමැතියි. ඒ තමයි, අපේ මධ්‍යම අධිවේගී මාර්ගය ගැන. හතරවන රුවන්පුර අධිවේගී මාර්ගය කියලායි මේක නම් කරලා තිබෙන්නේ. මේකේ තරගකාරීත්වයට සීමා පනවා තිබෙනවා. උදාහරණයක් විධියට දෙවන අදියරේදී - Phase IIවලදී - contract packages 7ක් සඳහා RDA එක විසින් ඉඩ ලබා දුන්නේ දේශීය කොන්ත්‍රාත්කරුවන් හය දෙනෙකුට පමණයි.

මේ හේතුව නිසා, සියයට 16ත්, 21ත් අතර ප්‍රමාණයකින් පිරිවැය ඉහළ ගියා. සාමාන්‍යයෙන් engineering estimates ටික ආවාට පස්සේ ඒ engineering estimatesවලට වැඩි පිරිසක් ඉල්ලුවොත්, වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් ආවොත් ලොකු competition එකක් ඇතිවෙනවා. එහෙම competition එකක් ඇති වුණාම මාර්ග සංවර්ධන අධිකාරියට - RDA එකට - පිරිවැය අඩු කරගන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුගත මුදල රුපියල් බිලියන 94.69යි. පිරිවැය රුපියල් බිලියන 112.56ක් දක්වා වැඩි වුණා. එතකොට රටට සිදුවුණු පාඩුව රුපියල් බිලියන 1,787යි. ඒ කියන්නේ, මේ ක්‍රියාදාමය නිසා කෝටි 1,700ක පාඩුවක් සිදුවුණා.

ඊළඟට, අධිවේගී මාර්ගයේ Phase I of CEP III සඳහා විශාල competition එකක් තිබුණු නිසා සියයට 37 ඉඳලා 42 දක්වා පිරිවැය අඩුකර ගන්න හැකියාව ලැබුණා කියන එක මම කියන්න කැමැතියි. ඒ නිසා රුපියල් බිලියන 5.9ක් රටට ඉතුරු වුණා. මේ ක්‍රියාදාමය තුළ මහාමාර්ග ඉදිකිරීම් සඳහා වන කොන්ත්‍රාත් එකට, CS2 ශ්‍රේණිගත කිරීම් සහිත කොන්ත්‍රාත්කරුවන් 13 දෙනෙක් ඉන්නවා. හැබැයි, හම්බවුණේ 6දෙනෙකුට විතරයි. මේකෙන් මොකක්ද නවත්වලා තිබෙන්නේ? එකක් තමයි, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඉස්සර නම් මේ වාගේ එකක් ආවාම, පිටරට company එකක් එක්ක - ඒගොල්ලන්ට consultancy වැඩි ප්‍රමාණයක් තිබෙනවා නම් - joint venture එකක් දමලා යන්න අපට ඉඩක් ලබා දෙනවා. ලංකා ඉතිහාසයේ highways හදපු කට්ටිය කවදාවත් හිටියේ නැහැ නේ. නමුත් ඒ අවස්ථාව ලබා දුන්නා. මේකෙදී ඒ අවස්ථාව දෙන්නෙත් නැහැ. ඒ නිසා, කරුණාකරලා මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා විශේෂයෙන්ම බිමල් රත්නායක මැතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. මේක, එතුමාගේ කාරණයක් නොවෙයි. පහළ ඉන්න නිලධාරීන් හැමදාම මේ වැඩේ කළා. අපට මේ නැතිවෙන මුදල් ටික නැවත ලබා ගන්න පුළුවන් විධියට සාධාරණ ක්‍රියාවලියක් ආරම්භ කරන්න කියන එක මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු විජිත හේරත් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.35]

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ආණ්ඩුව වැඩ ආරම්භ කරනකොට ආර්ථික අමාරුකම් යටතේ තිබිච්ච රටක් තමයි අපි විවිධ ක්‍රියාමාර්ග හරහා ශක්තිමත් කරන්න පටන් ගත්තේ. අපි 2024දී ආරම්භ කරපු ගමන ඉස්සරහට යනකොට 2025 අප්‍රේල් මාසයේදී ඇමෙරිකාවේ ජනාධිපතිවරයා විසින් අපේ අපනයන මත අලුත් තීරු බද්දක් පැනෙව්වා. ලෝකයේ රටවල් ගණනාවකට විවිධ අනුපාතවලින් ඒ තීරු බද්ද පැනෙව්වා. ශ්‍රී ලංකාවටත් සියයට 44ක තීරු බද්දක් පැනෙව්වා. අපි රෙදිපිළි අපනයනයෙන් සියයට 25කට වැඩි ප්‍රමාණයක් අපනයනය කරන්නේ ඇමෙරිකා එක්සත් ජනපදයට. ඒ වාගේම අපේ රබර් ආශ්‍රිත නිෂ්පාදන සහ තවත් බොහෝ නිෂ්පාදන ඇමෙරිකා එක්සත් ජනපදයට අපනයනය කරනවා. ඒ වෙලාවේ අපනයන මත ඒ තීරු බද්ද ක්‍රියාත්මක වුණා නම්, අපේ ආර්ථිකයට මරු පහරක් එල්ල වෙනවා. අපේ ආණ්ඩුව බලයට ආපු ගමන් පනවපු ඒ තීරු බද්දට මුහුණ දෙන්න බැරිව ආර්ථිකය තවත් කඩාගෙන වැටිලා අපේ ආණ්ඩුවත් වැටෙයි කියලා විපක්ෂයේ බොහෝ අය එදා උදන් ඇනුවා; සතුටු වුණා. අපේ ආණ්ඩුවට ඒක පාලනය කරගන්න බැරි වෙයි කියලා සමහරු විවිධ පුරාජේරු කිව්වා; උසුළු විසුළු කළා. සමහරු කැට තියලා කිව්වා, මේක කර ගන්න බැහැ කියලා. ආර්ථික ඔස්තාර්ලා කියාගන්නා අය එහෙම පුරාජේරු නැඟුවා. නමුත් අපේ අපනයන මත සියයට 44ක තීරු බද්ද පනවපු විගසම අපි රජයක් විධියට ඇමෙරිකා එක්සත් ජනපදයේ වෙළෙඳ නියෝජිතයින් සමඟ Zoom තාක්ෂණය හරහා සාකච්ඡා ආරම්භ කළා. ඒ වාගේම අපේ ආණ්ඩුව කණ්ඩායමක් පත් කළා. එම කණ්ඩායමේ ඉන්නවා, එවකට නියෝජ්‍ය අමාත්‍යවරයෙක් විධියට කටයුතු කරපු හර්ෂණ සූරියප්පෙරුම මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා, වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම්තුමා, මහ බැංකුවේ අධිපති නන්දලාල් වීරසිංහ මහත්මයා සහ ජනාධිපතිතුමාගේ ආර්ථික උපදේශක වශයෙන් කටයුතු කරන දුමින්ද හුලංගමුව මැතිතුමා. ඒ විධියට කණ්ඩායමක් නම් කරලා විදේශ අමාත්‍යාංශය එක්ක සම්බන්ධීකරණය කළා. විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ඇමෙරිකා එක්සත් ජනපදයේ තානාපති කාර්යාලය හරහා ඇමෙරිකාවේ අදාළ නියෝජිතයින් සමඟ මේ සම්බන්ධව සාකච්ඡා ආරම්භ කළා. එසේ සාකච්ඡා ආරම්භ කරලා බොහෝ ලිපි හුවමාරු, ගනුදෙනු සිද්ධ වුණා. පසුව අපේ කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය අනිල් ජයන්ත ඇමතිතුමාත් ඒකට සම්බන්ධ වුණා. අපේ මේ කණ්ඩායම අවස්ථා කිහිපයකදී ඇමෙරිකා එක්සත් ජනපදයට ගියා. ඒ වාගේම ලංකාවේ ඉඳලා Zoom මඟින් මේ පිළිබඳව කථා බහ කළා. අවසානයේදී අපි සමත් වුණා, අප මත පනවපු ඒ සියයට 44ක බද්ද සියයට 30ක් දක්වා වෙනස් කරගන්න. ඊට්ත් පසු අපේ සාකච්ඡා සහ ඒ ඇති වෙච්ච එකඟතා මත අපි සමත් වුණා, ඒ බදු ප්‍රමාණය සියයට 20කට අඩු කරගන්න. එහිදී විදේශ කටයුතු අමාත්‍යාංශය විධියට අපේ පැත්තෙන් මේ කටයුතු සම්බන්ධීකරණය කරමින්, මේ බදු පැනවීම ඇති වෙච්ච වෙලාවේ ඉඳලාම අපේ වගකීම මැනවින් ඉටු කර දුන්නා. ඒකෙන් තමයි රජයක් විධියට අපට හැකියාව ලැබුණේ අප මත පනවපු සියයට 44ක බද්ද වෙනස් කරගන්න. ඒකෙන් විශේෂයෙන්ම අපේ රටේ garment industry එකේ විශාල පිරිසකට සහනයක් ලැබුණා. ඒ garment factoriesවල වැඩ කරන 350,000කට එහා ගිය අපේ සේවක සේවිකාවන් තමන්ගේ රැකියා අහිමි වීමේ අනතුරට මුහුණ දී තිබුණා. මේ සහනය නිසා ඒ තත්ත්වයෙන් ඒ අයව මුදාගන්න අපට හැකියාව ලැබුණා. ඇත්තටම මේක වික්‍රමාන්විත වැඩක්. මොකද, ලෝකයේ බොහෝ රටවලට ඒ වෙනස්කම සිද්ධ වුණේ නැහැ. බොහෝ රටවලට අධික තීරු බද්දක් පැනවුණා. නමුත් ශ්‍රී ලංකාව සමත් වුණා, ඒ තීරු බදු අනුපාතය වෙනස් කරගන්න.

ඒත් එක්කම ඇමෙරිකාවේ අධිකරණයක් මඟින් ලබා දීපු තීන්දුවත් එක්ක ඒ බදු පැනවීමේ ක්‍රියාවලිය වෙනස් කරන්න සිද්ධ වුණා. හැබැයි, ඊට පස්සේ ඇමෙරිකා එක්සත් ජනපදය 1974දී සම්මත වෙලා තිබුණු වෙළෙඳ පනත පාවිච්චි කරලා නැවත අප මත සියයට 12.5ක බද්දක් පනවන්න තීරණයක් අරගෙන තිබුණා. ඒ, ලංකාව මත පමණක් නොවෙයි, තවත් රටවල් ගණනාවක් මත. මුලදී අපට සියයට 44කට පනවා තිබුණු බද්ද අපි සියයට 20කට අඩු කරගත්තා. ඒත් එක්කම, අධිකරණ නියෝගය ලැබීමත් එක්ක අප මත සියයට 12.5ක අමතර බද්දක් පනවන්න අලුත් තීරණයක් ආවා. ඒ බද්දෙන් අපේ රට නිදහස් කරගන්නත් රටක් විධියට, ආණ්ඩුවක් විධියට අපේ නියෝජිත කණ්ඩායම මැදිහත් වුණා. ඒ නියෝජිත කණ්ඩායම මැදිහත් වීමේ ප්‍රතිඵලයක් විධියට ඇමෙරිකා එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර වෙළෙඳාම පිළිබඳව ද්විපාර්ශ්වික ගිවිසුමකට සාකච්ඡා ආරම්භ කළා. ඒ ගිවිසුමේ බොහෝ කරුණු අපි සාකච්ඡා කර සියයට 95කට එහා ගිය ප්‍රමාණයක් අවසන් කර තිබෙනවා. තව යම් ප්‍රමාණයක් ඉතිරි වෙලා තිබෙනවා. අපට එකඟ වෙන්න පුළුවන් කරුණුවලට අපි එකඟ වෙලා තිබෙනවා. අපට එකඟ වෙන්න බැරි සමහර කරුණුවලට අපි එකඟ වෙන්න බැහැ කියලා කිව්වා. රටට අවාසි කරුණුවලට අපි එකඟ වුණේ නැහැ. රටට, අපේ ජාත්‍යන්තර වෙළෙඳාමට වාසිදායක වන දේවල්වලට එකඟ වෙලා, ඒ ගිවිසුම පිළිබඳ කටයුතු සියයට 95කට වැඩි ප්‍රමාණයක් අපි අවසන් කර තිබෙනවා. තවත් යම් ප්‍රමාණයක් ඉතිරි වෙලා තිබෙනවා.

මෙහිදී අපට අභියෝගයක් තිබෙනවා. ඒ අභියෝගාත්මක දෙයටත් අපි මෙතෙක් මුහුණ දුන්නා වාගේ ඉදිරියේදීත් අනිවාර්යයෙන් මේවාට මුහුණ දෙනවා. සාකච්ඡා ක්‍රියාමාර්ගවලින් ඒක අවසන් කරන්න අපි ඉලක්ක සහගතව ගමනක් යනවා. ඒ අධිකරණ තීන්දුවත් එක්ක තමයි 1974 වෙළෙඳ පනත පාවිච්චි කරලා, 301 වගන්තිය යටතේ සියයට 12.5ක අමතර බද්ද අප මත පැටවුණේ. එතැනදී අපට තිබුණු ප්‍රධාන කාරණය මේකයි. බලහත්කාර ශ්‍රමය පාවිච්චි කරලා යම් භාණ්ඩයක් ආනයනය කරනවා නම් හෝ ඒ භාණ්ඩ දම්වැල - chain එක - ඇතුළේ මොනවා හෝ දෙයක් අපි ලංකාවට ගෙන්වනවා නම්, අන්න ඒ මත තමයි මේ සියයට 12.5ක බද්ද පැනවෙන්නේ. අපි ඒකටත් කමිටුවක් පත් කළා. වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ මූලිකත්වයෙන් ඒ කමිටුව පත් කරලා, එහි නිර්දේශ මත පදනම් වෙලා අපි තීන්දු කළා, බලහත්කාරයෙන් ශ්‍රමය පාවිච්චි කිරීම නීත්‍යනුකූලව වැළැක්වීම සඳහා ගැසට් නිවේදනයක් හරහා නීතියක් පනවන්න. එම ගැසට් නිවේදනය මඟින් ඉදිරිපත් කළ රෙගුලාසි තමයි අද පාර්ලිමේන්තුවේදී අපි සම්මත කරන්නේ. එය නියාමනය කිරීමේ බලය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලැබෙනවා. බලහත්කාරයෙන් ශ්‍රමය යොදවා නිෂ්පාදනය කරන ලද හෝ කැණීම් කරන ලද හෝ භාණ්ඩයක් අපි ආනයනය කරනවා නම් ඒක තහනම් කරන රෙගුලාසියක් තමයි අද මේ නිකුත් වෙලා තිබෙන්නේ. ඒ හරහා ඇමෙරිකා එක්සත් ජනපදය අපේ රට මත නැවත සියයට 12.5ක් විධියට පනවපු බද්දත් ඉවත් කර ගන්න අපි සමත් වුණා. ඇත්තටම සියයට 10ක බද්දක් පමණයි දැන් අප මත තිබෙන්නේ. ඒ අවස්ථාව ලැබුණේ ලෝකයේ රටවල් සුළු ප්‍රමාණයකට පමණයි. ඇත්තටම ගත්තොත් රටක් විධියට එය අපි ලබා ගත් විශිෂ්ට ජයග්‍රහණයක්.

මෙම කටයුත්ත තනි පුද්ගලයෙක් විසින් කළ දෙයක් නොවෙයි. මෙම කටයුත්තට මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර අමාත්‍යාංශය, ඒ වාගේම විදේශ කටයුතු, විදේශ රැකියා අමාත්‍යාංශය සහ මේ පිළිබඳ දැනුම හා හැකියාව තිබෙන විශේෂඥයන් සම්බන්ධ වුණා. ඒ සියලුදෙනාගේම අදහස් සහ යෝජනා මේ සඳහා උපකාර වුණා. ඇත්තටම ගත්තොත්, මේක සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක්. රජයක් විධියට අපි මේ රට ආර්ථික වශයෙන් ගොඩ ගැනීම සඳහා දරපු උත්සාහයේ ප්‍රතිඵලයක්. ඒ අනුව තමයි සියයට 10ක සීමාවේ තීරු බදු පැනවීම රඳවා ගන්න අපි සමත් වුණේ. එම කටයුත්තේදී ජනාධිපතිතුමාත්, මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු අනිල් ජයන්ත මැතිතුමා ඇතුළු එම කණ්ඩායම විවිධ අවස්ථාවලදී විශේෂ මැදිහත් වීමක් කළා. විදේශ කටයුතු අමාත්‍යාංශය විධියට අපි මුල සිට මේ දක්වාම ඒ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය කළා.

එම තීරු බදු පැනවීම පටන් ගත්ත දවසේ ඉඳලා මේ දක්වා ආ ගමනේදී ඒ අවශ්‍ය කරන සම්බන්ධීකරණය, ඒ සාකච්ඡා සඳහා අවශ්‍ය කරන පහසුකම් සැලසීම වාගේ දේවල් තමයි විදේශ කටයුතු අමාත්‍යාංශයත්, විදේශ කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධ ඇමෙරිකා එක්සත් ජනපදයේ අපේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයත් සිදු කළේ. ඒ හරහා තමයි අපට මේ ජයග්‍රහණය ලබා ගන්න පුළුවන් වුණේ. ඒ නිසා තමයි මම කියන්නේ, මෙය සාමූහික ජයග්‍රහණයක් කියලා. එය අපි සියලුදෙනාගේම මැදිහත් වීමෙන් ලබා ගත් ජයග්‍රහණයක්.

ඒ ජයග්‍රහණය තවත් ශක්තිමත් කර ගන්න නම් අපට ඉතිරි වෙලා තිබෙන සියයට 05ක අභියෝගයත් අපි ජයග්‍රහණය කළ යුතුයි. සියයට 10 තීරු බද්ද අඛණ්ඩව පවත්වාගෙන යන්න නම් අප දෙරට අතර දැනට ක්‍රියාත්මක කරන්න සැලසුම් කර තිබෙන, එකඟතාවලට පැමිණ තිබෙන, ඒ ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම සම්පූර්ණ කර ගැනීමේ අවශ්‍යතාවත් අප ඉස්සරහ තිබෙනවා. ඒ අභියෝගයත් ජයග්‍රහණය කළොත් තමයි අපට මෙය අඛණ්ඩව පවත්වාගෙන යන්න හැකියාව ලැබෙන්නේ. ඉතින් අපි විශ්වාස කරනවා, ඒ වාගේම බලාපොරොත්තු වනවා, රජයක් විධියට ඒ කටයුත්තත් සාර්ථකව ඉදිරියට ගෙන යන්න හැකි වෙයි කියලා. ඒක අභියෝගයක්. ඒ අභියෝගයට මුහුණ දෙන්න අපි ලැහැස්තියි. ඒ අභියෝගය ජයග්‍රහණය කිරීම හරහා තමයි අපේ අපනයන ආර්ථිකය ශක්තිමත් කර ගන්න පුළුවන් වන්නේ.

අපි ඇමෙරිකා එක්සත් ජනපදයට වාර්ෂිකව සිදු කරන අපනයන තුළින් ඩොලර් බිලියන 2.8කට ආසන්න මුදලක් උපයනවා. එම ප්‍රමාණය අපේ ජාතික ආර්ථිකයට ඉතා වැදගත් පංගුවක්. ඒ වැදගත් පංගුව ආරක්ෂා කර ගන්න අපි රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් මේ සම්බන්ධතාව තවත් තහවුරු කර ගන්න ඕනෑ. අපේ තානාපති සේවා හරහා ලෝකයේ හැම රටක් එක්කම රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ශක්තිමත් කරගෙන ඉදිරියට යන්න අපි සමත් වුණා.

මෙහිදී විශේෂ දේ තමයි, ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක ශ්‍රී ලංකා රජය විධියට අප පවත්වාගෙන යන ද්විපාර්ශ්වික සබඳතාව. ඒ ද්විපාර්ශ්වික සබඳතාව නිසා තමයි අපට ඉතා මිත්‍රශීලීව එම සාකච්ඡා පවත්වා, මේ ගනුදෙනුව සාර්ථක කර ගන්න හැකියාව ලැබුණේ. බොහෝ අය හිතුවා, ඒක කර ගන්න බැරිව අපි අසාර්ථක වෙයි කියලා; ඒ වාගේම ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක එම ගනුදෙනුව කර ගන්න බැරිව ඒකෙන් අපි අසමත් වෙයි කියලා. එහෙම නැහැ. අපි ආරම්භයේ ඉඳලාම ඉතා සැලසුම් සහගතව, ඉතා සංයමයෙන් යුක්තව අපේ වෙළෙඳාම දියුණු කර ගන්න, අපේ ආයෝජන දියුණු කර ගන්න, අපේ ආපනයන ආදායම වැඩි කරගෙන අපේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමේ ඉලක්ක තියාගෙන එම සාකච්ඡා පැවැත්වුවා. එලෙස ඒ සාකච්ඡා මෙහෙයවීමේ ප්‍රතිඵලයක් විධියට අපට මේ ජයග්‍රහණය ලැබිලා තිබෙනවා. එතැනදි අපේ දෙරට අතර පවත්නා මේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතාව ඉතාම වැදගත් වුණා. එම සබඳතාව අපි අඛණ්ඩව ඉස්සරහට පවත්වාගෙන ආවා. අපි එම සබඳතාව අඛණ්ඩව ඉදිරියටත් ශක්තිමත්ව පවත්වාගෙන යනවා. මොකද, විශේෂයෙන්ම අපේ අපනයන ආර්ථිකයට විශාල දායකත්වයක් ඇමෙරිකාවේ වෙළෙඳ පොළ මඟින් ලැබෙනවා.

ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, යුරෝපා සංගමයත් එක්කත් මේ හා සමානවම ආර්ථික සබඳතා, රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හරහා අපේ අපනයන ආදායම් වැඩි කර ගන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ග ගන්න. එහිදී අපට GSP Plus බදු සහනය ඉතා වැදගත් වෙනවා. ඒ පිළිබඳව අපි දැනටමත් කටයුතු කරමින් සිටිනවා. විශේෂ කමිටුවක් අපි පත් කර තිබෙනවා, විදේශ කටයුතු අමාත්‍යාංශයේත්, වෙළෙඳ අමාත්‍යාංශයේත් මූලිකත්වයෙන්. ඒ හරහා අපි GSP Plus බදු සහනය නැවත ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරලා, එය අඛණ්ඩව ලබා ගන්නත් ඉදිරියේදී මැදිහත් වෙනවා. ඒ අනුව garment industry එකේ ඉන්න නිෂ්පාදකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කරගන්න අවශ්‍ය ඉඩ පහසුකම් සලසන්න අපි රාජ්‍ය තාන්ත්‍රිකව මැදිහත් වන බව සහතික කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. KAVEENTHIRAN KODEESWARAN took the Chair.*

[අ.භා. 2.49]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
**வணக்கம்!** මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එන්න එන්නම නරක් වෙන සමාජ වියමනක, පද්ධතියක වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් වෙමින් විසි දෙවන වතාවටත් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට කටයුතු ආරම්භ කරපු අද දිනයේදී අපි සඳහන් කළ යුතුයි, අපේ මව් බිමට ආදරය කරන අපි හැමෝම විවිධ අවස්ථාවලදී විවිධ විධියට වැරදි තීන්දු තීරණවලට යම් විධියකට හෝ සහාය ලබා දීලා තිබෙන බව. සමහරු සෘජුවම වැරදි කර තිබෙනවා. මේ ආණ්ඩුවේ ඉන්න - බලයේ ඉන්න - පක්ෂය සෘජුවම වැරදි කරපු පක්ෂයක්. වැරදිවලට වක්‍රව යම් සහායක් ලබා දුන්නු පුද්ගලයෙක් හැටියට මටත් පාපෝච්චාරණයක් තිබෙනවා. නමුත්, මේ සියල්ල තුළ අපි හැමදාම උත්සාහ කළේත්, විශේෂයෙන්ම මම පෞද්ගලිකව දේශපාලනයට එන්න තීරණය කළේත්, සෘජුවම මේ ක්‍රියාදාමයට මැදිහත් වුණේත්, අපේ මේ මුහුකුරා ගිය ජීවිතයේදී වඩා හොඳ ශ්‍රී ලංකාවක් දකින්නට අපට අවස්ථාවක් ලැබෙයි කියලා හිතාගෙනයි. නමුත්, බලාගෙන සිටියදී ඒ බලාපොරොත්තුව කඩාගෙන වැටෙන ආකාරය දැන් පැහැදිලියි.

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියට, අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑම් කරපු අවස්ථා බොහොමයක් තිබෙනවා. අධම යුගය යැයි අපි සලකන ජේ.ආර්. ජයවර්ධනගේ යුගයේ අපි මොවුනුත් එක්ක එකතු වෙලා ඊට විරුද්ධව සටන් කළා. නෙවිල් සමරකෝන් අග්‍ර විනිශ්චයකාරතුමාගේ ගෙදරට ගල් ගහපු යුගයේ සිට අද සිටින අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ගේ නිදහසට සෘජු බලපෑමක් කරමින්, රටක ප්‍රජාතන්ත්‍රවාදයේ වඩා වැදගත් කුලුනු තුන වන විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය තුළ තිබිය යුතු ඒ වෙනස සම්පූර්ණයෙන්ම හෙළා දමමින්, ඒ තිබුණු සමතුලිතභාවය සම්පූර්ණයෙන්ම හෙළා දමමින් විධායකය සෘජුව මැදිහත් වුණු නරකම පූර්වාදර්ශය අද අපට දකින්නට පුළුවන්. මෙයට මම ඇතුළු අපේ නීතිඥ සංගමය, ගරුතර මහනායක ස්වාමීන් වහන්සේලා, පිට රටවල ඉන්න සියලුම නීතිඥ සංගම්, මහජනතාව සහ විපක්ෂය බරපතළ විධියට විරුද්ධ වෙද්දී මෙතරම් දරදඬු විධියට මේ කටයුත්ත කරන්නේ කුමක් නිසාදැයි කියලා අද වනකොට ජනතාව තේරුම් ගෙන තිබෙනවා. ඔබ කරන්නට උත්සාහ කරන මෙය, අවසානයේදී යම් හෙයකින් සම්මත වුණොත් අපි ලබා දෙන පූර්වාදර්ශය මේ රටේ නූපන් දරුවන්ටත්, මේ රටේ අනාගතයටත් හැම දාම බලපාන නරක, කැත පූර්වාදර්ශයක් බව ඉස්සෙල්ලාම මම පවසන්නට ඕනෑ. මෙය සිදු වුණොත් එහි ප්‍රතිඵලය හැටියට මින් ඉදිරියට ලංකාවේ කිනම් හෝ අධිකරණයකින් දෙනු ලබන තීන්දුවක් තවදුරටත් නිදහස් අධිකරණ තීන්දුවක් හැටියට මේ රටේ ජනතාව පිළිගන්නේ නැහැ. එය විධායකය මැදිහත් වුණු, ව්‍යවස්ථාදායකය මැදිහත් වුණු, ඒ තුළ සිටින ආණ්ඩු පක්ෂය මැදිහත් වුණු තීන්දුවක් හැටියටයි මේ රටේ ජනතාව මින් ඉදිරියට සලකන්නේ කියන එකත් මම දැන්මම කියා සිටින්නට ඕනෑ.

මම මේ කාරණය බොහොම සද්භාවයෙන් කියන්නේ. අපේ මිත්‍රයෝ, අපි ඔක්කොම එකට සටන් කළේ වඩා හොඳ ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම සඳහායි. අපි බලාපොරොත්තු වුණා, වඩා හොඳ ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම සඳහා මේ ආණ්ඩුව එකදු හෝ පියවරක් ඉදිරියට තබයි කියලා. නමුත් ජේ.ආර්. ජයවර්ධනටත් වඩා එහාට ගිය නරකම පූර්වාදර්ශයක් තමයි අද මේ පාර්ලිමේන්තුවට ගෙනාවේ කියන එක ප්‍රකාශ කරමින් අද සංවාදයට ලක් කරන අපේ ආර්ථික කරුණු සම්බන්ධයෙනුත් මම යමක් සඳහන් කරන්නට ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම මේ කාරණය බොහොම අවංකව කියන්නේ. මම දන්නේ නැහැ, මොවුන් මෙය තේරුම් අරගෙනද කථා කරන්නේ කියලා. අපේ ඇමතිතුමා මෙතැන කථාවක් පවත්වලා ගියා. එතුමා දැන් සභාවේ නැහැ. එතුමා මේ අවස්ථාවේදී සභාවේ හිටියා නම් මම කැමතියි. මම එතුමාගෙන් දිගින් දිගටම ප්‍රශ්න කරන්නේ මේකයි. අපි ආර්ථික විශේෂඥයන් නිසා අප දන්නා කරුණු ගැන පමණක්, දන්නා උදාහරණ පමණක් අරගෙන මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න කැමතියි. එතුමා කථා කරද්දී කියන්නට උත්සාහ කළා, අපේ ආර්ථිකයේ ප්‍රගතියක් ඇති වෙමින් පවතිනවාය කියලා. ඒ වාගේම එතුමා කියන්න උත්සාහ කළා, එතුමාගේ මැදිහත්වීමත්, එතුමාගේ කණ්ඩායමේ මැදිහත්වීමත් නිසා අද අපේ අපනයන වර්ධනය කර ගන්නට පුළුවන්කම ලැබිලා තිබෙනවා කියලා. මෙය කිසිසේත්ම යථාර්ථයක් නොවෙයි. මෙය යථාර්ථයක් නොවන්නේ ඇයි කියන එක අද මේ මහ පොළොවේ පය ගහලා සිටින කර්මාන්තශාලාහිමියන්, ව්‍යවසායකයන් එක්ක ඔබ අවංක සංවාදයකට ගියොත්, ඔවුන් සමඟ සාකච්ඡා කළොත් දැනගන්න පුළුවන් වෙයි. අද ඇති වී තිබෙන ගෝලීය අභියෝග හමුවේ, ගෝලීය වෙළෙඳ පොළ තුළ ඇති වී ඇති නව ප්‍රවණතා හමුවේ අපේ මේ කුඩා ලංකාවේ ව්‍යවසායකයන් විශාල අර්බුදයකට මුහුණ දෙමින් සිටිනවා, අපේ කර්මාන්තශාලා, අපේ ව්‍යාපාර රැක ගන්නට. එයයි යථාර්ථය. අපේ අපනයන වාගේම දේශීය කර්මාන්ත සියල්ල අද වනකොට විශාල අභියෝගවලට මුහුණ දෙමින් පවතිනවා, ඔබවත් නොදන්නා මාර්ගයක ඔබ ගෙන යන මේ ආර්ථික ප්‍රතිපත්තිය මත. විශේෂයෙන් ඔබ භාවිත කරන මේ බදුකරණ ප්‍රතිපත්තිය මත, වියදම් ගැළපුම මත විදුලි බිල බරක් හැටියට ඒ ව්‍යවසායකයන් මත පැටවීම නිසා මේ සියලු ක්ෂේත්‍ර කඩා වැටෙමින් පවතිනවා.

මම මේ අවස්ථාවේදී තව එක උදාහරණයක් පමණක් සඳහන් කිරීමට කැමතියි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සභාපති බුද්ධික හේවාවසම් මැතිතුමා ඊයේ අස් වුණා. මම හිතන විධියට ඔබතුමන්ලා තවමත් ඒ සඳහා සභාපතිවරයෙක් පත් කරලා නැහැ. එතුමා එම ධුරයෙන් අස් වෙන්නේත් ඉතාම දුෂ්කර තත්ත්වයක් තුළ වාගේම ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය බරපතළ අර්බුදයක තිබෙන අවස්ථාවකයි. සංචාරක කර්මාන්තය ගත්තාම, ලංකාවට එන සංචාරකයන් ප්‍රමාණය අපි මොන විධියට උත්කර්ෂයට නංවන්නට උත්සාහ කළත් යථාර්ථය මේකයි. අපේ රටේ සංචාරක කර්මාන්තය යම්කිසි ඉහළ තත්ත්වයකට පැමිණ තිබුණේ පාස්කු ඉරිදා ප්‍රහාරයට - Easter Sunday attack එකට - කලින්නුයි. නමුත් ඒ අවස්ථාවේදීත් එම ඉහළ අගය ලබා තිබුණේ අපට අවශ්‍ය තත්ත්වයට නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සරල දත්ත හැටියට සංචාරක කර්මාන්තයේ යෙදෙන කොළඹ හෝටල් පමණක් ගත්තොත්, 2018-2019 කාලයේදී කොළඹ හෝටල්වල rate එක, ඒ කියන්නේ average එක ඩොලර් 128ක් විධියට තිබුණා. අද වනකොට එය ඩොලර් 80 දක්වා අඩු වී තිබෙනවා. හෝටල් කාමරවල සංචාරකයන්ගේ සාමාන්‍ය පදිංචි මට්ටම - average occupancy එක - තිබුණේ සියයට 70ට. එය අදත් ඒ මට්ටමේම තිබෙනවා. හැබැයි, අපේ එක හෝටල් කාමරයක් සඳහා ලැබෙන ආදායම සියයට සියයක් වශයෙන් තිබුණා නම් එය සියයට 58 දක්වා අඩු වෙලා තිබෙනවා. සියයට 37.5 හෝ සියයට 37 හෝ ඊට ආසන්න ප්‍රමාණයකින් එය

අඩු වී තිබෙනවා. ඒ අනුව අපේ රටේ සංචාරක කර්මාන්තයේ යෙදෙන්නන්ගේ වියදම වැඩි වෙලා, ආදායම අඩු වෙලා තිබෙනවා. මේ නිසා සංචාරක කර්මාන්තයේ යෙදෙන මහා පරිමාණයේ හෝටල්, ඒ වාගේම මධ්‍යම පරිමාණයේ හෝටල් අද වනකොට විශාල අර්බුදයකට මුහුණ පා තිබෙනවා. නමුත් මේ රජය ජනතාගත කරන්නට, උත්කර්ෂයට නංවන්නට හදනවා, අපේ සංචාරක කර්මාන්තය දියුණු වෙලා කියලා. නමුත් සංචාරක කර්මාන්තය එසේ දියුණු වෙන්න ගත යුතුව තිබෙන කිසිම පියවරක් නොගෙන අපි මේ සංවාදය අද කරගෙන යනවා.

අපි මේ බොරුවෙන් අපිම රවටා ගන්නවා නම්, අපි හොඳටම දන්නා කාරණා අමතක කරලා අපි කටයුතු කරනවා නම්, අපි කොහොමද මේ රටේ මේ සංවාදය කරගෙන යන්නේ? මොකටද, අපි මේ පාර්ලිමේන්තුවට එන්නේ? මොකටද, මේ කාරණා අපි මෙතැන කියන්නේ? මම සංචාරක කර්මාන්තය ගැන කොච්චර කථා කරලා තිබෙනවාද? මේ ආණ්ඩුව බලයට පැමිණියාට පසුව අපේ රටේ සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ ආයතන හරහා අන්තර්ජාතික මට්ටමේ දැන්වීම්කරණයක් - advertising campaign එකක් - කරලා, මේ ගමනාන්තය - destination එක - සන්නාමයක් බවට පත් කරලා ඒකට අගයක් එකතු කරන්නට අද වෙනකම් කිසිම කටයුත්තක් නොකළා නම් වියදම් කරන්නට පුළුවන් සංචාරකයන් මේ රටට එයි කියලා අපි බලාපොරොත්තු වන්නේ කොහොමද? එන්න එන්නම අපේ රටට එන්නේ අඩුවෙන් වියදම් කරනු ලබන සංචාරකයන් නම්, ඔවුන්ගේ ඒ වියදමින් අපේ රටේ සංචාරක කර්මාන්තයේ යෙදෙන්නන්ට තමන්ගේ වියදම ගැට ගහගන්නට බැරි නම්, නුදුරු අනාගතයේදීම මේ හෝටල් වැසී යාම අපට දකින්නට පුළුවන් වෙයි. ඒ නිසා තමයි අපි මේ ගැන කථා කරන්නේ. එහෙම නැතුව, මේ හැම දෙයක් ගැනම විවේචනය කරන විපක්ෂයක දෘෂ්ටි කෝණයෙන් නොවෙයි.

මේවා සාධනීය යෝජනා; සාධනීය සංවාද. මේ සංවාදය තුළ මේ ආණ්ඩුව පවත්වා ගෙන යන්න වාගේම ඔබට මේ දැනීම, මේ අවබෝධය ලබා දෙන්නට පුළුවන් හැම අවස්ථාවකදීම මේ රටේ මහජනතාව වෙනුවෙන් ඒක කරන්නයි අපිට ඕනෑ. නමුත් මේ සියල්ල මේ තත්ත්වයේ පවතිද්දී අපේ රටේ ආර්ථිකය බරපතළ විධියට කඩා වැටිලා. මම දන්නේ නැහැ, ගමින් ආපු අපේ මිත්‍රයෝ අද ගමට යනවාද කියලා. ගමට ගිහිල්ලා ගමේ මනුස්සයා කන්නේ, බොන්නේ කොහොමද කියා අහනවාද කියලා මම දන්නේ නැහැ. මේ මිනිස්සු අද කොච්චර දුක් විඳිනවාද කියලා ඔබ දන්නවාද, දැනගෙන නොදන්නා සේ ඉන්නවාද කියන එක විතරයි මට අහන්නට තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි, நன்றி

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Arun Hemachandra. You have nine minutes.

[3.02 p.m.]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

Hon. Presiding Member, Sri Lanka is passing through an important period of rebuilding. Under the leadership of President Anura Kumara Dissanayake and the National People's Power Government, we are working to strengthen both the institutions of the State and the foundations of our economy. There is still much more to be accomplished, but there is also progress, which this House should recognize with confidence.

One important area we are focusing on is corruption. Corruption is not simply about a person taking public money, but it also affects the entire development process, increases cost, weakens institutions, damages public confidence and makes honest businesses less willing to compete and invest. Therefore, our objective must be broader than investigating individual incidents; we must create institutions where transparency, accountability and integrity become normal features in public administration. For example, yesterday, we witnessed a very unusual situation. A news was reported earlier, weeks back, relating to a matter connected with money laundering and a number of arrests were made yesterday with regard to that. So, these are part and parcel of the reforms we are making at the moment. We are highly committed to establish a transparent and a corruption-free business environment. That is the direction President Anura Kumara Dissanayake and this Government are moving towards.

We are applying that same determination to curb organized crimes and narcotics. Criminal networks cannot be allowed to become alternative centres of power; we cannot allow any mini-governments to function in this country. Sri Lanka has strengthened international cooperation to locate and bring back such suspects who operate from overseas. You must have seen that a number of suspects had been brought back to Sri Lanka and there are a number of other suspects to be brought back to the country in the coming days and weeks. But, we must always operate within the rule of law and investigations must be based on evidence. Accused persons are entitled to go through the due process and their guilt must ultimately be determined by independent courts. That is the difference between power and the rule of law.

Investigations into the Easter Sunday attacks also remain an important national responsibility. The victim families are still waiting for answers. Therefore, the Government has a duty to ensure that every credible lead is followed, every evidence is examined into and no political considerations stand between the victims and the truth. We should neither predetermine conclusions nor allow serious unanswered questions to disappear with time. Accountability must come through credible investigation and proper administration of justice.

Alongside rebuilding institutions, we have proceeded with economic recovery. We know what Sri Lanka had been experiencing since 2022. There were sovereign defaults, severe foreign exchange shortages, fuel queues, shortages of medicine and essential goods and businesses struggling to survive. With the NPP Government assuming Office, the economic stabilization programme has strengthened even further. We have always acknowledged that our responsibility is to strengthen the fragile recovery process and to move it towards

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

something more sustainable. Sri Lanka recorded a real GDP growth of 5 per cent in 2025, while the IMF said, in May, 2026, that the programme performance remained generally strong and that all the quantitative performance criteria had been met by end-December, 2025. Stability is important, but stability is not development.

Our next phase must be production, investments, exports, employment, technology and greater integration with the global economy. In 2025, Sri Lanka achieved a significant milestone in economic recovery; I repeat, in 2025, Sri Lanka achieved a significant milestone in economic recovery. Our merchandise exports reached approximately US Dollars 13.6 billion, the highest annual merchandise export earnings ever recorded in the country's history. With merchandise exports and selected service exports considered together, Sri Lanka's total export earnings exceeded US Dollars 17.2 billion. That growth was not confined to one sector. Our apparel and textile sector continued to remain the largest export contributor, generating nearly US Dollars 4.9 billion. Tea exports exceeded US Dollars 1.5 billion, while coconut-based exports recorded an exceptional growth, reaching more than US Dollars 1.2 billion.

At the same time, sectors such as ICT and BPM services continued to expand their contribution to foreign exchange earnings. These figures are important because these exports are not simply statistics. Every additional dollar earned through exports means more opportunities for our industries, more employment for our people, greater foreign exchange stability and stronger confidence in the Sri Lankan economy. After facing one of the most difficult economic crises in our history, reaching a historic high in exports demonstrates that Sri Lanka is moving in the right direction. But, we should not be satisfied with breaking only one record. Our next challenge is to diversify our export markets, increase value-added production, support SMEs and local entrepreneurs, attract export-oriented investments and ensure that Sri Lankan products and services become more competitive across the world. So, our objective must be very clear: Sri Lanka should become a strong, export-driven economy capable of earning its way forward, rather than repeatedly depending on borrowing. The export performance of 2025 shows that that transformation is possible. Now, our responsibility is to rebuild on that momentum and take Sri Lankan exports to an even higher level.

Sir, our recent decision demonstrates how these different areas of Government policy could support our economic interests. On the 10th of July, 2026, Sri Lanka introduced Regulations, prohibiting the importation of goods mined, produced or manufactured wholly or partly through forced labour. Forced labour, first of all, is an issue of human dignity. Sri Lanka has long-standing international commitments against it: we ratified the ILO Convention No. 29 in 1950, Convention No. 105 in 2003 and the 2014 Protocol to Convention No. 29 in 2019. What has changed is the nature of international trade. Forced labour is now directly connected to market access, customs regulations, corporate responsibility and global supply chains. The words, "wholly or partly" are important. A garment may be manufactured in Sri Lanka, but its cotton, yarn, fabric, chemicals, accessories and packaging may originate from several different places. So, increasingly, modern buyers simply ask not "Where was this product made?", but "What happened throughout the supply chain?" Our Parliamentary references note that we have exactly recognized this reality. Under the new Regulations, the Sri Lanka Customs would require documentary evidence, declarations or certifications relating to the production of imported goods. This gives Sri Lanka an opportunity.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Deputy Minister, your time is up.

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா)
(The Hon. Arun Hemachandra)
Sir, give me just one more minute.

So, these Regulations under the Imports and Exports (Control) Act that we have presented to this House are very valuable and important. We will make sure that, by making use of this opportunity, we would create more opportunities for us in the global trade environment and position Sri Lanka in a very important place within the global supply chain.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Leader of the Opposition. You have seven minutes.

[අ.භා. 3.12]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" නිර්මාණය කරනවා කියපු මේ රජය අද කරාවට පමණක් සීමා වෙලා තමන් දසලක්ෂ සංඛ්‍යාත ජනතාවට ලබා දුන්නු බලාපොරොත්තු ඉෂ්ට කරන්න බැරුව ළතැවෙමින් සිටින මොහොතක විශේෂයෙන්ම රජයේ අවධානය, ජනාධිපතිවරයාගේ අවධානය, මැති ඇමතිවරුන්ගේ අවධානය යොමු කරවමින් ප්‍රධාන වශයෙන් පාර්ශ්ව 3ක දුග්ගැනවිලි මම මේ අවස්ථාවේ සභාවට ඉදිරිපත් කරන්නේ, ඒ ජනතාවට යුක්තිය, සාධාරණත්වය ඉෂ්ට සිද්ධ වෙයි කියන බලාපොරොත්තුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සතුටු වෙනවා, අපේ ගරු වසන්ත සමරසිංහ අමාත්‍යවරයාත් මේ සභාවේ සිටීම ගැන. ගරු අමාත්‍යතුමනි, මාතර විවිධ සේවා සමුපකාර සමිතියට අයත් ග්‍රාමීය බැංකු ශාඛා 14ක තැන්පත්කරුවන් 13,000ක් ඉන්නවා. 2026 අප්‍රේල් මාසය වන තෙක් ඒ ග්‍රාමීය බැංකු 14හි ගනුදෙනු කටයුතු ක්‍රියාත්මක වුණා. නමුත් අප්‍රේල් මාසයෙන් පසුව මේ මොහොත වන විටත් ඒ තැන්පත්කරුවන්ට තමන්ගේ මුදල් ආපසු ලබා

ගන්න බැරි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා එය දන්නවාද? එයට හේතු හැටියට දක්වමින්, අවුරුදු ගණනාවක් විගණන කටයුතු කළේ නැහැ කියනවා; යම් යම් අඩුපාඩුකම්, අක්‍රමිකතා ගැන කථා කරනවා. හැබැයි, 2026 අප්‍රේල් මාසය වනකල් තමන්ට අදාළ පොලී මුදල් ලබා ගන්න ඕනෑ වුණාම ඒ මුදල් ලබා ගැනීමේ අවස්ථාව ඒ තැන්පත්කරුවන්ට ලැබුණා.

දකුණු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමියගේ වගකීම තමයි, 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත, ඒ වාගේම සංශෝධිත 1992 අංක 3 දරන දකුණු පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය ආදී සියල්ල යටතේ ඒ තැන්පත්කරුවන් 13,000දෙනාගේ මුදල්වල සුරක්ෂිතභාවය, මූල්‍ය පාලනය, අධීක්ෂණය කියන පුළුල් පරාසය වෙනුවෙන් වග බලා ගැනීම. දැන් එතුමිය දෙන එකම උත්තරය මොකක්ද? විශේෂයෙන්ම ග්‍රාමීය බැංකු ශාඛා 14ක තැන්පත්කරුවන්ට - ඒ තැන්පත්කරුවන් 13,000ට - ලබා දෙන උත්තරය මොකක්ද? "යන්න, පොලීසියට. පොලීසියට ගිහිල්ලා පැමිණිලි දාන්න. පොලීසියත් එක්ක බලා ගන්න" කියන එකයි. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ කාරණාව පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා. මම කථා කරන්නේ ඒ තැන්පත්කරුවන් වෙනුවෙන්; 13,000ක් වන තැන්පත්කරුවන් වෙනුවෙන්. මෙහෙම නේ. 2026 අප්‍රේල් මාසය වනකල් ඔක්කෝම හරියට ක්‍රියාත්මක වෙලා එක පාරටම ඒක කඩාගෙන වැටෙන්න බැහැ නේ. තැන්පත්කරුවන්ගේ චෝදනාවක් තිබෙනවා, මේකට දේශපාලන බලපෑම් ඇවිල්ලා, විවිධ පුද්ගලයන් මේකට අත ගහලා තිබෙනවා කියලා. මේ දේශපාලන බලපෑම තුළ අවසානයේ අද අගතියට පත් වෙලා ඉන්නේ 13,000ක් වන ඒ තැන්පත්කරුවන්. ඒ අයට සාධාරණත්වය ඉෂ්ට කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

පොහොසත් රටේ ලස්සන ජීවිතය නිර්මාණය කරනවා කියලා කිව්වත්, සමෘද්ධි පද්ධතිය තුළ ප්‍රජා මූල බැංකු සඳහා බඳවා ගත් සමෘද්ධි පරිගණක සහකාරවරුන් 250දෙනෙක් අද මහ පාරට ඇද දමා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා කියා ගන්නේ, ඔබතුමන්ලාගේ රජය කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරන රජයක් කියලා නේ. 2021 වසරේ කම්කරු විනිශ්චයාධිකරණයෙන් ලබා දුන්නු තීන්දුව මොකක්ද? ඒ සමෘද්ධි පරිගණක සහකාරවරුන් 250දෙනා නැවත සේවයේ පිහිටුවන්න කියන තීන්දුවයි. හැබැයි, ඒක වර්තමාන රජය ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ තරමටම මේ රටේ කම්කරු ජනතාවට ඔබ ආදරෙයි. හැබැයි, බලය ලබා ගන්න ඔබතුමන්ලා සටන් පාඨ කිව්වා; පෙළපාළි ගියා; කම්කරුවා වෙනුවෙන්, කම්කරු අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියා. නමුත් අද වන විට මොකක්ද වෙලා තිබෙන්නේ? සමෘද්ධි පරිගණක සහකාරවරුන් 250දෙනෙකු එළියට දමා තිබෙනවා. ඒ අයට පක්ෂපාතීව කම්කරු විනිශ්චයාධිකරණයෙන් 2021දී ලබා දුන් තීන්දුව ක්‍රියාත්මක කරන්න වර්තමාන ජනතා විමුක්ති පෙරමුණු රජය අපොහොසත් වෙලා තිබෙනවා. කරුණාකර, ඒ අයගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන ආකාරයට පියවර ගන්න කියා මම රජයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුන්වන සහ අවසාන කාරණාව මේකයි. අපි හැමෝම දන්නවා, අපේ රටේ රණවිරු ප්‍රජාවගෙන් අතිබහුතරය මේ රජය බලයට පත් කරන්නට ලොකු ශක්තියක් ලබා දුන්නු බව. රට දැය බේරා ගත්තු වීරෝදාර රණ විරුවන්, ජීවිත කැප කරපු, ඇස්, ඉස්, මස්, ලේ දන් දුන්නු රණ විරුවන් අද විශාල වශයෙන් අගතියට පත් වෙලා සිටිනවා, විශේෂයෙන්ම ආබාධිත රණ විරුවන්. 1982.07.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඒ අයට වයස අවුරුදු 55 දක්වා වැටුප් සහ දීමනා ලැබෙනවා. නමුත්, ඇත්ත වශයෙන්ම අඩුපාඩුකම් ගණනාවක් නිර්මාණය වුණා. 2014දී චක්‍රලේඛයක් නිර්මාණය වුණා. ඒ චක්‍රලේඛය අනුව ආබාධිත තත්ත්වයට පත් වුණු රණවිරුවන් කොට්ඨාස දෙකකට බෙදුවා. 2016 වසරේදී එවකට පැවැති යහපාලන රජය වසර 22ක සේවා කාලය අවසන් වීමෙන් පසු සේවයෙන් විශ්‍රාම ලැබූ සහ ආබාධිත දුබලතා ප්‍රතිශතය සියයට 20ට වැඩි සියලු රණ විරුවන්ට වයස අවුරුදු 55 දක්වා වැටුප්, දීමනා හා වැටුප් වර්ධක ලබා දෙන්න කටයුතු කළා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? 2014.03.01වන දින අතිරේක ලේකම්වරයෙකු නිර්මාණය කරපු චක්‍රලේඛයක් නිසා 2014.03.01 දිනට පෙර වෛද්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නු අයට ඒ වරදාන, වරප්‍රසාද සියල්ලම, ඒ සහන ටික ඔක්කෝම ලැබෙනවා. ඒ අයට වැටුප් වර්ධක ලැබෙනවා; වේතන ටික ලැබෙනවා; දීමනා ටික ලැබෙනවා. 2014.03.01 දිනෙන් පසුව විශ්‍රාම ගැන්වූ රණ විරුවන් 500දෙනෙකුට ඒවා ලබා දීම අහිමි කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Leader of the Opposition, your time is up.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, give me one more minute, please.

බරපතළම ප්‍රශ්නය මේකයි. ඔබතුමන්ලා පොරොන්දු වෙලා තිබෙනවා, ඒ ඉල්ලීම ඉෂ්ට කරනවා කියලා. හැබැයි, 2026.05.17වන දින වත්මන් ආණ්ඩුව නිකුත් කර ඇති නවතම අමාත්‍ය මණ්ඩල තීරණයෙනුත් ඒ අඩුපාඩුව, ඒ විෂමතාව, ඒ ඌනතාව නිවැරදි කරන්න කටයුතු කරලා නැහැ.

ඉතින් මම උදාහරණ තුනක් විතරයි මේ අවස්ථාවේ ඉදිරිපත් කළේ. ඒ අනුව, ඔබතුමන්ලා පොරොන්දු වුණු "පොහොසත් රට - ලස්සන ජීවිතය" සිහිනයක් පමණයි. දසලක්ෂ ගණන් ජනතාව මැතිවරණ තුනකදී ඔබතුමන්ලාට ලබා දුන්නු වරමට ගෞරව කරලා, කරුණාකර ඒ අයගේ ඒ ගැටලුවලට විසඳුම් ලබා දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Wasantha Samarasinghe. You have been allocated 12 minutes.

[අ.භා. 3.20]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විපක්ෂ නායකතුමා ප්‍රශ්න 3ක් විතර ඇහුවා. ඒවා අතරින් මාතර සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය පිළිබඳව එතුමා විශේෂයෙන් අහපු ප්‍රශ්නයට උත්තරයක් දෙන්නයි මා හදන්නේ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා සඳහන් කළා, ඒ අය 2026 අප්‍රේල් වනකල් පොලී මුදල් හොඳින් ගෙවාගෙන ගියා කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තැන්පත්කරුවනුයි එහෙම කියන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

තැන්පත්කරුවන් ඔබතුමාට එහෙම කියන කොට ඔබතුමාත් ප්‍රශ්න කරන්න එපායැ, මේ කියන කථාව ඇත්තද කියලා බලන්න. මම ඒ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ ඇයි? විපක්ෂ නායකතුමා ලෙස ඔබතුමා ඒ කථාව කිව්වාට මා දැන් කියන කාරණාවලින් ඔබතුමා කියපු කථාව බොරු වෙනවා නේ. මාතර සමුපකාර ග්‍රාමීය බැංකු සංගමයේ සභාපති හිරේ කියලා ඔබතුමා දන්නවා නේ. ඔබතුමා දන්නවාද ඒක? තැන්පත්කරුවන් ඔබතුමාට ඒක කිව්වාද? *[බාධා කිරීමක්]* නැහැ, සජබයේද, නැද්ද කියන එක මට වැඩක් නැහැ. ගරු විපක්ෂ නායකතුමනි, මාතර ග්‍රාමීය බැංකු සංගමයේ සභාපතිතුමා හිරේ. *[බාධා කිරීමක්]* ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවා නම්, මම මේ කරුණු ටික කිව්වාට පස්සේ අහන්න පුළුවන්. ගරු විපක්ෂ නායකතුමනි, මාතර බැංකු සංගමයේ සභාපති හිරේ ඉන්නේ පොල් කඩන්න ගිහිල්ලා අහුවෙලා නොවෙයි, දැල් අදින්න ගිහිල්ලා අහුවෙලා නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාතර විවිධ සේවා සමුපකාර සමිතිය, මාතර ග්‍රාමීය බැංකු සංගමය, මාතර ආරෝග්‍යශාල සමිතිය කියන සමිති තුනෙන් විතරක් රුපියල් මිලියන 7,000කට වැඩි මූල්‍ය වංචාවක් කරලා මේ වෙනකොට CID පරීක්ෂණයක් යනවා. ඔහු හිරේ. ඒ විතරක් නොවෙයි, මේ වෙනකොට අයථා වත්කම් රැස් කිරීම පිළිබඳ පරීක්ෂණයකුත් යනවා. විපක්ෂ නායකතුමාට කියපු නැති තොරතුරු ටිකක් මම මේ කියන්නේ. මේ වංචාව ඉතාම සංවිධානාත්මකව, සැලසුම්සහගතව කලක සිට කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඒක කොච්චරද කියනවා නම්, හරියට අපේ රටේ සිද්ධ වුණු වංචා ටිකක් තිබෙනවා, ඒ වගේමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට Golden Key වංචාව මතක ඇති, රත්තරන්වලින් සල්ලි ගත්ත වංචාව මතක ඇති, එක එක පොලී මුදලාලිලා වාගේම අපේ රටේ මහුල් කපුවෝත් සල්ලි එකතු කළා මතක ඇති. මහුල් කපුවෝත් මාසයකට සියයට 4ක පොලියක් දෙනවා කියලා සල්ලි එකතු කළා. ඒවාට සල්ලි දාපු අයට යන එන මං නැති වුණා. ඉංග්‍රීසි මාස්ටර්ස්ලා සල්ලි එකතු කරලා සිදු වුණු වංචාවකුත් තිබෙනවා. ඒ වාගේම එකක් මේක. සියයට 15ක, සියයට 16ක, සියයට 18ක, සියයට 20ක පොලියක් දෙනවා කියලා මිනිසුන්ගෙන් සල්ලි අරගන්නවා. අරගෙන ටික කාලයක් පොලිය ගෙවනවා. ගෙවන ගමන් තව තැන්පතු ටිකක් ගෙන්වා ගන්නවා. මේ විධියට ග්‍රාමීය බැංකු සංගමයේ විතරක් රුපියල් මිලියන 5,920ක මුදලක් හොරා කාලා තිබෙන්නේ. ගරු විපක්ෂ නායකතුමනි, ඊට අදාළ අතුරු වාර්තාවෙන් කියනවා, - ඒ අතුරු වාර්තාවෙන් හඳුනාගෙන තිබෙනවා - රුපියල් මිලියන 5,920ක මුදලක් නැහැ කියලා. ඒවා තැන්පත්කරුවන්ගේ සල්ලි. ඒ විතරක් නොවෙයි, අපේ රටේ සමුපකාර ව්‍යාපාරය තුළ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේ ග්‍රාමීය බැංකු සංගම්වල මුදල් හොරා කනවා. ඒවා නිදහස් කර ගන්න ඕනෑ; මුදාගන්න ඕනෑ.

මේක හම්බන්තොට පෞද්ගලික බැංකුවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පෞද්ගලික බැංකුවක් නිසා මම බැංකුවේ නම කියන්නේ නැහැ. සමහර විට ඒ අය සමුපකාර කොමසාරිස්ගේ අනුමැතිය සහිතව කරන්න ඇති. හොර ලේඛන හදලා මේ වංචාව කරගෙන ගියාට පස්සේ, ඒ අවසර දුන්න අයටත් වගකීමක් තිබෙනවා ඒක check කරගන්න. හම්බන්තොට එක්තරා පෞද්ගලික බැංකුවක ගිණුමක් හරහා මාතර ග්‍රාමීය බැංකු සංගමයේ තැන්පතු කියලා මිලියන 1,000කට වැඩි මුදලක් නිදහස් කරගෙන තිබෙනවා. ඒ මුදල රුපියල් මිලියන 1,000කට වැඩියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොහු මාතර ග්‍රාමීය බැංකු සංගමයේ, මාතර විවිධ සේවා සමුපකාර සමිතියේ, ආරෝග්‍යශාලා සමිතියේ, පේෂකර්ම හා කර්මාන්ත සමුපකාර සමිතියේ සභාපති ලෙසත් සිටියා. එහෙම ඉන්න ගමන් කුරුණෑගල තිබුණු ඉඩමක් විකුණලා තිබෙනවා. බලනකොට මාතර සමිතියට ගත්තා කියලා වෙනත් නමකට අරගෙන තිබෙන්නේ. එම නිසා මේ සමුපකාර සමිතිය පිළිබඳව, එහි තැන්පත්කරුවන් පිළිබඳව ගන්න තිබෙන හොඳම තීරණය තමයි කොමසාරිස්තුමා අරගෙන තිබෙන්නේ. තවදුරටත් මේ සභාපති අධ්‍යක්ෂ මණ්ඩලයේ හිටියොත් සමුපකාරයේ පුටු මේස ටිකත් විකුණලා යනවා. ඒකයි වෙන්නේ. ඒ නිසා තමයි ඔහුට අදාළව නීතිමය ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ. අද ඔහු රිමාන්ඩ් එකේ. අයථා වත්කම් රැස් කිරීම පිළිබඳව CID පරීක්ෂණයක් ක්‍රියාත්මක වෙනවා. අතුරු කමිටු වාර්තාවක් හරහා සොයාගෙන තිබෙනවා, බැංකුවේ රුපියල් මිලියන 5,920ක මුදලක් නැහැ කියලා. විවිධ සේවා සමුපකාර සමිතියේත්, මාතර ග්‍රාමීය බැංකු සමිතියේත්, මාතර ආරෝග්‍යශාලා සමිතියේත් මුදල් තමයි මේ අවභාවිතයට ලක් කරලා තිබෙන්නේ. ගරු විපක්ෂ නායකතුමා මතු කරපු කාරණය ගත්තොත්, හිටපු සභාපති නිලධාරිනුත් අල්ලාගෙන තමයි මේ වැඩේ කරලා තිබෙන්නේ. එම නිසා දැන් පත් කර තිබෙන දිස්ත්‍රික් කොමසාරිස්තුමිය, ගරු ආණ්ඩුකාරතුමා ඇතුළු ඒ සියලුදෙනා එකතුවෙලා ග්‍රාමීය බැංකු සංගමයත්, විවිධ සේවා සමුපකාර සමිතියත්, ආරෝග්‍යශාලා සමිතියත් බේරා ගන්න ගත්ත ක්‍රියාමාර්ගය නිසා තමයි අද ඔහු හිරේ ඉන්නේ. එහෙම නැත්නම් ඒ අයථා කටයුතු තවමත් නවතින්නේ නැහැ.

තවත් සමුපකාර ගණනාවක මේ ප්‍රශ්නය තිබෙනවා. රටේ ප්‍රධාන සමුපකාර ආයතනවලට අරක් ගත්ත බහිරවයෝ වාගේ කට්ටියක් ඉන්නේ. මේ එහෙම හිටපු එක්කෙනෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර අය එනකොට අනෙක් සමුපකාර සමිතිවල කට්ටියගේ සාක්කුවලට රුපියල් 50,000ක් දමනවා. ඒ මොකද? සමිතිය පවත්වාගෙන යන්න. කොහේ සල්ලිද ඒ විධියට දාලා තිබෙන්නේ? පරීක්ෂණ ක්‍රියාත්මක වෙනකොට මේවා එළිවෙයි. එම නිසා මාතර විවිධ සේවා සමුපකාර සමිතිය තුළ, ඒ වාගේම මාතර ග්‍රාමීය බැංකු සංගමය තුළ මේ වනවිට අර්බුදයක් තිබෙනවා. ඒ අර්බුදය ඇතුළේ එම සමිති පවත්වාගෙන යන්න ගතයුතු උපරිම සහ හොඳම ක්‍රියාමාර්ග සමුපකාර කොසමාරිස්තුමිය විසින් 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත අනුව අරගෙන තිබෙනවා. එහෙම කළේ නැත්නම් ඒ සමුපකාර සමිතිවලට සිදු වන දේ හිතාගන්නවත් බැහැ.

ඒ විතරක් නොවෙයි, අපේ රටේ තවත් විවිධ සේවා සමුපකාර සමිති යටතේ තිබෙන ග්‍රාමීය බැංකු සංගම් 68ක මූල්‍ය වංචා සිදුවෙලා තිබෙනවා. මහරගම ග්‍රාමීය බැංකු පද්ධතියේ සිදු වූ වංචාවක් පිළිබඳව සොයන්න කොළඹ දිස්ත්‍රික්කය නියෝජනය කරන දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා සහ ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා කිහිප වතාවක්ම මාත් එක්ක ආවා. මහරගම බැංකුවේ විතරක් මිලියන 1,000ක්. සීතාවක මිලියන 980ක්. මේ විධියට සමුපකාර සමිතිවල සල්ලි අවභාවිත කරනවා පනත පාවිච්චි කරලා, පනතේ දුර්වල තැන් පාවිච්චි කරලා. ඒවාට ඒගොල්ලන් විතරක්ම නොවෙයි සමහර නිලධාරීනුත් සමහර තැන්වලට වග කියන්න ඕනෑ. ඉතින් අපි ඒවා වෙනස් කරන්න ඕනෑ. ඒවා වෙනස් කරලා සමුපකාර ව්‍යාපාරය ගොඩ නඟන්න, ආරක්ෂා කරන්න ගත යුතු හොඳම තීරණය ගන්නවා. ඒ විතරක් නොවෙයි. තැන්පත්කරුවන්ගේ මුදල් වංචා කරන පුද්ගලයන්ට විරුද්ධව ගත යුතු නීත්‍යනුකූල ක්‍රියාමාර්ග ගන්නත් අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ විවාදය තිබෙන්නේ මේ කථාවට සම්පූර්ණයෙන් වෙනස් මාතෘකාවක්. නමුත් මතු වුණු කරුණුවලට මොනවත් නොකියා ගියොත් හොඳ නැහැ. දිලිත් ජයවීර මන්ත්‍රීතුමා මෙතැනින් ගියා මට හිතෙන්නේ. අද විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත අපි පාර්ලිමේන්තුවට සභාගත කළා. දැන් ඒ කෙටුම්පත ගැන අවශ්‍ය නම් අධිකරණ ක්‍රියාමාර්ගවලට යන්න පුළුවන්. අධිකරණයේ ස්වාධීනත්වය ගැන කථා කරන අය කොයි වෙලාවේවත් කියන්නේ නැති කාරණයක් තිබෙනවා. උපරිමාධිකරණවල, එහෙම නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය සහ මහාධිකරණය කියන අධිකරණ තුනේ විනිශ්චයකාරතුමන්ලාගේ විශ්‍රාම යන වයස තීරණය කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. අනෙක් අධිකරණ දෙක, දිසා අධිකරණයේ සහ මහෙස්ත්‍රාත්

අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස රජ්‍ය සේවයේ විශ්‍රාම යන වයසට සමපාතව එහා මෙහා වෙනවා. 1978න් පස්සේ රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 60 වෙලා තිබෙනවා. රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම යන වයස දැන් අවුරුදු 60 වෙලා තිබෙන්නේ, ගරු විපක්ෂ නායකතුමා. ඉස්සෙල්ලා තිබුණේ අවුරුදු 55යි. ඒ හා සමානව ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු 65ට තිබුණා, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු 63ට තිබුණා, මහාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු 61ට තිබුණා. ඒක සැලකුවොත් දිසා අධිකරණ සහ මහෙස්ත්‍රාත් අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස තිබෙන්න ඕනෑ, අවුරුදු පනස්පහේ. හැබැයි රාජ්‍ය සේවයේ විශ්‍රාම යන වයස වැඩි වෙනවාත් එක්ක අර අධිකරණ දෙකේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස වැඩි වුණා. එහෙම නේද? නීතිඥ මහත්තයෙකුත් මගේ ළඟ ඉන්නවා. එහෙම තමයි වැඩි වුණේ. *[බාධා කිරීමක්]* දොස්තරලා ගැන නොවෙයි නේ සහෝදරයා මේ කථා කරන්නේ. ඉන්නකෝ පොඩ්ඩක්. වැදගත් මාතෘකාවක් කථා කරනකොට ඔය වාගේ කථා කියනවා. අපේ විපක්ෂ නායකතුමාත් කථා කළ මාතෘකා තිබුණා, කොච්චර වැදගත්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි ගේන්නේ ඇයි? සම ප්‍රවේශී අධිකරණ පද්ධතියක් සකස් කිරීමට අදාළව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් කරුණු කිව්වා. ඒ අනුව අපේ අධිකරණ පද්ධතියේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු ප්‍රමාණයක් වැඩි කරනවා, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු ප්‍රමාණයක් වැඩි කරනවා. ශ්‍රෙෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු ගණන 20ක් කරනවා, මහාධිකරණයේ විනිශ්චයකාරවරු 110 ප්‍රමාණය 120 කරනවා, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු 20 ප්‍රමාණය 24 කරනවා. තව මහාධිකරණ 10ක් අපි දැන් පටන් අරගෙන තිබෙනවා. සමහර මහාධිකරණවල නඩු විශාල ලෙස ගොඩ ගැහිලා තිබෙනවා. අධිකරණ පද්ධතිය ඇතුළේ කාර්යක්ෂමතාව හදන්න අධිකරණවලට අවශ්‍ය පහසුකම් දෙනවා. විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස වැඩි කිරීම සඳහා වෙන කිසිම මගක් නැහැ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් හැරෙන්නට, ගරු විපක්ෂ නායකතුමනි.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමේ අරමුණ මොකක්ද? එක පැත්තකින් පහළ අධිකරණ දෙකේම විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 60ට ඇවිල්ලා තිබෙන්නේ. දැන් මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 61යි, දිසා අධිකරණයේ අවුරුදු 60යි, මහෙස්ත්‍රාත් අධිකරණයේ අවුරුදු 60යි. අපි දැන් අරගෙන එන විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ශ්‍රෙෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 67යි, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 65යි, මහාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 63යි. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එයට සමගාමීව මහෙස්ත්‍රාත් අධිකරණ සහ දිසා අධිකරණවල විනිශ්චයකාවරුන්ගේ විශ්‍රාම වයසත් 62 දක්වා වැඩි කරනවා. දැන් මොකක්ද මේ වැඩි කිරීමෙන් අධිකරණයේ ස්වාධීනත්වයට වන හානිය? විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේත්, අභියාචනාධිකරණයේත් විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය වැඩි කරද්දී, ඒ වෙලාවේ මේ ගැනත් සාකච්ඡාවක් ගන්න තිබුණා. නමුත් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇතුළේ විනිශ්චයකාරවරු ප්‍රමාණය විතරයි වැඩි කළේ. ඉතින් ඒ අනුව අපි මේ කරන වැඩේ, විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස වැඩි කරන එක; විශ්‍රාම වයස අවුරුදු දෙකකින් කල් දමන එක. සමප්‍රවේශී අධිකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට ගෙන යන ක්‍රියාමාර්ග බොහෝ ප්‍රමාණයක් අතර එකම එකක් විතරයි. අග්‍ර විනිශ්චයකාරතුමා ලබන ජනවාරි මාසයේ විශ්‍රාම යනවා.

මේ ව්‍යවස්ථා සංශෝධනය ඊට පස්සේ ගෙනාවත් කමක් නැහැ කියන අයත් ඉන්නවා කියලා තමයි අපට ආරංචි වෙන්නේ. ඊට පස්සේ, ඇයි ඒ? අපි කියන්නේ මේකයි. ව්‍යවස්ථාව සංශෝධනය කරන්න පුළුවන් බලය ජනතාව අපට දීලා තිබෙනවා. ඒ බලය පාවිච්චි කරලා, අපි ඒ අදාළ කටයුත්ත කරනවා. ඒ කටයුත්ත කරගෙන යනකොට, අධිකරණයේ කාර්යක්ෂමතාව ඇති කිරීමට අවශ්‍ය කරන ඒ පහසුකම් අපි ලබා දෙනවා. වැඩිපුර අධිකරණ, මහාධිකරණ ඇති කරනවා. ඒ වාගේම විනිශ්චයකාරවරු ප්‍රමාණයත් වැඩි කරනවා. ඒ විධියටම ශ්‍රේෂ්ඨාධිකරණයේත්, අභියාචනාධිකරණයේත් විනිශ්චයකාරවරු ප්‍රමාණය වැඩි කරනවා. පළපුරුදු සහ අත්දැකීම් තිබෙන විනිශ්චයකාරවරු ප්‍රමාණය අපි වැඩි කරනවා. ඒ අනුව, ඒ අයගේ විශ්‍රාම යන වයස තව අවුරුදු දෙකකින් වැඩි කරනවා. විපක්ෂය තේරුමක් නැති කථාවක් කියනවා කියලායි මට හිතෙන්නේ. සමහරුන්ට නඩු තිබෙනවා. ඒකයි මේ ප්‍රශ්නය. ආර්ථික විශේෂඥයින් කියන කට්ටිය පසුගිය කාලයේ කොටස් වෙළෙඳ පොළේ කරපු සමහර ගනුදෙනු පිළිබඳව Securities and Exchange Commission - SEC - එක පරීක්ෂණ කරනකොට, ඒවා එහෙම කරන්න බැහැ කියලා ගිහිල්ලා තහනම් නියෝග ගත්තා. සාධාරණව ආයෝජනය කරලා බිස්නස් කරන්න තිබුණා නේ. Rapid Antigen Test kits විකුණපු එක ගැනයි, සමහරු "එයාර් ලංකා" එක මඟින් හෝටල් කාමර දීපු එක ගැනයි කථා කරන්න ගියොත් මට වෙලාව මදි වෙනවා. එම නිසා මම ඒ දේවල් ගැන කථා කරන එක මෙතැනින් නවත්වලා ඊළඟ කාරණයට යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපට කරන්න තිබෙන්නේ වැදගත් විවාදයක්. ඒ විවාදය වැදගත් වෙන්නේ, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, your time is up now.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
අපේ වෙලාවෙන් මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම ඉක්මනින් අවසන් කරන්නම්. - *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, you have been given an additional four minutes.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සංශෝධනය අපි සම්මත කරගත යුතු වන්නේ මේ නිසායි. ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ ලෝකයේ බහුතරයක් රටවල්, විශේෂයෙන් ඇමෙරිකාවට භාණ්ඩ අපනයනය කරන රටවල්, ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක සෑහෙන සාකච්ඡා වට පැවැත්වූවා, ඇමෙරිකාව විසින් පැනවූ බදු අඩු කර ගන්න. ඔබතුමාගේ නම කිව්වා කියලා නැඟිටින්න එපා. නම කිව්වේ ඔබතුමාගේ දැන ගැනීම සඳහායි, ගරු මන්ත්‍රීතුමා. ඒ සාකච්ඡා වටය ඇතුළේ අපි උත්සාහ කළා, අපට සියයට 40 ඉඳලා තිබුණු සමහර taxes - tariffs - අඩු කර ගන්න. ඒ සියයට 40ක් ලෙස තිබුණු එක, යම්

[ගරු වසන්ත සමරසිංහ මහතා]

වෙලාවක සියයට 12.5ට ආවා. ඒ සියයට 12.5ට එනකොට අපට තවත් තත්ත්වයක් ඇති වුණා. ඒ මොකක්ද? ඒ සියයට 12.5ත් අඩු කර ගන්න පුළුවන්කමක් ලැබුණා. ඇමෙරිකා එක්සත් ජනපදය ඒ අයගේ නීතිය - Section 301, ඒ Convention එක - යටතේ මේක apply කර ගෙන තිබෙනවා.

ඒ Trade Act එකේ Section 301 යටතේ forced labour, එහෙම නැත්නම් බලහත්කාරී ශ්‍රමය යොදවලා නිෂ්පාදනයක් කරලා තිබෙනවා නම්, අමුද්‍රව්‍යයක් හදලා තිබෙනවා නම්, උපකරණයක් හදලා තිබෙනවා නම්, ඒක රටකට ගෙනෙද්දී ඒ රටවලට බදු සහනය දෙන්නේ නැහැ කියන එක තමයි ඒගොල්ලෝ මේ තුළින් අර්ථ කථනය කළේ. මගේ අමාත්‍යාංශය වන වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කණ්ඩායම, BoI එකේ වර්තමාන සභාපති, ජනාධිපතිතුමාගේ ආර්ථික උපදේශක දුමින්ද හුලංගමුව මහතා ඇතුළු කණ්ඩායම, මහ බැංකුවේ අධිපතිතුමා, මුදල් අමාත්‍යාංශයේ ලේකම් වන හර්ෂණ සූරියප්පෙරුම මහත්මයා ඇතුළු කණ්ඩායම, අපේ විදේශ අමාත්‍යාංශය ඇතුළු සියලුදෙනා එකට එකතු වෙලා වෙහෙස වෙලා ඉතා දුෂ්කර කාර්යභාරයක් කරලා අපේ බදු ප්‍රමාණය සියයට 10 දක්වා අඩු කර ගත්තා. ඒ අඩු කර ගැනීම විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අඩු කර ගැනීම කර ගන්න යද්දී මේ පනත යටතේ ඇවිල්ලා තිබෙන සමහර ක්‍රියාකාරකම් ප්‍රමාණයක් තිබෙනවා. ඒවා තවදුරටත් තහවුරු කර ගන්න නම්, අපේ ආනයන හා අපනයන (පාලන) පනත සංශෝධනය කරන්න ඕනෑ. මේ පනත සංශෝධනය කිරීම සඳහා, ශ්‍රී ලංකාවෙන් සිදු කරන ආනයනවලට එරෙහිව පැනවිය හැකි තීරු බදු අනුපාතය ඉහළ දැමීමක් වළක්වා ගැනීමට කඩිනම් පියවරක් වශයෙන් 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමට එකඟතාවට පැමිණියා. එම එකඟතාවට අනුව තමයි අද අපි මේ රෙගුලාසි ඉදිරිපත් කරන්නේ. ඒ අනුව, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ මෙම රෙගුලාසි පැනවෙනවා. මොකද අපි mechanism එකක් හදනවා නම්, filtering system එකක් හදනවා නම්, ලෝකයේ අනෙක් රටවලින් අපේ රටට භාණ්ඩ - raw materials - ආනයනය කරද්දී, forced labour, එහෙම නැත්නම් බලහත්කාරී ශ්‍රමය, විශේෂයෙන් බලහත්කාරී ළමා ශ්‍රමය පාවිච්චි කරලා තිබෙනවා නම් අපට ඒ සඳහා බදු සහනය ලැබෙන්නේ නැහැ කියන එක දැන් අපි දන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, please wind up.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, අපේ Sri Lanka Customs එක, වෙළෙඳ අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව යන මේ සියලු ආයතන ඒකාබද්ධව කටයුතු කරනවා. විශේෂයෙන් ඇඟලුම් ක්ෂේත්‍රය - garment and textile industry එක - ගත්තොත්, අපේ රටේ අපනයන ආදායමෙන් සියයට 50ක් තිබෙන්නේ මෙතැන. ඒකෙන් තවත් සියයට 50ක් ගත්තොත්, බිලියන දෙකහමාරකට වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ ඇමෙරිකාවේ. ඒක නිසා විශේෂයෙන් ඇඟලුම්වලට ගෙනෙන නූල් වෙන්න පුළුවන්, නූල් හදන්න ගෙනෙන knit එක වෙන්න පුළුවන්, එහෙම නැත්නම් colouring වෙන්න පුළුවන්, ඒකට ගෙනෙන machines වෙන්න පුළුවන්, ඒ ඕනෑම දෙයක් අපේ රටට ගෙනැල්ලා තිබෙනවා නම් අපට බදු සහනය ලැබෙන්නේ නැහැ. එහෙම වුණොත් අපේ අපනයන වෙළඳපොළ ඇතුළු අපේ රෙදිපිළි, ඇඟලුම් අපනයනකරුවන්ට වන බලපෑම නවත්වා ගැනීම වෙනුවෙන් රජයක් හැටියට පසුගිය අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ ගත් වෙහෙස මහන්සිය, තවදුරටත් අපේ අපනයනකරුවන්ගේ අපනයන වෙළෙඳ පොළ ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඒ ගත් තීරණය තමයි අද අපි මේ සභාගත කරලා පාර්ලිමේන්තුවේ සම්මත කරන්න හදන්නේ. මෙතුමන්ලාට ඉතින් විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරන්නත් පුළුවන්. මේ මතු වෙලා තිබෙන තත්ත්වය හරියට තේරුම් ගන්න. ආර්ථිකය ඇතුළේ වෙන්න තිබෙන අවදානම අඩු කරගන්න සහ අපනයනකරුවන් ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ගත යුතු හොඳම ක්‍රියාමාර්ගයක් ලෙසයි මේ රෙගුලාසි සම්මත කර ගැනීම අද අපි මේ කරන්නේ. ඒකට සහාය දෙන්න කියන ඉල්ලීම කරමින්, මා නවතිනවා.

බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමා දැන ගන්නට ඕනෑ, සමුපකාර ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මම කථා කළේ වෙන කවුරුවත් වෙනුවෙන් නොවෙයි, තැන්පත්කරුවන් 13,000 වෙනුවෙන්ය කියන එක. මාතර සමුපකාර ග්‍රාමීය බැංකු තැන්පත්කරුවන්ගේ සංසදයේ සී.එන්. කරුණානායක මහත්මයා ඉදිරිපත් කරපු දුක්ගැනවිල්ල ඔබතුමාගේ දැන ගැනීම පිණිස මම ඉදිරිපත් කරනවා. ඇත්ත වශයෙන්ම සමූහයක් ආවා, මාව හමු වෙන්න. ඒ අයගේ දුක්ගැනවිල්ලයි මා ඉදිරිපත් කළේ. ඒක නිසා විශේෂයෙන් මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, ඒ තැන්පත්කරුවන් 13,000ට යම්කිසි සහනයක් ලබා දෙන්න, විශේෂයෙන්ම ඒ අයගේ තැන්පතු ආපසු ලබා ගැනීම සඳහා යම් කිසි මැදිහත්වීමක් වෙන්න පුළුවන් නම් ඒ මැදිහත් වීම කරන්න කියන කාරණාව පමණයි මම ඔබතුමාට ඉදිරිපත් කරන්නේ. එහෙම නැතුව සමුපකාර ක්ෂේත්‍රයේ එක එක මගඩි ගහපු කට්ටිය වෙනුවෙන් මම කවදාවත් ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ තැන්පත්කරුවන් 13,000 වෙනුවෙන් පමණයි මා ඉදිරිපත් වෙන්නේ. එම කරුණු ඇතුළත් ලේඛනය මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමා කියපු කාරණයට මම උත්තරයක් දෙන්න ඕනෑ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු විපක්ෂ නායකතුමනි, එම තැන්පත්කරුවන්ගේ තැන්පතු ආරක්ෂා කිරීම වෙනුවෙන් ගතයුතු උපරිම පියවර අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ වනවිටත් එම සභාපතිවරයාගේ ගිණුමක කෝටි 30ක් seize කරලා තිබෙනවා. මම ඔබතුමාගේ අවධානය සඳහා කියන්නේ. ඔබතුමා ගම්‍ය කරන්න උත්සාහ කළා, පසුගිය අප්‍රේල් වෙනකල් සමුපකාර හොඳටම ක්‍රියාත්මක වුණා කියලා. නැහැ, ඒක ගැන මම ඔබතුමාට කියන්න ඕනෑ. "පසුගිය අප්‍රේල් වෙනකල් සමුපකාර බැංකුව ක්‍රියාත්මක වුණා, හොඳටම පොලිය ගෙව්වා" කියලා කිව්වා. නැහැ. නමුත් හොඳටම දුන්නා, සුද්දයක්. මම ඒක කියන්න ඕනෑ. ඔය සංගමය ඇවිල්ලා තුන් පාරක් විතර මාව හම්බ වුණා. ඔය සංගමය ඇවිල්ලා මාව හම්බ වුණා; පුද්ගලයෝ මාව හම්බ වුණා. ඒ විතරක් නොවෙයි. අපේ දිස්ත්‍රික්කයේ සිටින දේශපාලන අධිකාරියේ කට්ටිය මාව මුණ ගැහුණා. අපි මේක ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් මැදිහත් වෙනවා. ඔබතුමා ඉදිරිපත් කළ document එකත් අවධානයට ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Chanaka Madugoda. You have seven minutes.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. (Dr.) Ramanathan Archchuna, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු ඇමතිතුමා මගේ නම සඳහන් කරලා කථා කළා. ඒක නිසා මට විනාඩියක් දෙන්න. මට කථා කරන්න අයිතියක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම සඳහන් කළාද? නැහැ, නැහැ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ නම සඳහන් කළා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නම සඳහන් කළේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Chanaka Madugoda, you may commence your speech now.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලයෙන් නම් අඩු කරන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You commence your speech, Hon. Member.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. මගේ නම සඳහන් කළා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වේලාව දෙන්න. හැබැයි මගේ වේලාවෙන් අඩු කරන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You commence your speech, Hon. Member.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. - *[බාධා කිරීම්]* එතුමාගේ point of Order එකට ඉඩ දෙන්න. නැත්නම් මට කථාව කරගෙන යන්න බැරිවෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. (Dr.) Archchuna, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ නම සඳහන් කළා. හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න. කරුණාකරලා ඔබතුමා මූලාසනයේ වාඩි වෙන්න කලින් සිංහල ඉගෙන ගන්න. මගේ නම සඳහන් කරලා කථා කළා. මූලාසනයේ වාඩි වෙලා සිටිද්දී කොහොමද, මගේ නම සඳහන් කළේ නැහැ කියන්නේ? මගේ නම සඳහන් කරලා තිබෙන නිසා මට උත්තර දෙන්න අයිතියක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තත්පර කිහිපයක් දෙන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Sir.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම වගකීමෙන් මේක අහන්නේ. මම මේ නිකම් ආතල් එකක් ගන්න නොවෙයි මේක

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

අහන්නේ. ඔබතුමන්ලා කිව්වා නේ, දේශපාලනයක් නැහැ, ඒ නිසා සේවා කාලය අවුරුදු 67 වෙනකම් වැඩි කරනවා කියලා. අපේ professorsලා, doctorsලා, consultantsලා ඔක්කෝම පනිනවා නේ. ඔයගොල්ලෝ ඇත්තටම රටට ආදරේ නම් ඒගොල්ලන්ගේත් සේවා කාලය වැඩි කරන්න තිබුණා නේ. එහෙම නිකම් දේශපාලනය කරන්න එපා, අයියා. *[බාධා කිරීමක්]* බොරු කියන්න එපා. එහෙනම් ඒකට උත්තර දෙන්නකෝ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Chanaka Madugoda.

[අ.භා. 3.40]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වේලාව දැනුයි පටන් ගන්නේ, මගේ වේලාව අඩු කරන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්.

මීට පෙර ගරු විජිත හේරත් ඇමතිතුමා කිව්වා, ඇමෙරිකාව සමඟ ඉතාම හොඳ ගනුදෙනුවක් කළා, ඒ ගනුදෙනුව තුළින් ජයග්‍රහණ ලබා ගත්තා කියලා. ඒ ගැන අපි සතුටු වනවා. හැබැයි ඒ සහන ලබා ගැනීම වෙනුවෙන් ඇමෙරිකාව එක්ක ගහපු ගිවිසුම් මොනවාද කියන කාරණය මේ රටවත්, අපිවත් තවම දන්නේ නැහැ. ඒ නිසා අපි එය දැනගන්නත් කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගරු විජිත හේරත් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ වනකොට සරණාගත වීසාවල ගැටලුවක් තිබෙන ඊශ්‍රායලයේ සිටින ශ්‍රමිකයින් වෙනුවෙනුත්, ඒ වාගේම මේ වනකොට රැකියා සඳහා ඊශ්‍රායලයට යන්න බලාගෙන ඉන්න තරුණ තරුණියන් වෙනුවෙනුත්, ඒ වාගේම කොරියාවේ රැකියා සඳහා යන්න බලාපොරොත්තුවෙන් ඉන්න තරුණ තරුණියන් වෙනුවෙනුත් එතුමාගේ මැදිහත්වීම ලබා දීලා, ඒ තරුණ තරුණියන්ගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න, ඇමෙරිකාව සමඟ ගනුදෙනු කළා වාගේ ඒ රටවල් දෙක සමඟත් ගනුදෙනු කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන අද උදේ ඉඳන් කථා කළා. අද විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරන දවසක් නොවුණත් මම මේ කාරණය කියන්න ඕනෑ. අද මේ ආණ්ඩුව විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න මෙතරම් මහන්සි වෙන්නේ, මෙතරම් දත කන්නේ, මොන ජාතියෙන් හරි මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්නේ කාව සතුටු කරන්නද කියන කාරණය අපට පැහැදිලියි. මොකද, මේ ආණ්ඩුව කරන හැම කටයුත්තකින්ම අවසානයේ සතුටු කරන්නේ එල්ටීටීඊ ඩයස්පෝරාවයි කියන කාරණාව මේ රටම අද දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ආණ්ඩුව ගෙනෙන මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අවසාන ප්‍රතිඵලය වෙන්නේ රට බෙදන, රට කඩන, ජාතිය දෙකඩ කරන, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි ෆෙඩරල් මතවාදයක් ගෙන ඒමයි. ඒ නිසා අපි මේ මොහොතේ ඒ පිළිබඳව කියන්න ඕනෑ. ඒ වාගේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විධියට මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි දැඩි ලෙස විරුද්ධයි කියන කාරණයත් මේ මොහොතේ මම සිහිපත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණයේ කටයුතු දියුණු කරන්න, කාර්යක්ෂම කරන්න කටයුතු කරනවා කියලා අද ආණ්ඩුව කිව්වා. පසුගිය අපේ ආණ්ඩුවෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ අධිකරණ සංකීර්ණය හදලා මේ වනකොට අවුරුදු දෙකක් වෙනවා. ගාල්ල දිස්ත්‍රික්කයේ ඒ අධිකරණ සංකීර්ණය විවෘත කරගන්න මේ ආණ්ඩුවට තවම බැරි වුණා. එතකොට මේ අධිකරණ ක්‍රියාවලිය ශක්තිමත් වෙන්නේ කොහොමද කියන කාරණය අපි අහනවා. ඒ නිසා අධිකරණය ගැන කථා කිරීමත් අද විහිළුවක් බවට පත් වනවා. ඔවුන්ට අද ගාල්ල අධිකරණ සංකීර්ණයවත් විවෘත කරගන්න බැරි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද දවසේ මේ පාර්ලිමේන්තුවේ කථා කරපු කරුණ, අද පාර්ලිමේන්තුවේ සම්මත කරන්න යන 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන 2026 අංක 07 දරන රෙගුලාසි පිළිබඳව විශේෂයෙන්ම අපේ මතය, අපේ අදහස ඉදිරිපත් කරන්නත් මා මෙය අවස්ථාවක් කරගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම රෙගුලාසිවල ප්‍රධාන අරමුණ වන්නේ, බලහත්කාරයෙන් ශ්‍රමය යොදාගෙන සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ ආනයනය කිරීම තහනම් කිරීමයි. අද දවසේ ගේන මේ යෝජනාවට විපක්ෂයක් විධියට අපේ දැඩි කැමැත්ත, දැඩි එකඟත්වය පළ කරන්න කැමැතියි.

ඒ වාගේම අපට සාධාරණව නැඟෙන ගැටලු පිළිබඳව ප්‍රශ්න කරන්නත් මා මෙම අවස්ථාව යොදා ගන්නවා. අපි දන්නවා, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12 ව්‍යවස්ථා මඟින් මෙන්ම ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 358 A සහ 360 C වගන්ති මඟින් බලහත්කාරයෙන් ශ්‍රමය යෙදවීම සහ මිනිස් ජාවාරම අපරාධයක් විධියට හඳුන්වා තිබෙන බව. කම්කරු අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලීසිය මේ සඳහා දැනටමත් නීතිමය බලතල සහිතව ක්‍රියාත්මක වනවා. එසේ තිබියදීත් විදේශ රටවලින් ගෙනෙන භාණ්ඩයක් නිෂ්පාදනය කළේ බලහත්කාරයෙන් ශ්‍රමය යොදාගෙනද, නැද්ද යන්න පිළිබඳව නිවැරදි නිර්ණායක ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා රේගුවට ඇති හැකියාව සහ ප්‍රායෝගික තාක්ෂණ ශක්‍යතාව කුමක්ද කියන එක මම මෙම සභාවෙන් දැනගන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම රෙගුලාසි යටතේ වූ භාණ්ඩ ආනයනය තහනම් කරනකොට රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සහ ඇමතිවරයා වෙත බලතල විශාල ප්‍රමාණයක් පැවරෙනවා. ඒ නිසා විනිවිදභාවයෙන් තොර ක්‍රමවේදයක් තුළින් ව්‍යාපාරිකයින් සහ ආනයනකරුවන්ට අනවශ්‍ය ලෙස හිරිහැර කරන්නත්, රේගු ක්‍රියාවලිය ප්‍රමාද වෙන්නත්, අක්‍රමිකතාවන්ට මඟ පෑදෙන්නත් මේ මඟින් අවදානමක් තිබෙනවා. ජාත්‍යන්තර සැපයුම්දාමය ඉතාම සංකීර්ණයි කියන කාරණය අපි දන්නවා. රටවල් ගණනාවක් හරහා අමුද්‍රව්‍ය ගෙනැවිත් සාදන භාණ්ඩවල බලහත්කාරයෙන් යොදවන ශ්‍රමය අඩංගු දැයි සොයා බැලීමට අපගේ රේගු දෙපාර්තමේන්තුවට තොරතුරු ලැබෙන්නේ කොහොමද කියන එක මෙහිදී අපට ප්‍රශ්නයක් වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව යෝජනා කරන මෙම සහතික කිරීමේ ක්‍රමවේදයත්, ප්‍රායෝගිකව ආයතනික ක්‍රමවේදවලට යොමු කරන්නේ කොහොමද කියන ගැටලුවත් මෙහිදී අපට පැන නැඟී තිබෙනවා. ඒ වාගේම මිනිස් අයිතිවාසිකම් සහ කම්කරු අයිතිවාසිකම් සුරැකීම සහ විදේශ වෙළෙඳ සහන

ලබා ගැනීම සම්බන්ධව විපක්ෂයක් ලෙස මෙහිදී අප එකඟයි. නමුත්, එම අරමුණ ඉටු කර ගත යුත්තේ දේශීය ව්‍යාපාරිකයාට වාගේම ආනයනකරුවන්ටත් අනවශ්‍ය බාධා ඇති නොවන, විනිවිදභාවයකින් යුතු සහ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි නීති රාමුවක් තුළින්ය කියන මතය අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සඳහන් කළ ගැටලු පිළිබඳව අවධානය යොමු කරන්න. මේ පනත යටතේ ඉතාම වැදගත් වූ රෙගුලාසි තමයි ආණ්ඩුව අද දවසේ ඉදිරිපත් කළේ. එම නිසා ඒ ගැටලු පිළිබඳව ඔබගේ - ආණ්ඩුවේ - අවධානය යොමු කරන්න කියන කාරණයත් මේ මොහොතේ මා සිහිපත් කරනවා.

අවසාන වශයෙන්, මේ කාරණයත් මම කියන්න කැමැතියි. මෙය විපක්ෂයේ මන්ත්‍රීවරයකු විධියට මා කියන කථාවක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව 2025 අය වැය ලේඛනය හරහා මෙරට ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට යම් පොරොන්දුවක් දුන්නා. නමුත්, අද ඒ පොරොන්දුව ගැන කථාවක් නැහැ. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා එක දවසක් ප්‍රකාශ කළා, "පාර්ලිමේන්තුවේදී නම් අපි කියන්නේ බොරු, එළියේදී නම් කියන්නේ ඇත්ත" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025 අය වැය ලේඛනය හරහා මෙරට ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට දෙනවා කියපු සහන ලබා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීමත් මේ මොහොතේ කරමින්, අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Upali Samarasingha. You have been allotted nine minutes.

[අ.භා. 3.49]

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන ජනතාවාදී ආණ්ඩුව පත් වුණාට පසුව ගෙවුණු මේ කාලය තුළ මේ සභාවේදී ජනතාවටත්, රටටත්, ඒ වාගේම ජාත්‍යන්තරයටත් වඩාත් වැදගත් වන බොහෝ පනත් මඟින් අලුත් නීති සංශෝධනය කර තිබෙනවා. මම හිතන විධියට, අද දවසේත් වර්තමාන ආණ්ඩුව විසින් කරමින් ඉන්නේ අපේ රටට, අපේ රටේ ජාත්‍යන්තර සම්බන්ධතාවලට, ජාත්‍යන්තර වෙළෙඳාමට ගැළපෙන පරිදි යම් පනතකට අදාළ රෙගුලාසි අනුමත කිරීමයි. ඇත්තටම අපි මෙවැනි පනත්වලට රෙගුලාසි ඉදිරිපත් කරමින් ජාත්‍යන්තර පනත්වල හවුල්කරුවන් බවට පත්වීම සඳහා හේතු වන කාරණා පිළිබඳව කථා කරන්න ඕනෑ.

අපි දන්නවා, ලෝකයේ තාක්ෂණය වේගයෙන් දියුණු වන බව. ලෝකයේ සමාජ පරිවර්තනයන් වේගයෙන් සිදු වනවා. ලෝකයේ දියුණු රටවල් මානව හිමිකම් ඇතුළු බොහෝ දේ සම්බන්ධව විවිධ අණ පනත් සම්මත කරමින් ඉන්නවා. ඒ නිසා රටක් විධියට අපි විශ්වාස කරනවා, රටේ නීති පද්ධතිය ජාත්‍යන්තර වශයෙන් සම්බන්ධ වන කාරණාවලදී අපේ රට තනි නොවී ලෝකයත් සමඟ ඉදිරියට යන්න නම් එවැනි දියුණු සමාජ තත්ත්වයන්වලට, නීතිවලට එකතු වන්න ඕනෑ කියලා. හැබැයි, අවාසනාවකට වාගේ අද දවසේ මේ වැදගත් පනතට රෙගුලාසි ඉදිරිපත් කරන අවස්ථාවේදීත් විපක්ෂය පැත්තෙන් අපි දැක්කේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ කාරණායි. ඇත්තටම මම හිතනවා, ඉස්සරහට විපක්ෂයේ පක්ෂ නායකයන්ට විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ තත්ත්වයන් පිළිබඳව දවසක හෝ දෙකක විවාදයක් කරන්න පුළුවන්කම ලැබෙයි කියලා. ඒ සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ. ඒකට ආණ්ඩුව විවෘතයි. හැබැයි, අද දවසේ මෙවැනි වැදගත් සංවාදයක් ගැන කථා කරනවා වෙනුවට ඔවුන් මාධ්‍යවලට තමන්ගේ මුහුණ පෙන්වා ගන්න තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඇත්තටම අපි පුදුම වෙනවා, වැදගත් පනතක් යටතේ ගෙනෙන රෙගුලාසි සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේදී විපක්ෂ නායකතුමා සමුපකාර ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු මතු කිරීම ගැන. ඇත්තටම අපි දන්නවා, සෑම මන්ත්‍රීවරයෙකුටම පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න අහන්න පුළුවන් බව. එතුමාට සමුපකාර සම්බන්ධව ගැටලුවක් තිබෙනවා නම්, වෙනත් දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා නම් පොදුවේ න්‍යාය පත්‍රයේ තිබෙන විධියට ප්‍රශ්නයක් අහලා උත්තර ලබා ගන්න පුළුවන්. බලහත්කාරයෙන් යොදවන ශ්‍රමය මඟින් නිෂ්පාදනය කරන අමුද්‍රව්‍ය හා භාණ්ඩ සම්බන්ධයෙන් වන රෙගුලාසි ගැන වචනයක්වත් කථා නොකර එතුමා වෙනත් කාරණා සම්බන්ධව කථා කළා. ඒක, කොහෙද යන්නේ කියලා ඇහුවාම මල්ලේ පොල් කිව්වා වාගේ දෙයක්.

ඇත්තටම අපි මෙතැනදී හිතන්න ඕනෑ කාරණා කිහිපයක් තිබෙනවා. එක කාරණයක් තමයි, මේ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි හා සම්බන්ධ වීමෙන් අපටත්, අපේ රටේ ජනතාවටත් ඇති වන වාසිදායක තත්ත්වය මොකක්ද කියන එක. අපි රටක් විධියට අපේ නිෂ්පාදන ජාත්‍යන්තරයට අළෙවි කිරීමේදී මෑත කාලයේ ඇමෙරිකාව විසින් පනවන ලද බදු ප්‍රතිපත්තිය මත අපේ අවසාන බදු ප්‍රතිශතය විධියට තිබුණේ 12.5ක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතකොට අපේ අසල්වාසි ආසියාතික රටවලට සියයට 10ක බද්දක් තමයි තිබුණේ. ඒ නිසා අපේ නිෂ්පාදනවලට සමානව ඔවුන්ගේ නිෂ්පාදන ලෝක වෙළෙඳ පොළට යද්දී ඔවුන් අපට වඩා අඩු බදු ප්‍රතිශතයක ඉන්නකොට අපට ඒ වෙනුවෙන් විශාල තරගයක් දෙන්න සිද්ධ වෙනවා. හැබැයි, අපි ජාත්‍යන්තර ගිවිසුම්වලට එකඟ වුණාට පස්සේ නැවත වතාවක් ඒ බදු ප්‍රතිශතය 10ක් වෙලා තිබෙනවා. බදු ප්‍රතිශතය 10ක් වීම නිසා අපට ඉදිරියේදී පුළුවන්කම ලැබෙනවා, ලෝක වෙළෙඳ පොළ තුළ අපේ නිෂ්පාදනවලට හොඳ අගයක් ලබා ගන්න. ඒ විතරක් නොවෙයි, මෙවැනි ජාත්‍යන්තර ගිවිසුම්වලට අපි ඇතුළත් වුණාට පසුව ලෝකයේ තවත් ගිවිසුම් ඇති කරගෙන තිබෙන රටවල් සහ ඔවුන්ගේ නිර්ණායක සමඟ අපට බැඳීම් ඇති වනවා. අද දවසේ සම්මත කර ගන්න බලාපොරොත්තු වන රෙගුලාසි මඟින් අපට අනාගතයේදී අපේ රටේ නිෂ්පාදන ජාත්‍යන්තරයට අළෙවි කිරීම සඳහා දැවැන්ත ඉඩක් ලැබෙයි කියලා අපි හිතනවා. ඒ වාගේම ලෝකය තුළ තිබෙන නිෂ්පාදන ලංකාවට ගෙන ඒමේදී ඒ නිෂ්පාදනවලින් ඉවත් වෙලා අපේ රටේ නිෂ්පාදන පද්ධතිය තුළ රැඳෙන්නත් අපට පුළුවන් වනවා.

විපක්ෂය මේ සාකච්ඡාවට සම්බන්ධ නොවීමට බලපෑ කාරණා කිහිපයක් තිබෙනවා. අපි අද බලහත්කාරයෙන් යොදවන ශ්‍රමය මඟින් නිෂ්පාදනය කරන අමුද්‍රව්‍ය සහ භාණ්ඩ සම්බන්ධයෙන් වූ රෙගුලාසි සම්බන්ධයෙන් සාකච්ඡා කළාට, අපේ රටේ බලහත්කාරකමින්, අඩු වයස්ලාභී ළමා ශ්‍රමිකයන් යොදාගෙන තමන්ගේ දරුවෝ බලා ගත්ත, තමන්ගේ ගෙවල්වල තිබෙන මල් ගස්වලට වතුර දමා ගත්ත, රෙදි හෝදා ගත්ත ඉතිහාසයක් තිබුණා. මේ පාර්ලිමේන්තුවට තේරී පත් වෙච්ච, මේ පාර්ලිමේන්තුවේ වගකීම් දරපු මැති ඇමතිවරු සහ වෙනම පන්තියක් විසින් මෙන්න මේ මානව හිමිකම කඩ කරලා තිබුණා. ඒ නිසා ඔවුන් කල්පනා කරනවා ඇති, ලංකාව තුළ දැනට තිබෙන නීතිරීති තවත් ශක්තිමත් කරලා, බාලවයස්කාර දරුවන් මෙහෙකාර සේවයේ

[ගරු උපාලි සමරසිංහ මහතා]

යොදවමින් බලහත්කාරකමින් වැඩ ගැනීම සම්බන්ධ අණපනත් ඉදිරියේදී තවත් ශක්තිමත් වුණොත්, මේ සංවාදය තවත් ඉස්සරහට ගියොත් ඔවුන්ට මේක ප්‍රශ්නයක් වෙයි කියලා. අතීතයේ සිට, අපේ රටේ වතුකරයේ සිටින, නැත්නම් වන්නියේ සිටින දරුවන් කොළඹට ගෙනෙන බව අපි දන්නවා. ඒ දරුවන් කොළඹට ගෙනැල්ලා ධනවත් අයගේ ගෙවල්වල මෙහෙකාරකමට, ඔවුන්ගේ ගෙවල්වල වැඩ කරගන්න තමයි පාවිච්චි කළේ. බාලවයස්කාර දරුවන් මෙහෙකාරකමට යොදා ගැනීම වැළැක්වීමේ අණපනත් ශක්තිමත් කරන්නත් අපි මේ වෙද්දී බලාපොරොත්තුවෙන් ඉන්නවා. අපි ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙනවා. ඒ නිසා බලහත්කාරකමෙන් ශ්‍රමය යොදවා නිෂ්පාදනය කරන අමුද්‍රව්‍ය සහ භාණ්ඩවලට අමතරව අපේ රටේ දැනටත් බාලවයස්කාර දරුවන් මෙහෙයවමින් සමහර අය කරන නීති විරෝධී වැඩ සම්බන්ධයෙනුත් අපි සංවාදයක් කරන්න වෙයි. ඒවාට අලුතින් නීති ගෙනැල්ලා, ඒ නීති සියල්ලම දැඩි කරන්න වේවි. අපේ රටේ පුරවැසියන් සැමටම හිමි ඒ සමාජය තුළ කිසිම දරුවෙකු බලහත්කාරයෙන් වැඩවලට යෙදවීම හෝ ඔවුන් වෙනත් තැනක මෙහෙකාර සේවයට යෙදවීම වැනි කාරණා අපේ රටින් තුරන් කරන්න ඕනෑය කියා අපි හිතනවා. මොකද, වර්තමාන රජය බලයට පත් වුණේ මේ රටේ පුරවැසියන්ට ඔවුන්ගේ මානව අයිතිවාසිකම්, කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන්නයි. ඒ ආකාරයට කටයුතු කරමින් අපි රටක් විධියට ලෝකය ඉස්සරහ ඉතා හොඳ රටක් බවට පත්වීම සඳහා වැඩ කටයුතු කළ යුතු වෙනවා. මේ වාගේ අණපනත් තව තවත් ඉදිරියේදීත් සංශෝධනය කර ගනිමින් අපේ ගමන ඉදිරියට යන බවට පොරොන්දු වෙමින් මම නිහඬ වනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Nalin Hewage. You have been allotted ten minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Chanaka Madugoda to the Chair?

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. KAVEENTHIRAN KODEESWARAN left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 3.59]

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතා වැදගත් විෂයයක් පිළිබඳව කථා කරනවා. පළමුවෙන්ම මම අපේ විපක්ෂ නායකතුමාටත්, විපක්ෂයටත් ගෞරවනීය ස්තුතියක් පළ කරන්න ඕනෑ. මොකද, අද උදෑසන ඔවුන් පුවරු ප්‍රදර්ශනය කරමින් උද්ඝෝෂණයක් කළා. ඇත්තටම ඒක ආණ්ඩුව ශක්තිමත් කරන්න කරපු උද්ඝෝෂණයක්. ඒ සම්බන්ධයෙන් විපක්ෂ නායකතුමා ඇතුළු ඔබතුමන්ලා හැම දෙනාටම අපේ ස්තුතිය පළ කරන්න ඕනෑ. මන්ත්‍රීවරු කිහිප දෙනෙක් හැර ගොඩක් දෙනා ඒ උද්ඝෝෂණයට සම්බන්ධ වනවා මම දැක්කා.

ඒ පුවරුවල මොකක්ද තිබුණේ? ඒකේ එක කුලුනක් හැටියට තිබුණා, ව්‍යවස්ථාදායකය නමැති කුලුන. අනෙක් එක, විධායකය නමැති කුලුන. අනෙක් එක තමයි, අධිකරණය නමැති කුලුන. අධිකරණය නමැති කුලුන තිබුණේ කළුවට. ඒ කුලුනු තුන උඩ ප්‍රජාතන්ත්‍රවාදය - democracy - කියන එක තිබුණා. ඒක තිබුණේත් කළුවට. එතකොට අධිකරණය නමැති කුලුන කළුයි. හැබැයි, අනෙක් කුලුනු දෙකේ පාට ගාලා. අදහස තිබුණේ අධිකරණ කුලුනත් පාට ගාලා හදන්න. දැන් අපි අහන්නේ මේකයි. පාට ගාපු කුලුනු දෙකක් තිබුණා. ඒ කුලුනු දෙක තමයි, විධායකය සහ ව්‍යවස්ථාදායකය කියන කුලුනු. ඒ පාට ගාපු කුලුනු දෙක හොඳ නැද්ද? අපිට හිතන්නේ ඒ කුලුනු දෙකත් කලින් තිබෙන්න ඇත්තේ කළුවට කියායි. කළුවට තිබිච්ච දෙකක් තමයි දැන් පාට ගාලා වෙනස් කරලා තිබෙන්නේ. ව්‍යවස්ථාදායකය කියන කුලුන කලින් කළුවට තිබුණු බව එතුමන්ලා පිළිගන්නවා.

ඒ ව්‍යවස්ථාදායකය කොහොමද එදා තිබුණේ? මේ පාර්ලිමේන්තුව එදා කොහොමද තිබුණේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුටු කඩාගෙන, මයික් කඩාගෙන, වතුර ගහගෙන, ඔබතුමා ඉන්න පුටුවට වතුර වක් කරගෙන, මිරිස් කුඩු ගහගෙන, ඇඳි වත උස්සලා පෙන්වාගෙන සිටින පාර්ලිමේන්තුවක් තමයි එදා තිබුණේ. ඔන්න, එදා තිබුණු කළු කුලුන. ඒවා තමයි දැන් පාට ගාලා වෙනස් කරලා මේ අවුරුද්දයි මාස දහයක් ඇතුළත ලස්සනට හදලා තිබෙන්නේ. මේක එදා කළු කුලුනක්. මේ, පාර්ලිමේන්තුවට ඇවිල්ලා දින හයෙන් මහජනතාවගේ බදු මුදල්වලින් රුපියල් කෝටි ගණන් වියදම් කරලා වාහන ගත්ත ව්‍යවස්ථාදායකය. ඒක තමයි පාට වෙනස් කරලා, වාහන බලපත්‍ර ගන්නේ නැති විධියේ සංස්කෘතියකට හදලා තිබෙන්නේ. ඒක තමයි අපි වෙනස් කරලා තිබෙන්නේ.

ඒ වාගේම තමයි, ව්‍යවස්ථාදායකයේ අපි අත ඔසවලා අපේ පෙන්ෂන් එක කපාගෙන තිබෙනවා. කලින් තිබුණු කළු කුලුන පාට ගාලා වෙනස් කරගෙන තිබෙන්නේ, ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරුන්ගේ විශ්‍රාම වැටුප අපිම අහෝසි කරගෙනයි. ඒක වෙනස් කරලා තිබෙන්නේ එහෙමයි. ඒ ව්‍යවස්ථාදායක කුලුන වෙනස් කරලා තිබෙනවා. පෙන්ෂන් එක ගන්නේ නැති මන්ත්‍රීවරු හදලා තිබෙනවා. නිල නිවාස ගන්නේ නැති ඇමතිවරු හදලා තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ ශික්ෂණයක් ඇති කර තිබෙනවා. ඒ වෙනස් කිරීම් සම්බන්ධයෙන් මේ රටේ ජනතාවට තිබෙන්නේ සතුටක්. විධායක කුලුන වෙනස් කරලා තිබෙනවා. එහි පාට වෙනස් කරලා තිබෙනවා. ඉතින් නරකද?

අපට මතකයි, 1977දී ආපු විධායකය සති දෙකක් නිවාඩු දීලා, ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන්න, ගෙවල් ගිනි තබන්න කටයුතු

කළ ආකාරය. එහෙමයි කටයුතු කළේ, විධායකය. මෙවර විධායකය කිව්වා, අනික් මිනිස්සුන්ට රිද්දන්න රතිඤ්ඤාවත් දමන්න එපා කියලා. ඒක හොඳ නැද්ද? විධායකය සහ ව්‍යවස්ථාදායකය කියන කුලුනු දෙකේ පාට ගාලා වෙනස් කරලා තිබෙනවා. ඔබතුමන්ලා කියන ආකාරයට දැන් අධිකරණ කුලුනත් කළුයි. ඒකත් අර ආකාරයෙන් වෙනස් කරනවාට ජනතාව කැමැතියි.

අඩුම ගණනේ විපක්ෂ නායකතුමා, ඒ පුවරුවල තිබුණු යටි අර්ථය කියවා ගත්තා නම්, ඒක අතින් අල්ලාගෙන උද්ඝෝෂණයක් නම් කරන්නේ නැහැ. ඇත්තටම ඒක අපට පක්ෂ පුවරුවක්. හොයලා බලන්න විපක්ෂ නායකතුමනි, ඔය පුවරුව එක ඔබතුමාගේ අතට දුන්නේ කවුද කියලා. අතට දෙන ඕනෑ එකක් අල්ලන්න එපා, තමන්ටම හානි වෙනවා. කළු කුලුනක් තිබෙනවා, අධිකරණයේ. ඒක වෙනස් කරන්න ඕනෑ නැද්ද? ඒක වෙනස් කරන්න තමයි මේ ක්‍රියාමාර්ග ගොඩක් ගන්නේ. ඒ ක්‍රියාමාර්ග ඇතුළේ තමයි ඔය කාලය දීර්ඝ වීම තිබෙන්නේ. අධිකරණ කුලුන වෙනස් වන නිසා තමයි දැන් වේගයෙන් නඩු අහලා ගොඩක් අය හිරේ යන්නේ; සාධාරණය ඉෂ්ට වෙන්නේ. ඇත්තටම අද උදේ විපක්ෂය විසින් අල්ලාගෙන සිටි ඒ පුවරු හොඳට කියවා ගත්තොත් හොඳයි. ඒක කියවා ගන්න තරම්වත් බුද්ධියක් නැති වීම පිළිබඳව පොඩි සතුටක් තිබෙනවා. විපක්ෂ නායකතුමාට අපි කියනවා, මොනවා හෝ පරීක්ෂණයක් කරලා ඔය පුවරුව අපේ පැත්තෙන් ආපු එකක්ද කියලා පොඩ්ඩක් හොයලා බලන්න කියලා. ඇත්තටම ගත්තොත්, ඒක අපට පක්ෂව කරපු උද්ඝෝෂණයක්; අපට පක්ෂව කරපු වැඩක්. මොකද, දැන් කුලුනු දෙකක් වෙනස් කරලා තිබෙනවා. ඒ වෙනසට මේ රටේ ජනතාව කැමැතියි. *[බාධා කිරීමක්]* ඔව්. ඔබතුමන්ලා දීපු ලනුවක් ද කොහේද මේ උදේ පාන්දර කාලා තිබෙන්නේ. ඒක ඉතා හොඳ උද්ඝෝෂණයක්. බුදු අම්මේ! මෙයින් පස්සේවත් උද්ඝෝෂණ කරද්දී පොඩ්ඩක් කියවා බලා, තේරුම් අරගෙන ඔහොම එකක් අල්ලන්න කියලා අපි විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

අද දින විවාදයට ගෙන තිබෙන්නේ ශ්‍රමය කේන්ද්‍ර කරගත් මාතෘකාවක්. එය ඉතාම වටිනා මාතෘකාවක්. මේ මාතෘකාව සම්බන්ධයෙන් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා එක් වචනයක්වත් කථා කළේ නැහැ. එතුමා එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගැන කථා කළා. විපක්ෂ නායකතුමා පොදුවේ පොඩි සිල්ලර කරුණු 3ක් ගැන කථා කළා. මේ මාතෘකාව සම්බන්ධයෙන් කථා වුණේ නැහැ. මෙය ඉතා වැදගත් මාතෘකාවක්. විශේෂයෙන්ම වාමවාදී ව්‍යාපාරයක් හැටියට අපි අදහස් කරනවා ශ්‍රමය ඉතාම වටිනා දෙයක් බව. ඒ වටිනා ශ්‍රමය පිළිබඳව සාකච්ඡා කරන්නට ලැබීම ගැන ඇත්තටම,-

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව යන අතරතුර නොවෙයි, පසුව අවස්ථාව ගන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Order එකක්. රීති ප්‍රශ්නයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. කියන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම මේක අහන්නේ ස්ථාවර නියෝග 92(2)(අ) සහ 91(එ) යටතේයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අහනවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වාගේ dress දාගෙන එන්න පුළුවන්ද කියලා පාර්ලිමේන්තුව ඇතුළට. මේ dress code එක ප්‍රශ්නයක්. වහාම එළියට දමන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ පිළිබඳව සොයා බලන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය ඉතාම වැදගත් මාතෘකාවක්. අපි දන්නවා, අපේ රට අපනයනවලට විශාල වැදගත්කමක් දරන බව. මොකද, අපේ රටට දේශීය මුදල් සහ විදේශීය මුදල් අවශ්‍යයි. අපට විදේශීය මුදල් ලබාදෙන ක්‍රමවේද කිහිපයක් තිබෙනවා. ඒ එක් ක්‍රමවේදයක් ලෙස අපට අපනයනවලින් විදේශ මුදල් ලැබෙනවා. ඒ වාගේම, විදේශීය ප්‍රේෂණවලින් අපට විදේශ මුදල් ලැබෙනවා. Foreign Direct Investmentsවලින් විදේශ මුදල් ලැබෙනවා. ඒ වාගේම, ණය හා ආධාර හැටියට විදේශ මුදල් ලැබෙනවා. සංචාරක කර්මාන්තයෙන් විදේශ මුදල් ලැබෙනවා. ප්‍රධාන වශයෙන් අපට විදේශ මුදල් ලැබෙන ප්‍රභව 5ක් තමයි මේ සඳහන් කළේ. ඒ පහෙන් අපට විදේශ මුදල් ලැබෙන වැදගත්ම ප්‍රභවය තමයි, අපනයන. අපනයන මත තමයි මේ ක්‍රියාකාරිත්වය තිබෙන්නේ. අපි දන්නවා, අපනයන තුළින් විශාල විදේශීය මුදල් ප්‍රමාණයක් ලැබෙන බව.

මට මතකයි, දිලිත් ජයවීර මන්ත්‍රීතුමා කිව්වා, රටේ ආර්ථිකය වැටිලා කියලා. 2020දී අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 12යි; 2021දී ඩොලර් බිලියන 14යි; 2022දී ඩොලර් බිලියන 14යි; 2023දී ඩොලර් බිලියන 15යි, 2024දී ඩොලර් බිලියන 16යි. 2025දී ඩොලර් බිලියන 17.30යි. ඒ අනුව, මේ මෑත කාලයේ වැඩිම අපනයන කරලා තිබෙන්නේ, අපේ ආණ්ඩුව. වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් ලංකාවට ගෙනැල්ලා තිබෙන්නේ අපේ ආණ්ඩුව. ගිය වර්ෂයේ තමයි අපනයන ආදායම වැඩියෙන්ම ලබාගෙන තිබෙන්නේ. ඒ නිසා අපට මේ අපනයන ඉතා වැදගත්. අපනයන වැදගත් නිසා තමයි මේ වාගේ කටයුත්තකට අපි ඉතාම කැමැත්තෙන් ඇතුළත් වුණේ. ඇත්තටම ගත්තොත්, මේක අර ඉබ්බා දියට දමන්න ඇහුවාම, "ඇන්නෑවේ" කිව්වා වාගෙයි.

ශ්‍රමය සම්බන්ධයෙන් අපේ ආණ්ඩුව දක්වන උනන්දුව පිළිබඳව ඔබතුමා දන්නවා. අපේ ආණ්ඩුව බලයට පත්වීමෙන් පසුව පළමු අවුරුද්ද තුළ රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි කරන්න

[ගරු නලින් හේවගේ මහතා]

බිලියන 110ක් වෙන් කළේ ශ්‍රමයේ වටිනාකම හඳුනා ගත්ත ආණ්ඩුවක් නිසායි. දෙවැනි අවුරුද්දේදීත් රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි කරන්න බිලියන 110ක් වෙන් කර තිබෙන්නේ, ශ්‍රමයේ වටිනාකම හඳුනා ගත්ත ආණ්ඩුවක් නිසායි. තුන්වන අවුරුද්දෙත් - මේ අවුරුද්දෙත් - අපි බලාපොරොත්තු වනවා රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි කරන්න බිලියන 110ක් වෙන් කරන්න. මේ තමයි ශ්‍රමයේ වටිනාකම හඳුනා ගත්ත ආණ්ඩුව.

ඔබතුමන්ලා දීර්ඝ කාලයක් වතුකරයේ ජනතාව රැවැට්ටුවා. ඔබතුමන්ලා හැම දාම ඒ ජනතාවගේ ඡන්ද ටික අරගෙන පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඒ ජනතාවට කොකා පෙන්නුවා. නමුත්, අපි වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,350 ඉඳලා 1,750 දක්වා, රුපියල් 400කින් වැඩි කළා. එසේ කළේ, ශ්‍රමයේ වටිනාකම හඳුනන ආණ්ඩුවක් නිසා. ඒකටත් විරුද්ධව ඔබතුමන්ලා ගිහිල්ලා නඩු දැම්මා. එම නිසා ඔබතුමන්ලාගේ පින්තූර ගෙනැවිත් ඒ ජනතාව පිච්චුවා, පොළවේ ගැහුවා. අපි දැක්කා, නාමල් රාජපක්ෂ මහත්මයාගේ පින්තූර පොළොවේ ගහනවා. ඒ වාගේම සජිත් ප්‍රේමදාස මහත්මයාගේ පින්තූර අරගෙන ගිහිල්ලා දේවාල ඉස්සරහා ගිනි තියනවා දැක්කා. එහෙමයි කටයුතු කළේ. නමුත් අපි ශ්‍රමයේ වටිනාකම හඳුනා ගත්ත ආණ්ඩුවක්.

අපට අපනයන වර්ධනය කරන්න අවශ්‍යයි. අපනයනය වර්ධනය කිරීම තුළින් තමයි අපට ඩොලර් විශාල ප්‍රමාණයක් හොයා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. අපි ඒකට ඉලක්කයක් හදලා තිබෙනවා. අපේ පස් අවුරුදු සැලැස්මක් තිබෙනවා. එම සැලැස්ම ඇතුළේ තිබෙනවා අපි කොහොමද කෘෂි කර්මාන්තය, කර්මාන්ත ක්ෂේත්‍රය සහ ධීවර කර්මාන්තය වර්ධනය කර ගන්නේ සහ ඒ හරහා අපනයන වර්ධනය කර ගන්නේ කොහොමද කියලා.

අපේ රටට ලෝකයේ තිබුණු ඒ කළු චිත්‍රය අද මැකිලා යනවා. මේ වනකොට දකුණු ආසියාවේ සාමකාමී දෙවැනි රට බවට අපේ රට පත් වෙලා තිබෙනවා. ඒවා නිකම්ම වෙන්නේ නැහැ. කළු චිත්‍ර පාට කරන නිසා තමයි එහෙම වෙන්නේ. අපට මතකයි කලින් තිබුණා, "බොදු බල සේනා", "රාවණා බලය", "සිංහ ලේ", "මහසොන් බලකාය" කියලා සංවිධාන. මහසොන් බලකාය! නම අහනකොටත් භයයි. ඔන්න, තිබුණු සංවිධාන. ඒවා රාජ්‍ය අනුග්‍රහය සහිතව තිබුණේ. ජාතීන් භේද කරන්න, එකිනෙකා කුලල් කා ගන්න හා ඇන කොටා ගන්න හදපු සංවිධාන, ඒවා. දර්ගා නගරය ගිනි තියන්න, අමිත් වීරසිංහලා දිගන ගිහින් මිනිසුන් අවුස්සන්න හදපු සංවිධාන. දැන් කෝ ඒවා? මේ මාස 10ට චිත්‍රය වෙනස් කරලා තිබෙනවා, පාට වෙනස් කරලා තිබෙනවා. ඒක නරකද? අර වාගේ කළු පාටම ඕනෑ ද? අධිකරණයේ කුලුන කළු කරලා තිබුණේ. කියන්නේ, කළු පාටින්ම තියන්න කියලාද? කළුවෙන් තියෙනකොට ඔබතුමන්ලාට හොඳයි, මහ බැංකුව කඩන්න පුළුවන්. කළුවෙන් තියෙනකොට ඔබතුමන්ලාට හොඳයි, ජනාධිපති අරමුදලේ සල්ලි ටික හොරකම් කරන්න පුළුවන්. ඒවා සුදු වනකොට කැමැති නැහැ. වෙන පාට ගානවාට කැමැති නැහැ. ගානවා පාට. වෙනස් කරනවා. වෙනස් කරන්න ඕනෑ. අද "බොදු බල සේනා" නැහැ, "රාවණා බලය" නැහැ, "සිංහ ලේ" නැහැ. "ලේ" කෝ? ලේ "නෝ". දැන් ලේ "නෝ". මේ රට තමයි දකුණු ආසියාවේ දෙවන සාමකාමීම රට. දෙවන සාමකාමීම රට! හොඳ නැද්ද? චිත්‍රය වෙනස් කරන්න ඕනෑ නැද්ද? කළුම ද ඕනෑ? කළුවල ඉඳලා, කළුවලින් ගහගෙන කාලා, ඒකේම ලැගලා ඉන්න ද ඕනෑ? ඒකේම ලැගලා ඉන්න දෙන්නේ නැහැ. ඒක වෙනස් කරන්න තමයි අපි බලයට ආවේ. චිත්‍රය පාට පාට කරන්න අපි ආවේ. දැන ගන්න, ඔබතුමන්ලා ඔසවපු picket board එක අපෙන් දීපු එකක්. ඒක ඔසවපු එක ගැන ලජ්ජයි.

අපි මේවා වෙනස් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද ගෙනෙන්නේ ඉතා වැදගත් සංශෝධනයක්. අපි එයට ඉතා කැමැත්තෙන් සහයෝගය දෙනවා. මොකද, මේවා වෙනස් වෙන්න ඕනෑ. දැන් ආර්ථිකය දැවැන්ත පිම්මක් පැනලා තිබෙනවා. 2024දී ඩොලර් බිලියන 99ක් ලෙස තිබුණු ආර්ථිකය මේ වනකොට ඩොලර් බිලියන 108 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. වර්ධනය, ඩොලර් බිලියන 9.2යි. දැන් ඒක පුද්ගල ආදායම ඩොලර් 5,003යි. අපේ රට අද ඉහළ මැදි ආදායම් ලබන රටක්. එතකොට තමයි රටට ගරුත්වය හැදෙන්නේ. සාමකාමී රටක් වුණාට පසුව තමයි ලංකාවට පිළිගැනීම ලැබෙන්නේ. මේ වාගේ රෙගුලාසි සම්මත කළාට පසුව තමයි, අපට ලෝකයේ ඉඩකඩ හැදෙන්නේ; අපේ රට ගැන ලස්සන චිත්‍රයක් හැදෙන්නේ. ඒ නිසා මෙම රෙගුලාසිවලට මගේ සහයෝගය පළ කරමින්, කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.10]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் எனது உரையை ஆரம்பிப்பதற்கு முன்னர், எனக்கு முன்பு பேசிய கௌரவ உறுப்பினர் அவர்கள் சொன்ன கருத்தில் சிறிய திருத்தத்தைச் சுட்டிக் காட்டுகிறேன். அவர் சம்பளம் சம்பந்தமாகச் சொன்னார். நாங்கள் அது சம்பந்தமாக ஓர் ஆய்வையும் மேற்கொண்டிருக்கின்றோம். அன்றைக்கு மாண்புமிகு ஜனாதிபதி அவர்களைச் சந்தித்தபோது, இந்தச் சம்பளப் பிரச்சினை சம்பந்தமான விடயத்தை நாங்கள் தெளிவாக முன்வைத்தோம். அன்றைக்கு இதே இடத்தில் நான் சவால் விடுத்தேன், "முடிந்தால், 10 ரூபாய் சம்பளத்தைக் கூட்டிக் காட்டுங்கள்" என்று. ஆனால், நான் அதனைச் சொன்னபோது, அதனோடு சேர்த்து நிபந்தனைகளையும் முன்வையுங்கள் என்று சொல்லவே இல்லை. நான் இதுவரைக்கும் சொல்லிக்கொண்டுதான் இருக்கிறேன், தயவுசெய்து, சம்பள நிர்ணய சபையினூடாக நீங்கள் வழங்கிய சம்பள அதிகரிப்பை தொழில் அமைச்சின் மூலமாக வர்த்தமானி - Gazette - அறிவித்தலின் ஊடாகப் பிரசுரியுங்கள் என்று. காரணம் என்னவென்றால், இன்றைக்கு மலையகத்தில் இது ஒரு பெரிய பிரச்சினை! நீங்கள் வழங்கிய சம்பள உயர்வு தொடர்பாக, நான் முதலில் குறிப்பிட்டதுபோன்று நாங்கள் ஓர் ஆய்வை மேற்கொண்டிருந்தோம். அதன்படி ஒவ்வோர் இடத்திலும் பறிக்கப்படும் கொழுந்தின் அளவை அதிகரித்திருக்கிறார்கள். அதாவது, 18 கிலோகிராமாக இருந்த 20 கிலோகிராமாகவும், 20 கிலோகிராமாக இருந்ததை 22 கிலோகிராமாகவும், 22 கிலோகிராமாக இருந்ததை 24 கிலோகிராமாகவும் மாற்றியிருக்கிறார்கள்.

அடுத்த பிரச்சினை, பறிக்கும் கொழுந்தின் நிறுவை அளவைக் கூட்டினால் மட்டும் போதாதென்று இப்போது அதில் கழிவுகள் என்ற அடிப்படையில் அதிகமாக வெட்டிக்கொண்டும் இருக்கிறார்கள். முன்னர் ஒரு கிலோ - 2 கிலோவாக இருந்த வெட்டும் அளவை இப்போது 4 - 5 கிலோகிராம் வரை அதிகரித்து வெட்டுகிறார்கள். அவ்வாறு

ஒரு நாளைக்கு 15 கிலோகிராம் வரை பிடிக்கிறார்கள். ஆனாலும், அங்கே இருப்பதிலே பெரிய பிரச்சினை சம்பளப் பிரச்சினைதான். ஏன் நாம் மறுபடியும் மறுபடியும் சம்பளம் தொடர்பாக வர்த்தமானி அறிவிப்பை வெளியிடுங்கள் என்று சொல்கிறோம் என்றால், அவ்வாறு அறிவித்தால் மாத்திரமே அனைவருக்கும் சம்பளம் சமமாகக் கிடைக்கும் என்பதால்தான். இன்றைக்கு, பதிவுசெய்யப்பட்ட தொழிலாளர்களுக்கு மட்டும்தான் நீங்கள் அறிவித்த சம்பளம் கிடைக்கிறதே தவிர, பதிவுசெய்யப்படாத தொழிலாளர்களுக்கு - cash workersக்கு அந்தச் சம்பளம் நியாயமான முறையில் கிடைப்பதில்லை. அவ்வாறான 40,000 பேர் இருக்கிறார்கள். இன்றைக்கு வெளித் தோட்டங்களிலிருந்துதான் வேலைக்கு ஆட்களைக்கொண்டு வருகிறார்கள். நீங்கள் சம்பளத்தை அதிகரித்து வழங்கியிருக்கிறீர்கள்; நான் இல்லை என்று சொல்லவில்லை. அதேநேரத்தில், நிபந்தனையற்ற சம்பள அதிகரிப்பை வழங்கவில்லை.

நாங்கள் சமீபத்தில் கொட்டகலைப் பெருந்தோட்ட நிறுவனத்தோடு ஒரு பேச்சுவார்த்தையை நடாத்தினோம். அப்போது மக்களுக்கு இருக்கும் பல்வேறு கஷ்டங்கள் தொடர்பாகவும் முக்கியமான பிரச்சினையாக இருக்கின்ற வீட்டுத் திட்டப் பிரச்சினை பற்றியும் பேசினோம். இந்த வீட்டுத் திட்டம் சம்பந்தமாக அரசாங்கத்துக்கு மிக முக்கியமான ஒரு பொறுப்பு இருக்கின்றது. இந்திய அரசாங்கம் வீடுகளை நன்கொடையாக வழங்கினாலும் சரி, பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சின்மூலமாக வீடுகளைக் கட்டினாலும் சரி, அதற்குரிய காணியைச் சரியான முறையில் விடுவிப்பது அரசாங்கத்துக்கு இருக்கின்ற மிகப் பெரிய பொறுப்பாகும். ஆனால், நீங்கள் ஆட்சியமைத்து இரண்டு வருடங்களையும் தாண்டிவிட்டது; இன்றைக்கும் காணிகள் விடுவிக்கப்படவில்லை. இரண்டு வருடங்களுக்கு முன்னர் ஜீவன் தொண்டமான் அடிக்கல் நாட்டிய 1,300 வீடுகள்தான் இன்னும் கட்டி முடிக்கப்படாமல் இழுத்தடிக்கப்படுகின்றது. அப்படியிருக்கும்போது, அரசாங்கம் மூலமாக தொடர்ச்சியாக இரண்டு வருஷமாக, "4,800 வீடுகள் கட்டுகின்றோம்; 6,800 வீடுகள் கட்டுகின்றோம்" என்று அறிவிப்பதால் எந்தவிதமான பிரயோசனமும் கிடையாது.

கடந்த தடவை நான் Maskeliya Hospital நிர்வாகம் சம்பந்தமாக கௌரவ பிமல் ரத்நாயக்க அவர்களிடம் ஒரு கோரிக்கையை முன்வைத்திருந்தேன். அதனுடன் சம்பந்தப்பட்ட அதிகாரிகள் அங்கிருக்கின்ற DMOஐச் சந்தித்திருக்கிறார்கள். அதற்காக நான் அவருக்கு நன்றி சொல்லியாக வேண்டும். கௌரவ பிமல் ரத்நாயக்க அவர்களின் கவனத்திற்கு இன்னுமொரு விஷயத்தையும் சமர்ப்பிக்க விரும்புகின்றேன். அது Maskeliya Hospital சம்பந்தமானது. ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில், அண்மையில் Maskeliya Hospitalக்கு நான் விஜயம் செய்திருந்தேன். அங்கே காணப்படுகின்ற முக்கியமான பிரச்சினைகள் அனைத்தையுமே DMO கையெழுத்திட்டு எழுத்துமூலமாக வழங்கியிருக்கிறார். கடந்த ஒரு வருஷமாக அங்கே மின்சார இணைப்புச் சீரின்மையால் அவர்கள் பெரிய பிரச்சினைகளைச் சந்தித்துக் கொண்டிருக்கிறார்கள். அங்குள்ள மின்தூக்கிகள் இயங்காத நிலையில், அந்த வைத்தியசாலையில் யாராவது இறந்துவிட்டால் 3ஆம், 4ஆம் மாடிகளிலிருந்து இறந்தவரை wheelchairஇல் இருத்தி போர்த்தி வைத்துத்தான் கொண்டுவருகிறார்கள். இதற்கு முக்கியமான காரணம், hospitalக்கு மின்சார வசதியைக் கொடுப்பதற்கு 35 இலட்சம் ரூபாய் இல்லாததாகும். இது சம்பந்தமாக நான் சமீபத்தில் நுவரெலியா மாவட்ட GA உடன் பேசியபோது, "எனக்கு பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் 10 மில்லியன் ரூபாய் வழங்கப்படுகின்றது. அதன்மூலமாக 35 இலட்சம் ரூபாயைப் பெற்றுக் கொள்ளுங்கள்" என்று அவரிடம் சொன்னேன், அதற்கு அவர் சொன்னார், ஏற்கனவே அதற்கான Budget அமுல்படுத்தப்பட்டுவிட்டது என்று. எனவே, தயவுசெய்து இதனை அரசாங்கம் கருத்தில் எடுக்க வேண்டும். அதுமட்டுமல்ல, Maskeliya Hospital ஆனது Type A வகுதியைச் சேர்ந்தது. இன்றைக்கு அங்கு lab facilities இல்லை. இது முழுமையாக அங்கே இருக்கின்ற மக்களுக்குப் பெரிய பாதிப்பை ஏற்படுத்துகின்றது. தயவுசெய்து கௌரவ அமைச்சர் அவர்கள் இதைக் கருத்தில் எடுப்பார் என்று நான் நம்புகின்றேன்.

அதுபோன்று, Bogawanthalawa Hospitalக்கும் வந்து பார்வையிட வேண்டும் என்றுகூட மக்கள் கோரிக்கை முன்வைத்திருந்தார்கள். இதுசம்பந்தமாக எதிர்க்கட்சிப் பிரதிநிதியான நான் மட்டுமல்ல, ஆளுங்கட்சியில் இருக்கின்ற பிரதிநிதிகளும் அங்கு சென்று பார்வையிட்டு அங்குள்ள குறைபாடுகளுக்குத் தீர்வுகளை வழங்குவார்கள் என்று எதிர்பார்க்கின்றேன்.

கடந்த பாராளுமன்ற அமர்வு சம்பந்தமாக எனக்கு ஒரு வருத்தம் இருக்கிறது. அப்போது மலையகத்திலே ஏற்பட்ட வெள்ளம், மழை சம்பந்தமாக நாங்கள் - ஆளுங்கட்சியினரும் எதிர்க்கட்சியினரும் - பேசினோம். அந்த மழை, வெள்ளத்தினால் ஆயிரக்கணக்கான குடும்பங்கள் பாதிக்கப்பட்டிருக்கின்றன. நான் பாதிக்கப்பட்ட ஒவ்வோர் இடத்திற்கும் போய்ப் பார்வையிட்டபோது, அங்கு 'தித்வா' புயலினால் பாதிக்கப்பட்ட மக்களுக்கே இன்னும் தீர்வு வழங்கப்படாமல் இருப்பதைக் காணக்கூடியதாக இருந்தது. நான் ஓர் எதிர்க்கட்சி உறுப்பினர் என்ற வகையில், ஒவ்வொரு விடயத்திலும் "நீங்கள்தான் தப்பு, நீங்கள்தான் தப்பு" என்று உங்களைக் குத்திக் காட்டிச் சொல்லவேண்டிய அவசியமில்லை.

அதுபோல், ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் கொட்டகலைப் பகுதியில் இருக்கின்ற மக்களை இடமாற்றம் செய்வதற்கு ஓர் இடத்தை ஏற்பாடு செய்திருக்கின்றோம். அதற்காக இந்தத் தருணத்தில் கொட்டகலை பெருந்தோட்ட நிறுவன முகாமையாளர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இதேபோன்று ஒவ்வொரு பகுதிக்கும் பண்ணியே ஆக வேண்டும். ஆனால், அதைச் செய்ய முடியாமலிருப்பதற்குக் காரணம் அங்கு ஆறு வெட்டாததாகும். ஆறு வெட்டினால் மட்டும்தான் அங்கு மழை வெள்ளம் வராமல் இருக்கும். ஆனால், இன்றைக்கு மக்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள்; அவர்களுக்குக் கட்டாயம் தீர்வொன்றை வழங்க வேண்டும். Lankem Estateஆக இருக்கட்டும், பார்கோவாக - Bargow - இருக்கட்டும், கொட்டகலையிலிருக்கின்ற பல்வேறு பகுதிகளாக இருக்கட்டும், ஏன், நானு ஓயாவும் பாதிக்கப்பட்டிருக்கின்றது. இதை அரசாங்கம் கட்டாயம் கருத்தில் எடுத்தாக வேண்டும்.

இன்னுமொரு விஷயத்தையும் நான் இந்த இடத்தில் கட்டாயம் சொல்லியாக வேண்டும். ஹற்றன் டிக்கோயா - மலையகத்தின் தலைவாசல் - பகுதியில் குப்பை கொட்டுவதால் இன்று அந்தப் பகுதி நாறிக்கொண்டிருக்கின்றது. நாங்கள் அதுசம்பந்தமாக அரசாங்கத்திடம் பல தடவை கோரிக்கை விடுத்திருக்கின்றோம். ஏனென்றால், அந்த நகர சபையை நாங்களும் சேர்ந்துதான் அமைத்திருக்கின்றோம்; நாங்களும் மக்களுக்குப் பொறுப்புக்கூற வேண்டும். அங்கே குப்பையைக் கொட்டி, அதுதான் தீர்வு என்று மக்களுக்குச் சொல்லிக் கொண்டிருக்கிறார்கள். அதை எங்களால் ஏற்றுக்கொள்ள முடியாது; அது ஒரு பெரிய தவறு.

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

இறுதியாக, நான் ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். 2025இல் ஆய்வொன்று மேற்கொள்ளப்பட்டது. அந்த ஆய்வின் அடிப்படையில், தோட்டப் பகுதியில் உள்ள கிட்டத்தட்ட 37.8 சதவீதமான மக்கள் - பெண்கள் - அதிகமானளவு பொருளாதாரத்திற்கு உதவி செய்துகொண்டிருக்கிறார்கள். அதாவது, அங்குள்ள 360,106 மக்களில் 136,212 பெண்கள் தோட்டங்களில் வேலைசெய்து கொண்டிருக்கிறார்கள்; நாட்டின் பொருளாதாரத்திற்கு உதவிக் கொண்டிருக்கிறார்கள். அதைவிட, இன்றைக்கு வெளிநாட்டு வேலைவாய்ப்புகளில் 55,695 பெண்கள் வேலைசெய்கிறார்கள். ஆனால், அவர்களில் கிட்டத்தட்ட 80 சதவீதமான பெண்கள் Sri Lanka Bureau of Foreign Employment இடம் குற்றச்சாட்டை முன்வைத்திருக்கிறார்கள். அவர்கள் தொடர்பான கிட்டத்தட்ட 694 non-payment cases இருக்கின்றது. இதனைக் கட்டாயம் கருத்தில் எடுத்தாக வேண்டும். ஏனென்றால், இவர்கள் கிட்டத்தட்ட 3,730 பில்லியன் US Dollarsஐ இந்த நாட்டுக்கு வழங்கிக்கொண்டு இருக்கின்றார்கள். ஒரு பெரிய பிரச்சினையாக இருக்கின்ற இந்த விடயம் இன்றைக்கு நேற்று நடக்கின்ற ஒன்றல்ல. எனவே, இதனைத் தீர்ப்பதற்கு முழுமையாக ஒத்துழைப்பு வழங்க வேண்டும்.

இறுதியாக நான் ஒரேயொரு விஷயத்தைத்தான் சொல்ல விரும்புகின்றேன். ஏனென்றால், இந்த விஷயம் மக்களுக்குத் தெரிந்தாக வேண்டும். நாங்கள் ஜனாதிபதி அவர்களைச் சந்தித்தபோது சொன்ன ஒரேயொரு விஷயம் என்னவென்றால், இன்றைக்கு மலையகப் பிரச்சினைகள் சம்பந்தமாக அதிகமான அளவு கண்காணிப்புக் கிடையாது என்பதனால், அவற்றுக்குக் கட்டாயம் முக்கியத்துவம் வழங்கியாக வேண்டும் என்பதாகும். நான் இதைச் சொன்னதற்குக் காரணம், மலையகத்தைப் பொறுத்தவரைக்கும் அந்த மக்கள் மாண்புமிகு ஜனாதிபதி அவர்கள்மீது அதிகமான நம்பிக்கை வைத்திருப்பதாகும். கடந்த தடவை மேற்கொள்ளப்பட்ட ஆய்வில் 75 சதவீத ஆதரவை அரசாங்கம் பெற்றுக்கொண்டபோது இனித்தது, இன்றைய ஆய்வில் அது 40 சதவீதமாகக் குறைந்திருக்கின்றபோது கசக்கின்றது. எனவே, கௌரவ அமைச்சர் அவர்களே, தயவுசெய்து உங்களுடைய பாராளுமன்ற உறுப்பினர்களுடைய செயற்பாடுகளை நீங்கள் கண்காணியுங்கள்! இவர்களால் அரசாங்கத்துக்குக் கெட்ட பெயர் வந்துகொண்டிருக்கிறது. தயவுசெய்து இதைக் கருத்தில் எடுத்துக் கொள்வீர்கள் என்று நான் எதிர்பார்க்கின்றேன். இது விமர்சனம் அல்ல, ஓர் அக்கறை! நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බිමල් රත්නායක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.17]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දුන්නාට ස්තුතිවන්ත වෙනවා. මම ගරු ජීවන් තොණ්ඩමන් මන්ත්‍රීතුමා මතු කරපු Maskeliya Hospital එකේ ප්‍රශ්න පිළිබඳව ගරු සෞඛ්‍ය ඇමතිතුමාව දැනුවත් කරන්නම්.

අද දිනයේ විවාදයට ගැනෙන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන රෙගුලාසි පිළිබඳ සාකච්ඡාවට වඩා පොදු, ජාතික දේශපාලන කරුණු ගැන තමයි සාකච්ඡා වෙමින් තිබෙන්නේ. නමුත්, ඒ රෙගුලාසිවලටත් වඩා ඒ ක්ෂේත්‍රය ගැන කථා කළොත්, ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ යම්කිසි ව්‍යුහාත්මක වෙනසක් වෙමින් තිබෙනවා කියන එකත් අපි කියන්න ඕනෑ. මොකද, හැමදාම සාම්ප්‍රදායික පැත්තට යොමු වෙලා තිබුණු දේවලට වඩා electronics exportsවල සහ service sector එකේ යම්කිසි වෙනසක් සිදු වෙමින් තිබෙනවා.

අද උදේ වරුවේ මම දැක්කා, විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා පුවරු ඔසවාගෙන ඇවිත් හිටපු ආකාරය. අපි දැනගන්න කැමැතියි, ඒවා කොහොමද ගෙනාවේ කියන එකත්. අපට ප්‍රශ්නයක් නැහැ, ඒවා කොහොම ගෙනාවත්. ඊයේත් පාර්ලිමේන්තුවේ ආරක්ෂාව පිළිබඳ යම්කිසි කාරණාවක් කෙරෙහි අවධානය යොමු වෙලා තිබුණා. මා හිතන විධියට, පොලීසිය පසුව එය සම්පූර්ණයෙන්ම නිරවුල් කරලා තිබුණා. එහෙම තත්ත්වයක් යටතේත් ඒවා ගෙනාවේ කොහොමද කියන එක ගැනත් පාර්ලිමේන්තුවේ නිලධාරින් කල්පනා කරන්න ඕනෑ කියා මම හිතනවා.

කෙසේ වුණත්, අධිකරණය සම්බන්ධව කථා කරද්දී අද විශේෂ දවසක්. මොකද, අපි අද විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා. මා අත මේ තිබෙන්නේ, විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතයි. ඇත්තටම, මෙහි එක පිටුවයි තිබෙන්නේ. මේ පිටුව කියෙව්වාම තේරුම් ගන්න පුළුවන්, මේකෙන් කාටවත් අසාධාරණයක් වෙනවාද, අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑමක් වෙනවාද කියලා. අනෙක් එක තමයි, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත. මේ දෙකම ගැන එකටම තමයි කථා කරන්න ඕනෑ. හරියටම ගත්තොත්, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතේ තිබෙන්නේත් පිටු දෙකයි. එම පනත් කෙටුම්පතෙන් කරලා තිබෙන්නේ පොඩි සංශෝධනයක්. පොඩි වුණාට ඒක වැදගත්. එහි එක් සංශෝධනයක් ලෙස තිබෙන්නේ, අධිකරණ සංවිධාන පනතේ 4 වන වගන්තියේ (අ) ඡේදයේ "එකසිය දහයකට වැඩි නොවන්නා වූ ද, විනිශ්චයකාරවරයන්ගෙන්;" යන වචන වෙනුවට "එකසිය විසිදෙනකුට වැඩි නොවන්නා වූ ද, විනිශ්චයකාරවරයන්ගෙන්;" යන වචන ආදේශ කිරීමයි. මගේ දැනීමේ හැටියට මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාවත් වැඩි කරනවා. වයස වැඩි කරනවා විතරක් නොවෙයි, විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාවත් වැඩි කරනවා. එකසිය දහය එකසිය විස්ස කරනවා. ඒ වාගේම, පනතේ 6 වන වගන්තියේ (3)වන උප වගන්තියේ, "අවුරුදු හැට එක" යන්න "අවුරුදු හැට තුන" කරනවා. එම සංශෝධන තමයි අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතෙන් කරලා තිබෙන්නේ.

ශ්‍රේෂ්ඨාධිකරණය සහ උපරිමාධිකරණය සම්බන්ධ සංශෝධන කරලා තිබෙන්නේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතෙන්. එහි 2වන වගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "(5) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් විශ්‍රාම ගත යුතු වයස හැට හත වන අතර, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් විශ්‍රාම ගත යුතු වයස අවුරුදු හැට පහ වන්නේ ය:"

ඊට පසුව එහි ඉතාම විශේෂ දෙයක් තිබෙනවා. විපක්ෂය ඒක ගැන කියන්නේ නැහැ. එය මෙසේ සඳහන් වෙනවා:

"එසේ වුව ද, අග්‍රවිනිශ්චයකාරවරයා විශ්‍රාම ගත යුතු දිනය, ඔහු වයස අවුරුදු හැට හතට එළඹෙන දිනය හෝ ඔහු අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් වන දිනයේ සිට වසර හයක කාලසීමාවක් සම්පූර්ණ වන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය වන්නේ ය."

ඒ කියන්නේ, අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් වුණාම, එක්කෝ අවුරුදු 67න් විශ්‍රාම යන්න ඕනෑ. නැත්නම්, අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් වෙන්නේ අවුරුදු 55න් කියා අපි හිතමු. එතකොට අවුරුදු 61න් විශ්‍රාම යන්න ඕනෑ. මා හිතන විදියට, ශිරානි බණ්ඩාරනායක මැතිනිය අවුරුදු 52න් විතර තමයි අග්‍ර විනිශ්චයකාර ධුරයට පත් වුණේ. එතුමියට අවුරුදු 13ක් සේවය කළ හැකිව තිබුණා. අපි හිතනවා ඒකත් එච්චර හොඳ නැහැ කියලා. එතුමියට නිසි ගෞරවය ඇතිවයි මෙය කියන්නේ. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත මඟින් දැන් කියා තිබෙන දේ මේකයි. අග්‍ර විනිශ්චයකාරවරයා එක්කෝ අවුරුදු 67 වනකල් එම ධුරයෙහි ඉන්න ඕනෑ. අවුරුදු 55න් එම ධුරයට පත් වුණා නම්, අවුරුදු 61න් විශ්‍රාම යන්න ඕනෑ. ඉතාම ප්‍රජාතන්ත්‍රවාදී සංශෝධනයක් තමයි මෙහි ඉදිරිපත් කර තිබෙන්නේ. ඊට පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 ව්‍යවස්ථාවේ සඳහන් "දහනව දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් ද" යන වචන වෙනුවට "විසිහතර දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් ද" යන වචන ආදේශ කර තිබෙනවා. මට මතක හැටියට අභියාචනාධිකරණයේ දැනට ඉන්නේ විනිසුරුවරුන් 19දෙනෙක්. එම සංඛ්‍යාව 24ක් කරනවා. ඒක තමයි ගරු ජනාධිපතිතුමා නීතිඥ සංගමයටත් කිව්වේ, "ඉදිරියේදී අභියාචනාධිකරණය සංචාරක මට්ටමින් ගිහිල්ලා කිලිනොච්චිය, මන්නාරම, මොනරාගල වැනි දුර බැහැර ප්‍රදේශවල ජනතාවගේ ප්‍රශ්න විසඳන්න අධිකරණයක් ලෙස කටයුතු කරයි කියලා අපේ බලාපොරොත්තුවක් තිබෙනවා" කියා. මේක තමයි මේකෙන් කරලා තිබෙන්නේ. ඒ නිසා අපි මෙතැන කරලා තිබෙන දෙය හරි පැහැදිලියි. අපි අධිකරණ ප්‍රමාණය වැඩි කරනවා. සියලු අධිකරණවල සිටින විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස අවුරුදු දෙකකින් වැඩි කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ Rapporteur කෙනෙක් මොකක් හරි නිවේදනයක් දාලා තිබුණා. අපි එක්සත් ජාතීන්ගේ සංවිධානය තොරතුරුවලින් දැනුවත් කරනවා. ඒගොල්ලන් ලංකාව ගැන එක එක දේවල් කියන්න පුළුවන්. ඒවා නොපිළිගන්නත් අපට ස්වෛරී අයිතියක් තිබෙනවා. නමුත් අපි පසුගිය ආණ්ඩු වාගේ රණ්ඩු වෙවී, කැගසමින් එක්සත් ජාතීන්ගේ ප්‍රධානීන්ට මොකුත් කියන්න යන්නේ නැහැ. නමුත් අපි පැහැදිලිව හිතනවා, එක්සත් ජාතීන්ගේ සංවිධානයට හරි තොරතුරු දීලා නැහැ කියලා. ඒක ඒ statement එක දැක්කාම අපට පේනවා. ඒ හැම statement එකේම තිබෙන්නේ Superior Courts සම්බන්ධව විතරයි; ඉහළ අධිකරණවල විශ්‍රාම යන වයස වැඩි කරනවා කියන එක විතරයි තිබෙන්නේ. අපි දන්න තරමින් මට හිතනවා, මෙහේ ඉන්න කට්ටිය එක්සත් ජාතීන්ගේ සංවිධානයත් අන්දලාද කියලා. මොකද, මහානායක ස්වාමීන් වහන්සේලා මුණගැහුණාට පස්සේ අපට දැණුනා, උන්වහන්සේලාට නිසි තොරතුරු ලබා දීලා නැහැ කියලා. ඒ නිසා තමයි හර්ෂණ නානායක්කාර ඇමතිතුමා කිව්වේ උන්වහන්සේලාට තොරතුරු කිව්වාට පස්සේ උන්වහන්සේලා ඒක පිළිගත්තා කියලා. අනෙක් කාරණය මේකයි. අධිකරණ පද්ධතියේ දැනට ඉන්න සියලුදෙනාගේ සේවා කාලය දීර්ඝ කළාට පස්සේ ඒකෙන් අධිකරණයට බලපෑමක් වෙනවා කියලා තර්ක කරන්නේ කොහොමද?

සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ පියාණන් අගමැති වශයෙන් සිටි ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනෙනකොට එතෙක් ශ්‍රේෂ්ඨාධිරණයේ සේවය කරමින් සිටි විනිශ්චයකාරවරු, අභියාචනාධිකරණයේ සේවය කරමින් සිටි විනිශ්චයකාරවරු 12දෙනෙකුට නැවත තනතුර දුන්නෙත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේගොල්ලන් කොච්චර selective ද කියනවා නම්, එහෙම තමයි මේගොල්ලන් වැඩ කළේ. අඩු ගාණේ අද ස්වයං විවේචනයක් කරන්න ඕනෑ. සජිත් ප්‍රේමදාස මහත්මයලා හරි කවුරු හරි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව කථා කරනවා නම්, 1978දී කරපු අපරාධයට ඇත්තටම ඔවුන් සමාව ගන්න ඕනෑ. කලින් සේවය කරලා 1978න් පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ තනතුරු නොලබපු විනිශ්චයකාරවරුන් කවුද කියලා මම ඉක්මනින් කියන්නම්.

ජයා පතිරණ විනිසුරුවරයා, සී. අල්බස් විනිසුරුවරයා, එස්. ෂර්වානන්ද විනිසුරුවරයා, ස්මයිල් විනිසුරුවරයා, ටී.ඩබ්ලිව්. රාජරත්නම් විනිසුරුවරයා, ජේ.ජී.ටී. වීරරත්න විනිසුරුවරයා, සී. විතායිලිංගම් විනිසුරුවරයා, එන්.ඒ. ද එස්. අමරතුංග විනිසුරුවරයා, එච්.ඒ.ජී. ද සිල්වා විනිසුරුවරයා, ප්‍රතාප් නෙවිල් වික්‍රමසූරිය, ඒ.සී. අලස් විනිසුරුවරයා, තම්බයියා විනිසුරුවරයා. මම මේ 12 දෙනාගේ නම් කිව්වේ ලොකු research එකක් කරලා නොවෙයි. මේ සමහර අය ඇත්තටම නීති ක්ෂේත්‍රයේ ඉතා ඉහළින් පිළිගත්ත පුද්ගලයන්. නමුත් එහෙම තමයි ජේ.ආර්ලා වැඩ කළේ. ඒගොල්ලන්ගේ ගෝලයෝ තමයි දැන් මෙතැන ඉන්නේ. අඩු ගාණේ ඔවුන් දැන් ලොකු ස්වයං විවේචනයක් කරන්න එපායැ. දැන් අපි කරන්නේ ඉන්න කට්ටිය ඔක්කොගෙම විශ්‍රාම යන වයස දීර්ඝ කරන එක මිසක් ඔවුන් අයින් කරන එක නොවෙයි. මේක තමයි ඇත්ත තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි තුන් දෙනා සිටියදීත්, හය දෙනා සිටියදීත්, දසදෙනා සිටියදීත් අපි විපක්ෂයට යම් කිසි වැදගත්කමක්, පිළිවෙළක්, line එකක් දුන්නා. අපි කුඩා කණ්ඩායමක් වුණත්, සටන් කළ යුතු තැන් පිළිබඳ පැහැදිලි කරලා දුන්නා. අපි මේ කවුරුත් එක්ක විපක්ෂයේ ඉඳලා තිබෙනවා නේ. අපි විපක්ෂයේ ඉන්නකොට යම් කිසි විනයක් ඇතිව, මොන සටන මොන විදියට මොන වෙලාවේද කරන්න ඕනෑ කියලා ජනාධිපතිතුමා ඇතුළු අපි විපක්ෂයට යම් line එකක් දුන්නා. මේගොල්ලන් ලොකු කණ්ඩායමක් නිසා සමහර වෙලාවට මේගොල්ලන්ගේ සද්දේ එළියට එන්න ඇති. නමුත් අපි යම් කිසි විනයක්, පිළිවෙළක් එක්ක තමයි විපක්ෂයේ වැඩ කළේ. අද ඇත්තටම වෙලා තිබෙන්නේ මේගොල්ලන්ට විපක්ෂයට නියමිත වැඩ කරන්න තේරෙන්නේ නැති එකයි. සමහර සටන් තිබෙනවා, ඒවා ඒ වෙලාවේ කරන්න හොඳ නැහැ. ඒ විදියට සටන් කරන්න හදන එකෙන් මුළු වැඩේම වොර වෙනවා, තේරෙන විදියට කිව්වොත්. කිසිම පිළිවෙළක් නැහැ, ආත බූත. ඔහේ එක, එක විදියට දහලනවා. පාස්කු ප්‍රහාරය සම්බන්ධ පරීක්ෂණ කරන පරීක්ෂකයන්ට ගහනවා. පස්සේ තමයි හිතෙන්නේ මොන අවුලක්ද කර ගත්තේ කියලා. ඉතින්, මෙතැනත් ඒකයි වෙලා තිබෙන්නේ.

දැන් රාජපක්ෂලා ඇතුළු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මෙතැන ඉන්නවා. ඒ හොරු දැන් හිරේට යමින් ඉන්නේ; අධිකරණ ක්‍රියාවලියේ ඉන්නේ. දැන් ඒකට විරුද්ධව

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

පෙනී ඉන්නවා. හොරුත් එක්ක ලගිනවා. නමුත් එහෙම නොවෙයි කියලා නේ එතුමා කියන්නේ. හරියට ඉව වැරදුණු සත්තු වාගේයි.

[ගරු බිමල් රත්නායක මහතා]

මම කියන්නේ මේකයි. අපි ළඟට එන්න. එක්කෝ, අපි කරපු විදිය හෝ බලන්න. අපේ ගරු අනුර දිසානායක සහෝදරයා විපක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් සිටියදී අපි විපක්ෂයට යම්කිසි plan එකක් දුන්නා. අඩු ගණනේ අපෙන්වත් plan එක ගන්න. අපි කියන්නම් fight කරන්න ඕනෑ කොහොමද කියලා. අපි දිගටම ඔබතුමන්ලාට කියනවා, ඔය යන ක්‍රමයෙන් නම් මළාට සමුපකාරයක්වත් තනියම දිනා ගන්න හම්බ වෙන්නේ නැහැ කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක්, දෙකක් ලබා දෙන්න.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. අපි ආණ්ඩුවක් විධියට ඉතා ස්ථාවර ගමනක් යනවා. අධිකරණයේ ප්‍රශ්න කියන්නේ අමුතුම දෙයක් නොවෙයි. අධිකරණයෙන් රනිල් වික්‍රමසිංහ අත්අඩංගුවට ගත්ත වෙලාවේ නීති ක්ෂේත්‍රයේ සමහරු කිව්වා, "රුබිකන් තරණය" කියලා. අපි නොවෙයි නේ, අත්අඩංගුවට ගත්තේ. අධිකරණයෙන් තමයි අත්අඩංගුවට ගත්තේ. අධිකරණයෙන් රනිල් වික්‍රමසිංහව අත්අඩංගුවට ගත්ත වෙලාවේ සමහර නීතිවේදීන් කිව්වා, ඒක රුබිකන් තරණය කිරීමක් කියලා. මම දැක්කා තව කවුරු හරි ලොක්කෙක් කියා තිබෙනවා, system change එක හොඳයි, හැබැයි සමහර තැන්වලට එපා කියලා. ඒකයි මම කිව්වේ. මේ තිබෙන්නේ status anxiety. අපි තිබෙන *status quo* එක වෙනස් කරලා රට ප්‍රජාතන්ත්‍රවාදී කරනවා. රට ප්‍රජාතන්ත්‍රවාදී කරනකොට, වරප්‍රසාද කියන ඒවා natural rights විධියට පිළිගෙන හිටපු කට්ටිය, වරප්‍රසාද සහිත ජීවිතයක් උරුමයක් ලෙස කරගෙන හිටපු කට්ටිය හිතනවා අපි අසාධාරණයක් කරනවා කියලා. අපි කිසිම අසාධාරණයක් කරන්නේ නැහැ. අපි කරන්නේ ඒ විධියට බොරුවට උඩ ඉන්න කට්ටිය මහ පොළොවට ගෙනෙන එකයි. ඒකයි මේ වෙන්නේ. දැන් ඒක තමයි උහුලා ගන්න බැරුව තිබෙන්නේ. ඒ නිසා තමයි සමහරුන්ට මේක රුබිකන් තරණයක් වුණේ. සමහරු එහෙම කිව්වා. රනිල් කියන්නේ කවුද? මේ රටේ මහ පරිමාණ අපරාධවලට සහමුලින්ම වගකියන්න ඕනෑ පුද්ගලයෙක් නේ. ප්‍රජාතන්ත්‍රවාදය අමු අමුවේ විනාශ කිරීමට කොයි තරම් වග කියන්න ඕනෑ පුද්ගලයෙක්ද රනිල් වික්‍රමසිංහ කියන්නේ? නමුත් එයා අත්අඩංගුවට ගත්තාම රුබිකන් තරණය කිරීමක්! අන්න එහෙම කියපු කට්ටියම තමයි අද කියන්නේ මේ සංශෝධනයෙන් අධිකරණයට විශාල හානියක් වෙනවා කියලා. මම ඒ නීතිවේදීන්ගේ උගත්කමට ගරු කරනවා. නමුත් ඒගොල්ලන්ගේ දේශපාලන ප්‍රතිපත්තිය ගැනයි අපි ප්‍රශ්න කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට එහෙම විශේෂ *status quo* එකක් නැහැ. මිනිස්සු ගරු කරන අයට ගරු කළාට අපට ප්‍රශ්නයකුත් නැහැ. හැබැයි, අපෙන් බලාපොරොත්තු වෙන්න එපා, අනවශ්‍ය වරප්‍රසාද. ඔයගොල්ලන් අනවශ්‍ය විධියට වරප්‍රසාද අත්පත් කරගෙන තිබෙනවා නම් අපෙන් ඒවා තවත් ශක්තිමත් වෙලා නඩත්තු වෙන්නේ නැහැ, අපි ඒවා විශේෂයෙන් වෙනස් කරන්න මහන්සි නොවුණත්. නමුත් මතක තබා ගන්න ඕනෑ කාරණය මේකයි. මේ රටේ ජනතාව 2024 වසරේදී අනුර දිසානායක ජනාධිපතිතුමා පත් කිරීමෙන් තමයි රුබිකන් තරණය කළේ, paradigm shift එක කළේ. ඒකෙන්, no return. ඒ නිසා මේ ආණ්ඩුව ජනතා විශ්වාසය දිනා ගෙන උතුරේත්, දකුණේත්, නැඟෙනහිරත් හැම තැනම ඒ ගමන යනවා. අපි ඒ ගමන යන්නේ අපි ජනවරම හොඳින්ම තේරුම් අරගෙන ඉන්නා නිසායි. අපි මේ හැම දේටම ඇහුම්කන් දෙනවා. හැබැයි, අපි බොරු තර්ජන, ගර්ජනවලට පොඩ්ඩක්වත් බය නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවි කරුණානායක මහතා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.30]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 14ක් තිබුණා. මම සතුටු වෙනවා, බිමල් රත්නායක ඇමතිතුමාගෙන් කථාවෙන් පසුව මට කථා කරන්න ලැබීම ගැන.

මම හිතන විධියට අද මූලිකත්වයේ තිබෙන්නේ ආර්ථිකයයි. ආර්ථිකය පැත්තකට - එහාට මෙහාට - තල්ලු කරන්න පටන් ගත්තොත් තමයි ප්‍රතිවිපාක දකින්න ලැබෙන්නේ. මම මේ අවස්ථාවේදී කථා කරන්න ආවේ forced labour සහ beneficial ownership සම්බන්ධවයි. නමුත් අද Public Finance Committee එකේ පැවති රැස්වීමෙන් පසුව මම හිතුවා, ආදායම ගැන ඉස්සෙල්ලා කථා කරලා ඊට පසුව ඒ සම්බන්ධව වචනයක් කථා කිරීම වඩාත් යෝග්‍යයි කියලා.

මම කියන්න කැමැතියි, අපි විශ්වාසයෙන් යුතු වැඩ පිළිවෙළක් ගෙන යන්න අවශ්‍යයි කියන කාරණය. බලන්න, BoI එකේ අර්ජුන හේරත් අයින් වෙලා, හනීෆ් යූසුෆ් අයින් වෙලා. බුද්ධික හේවාවසම් සංචාරක කර්මාන්තය තුළ හොඳ දේවල් කළා. ඔහුත් අයින් වෙලා තිබෙනවා. එහෙම වෙන එක නැති කරන්න පුළුවන් ගමනක් යන්න ඕනෑ. මොකද, මොන පාට, භේද තිබ්බත් මේ වාගේ පුද්ගලයන්ට ආර්ථිකය ගැන විශ්වාසයක් ඇති වෙන්න නම්, විශ්වාසයෙන් යුතු වැඩ පිළිවෙළක් තමයි ඇති කළ යුත්තේ.

අපට මේ ආර්ථිකය තුළ පුළුවන් තරම් ආදායම හොයන්න පුළුවන්. මේ ආදායම් ලැබීම පටන් ගත්තේ රනිල් වික්‍රමසිංහ ආදායම හොයන්න පටන් ගැනීමෙන්. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8.5ක්ව තිබුණු එක අද සියයට 15ට, 16ට ඇවිල්ලා තිබෙන්නේ ඒ පටන් ගත් ගමන නිසායි. හැබැයි, VAT එක online real-time invoice එකක් කිරීම තුළ අපට පෙනී යනවා, දැනට ලක්ෂ 130ක TINs ප්‍රමාණයක් ලියාපදිංචි වෙලා තිබෙන බව. ඒකෙන් tax files ලක්ෂ 12ක් තිබෙනවා. අද කොම්පැනි 240,000ක් Department of the Registrar of Companiesහි ලියාපදිංචි වෙලා තිබෙනවා. හැබැයි, VAT files තිබෙන්නේ 36,000යි. 139,000ක් Corporate Tax කියලා අද ගෙවනවා. 18,000ක් SSCL Tax ගෙවනවා. මේ තුළ ලොකු විෂමතාවක් තිබෙනවා. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 16.4ක් විධියට ගිය

අවුරුද්දේ ආදායම ඉපයුවාට, මේ විෂමතාව තුළ, මේ ගමන තුළ එහි සාර්ථකත්වයක් නැහැ කියන එක වාර්තා වෙලා තිබෙනවා. මේ නිසා තමයි VAT එකට register වෙන්න online real-time computing වැඩ පිළිවෙළක් ඇති කළ යුත්තේ. ඒ නිසා IRD එක, Sri Lanka CERT එක, Ministry of Digital Economy පුළුවන් තරම් ඒකාබද්ධ කරලා ආදායම හොයන්න පුළුවන් මාර්ග ඇති කරන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

අද අපි සාකච්ඡා කරන විෂයයට අදාළව forced labour, ඒ කියන්නේ බලහත්කාරයෙන් ශ්‍රමය පාවිච්චි කිරීම සම්බන්ධවත් කථා කරනවා. ඇත්තවශයෙන්ම මෙය අපනයන ආදායමට බලපෑමක් කරනවා. ඇමෙරිකාව බලනවා, චීනය, කාම්බෝජය, වියට්නාමය වාගේ රටවලින් අපි වාගේ රටවලට ගෙනෙන දේවල්වලට අගයක් එකතු කර යැවීම සම්බන්ධව.

හැබැයි අපි බලාගන්න අවශ්‍ය වෙනවා, මේ ආනයන කරනකොට එයින් මොනවාද අර්ථකථනය කරන්න හදන්නේ කියන එක. මොකද, මේවා නිකම් දැම්මාට පස්සේ ලංකාවේ ඒ වාගේ කිසිම දෙයක් පාවිච්චි කළේ නැත්නම් අපේ අපනයනයට බාධා කරන්නද මේවා කරන්නේ? ඉතින් අපි මේවා ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී, අපට පෙනුණා රේගුව තුළින් මේ වාගේ සොයන්න පටන් ගත්තාම, අපි නිර්දේශ කරන්න අවශ්‍යයි කියන එක. මොකද, එතකොට ඒ manifesto එකේ හරි, consolidated statement එකේ හරි ඒගොල්ලන් ඉල්ලන invoice එකේ මේ ඔක්කෝම දත්ත දමන්න අවශ්‍යයි. නැත්නම් ඉදිරියට අපි අපනයනය කරන ස්වරූපයට බාධාවක් ඇති වෙන්න පුළුවන්. ඒවා නිවැරදි කරන්න අවශ්‍යයි. අද විමලේන්තිරරාජා ලේකම්තුමා මේ ගැන කථා කරනකොට, වසන්ත සමරසිංහ මැතිතුමා එතැන ඉන්නවා. මේ සම්බන්ධයෙන් මීට වැඩිය විධිමත්ව කටයුතු කරන්න අවශ්‍යයි කියලා මම හිතනවා. නැත්නම් මේ සම්බන්ධයෙන් බාධාවක් ඇති වෙන්න පුළුවන්. ඔබතුමාට මම භාර දෙනවා, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න. Market access ඇති කරන්න අවශ්‍යයි. අපි තවම හිර වෙලා තිබෙනවා. තායිලන්ත වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක වෙලා නැහැ. සිංගප්පූරු වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක වෙලා නැහැ. අද ඉන්දියාව බදු රහිතව යුරෝපයට **භාණ්ඩ** යවනවා. ලංකාව හිර වෙලා තිබෙනවා. මේවා සම්බන්ධයෙන් අපි කථා කළේ නැත්නම් අපි යුරෝපයට කරන බිලියන 3ක අපනයන සම්පූර්ණයෙන් නැතිවෙලා යනවා. ඒ ගැන කථා කරන්න අවශ්‍යයි.

ඊළඟට, මේ රටට බලපාන ලොකු ප්‍රශ්නයක් තමයි එල් නිනෝ. උතුර, උතුරු මැද, නැඟෙනහිර, ඌව, වයඹ පළාත්වලට එල් නිනෝ තුළින් භයානක තත්ත්වයක් ඇති වෙනවා කියලා අද Meteorology Department එක කියලා තිබෙනවා. අද විදුලිය නිෂ්පාදනය ගත්තොත්, සියයට 45ක් විදුලිය නිෂ්පාදනය කරන්නේ ජලය තුළින්. බැරි වෙලාවත් මේක අඩු වුණොත්, රුපියල් 2.50කට නිෂ්පාදනය වන ඒකකය රුපියල් 125ට, 150ට ගියොත් ඒක විදුලි බිලට කොතරම් බලපාවිද? ඒ වාගේම වතුර සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. කෘෂිකර්මය, සත්ත්ව පාලනය සම්බන්ධයෙනුත්, ඒ වාගේම උෂ්ණත්වය සම්බන්ධයෙනුත් බැරෑරුම් ප්‍රශ්න මතු වෙනවා. ඉතින් මේ ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කරන්න ආණ්ඩුව සූදානම්ද? අපි වෙනත් වෙනත් දේවල් ගැන කථා කරනවා. නමුත් ජනතාවට එදිනෙදා ජීවත් වීමේදී ඇති වෙන මේ ගැටලු සම්බන්ධයෙන් මොන වාගේ වැඩ පිළිවෙළක්ද ඇති කරලා තිබෙන්නේ? මෙන්න මේවා තමයි අපට ඇති වෙලා තිබෙන ලොකුම ප්‍රශ්න.

බලන්න, අද foreign reserves තිබෙන්නේ US Dollars 6,500 million. 2024 සැප්තැම්බර් මාසයේ foreign reserves 6,100ක් ලෙස තිබුණු එක මේ අවුරුදු දෙකට මිලියන 400යි වැඩි වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් උනන්දුවක් ගන්නේ නැත්තේ ඇයි? මහ බැංකුවේ අධිපති ඕස්ට්‍රේලියාවට ගිහිල්ලා කියනවා, ලංකාවේ ආයෝජනය කරන්න කියලා. නමුත් අපේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සම්පූර්ණයෙන් නැත්තටම නැති වෙනවා. *[බාධා කිරීමක්]* මම නම් මුල ඉඳන්ම ඒ ගැන කිව්වා. කාර් 40,000ක් ඕනෑ ද, නැත්නම් රුපියල ශක්තිමත් කරනවාද කියලා. අපි එදා කිව්ව එකට, අද අධිභාර ගහනවා. අපි අවුරුදු දෙකකට ඉස්සෙල්ලා මේ ගැන කිව්වා. ඒ විධියට කටයුතු කළා නම් අද මේ වාගේ ප්‍රශ්නයක් ඇති වන්නේ නැහැ. අපට 60,000ක් අලුත් කාර් ඕනෑද, නැත්නම් අපේ රුපියල් ශක්තිමත් කරලා උද්ධමනය පාලනය කරගන්න පුළුවන් හැකියාව ඇති කරනවාද? දැන් මහ බැංකුව කියනවා, අධිභාර දාන්න ඕනෑ කියලා. ඔක්කෝම කාර්යක්ෂමව කරන්න බැරි වුණාම, දැන් ආණ්ඩුවට බණිනවා. මට ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩුවට බණිනවා. ඔයගොල්ලෝ රුපියල පාවෙන්න ඉඩ දුන්නා; ශක්තිමත් සංචිතයක් ඇති කළේ නැහැය කියනවා. ඉතින්, ඒකට උත්තර දෙන්න අවශ්‍යයි.

දැන් කියනවා, sophisticated frauds පිළිබඳව. "Daily News" පත්තරේ තිබෙනවා, "Sophisticated fraud scheme stealing bank deposits,..." ඒ කියන්නේ බැංකුවල තිබෙන තැන්පතු ව්‍යාජ මට්ටමින් හොරකම් කරනවා කියලා. මේ සම්බන්ධයෙන් මහ බැංකුව මොනවාද කරලා තිබෙන්නේ? NDB එක සම්බන්ධව මහ බැංකුව මොනවාද කළේ කියලා අපි අහනවා. අපේ මුදල් අමාත්‍යාංශයෙන් මිලියන 900ක් ගියා. ඒ සම්බන්ධයෙන් මොනවාද කළේ? US Postal Service එකට රුපියල් මිලියන 200ක් ගියා. ඒ සම්බන්ධයෙන් කටයුතු කළාද? SriLankan Airlines එකෙන් ගෙව්වා. මොනවාද කළේ? මේ ඔක්කෝම බදු ගෙවන්නන්ගේ සල්ලි. ඉතින්, මේවා මහ බැංකුව කරන්න තියෙන දේ. නමුත් ඔබතුමන්ලා තවම හුරතල් කර කර ඉන්නවා. ඒක ප්‍රශ්නයක් නැහැ. නමුත් ඔය සම්බන්ධයෙන් ගෙවන්න ඕනෑ මහ ජනතාව ද කියන ප්‍රශ්නය ඇහුවාම තමයි ඇත්ත වශයෙන්ම සැබෑ තත්ත්වය මතු වන්නේ.

මම අහනවා මේ කාරණය. මම තවම මේ ප්‍රශ්නය අහන්නේ මොකද? සංචිත ලෙස 6.4ක් තියාගෙන, the Governor of the Central Bank says, "Sri Lanka's Central Bank sees no need for further rate hikes this year." ඒ කියන්නේ, රුපියල පාවෙනවාද නැද්ද කියලා. මේක ගලේ කොටලාද තිබෙන්නේ? මේ උද්ධමනය ඇති වන්නේ පිටින් ගෙනෙන - ඒ පිටින් ගෙනෙන තෙල් ආදියෙහි මිල සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති වුණොත්, එතකොට මේ පොලී අනුපාතය වැඩි කරනවාද, නැද්ද කියන තීන්දුව ගන්නේ කොහොමද? දැන් ඉඳන් කියන්නේ කොහොමද, අවුරුද්දකට කරන්නේ නැහැ කියලා? මේවා තමයි තිබෙන ප්‍රශ්න. මට තවම පෙනෙන්න නැහැ, ඇයි ආණ්ඩුව ඔක්කෝම ප්‍රශ්න ඇති කරගෙන මහ බැංකුව සුද්ද කර කර යන්නේ කියලා. බයද? එහෙම නම් තීන්දුවක් ගන්න අවශ්‍යයි, රටේ ස්ථාවර ආර්ථිකයක් ඇති කරන්න. Verite Research එකෙන් මොනවාද කියන්නේ? ගිය මාසයේ කථා කරනකොට කිව්වා, බොහොම හොඳට ආර්ථිකය තිබුණා කියලා. දැන් ඒ ආර්ථික තත්ත්වය සියයට 35ට අඩු වෙලා තිබෙන බව කියනවා. අනෙක් එක, ජනතා විශ්වාසයත් සියයට 50ට අඩු වෙලා තිබෙන බව කියනවා. ඇයි, එහෙම වෙලා තිබෙන්නේ? අපිද ඒක කිව්වේ? සුමාන තුනකට ඉස්සර වෙලා කියපු එක දැන් සම්පූර්ණයෙන් වෙනස් වෙලා තිබෙනවා. ඒ නිසා මේ දත්ත නොවෙයි අවශ්‍ය වෙන්නේ. රටේ ආර්ථිකය සවි ශක්තිමත් කරන එකයි අවශ්‍ය වන්නේ.

සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා ඕස්ට්‍රේලියාවට ගිහින් තිබෙනවා, market research එකක් කරන්න. ඒ, අපේ market එක develop කරන්න. හැබැයි, එතුමා ඕස්ට්‍රේලියාවට යන්නේ එහේ

[ගරු රවී කරුණානායක මහතා]

නිවාඩු කාලයේ. ඒක ඇමතිතුමාට කියලා හරියන්නේ නැහැ. ඒක organize කරන අය දැනගන්න අවශ්‍යයි, July, August කියන්නේ එහේ නිවාඩු කාලය කියලා. ඒ, එහේ Winter Season එකේ holidays. ඉතින් මම කාරුණිකව ඉල්ලනවා, එවැනි දේවල් සම්බන්ධයෙන් මීට වඩා විධිමත්ව කටයුතු කරන්න කියලා.

දැන් බලන්න, මේ තෙල් මිල සංශෝධනය පිළිබඳව. මේ සම්බන්ධව තීන්දුවක් ගන්න අවශ්‍යයි. ඉදිරියේදීත් අඩු මිලට තෙල් විකුණනවාද, නැද්ද කියලා තීන්දුවක් ගන්නේ නැහැ. හැබැයි එය ගන්න අවශ්‍යයි. ඒ සම්බන්ධව තීන්දුවක් ගන්න ඕනෑ, අපි මේ අධික ලාභයක් ලබා ගන්න එක තෙල් මිලෙන් අඩු කරනවාද, නැද්ද කියලා. මේ විශ්වාසය තමයි ඇති වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුවට ආපු විගස මේ ආණ්ඩුව කිව්වේ, මන්ත්‍රීවරුන්ගෙන් ආහාර වේල් සඳහා වැඩියෙන් අය කරන්න යනවාය කියලායි. දැන් විගණනයෙන් පෙන්වා තිබෙනවා, පාර්ලිමේන්තුවේ ආහාර සඳහා යන වියදම සියයට 140කින් වැඩි වෙලා තිබෙනවා කියලා. එහෙම නම් ඒකටත් දමන්නකෝ අධි භාරයක්. මොකද, ජනතාවට නැති වාසියක් ඒගොල්ලන් ලබා ගන්නේ නැහැ කිව්වා නේ. මේවා ඔක්කෝම අපටත් බලපානවා නේ. මොකද ඒ අවස්ථාවේදී කිව්වේ, "මුන් ටික පිස්සු නටනවා" කියලා නේ. එතකොට දැන් තවම එහෙමමද යන්නේ? නැහැ. මේ සම්බන්ධව නිවැරදි ස්වරූපයක් ඇති කරන්න අවශ්‍යයි. එතකොට ජනාධිපති මන්දිරයේ 3,000ක් නවාතැන් අරගෙන හිටියාය කියනවා නේ. මේවා නිවැරදි කරන්න අවශ්‍යයි. මට අවශ්‍ය වන්නේ ශක්තිමත් ආර්ථිකයක් හදන එක. Online Safety Bill එක සම්බන්ධව මම මේ අවස්ථාවේදී කියන්නේ යම් විධියකින් එය සංශෝධනය කරන්න කියලා නොවෙයි, අහෝසි කරන්න කියලායි. කරුණාකරලා GSP Plus සහනය බේරාගන්න. මම ඒ යෝජනාව ගෙනැල්ලා දුන්නා. ඔබතුමන්ලා මේ වෙලාවේ මේක අහෝසි කරලා, ඊට පස්සේ අලුත් එකක් ගෙනැල්ලා දමන්න. නමුත් GSP Plus සහනය නැති කර ගන්න එපා, මේ Online Safety Bill එක නිසා. ඒගොල්ලන් ඉදිරිපත් කරලා තිබෙනවා, කොන්දේසි තුනක්. ඒ, Online Safety Bill එක, death penalty එක සහ Prevention of Terrorism (Temporary Provisions) Act එක සම්බන්ධව. ඒ තුනම අහෝසි කරන්න ඕනෑය කියලා තිබෙනවා. මෙතැනදී ඔබතුමන්ලාට තිබෙනවා, ලොකු වාසියක්. ඒක දුර්වලතාවක් නොවෙයි. අපි ආණ්ඩු කරලා තිබෙන නිසා අපි දන්නවා, අමාරුව. විපක්ෂයේ අපි ඔබතුමන්ලාට අදහස් දෙන්නේ ඒ නිසායි. මේ, අපේ අදක්ෂතාව හරි බය හරි නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් මිනිත්තු දෙකක් දෙන්නම ඕනෑ මේ අවස්ථාවේදී. මොකද, අපි කථා කරන්නේ මේ රටේ ආර්ථිකය ගැන.

අද imports of forced labour ගැන කථා කරනවා. අද අපට අපනයනය අවශ්‍යයි. ඒ වාගේම Verité Research එක කියන කාරණය සම්බන්ධයෙනුත් කථා කරන්න ඕනෑ. ජනතාව තුළ ඒ විධියට පිරිහීමක් ඇති වෙලා තිබෙන්නේ, හරි වෙලාවට තීන්දු ගන්නේ නැති නිසායි. ඉතින් ඒ නිසා අපි මේ අවස්ථාවේදී කරන්න අවශ්‍ය වන්නේ මොකක්ද? ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා, ඔබතුමා වෙළෙඳ ඇමති. අවුරුදු 15කට ඉස්සර වෙලා මම හිටපු තනතුරේ දැන් ඔබතුමා ඉන්නවා. දැන් බලන්න, මේ වෙලා තිබෙන දේ. පෙන්වා තිබෙනවා, ඩයලොග් එකෙන් රුපියල් බිලියන 31ක් ගෙවනවා කියලා. ඒ කියන්නේ මිලියන 31,000ක් ගෙවනවා කියලා පෙන්වනවා. මේ, රටේ බදු. ඉතින් එහෙම බලනකොට Ceylon Tobacco Company එක රුපියල් බිලියන 140ක් ගෙවනවා නේ; කෝටි 14,000ක්. ඒක නොවෙයි වෙන්න ඕනෑ. මේ වාණිජකරණය Sri Lankan economy එකට, ඒ කියන්නේ රටේ ආර්ථිකයට යොදා ගන්න පුළුවන් වන්නේ කොහොමද කියන එක බලන්න ඕනෑ. දැන් ඩයලොග් එකේ තිබෙන ලාභය මලයාසියාවට යනවා. Ceylon Tobacco Company එකේ ලාභය රටින් පිට යනවා.

බලන්න, චීන ආර්ථික ඒකාබද්ධතාව, economic integration එක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. කථාව අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තවත් මිනිත්තුවයි ගන්නේ.

ආර්ථික ඒකාබද්ධතාවට අද ඉතාම භයානක තත්ත්වයක් වෙලා තිබෙනවා. අද කොල්ලුපිටියට ගියොත් ලංකාවේ සුපර්මාර්කට්වලට වඩා තිබෙන්නේ චීන සුපර්මාර්කට්. ඒගොල්ලන් tax ගෙවනවාද? VChat එකෙන් ඒගොල්ලන් ගිහිල්ලා credit card එකෙන් ගෙවනවා. අන්තිමට ශත පහක්වත් බදු ගෙවන්නේ නැහැ. අපේ අය සියයට 18ක් ගෙවන්න ඕනෑ; SSCL එක ගෙවන්න ඕනෑ; සියයට 30ක බද්දකුත් ගෙවන්න ඕනෑ. ඒ, Corporate Income Tax එක. ඒ වාගේම තමයි යුක්රේනයේත්. යුක්රේනයේ යුද්ධ කරනවා. හැබැයි මෙහාට ඇවිල්ලා ගහනවා, payment platform එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගිහිල්ලා බලන්න, කොල්ලුපිටියට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මීට වඩා කාලය දෙන්න අපහසුයි. කාලය පිළිබඳ ගැටලුවක් තිබෙනවා. කථාව අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බලන්න ඉන්දියාව දිහා. එය ලෝකයේ තුන්වැනි ආර්ථිකය තිබෙන රට බවට, ශක්තිමත් ආර්ථිකයක් තිබෙන රටක් බවට පරිවර්තනය වනවා, තවත් මාස තුන හතරකින්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අවසන් කරනවාමයි.

මේ US Dollars ට්‍රිලියන 4.5න් සියයට 2ක් පාවිච්චි කළොත්, අපේ දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය කර ගන්න පුළුවන් සියයට 10කට විතර. ඒක පාවිච්චි කරන්න. අපට ඉන්දියාවත් ඕනෑ, චීනයත් ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මීට වැඩිය කාලය දෙන්න අපහසුයි.

මීළඟට, ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. ඔබතුමාට තවත් කාලය දෙන්න අපහසුයි. ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය අමාත්‍යතුමා කථාව ආරම්භ කරන්න.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. LAKSHMAN NIPUNA ARACHCHI took the Chair.*

[பி.ப. 4.44]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத் தலைப்பு பற்றி பேசுவதற்குப் பதிலாக, எமது நாட்டில் தற்போது பேசுபொருளாக மாறியிருக்கின்ற குறிப்பாக தமிழ் பேசும் சமூகத்தின் மத்தியில் பேசுபொருளாக இருக்கின்ற கல்முனை ஆதார வைத்தியசாலையில் இடம்பெற்ற விவகாரம் சம்பந்தமாக ஒருசில கருத்துகளைத் தெரிவிக்க விரும்புகின்றேன்.

எதிர்க்கட்சியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர் ஒருவர் இந்த உயரிய அவையில் குறித்த விவகாரம் சம்பந்தமாகப் பிழையானதொரு விடயத்தைக் குறிப்பிட்டார். அதாவது, குறித்த வைத்தியசாலைக்குப் புதிதாக நியமிக்கப்பட்ட முஸ்லிம் சுகாதார உதவியாளர்கள் 'அபாயா' அணிந்து சென்றதாக இந்த நாட்டில் உள்ளவர்களைப் பிழையாக வழிநடத்துகின்ற வகையில் ஒரு செய்தியை இந்தச் சபையில் சொல்லியிருந்தார். ஆனால், அவர்கள் மிகத் தெளிவாக சீருடை அணிந்திருந் தார்கள். அவர்கள் சீருடைக்கு மேலதிகமாக தலையை மறைத்திருந்தார்கள்; முகம் தெளிவாகத் திறந்திருந்தது; நீண்ட காற்சட்டையையும் அணிந்திருந்தார்கள். கடந்த வாரம் இந்த விவகாரம் எமது கவனத்துக்கு வந்தபோது, குறித்த அமைச்சருடனும் அதனோடு தொடர்புடைய இன்னும் பலருடனும் கதைத்து, இந்தப் பிரச்சினையைப் பூதாகார மாக்காது, எவ்வாறு இதற்கு மிகச் சிறப்பான முறையில் தீர்வு வழங்கப்பட வேண்டும் என்பதை மனதிற்கொண்டு அரசாங்கம் என்ற ரீதியில் நாங்கள் செயற்பட்டு வருகின்றோம். இந்த விவகாரம் சம்பந்தமாக இருதரப்பினரும் சமூக ஊடகங்களிலும் இலத்திரனியல் மற்றும் ஏனைய ஊடகங்களிலும் பல்வேறு கருத்துகளை முன்வைத்திருந்தார்கள். குறித்த பாராளுமன்ற உறுப்பினர் சமூக ஊடகங்களில் உள்ளவர்களையும் YouTubersஐயும் விமர்சித்திருந்தார்.

நீண்ட காலமாக ஒன்றாகவும் பரஸ்பரத்துடனும் வாழுகின்றவர்கள், அவரவர்களுடைய மத, கலாசாரங்களை மதித்து, அவற்றுக்கு கௌரவமளித்துச் செயற்படுவது சாலச் சிறந்ததென நான் நினைக்கின்றேன். இந்த நாடு யுத்தத்தால் பாதிக்கப்பட்ட ஒரு நாடு; சுதந்திரத்துக்குப் பின்னர், இனக் கலவரங்கள் பலமுறை ஏற்பட்டு உயிர்ப் பலிகளைச் சந்தித்த ஒரு நாடு! எனவே, உணர்ச்சிவசமிக்க இத்தகைய பிரச்சினைகள் வரும்போது, நிதானமாகச் செயற்படவேண்டிய கடமை அரச உயர் அதிகாரிகளுக்கு இருக்கின்றது. சில சந்தர்ப்பங்களில் அதனை மதிக்காது செயற்படுவதால் நாடு மீண்டும் பிழையான பாதையை நோக்கிச் செல்லக்கூடிய நிலை ஏற்படுகின்றது.

இந்த விவகாரம் தொடர்பில் பலராலும் பல்வேறு தரப்பினராலும் பல்வேறுபட்ட கருத்துகள் முன்வைக்கப் பட்டன. உண்மையிலேயே ஓர் இலங்கையனாக ஒரு வகையில் நான் சந்தோஷம் அடைகின்றேன். குறித்த விவகாரம் வெளியே வந்தபோது, மோகனதர்ஷனி என்ற பெயரில் - அது அவருடைய உண்மையான பெயரோ தெரியாது - தமிழ் சமூகத்தைச் சேர்ந்த ஒரு சகோதரி, இந்தப் பிரச்சினையை எவ்வாறு நாம் நோக்க வேண்டுமென மிக அழகானதொரு கட்டுரையை சமூக வலைத்தளத்தில் பதிவிட்டிருந்தார். இவ்வாறு அந்தச் சமூகத்திலுள்ள பலரும் குறித்த விவகாரத்தை எவ்வாறு அழகாக அணுகியிருக்க வேண்டுமெனக் கூறியிருந்தார்கள்.

முஸ்லிம் பெண் பிள்ளைகள் சிறுபராயம் முதல் தலையை மூடியும், நீண்ட காற்சட்டையை அணிந்தும் பழக்கப் பட்டவர்கள் என்பது உங்களுக்குத் தெரியும். இந்த நாட்டில் தாதியர் தொழிலில் முஸ்லிம் சமூகத்தைச் சேர்ந்த பெண்கள் மிகக் குறைவாக இருப்பதை நாங்கள் அவதானிக்கலாம். மத நம்பிக்கை மற்றும் கலாசாரத்தின் அடிப்படையில் சிறுவயதிலிருந்து பழக்கப்பட்ட ஆடை கலாசாரத்தோடு தொழில்புரிய முடியாது என்பதால்தான் அவர்கள் அந்தத் துறைசார்ந்து தொழில்புரிவதை தவிர்த்துக் கொள்கின்றார்கள். இதுவே இதற்குப் பிரதான தடையாக இருக்கின்றது. இன்று உலகில் பல நாடுகள் தங்கள் கலாசாரத்தை மதித்து, அதற்கு ஏற்றாற்போல் சுகாதார விதிமுறைகளையும் பேணியதாக

[ගරු මුනීර් මුලාෆර් මහතා]

சீருடைகளை அணிவதற்கான சந்தர்ப்பங்களை அளித்திருக் கின்றன. எமது நாட்டிலும் சில தனியார் வைத்தியசாலைகளில் அவர்களுக்கு அத்தகைய சந்தர்ப்பங்கள் கிடைத்திருக்கின்றன. இந்தப் பிரச்சினை ஒரு இனவாதப் பிரச்சினையா? இது வேறு திசையை நோக்கிச் செலுத்தப்படுகின்ற பிரச்சினையா? இந்த நாட்டில் மீண்டும் இனவாதத்தைத் தூண்டுவதற்காகச் சிலர் இந்தப் பிரச்சினையைத் தூண்டிவிட்டு, அதனூடாக அரசியல் செய்ய எத்தனிக்கின்றார்களா? என்ற கேள்விகள் எல்லாம் எழுகின்றன.

இனவாதத்தைப் புறக்கணிக்கின்ற, அதற்கெதிராகச் செயற் படுகின்ற அரசாங்கம் என்ற அடிப்படையிலும் சுகாதாரத் துறை தொடர்ந்தேர்ச்சியாக இயங்க வேண்டும் என்ற அடிப்படையிலும் இந்த விடயத்தில் அரசாங்கமானது உடனடியாக ஒரு தீர்மானத்தை எடுக்கவேண்டி இருந்தது. இந்தப் பிரச்சினையை வைத்து இரு தரப்பினரும் முரண்பட்டுக்கொள்வதால் பாதிக்கப்படப் போகின்றவர்கள் நோயாளிகள்! அவர்கள் எந்தச் சமூகத்தைச் சார்ந்தவர் களாகவும் இருக்கலாம். எனவே, சுகாதாரத்துறையின் செயற்பாடுகள் தடைப்படாத வகையிலும், இனவாதத்துக்குத் தொடர்ந்தும் வித்திடாத வகையிலும் குறித்த சுகாதார உதவியாளர்கள் தற்காலிகமாக அண்மையிலுள்ள வைத்திய சாலைக்கு இடமாற்றம் செய்யப்பட்டு இருக்கின்றனர். இது இந்தப் பிரச்சினைக்கு நிரந்தரத் தீர்வு அல்ல என்பதை நாங்கள் தெளிவாக ஏற்றுக் கொள்கின்றோம். இந்த விடயம் சம்பந்தமாக நீண்ட காலமாக பல மட்டங்களில் பல கலந்துரையாடல்கள் மேற்கொள்ளப்பட்டு இருக்கின்றன.

இன்றும்கூட, நாங்கள் கௌரவ அமைச்சருடன் இது சம்பந்தமாக கலந்துரையாடினோம். அவரும் இந்த விடயத்தை ஏற்றுக் கொண்டார். இன்று நடைபெற்ற ஊடக சந்திப்பில்கூட, அவர் இது பற்றி குறிப்பிட்டிருந்தார். மனிதாபிமானத்தோடு நோக்கி, ஒவ்வொரு மதத்தினரதும் கலாசாரங்களை மதித்து, அனைவரும் ஒன்றாக இணைந்து ஒரு தீர்மானத்தை எடுக்க வேண்டும். அதுதான் நிலையானதொரு தீர்வாக அமையும். அரசாங்கம் என்ற அடிப்படையிலும் இலங்கையர்கள் என்ற அடிப்படையிலும், நாங்கள் அனைவரும் இணைந்து இந்த விடயம் சம்பந்தமாகக் கலந்தாலோசித்து, சிறந்ததொரு தீர்வை எட்ட வேண்டுமென இந்த இடத்தில் கூறிக்கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කිරීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.52]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මට ඉතාම කෙටි කාලයක් තමයි ලබා දීලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කාලය දීර්ඝ කර ගත් නිසා මට තව වේලාව ලබා දෙන්න.

විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී කථා කළ යුතු කාරණා කිහිපයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ප්‍රධාන ගුවන් තොටුපළ තිබෙන්නේ කටුනායක බව අපි දන්නවා. කටුනායක ප්‍රදේශයේ ජනතාව මෑතකදී යම් කාරණයකට හොඳටම කලබල වෙලා තිබෙනවා. ඒ කාරණය තමයි, පාරිසරික ඇගැයීම් වාර්තා සහ බලපත්‍ර නොමැතිව, ඒ කියන්නේ නිසි අවසරයකින් තොරව ලියනගේමුල්ල ප්‍රදේශයේ නීති විරෝධී ලෙස සිමෙන්ති කර්මාන්තශාලාවක් ඉදි කිරීම. එම සිමෙන්ති කර්මාන්තශාලාව නිසා ඒ ප්‍රදේශයේ ජනතාවට විශාල හානියක් වෙනවා. ඒ ආසන්නයේ විශේෂ පාරිසරික පද්ධතියක් තිබෙනවා. ඒ ආසන්නයේ මීගමුව කළපුව තිබෙන බවත් අපි දන්නවා. ඒ වාගේම කඩොලාන පද්ධතියක් තිබෙනවා. එමෙන්ම සාම්ප්‍රදායික ධීවර කර්මාන්තයේ යෙදෙන පිරිසක් ඉන්නවා. ඒ වාගේම ජාත්‍යන්තර පාසල් දෙකක් ඇතුළුව පාසල් ගණනාවක් ඒ ආසන්නයේ තිබෙනවා. එය අධික නාගරික ප්‍රදේශයක්. ගරු ඇමතිතුමනි, ඔබතුමා මම මේ කියන කාරණය ගැන හොයා බලන්න. හෝටලයක් හදන්න අවසර අරගෙන තමයි ඒ ප්‍රදේශයේ එම සිමෙන්ති කර්මාන්තශාලාව හදාගෙන යන්නේ. දැන් එහි කටයුතු සියයට 80ක්, 90ක්ම ඉවරයි. ඒ වාගේ නාගරික, තදාසන්න ප්‍රදේශයක සිමෙන්ති කර්මාන්තශාලාවක් හදන්න අනුමැතිය ලබා දීම බරපතළ ප්‍රශ්නයක්. මොකද, ඒක එතැනට කිසිසේත්ම ගැළපෙන්නේ නැහැ. රටේ සිමෙන්ති කර්මාන්තශාලා හැදෙන්න ඕනෑ. නමුත්, ඒවා හැදෙන්න සුදුසු තැන් ඕනෑ තරම් තිබෙනවා. එසේ සුදුසු තැන් තිබියදී මේ වාගේ නාගරික ප්‍රදේශයක හෝටලයක් හදන්න කියලා අවසර අරගෙන, පාරිසරික ඇගැයීම් වාර්තාවලින් තොරව තමයි ඒ සිමෙන්ති කර්මාන්තශාලාව හදන්නේ. ලියනගේමුල්ල ප්‍රදේශයේ ඊට යාබදව යම්කිසි රක්ෂිත වන කොටසකුත් තිබෙනවා. ඒ කිසිම දෙයක් ගැන අවධානය යොමු නොකර එම සිමෙන්ති කර්මාන්තශාලාව ඉදි කරනවා. සමහර විට ඔබතුමන්ලාගේ කාලයේ නොවෙයි වෙන්න ඇති, ඒ සිමෙන්ති කර්මාන්තශාලාව ඉදි කරන්න පටන් ගත්තේ. *[බාධා කිරීමක්]* ඒක තමයි. හැබැයි, දැන් ඔබතුමන්ලාට යුතුකමක් සහ වගකීමක් තිබෙනවා, මීට කලින් වැරැද්දක් සිදු වෙලා තිබෙනවා නම් ඒ වැරැද්ද නිවැරදි කරන්න. *[බාධා කිරීමක්]* Very good. ඒ නිසා ඔබතුමන්ලා මේ සම්බන්ධයෙන් වහාම අවධානය යොමු කරන්න. ලියනගේමුල්ල ප්‍රදේශයට විතරක් නොවෙයි, ඒ තුළින් ප්‍රශ්න ඇති වෙන්නේ. අපේ රටේ ප්‍රධාන ගුවන් තොටුපළ තිබෙන්නේත් ඒ ආසන්නයේ. ඒක සංවර්ධනය කරමින් තිබෙන ගුවන් තොටුපළක්. එම නිසා ඒ සිමෙන්ති කර්මාන්තශාලාව හදන එක නතර කරන්න කටයුතු කරන්න. ඒ වාගේම ඊට අවසර දෙන්න, බලපත්‍ර දෙන්න පගාව ගත්, හොරකම් කරපු අය ඉන්නවා නම් ඔබතුමන්ලා ඒ අය සඳහාත් නීතිය ක්‍රියාත්මක කරන්න. හැබැයි, දැනටත් එහි කටයුතු ක්‍රියාත්මක වෙනවා. ඒ කර්මාන්තශාලාව දැනුත් හදනවා. කර්මාන්තශාලාව හදන ගමන් ඔබතුමන්ලා ඊට එරෙහිව කටයුතු කරලා වැඩක් නැහැ. එහි කටයුතු නතර කරලා, ඊට පස්සේ ඒ සඳහා වැරැදිකරුවෝ කවුද කියලා හොයා බලන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

Factory එකක් හැදුවාට productionවලට අවසර දෙන්න එපායැ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඒක තමයි. කලින් අවසර දුන්නා කියලා වැරදි කරන අයට ඔබතුමන්ලා ඒ පාරේම යන්න දෙනවා නම් ඒකත් ප්‍රශ්නයක්.

ඒ වාගේම මම ඉතා වැදගත් කාරණයක් කෙරෙහි ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා. සංගෘහිත කෘති මහජනතාව ඉදිරියේ ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමට සහ මහජනතාව වෙත සන්නිවේදනය කිරීම සඳහා වන බලපත්‍ර ගාස්තු ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ගැසට් නිවේදනයක් නිකුත් වෙලා තිබෙනවා. මේක බරපතළ ප්‍රශ්නයක්, ගරු ඇමතිතුමනි. බලන්න, අපේ ප්‍රදේශවල වාගේම ඔබතුමන්ලාගේ අනුරාධපුරයේ ලොතරැයි කුඩු කොච්චර නම් දැන් තිබෙනවාද කියලා. පොඩ්ඩ තැනින් ගන්නකෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලොතරැයි කුඩුවල සින්දු දාලා තිබෙනවා. දැන් ගෙනෙන්න හදන බලපත්‍ර ක්‍රමය යටතේ ලොතරැයි කුඩුවක, බස් රථයක, පොඩි කඩයක, කඩ විදියක සින්දුවක් දමන්න හම්බ වෙන්නේ නැහැ. මේ අවසරය නැත්නම් මේ බලපත්‍රය දෙන්නේත් ශ්‍රී ලංකා නිර්මාණකරුවන්ගේ සහ ප්‍රකාශකවරුන්ගේ සංගමයට. එක සංගමයකට මේ අවසරය දෙන්නේ. ඒ සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලයක් ඇති නේ. සංගම්වලට මේ බලපත්‍ර දුන්නාම සිදු වන දේ ඔබතුමා දන්නවා නේ, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි. අන්තිමට ඒ සංගමය තමයි පෝෂණය වෙන්නේ. ඒ සංගීතකරුවාටවත්, රචකයාටවත් එහෙම නැත්නම් සංගීත අධ්‍යක්ෂණය කරපු අයටවත් මේ මුදල් ලැබෙන්නේ නැහැ. අන්තිමට සංගමය තර වෙනවා. සමහරුන්ට සොච්චම් මුදලක් ලැබේවි. සමහරු දන්නේත් නැහැ, තමන් වෙනුවෙන් මුදලක් අර සංගමයට ගියාද කියලා. ඒ හරහා අන්තිමට රටේ ජනතාවට සංගීත රසය විඳින්න තිබෙන අවස්ථාව අහිමි වෙනවා විතරක් නොවෙයි, සාමාන්‍යයෙන් පොඩිම තැනක සින්දුවක් දමාගෙන කරන ව්‍යාපාර - අඩුම ගණනේ සින්දුවක් දමාගෙන ලොතරැයියක් විකුණන කෙනාට ඒ ව්‍යාපාරයවත් - කර ගන්න බැරි තත්ත්වයට පත් වෙනවා. ඇමතිවරු දෙතුන්දෙනෙක්ම මේ අවස්ථාවේදී සභාවේ ආණ්ඩු පක්ෂය පැත්තේ ඉස්සරහ ඉන්නවා. ඔබතුමන්ලා සොයා බලන්න, මේ ක්‍රමවේදය හරිද කියලා. මට නම් පෙනෙන්නේ මේක සංගමයක් පිටින් දමාගෙන කිහිපදෙනෙක් ගහන ගේමක් වාගේයි. ඒ නිසා ඔබතුමන්ලා වහාම මේ ගැන හොයා බලන්න. මොකද, පෙන්වන්නේ කලාකරුවන් වෙනුවෙන් කියලා. නමුත් අන්තිමට කලාකරුවන්ට මේකෙන් වෙන සෙතක් නැහැ. සංගමයේ ඉන්න අධ්‍යක්ෂ මණ්ඩලය වෙන්න පුළුවන්, ප්‍රධාන නිලතල දරන අය වෙන්න පුළුවන්. අපේ රටේ සංගම් ගණනාවකටම අද වනකොට වෙලා තිබෙන්නේ එහෙම තමයි. ඒ සංගම්වල අය තර වෙනවා. ඒ සංගම් යටතේ ඉන්න යම්කිසි වගකීමක් තිබෙන අයට අන්තිමට ඒවායේ අයිතියක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා හොයා බලන්න, මොකක්ද මේ සංගමය, මේක පිටුපස ඉන්නේ කවුද කියලා. සංගමය පිටින් දාලා කලාකරුවන්ව සූරා කන්න හදනවා විතරක් නොවෙයි, මේ රටේ ජනතාවට සංගීත රසාස්වාදය විඳින්න තිබෙන අවස්ථාවත්, තමන්ගේ ව්‍යාපාරයක් කර ගන්න තිබෙන අවස්ථාවත් අහිමි වෙනවා කියන කාරණය මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු යූ.පී. අබේවික්‍රම මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා මතු කරපු කාරණය පිළිබඳව මම පැහැදිලි කරන්න ඕනෑ. මම කියන්නේ සිමෙන්ති ෆැක්ටරිය පිළිබඳව නොවෙයි. ඒක ගැන කියන්න මන්ත්‍රීවරු ඉන්නවා. සින්දුවක්වත් දමන්න බැහැ කියලා ඔබතුමා කිව්වා, ගරු මන්ත්‍රීතුමනි. ඒ සම්බන්ධව කියන්න මම විනාඩියක් ඉල්ලනවා. ඔබතුමා මතු කරපු කාරණය පිළිබඳව යම් වැරදි අවබෝධයක් සමාජයට යන්න පුළුවන් නිසායි මම මේ කාරණය කියන්නේ. ඔබතුමා ඒ කාරණය මතු කරපු එක හොඳයි. මොකද, එහෙම ගැසට් නිවේදනයක තිබෙනවා. හැබැයි, ඒක රජයේ ගැසට් නිවේදනයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. ඒක පෞද්ගලික සංගීත නිර්මාණකරුවන් සහ ගීත රචකයන් කියන අයගේ copyright එක එකතු කර ගැනීම සඳහා වෙච්ච, ඒගොල්ලන්ට තිබෙන අයිතිය පිළිබඳ ගැසට් නිවේදනයක්. නමුත්, ඔබතුමා මතු කරන කාරණය මේකේ තිබෙනවා. Copyright එක ගන්න පුළුවන් copyright තිබෙන අයට විතරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන නිසා කෙටියෙන් කියන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
කෙටියෙන් කියන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මන්ත්‍රීතුමනි, බුද්ධිමය දේපළ පනත 2003 වර්ෂයේදී තමයි සම්මත වෙලා තිබෙන්නේ. ඒ පනත යටතේ බුද්ධිමය දේපළක්, එහෙම නැත්නම් තමන්ගේ සින්දුවක්, තමන්ගේ ගීත රචනයක් වෙනත් කෙනෙක් පාවිච්චි කරනවා නම්, වෙනත් කෙනෙක් තැනක කියනවා නම්, අහනවා නම්, බුද්ධිමය දේපළ පනත යටතේ ඒකට කර්තෘ භාගය ගෙවන්න ඕනෑ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
සංගමයට.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඒක තමයි. ඔබතුමා මතු කරන කාරණය මේ ගැසට් නිවේදනයේ පළ වීම නිසා යම් ප්‍රශ්නකාරී තත්ත්වයක් මතු වෙලා තිබෙනවා. ඒක නිරාකරණය කරන්න ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මැදිහත් වෙලා තිබෙනවා. මොකද, ඔබතුමා කියන විධියට ලොතරැයි කුඩුවේ, බස් එකේ radio එකෙන් විකාශනය වන සින්දුවක් අහන වාගේ ඒ හැම තැනකටම බලපත්‍ර නිකුත් කරන්න බැහැ. ඒගොල්ලන්ගේ සින්දුවක් radio එකේ විකාශනය වනවා නම් ඒගොල්ලන්ට copyright එක අය කර ගන්න පුළුවන්. ඒ වාගේම ඒගොල්ලන්ගේ සින්දුවක් TV එකේ විකාශනය වෙනවා නම් ඒ අයට copyright එක අය කර ගන්න පුළුවන්. හැබැයි, එහෙම නැතුව හැම තැනටම බලපත්‍ර නිකුත් කිරීමේ

[ගරු වසන්ත සමරසිංහ මහතා]

අයිතියක් කාටවත් අපි දීලා නැහැ. එම නිසා ඒ ගැන ඔබතුමාට මම පැහැදිලි කරන්න ඕනෑ. ඒ ප්‍රශ්නය මතු කළාට බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, ඒ බුද්ධිමය දේපළ අයිතිය තිබෙන අයට 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ අදාළ කටයුතු තමයි මේ සිද්ධ වෙන්නේ කියන එක අපි කියනවා. ඒ ගැන ගැටලුවක් තිබෙනවා. ඒ ගැටලුව නිරාකරණය කිරීමට ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයත්, අමාත්‍යාංශයත් මැදිහත් වෙනවා. සින්දුවක් අහන්න බැරි වන තරමට ප්‍රශ්නයක් හැදෙන්න කිසිම වෙලාවක අපි ඉඩ දෙන්නේ නැහැ. සින්දුවක් අහලා ඉන්න පුළුවන් වටපිටාව අපි හදනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.00]

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අදහස් දැක්වීම පටන් ගන්න කලින් එක කාරණාවකට මා අවධානය යොමු කරනවා. අද දවසේ TNA එකේ ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මන්ත්‍රීතුමා මූලාසනයේ ඉන්නකොට, එක අවස්ථාවකදී ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා නැඟිටලා ප්‍රකාශයක් කළා, "මූලාසනයට එන්න කලින් සිංහල ඉගෙන ගෙන එන්න" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුව ත්‍රෛභාෂාවෙන්ම වැඩ කරන පාර්ලිමේන්තුවක්. ඒ වාගේම භාෂාව සහ ජාතිය පදනම් කරගෙන තවත් කෙනෙකුට වෙනසක් කරන්න, ගරහන්න අවස්ථාව දිය යුතු නැහැ. ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් යෝජනා කරනවා, එකී කොටස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා අද උදෑසන ගරු අධිකරණ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පතත්, අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පතත් මත පදනම් වෙලා විපක්ෂය පාර්ලිමේන්තුව තුළ විරෝධතාවක් පළ කරන්න පටන් ගත්ත ආකාරය. එතුමන්ලා කිව්වේ ඒ විරෝධතාව දිගටම ගෙනියනවා කියලා. නමුත් මේ වෙනකොට නම් ඒ කවුරුත් පේන්න නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට මාස දෙකකට විතර කලින් විපක්ෂය සමාජ මතයක් නිර්මාණය කරන්න හැදුවා, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ පමණක් විශ්‍රාම ගැන්වීමේ වයස දීර්ඝ කරන්න යනවා කියලා. ඊට පස්සේ ටික දවසක් ගිහිල්ලා උපරිමාධිකරණ - ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණයේ - විනිසුරුවරුන්ගේ පමණක් විශ්‍රාම ගැන්වීමේ වයස දීර්ඝ කරන්න යනවා කියලා මේ සමාජය ඇතුළේ බිල්ලෙක් නිර්මාණය කරන්න උත්සාහ කළා. ඒ වාගේම මේ සම්බන්ධයෙන් නීතිඥ සංගමය විරුද්ධ වෙනවා කියලා විටින් විට කිව්වා. එක්සත් ජාතීන්ගේ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන කාරණාවකුත් කිව්වා; තව විවිධ සංගම් ගැන කිව්වා. ඒ එක්කම කියැවුණා, වැරදි තොරතුරු මත ඒ අය මේ ප්‍රකාශයන් කරන බවට රජයේ පාර්ශ්වයෙන් චෝදනා කරනවා කියලා. මෙන්න මේක තමයි වැරදි තොරතුර. මුලින් නිර්මාණය කරන්න හැදුවා මේ සංශෝධනය ශ්‍රේෂ්ඨාධිකරණයට පමණක් සීමා වෙනවා කියලා. ඊළඟට ශ්‍රේෂ්ඨාධිකරණයට සහ අභියාචනාධිකරණයට පමණක් සීමා වෙනවා කියලා බොරු මතයක් නිර්මාණය කරන්න හැදුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ මට මතක් වෙනවා, 2005 වසරේ තිරගත වුණු, ජයන්ත චන්ද්‍රසිරි මහත්මයාගේ "ගරිල්ලා මාර්කටිං" චිත්‍රපටය. ඒ චිත්‍රපටයේ එක තැනක තිබෙන සංවාදයක් මම මතක් කරන්න කැමැතියි. මම හිතන විධියට, ඔබතුමාටත් එය මතක ඇති. පාළු නිවසක් පෙන්වලා ජැක්සන් ඇන්තනි මහත්මයා කියනවා, "මේ පාළු නිවසේ හොල්මනක් ඉන්නවා කියලා මිනිස්සු විශ්වාස කරනවා. නමුත් එහෙම හොල්මනක් නැහැ. හැබැයි, මිනිස්සු ඒක කියලා කියලා විශ්වාස කරන නිසා, එහෙම එකක් නැති වුණත් දැන් මිනිස්සු ඒක විශ්වාස කරන තැනට ඇවිල්ලා තිබෙනවා" කියලා. ඒ වාගේම තව තැනක කියනවා, "බොරුවක් සමාජගත කරන්න ඕනෑ නම් ඉස්සෙල්ලා තමන් ඒ බොරුව විශ්වාස කරන්න" කියලා. විපක්ෂය මුල ඉඳන්ම ඒ ගරිල්ලා මාර්කටිං එක කරමින් මේ රටේ සාමාන්‍ය ජනතාව තුළත් බොරු බිල්ලෙක් මවලා ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව නැති, අසත්‍ය තත්ත්වයක් සමාජය තුළ නිර්මාණය කරන්න උත්සාහ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දිගින් දිගටම විපක්ෂයෙන් ඇහුවා, සමස්ත විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස දීර්ඝ කිරීමෙන් අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑමක් වෙන්නේ කොහොමද කියලා. නමුත් එතුමන්ලාට කවදාවත් සාර්ථක උත්තරයක් දෙන්න හැකියාවක් ලැබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ විශේෂයෙන් කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ තීන්දු තීරණ ගන්නේ මේ රටේ ව්‍යවස්ථාදායකය. ඒ වාගේම මේ තීන්දු තීරණ සම්බන්ධයෙන් තමන්ගේ අදහස්, යෝජනා ඉදිරිපත් කරන පාර්ශ්ව තමන්ගේ ඇතැම් නිපුණත්වයන් මත පදනම් වෙලා, තමන්ගේ විෂයයන් මත පදනම් වෙලා අදහස් දක්වනවා වෙන්න පුළුවන්. අපට ඒ අදහස් පිළිබඳව ගෞරවයක් තිබෙනවා, අපි ඒවා භාර ගන්නවා, අපට ඇගැයීමක් තිබෙනවා. නමුත් ව්‍යවස්ථාදායකය විධියට මේ උත්තරීතර සභාවේ වගකීම තිබෙන්නේ එක්තරා සමාජ පන්තියක්, කොටසක් සම්බන්ධයෙන් පමණක් නොවෙයි. මේ රටේ මිලියන 22ක සමස්ත මහජනතාව සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවට වගකීමක් තිබෙනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුව තීන්දු තීරණ ගන්නේ එක්තරා කණ්ඩායමක් සම්බන්ධයෙන් පමණක් සලකා බලා නොවෙයි, සමස්ත ජනතාව සම්බන්ධයෙන්ම සලකා බලායි. ඒ නිසා අපි දිගින් දිගටම කියමින් ඉන්නේ අධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම කියන කාරණාව හුදෙකලා කරලා අරගෙන මේ ප්‍රශ්නය දකින්න එපා කියලායි. එහෙම දැක්කොත් - අර, tunnel vision කියලා කියන්නේ - tunnel vision එකෙන් තමයි පෙනෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ෂුවාං ෂු කියන චීන දාර්ශනිකයා වරෙක කියනවා, ළිඳක ජීවත් වෙන ගෙම්බෙකුට ඔබට සාගරය ගැන කියලා දෙන්න බැහැ කියලා. එම නිසා ගෙම්බන් වෙන්න එපා. ගෙම්බන් වෙලා එක කොටසක් පමණක් අරගෙන ඒ තුළින් පමණක් තමන්ගේ විවේචනය නිර්මාණය කරලා, මේ රජය, සමස්ත මහජනතාව සම්බන්ධයෙන් ගේන්න යන ප්‍රගතිශීලී යෝජනා සම්බන්ධයෙන් පටු විවේචන ඉදිරිපත් කරන්න එපා කියන එක තමයි අපේ ඉල්ලීම. ඇයි, අපි මෙහෙම කියන්නේ? අපි දැක්කා විපක්ෂයේ අය කථා කරනකොට කියැවුණා, අකැමැති විනිසුරුවරුන් ඉවත් කිරීමත්, කැමැති අය තබා ගැනීමත් කියන දෙකම සුදුසු නැහැ කියලා. දැන් මේ කැමැති අකැමැති භේදය නිර්මාණය කරන්නේ කවුද? රජයට කැමැති අකැමැති කියලා භේදයක් නැහැ. අපි සමස්ත විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස තමයි දීර්ඝ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඔබතුමාට මතක ඇති, බන්ධනාගාර තදබදය හේතුවෙන් අර්බුද ඇති වෙනකොට විපක්ෂය කිව්වා, ඒකේ වගකීම රජය භාර ගන්න ඕනෑය කියලා. මේ සමස්ත ප්‍රශ්නය තේරුම් ගන්න. බන්ධනාගාර තදබදය විසඳන්න අපි ක්‍රියා කරමින් ඉන්නවා. මේ සමස්ත ප්‍රශ්නයේදී අපි කරමින් සිටින්නේ මොකක්ද? අපි විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කරමින් ඉන්නවා. නීතිපති දෙපාර්තමේන්තුවට අවශ්‍ය බඳවා ගැනීම් කරමින් ඉන්නවා සහ ඔවුන්ට අවශ්‍ය වැටුප් සම්බන්ධව සලකා බලමින් ඉන්නවා. රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට අවශ්‍ය බඳවා ගැනීම් කරමින් ඉන්නවා. ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් ඉන්නවා. ඒ වාගේම අධිකරණ ප්‍රමාණය වැඩි කරමින් ඉන්නවා. අධිකරණ කාර්ය මණ්ඩලයට නව බඳවා ගැනීම් කරමින් ඉන්නවා. නව බන්ධනාගාර ඉදිකිරීම සම්බන්ධයෙන් සලකා බලමින් ඉන්නවා. ඒ වාගේම නව පුනරුත්ථාපන මධ්‍යස්ථාන ඉදිකරන්න, දියුණු පුනරුත්ථාපන ක්‍රම ගේන්න වැඩ කරමින් ඉන්නවා. අධිකරණ පද්ධතිය ඩිජිටල්කරණය කිරීම සඳහා අවශ්‍ය වැඩ කරමින් ඉන්නවා. ඒ වාගේම විනිසුරුවරුන් වැඩි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. අලුත් නීති ගෙනෙමින් තිබෙනවා. පවතින නීති සංශෝධනය කරමින් තිබෙනවා. මේ සියල්ල මේ මොහොතේ අපි ඉස්සරහා තිබෙන සමස්ත අර්බුදය විසඳීම වෙනුවෙන් ගන්නා ප්‍රවේශයන්. විශාල නඩු ප්‍රමාණයක් පැවැතීම, බන්ධනාගාර තදබදයක් පැවැතීම, මත්ද්‍රව්‍ය ජාවාරම, සංවිධානාත්මක අපරාධ ආදී එකින් එකට බැඳුණු මේ සමස්තය සම්බන්ධයෙන් අපි ගන්න ප්‍රවේශයන්. එම නිසා අපි ඉල්ලන්නේ,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுசந்த தொடாவத்த)
(The Hon. Susantha Dodawatta, Attorney-at-Law)
මම ඉක්මනින් අවසන් කරනවා.

අපි මේ වෙලාවේ රටේ ජනතාවට කියනවා, අපි මේ සමස්ත ගැටලුව සම්බන්ධයෙන් විශාල ප්‍රවේශයන් ප්‍රමාණයක් ගනිමින් ඉන්න වෙලාවක, විපක්ෂය සහ ඉතා සුළු කණ්ඩායම් පිරිසක් පමණක් මේක විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහ අධිකරණ සංවිධාන පනතේ සංශෝධනයට පටු කරලා, ඒකට පමණක් සීමා කරලා පටු දේශපාලන වාසියක් ගැනීමේ උත්සාහයක් දරමින් ඉන්න බව. හැබැයි, විපක්ෂයේ මේ ගරිල්ලා මාර්කටිං එක මේ රටේ ජනතාව භාර ගන්නේ නැහැ කියලා අපි දන්නවා. මොකද, අපි වැඩ කරන්නේ ජන වරමට අනුකූලවයි කියන එක නැවත වතාවක් මම මතක් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු නලින් බණ්ඩාර මැතිතුමාගේ කථාවේදී අපේ දිස්ත්‍රික්කයට අයත් ලියනගේමුල්ල ප්‍රදේශයේ තිබෙන cement factory එකක් ගැන ප්‍රශ්නයක් මතු කළා. එතුමා මතු කරපු කාරණය ඇත්ත. ඇත්තටම ඒකට අවසර දීලා තිබෙන්නේ අපේ ආණ්ඩුව බලයට එන්න කලින්. මුලින් හෝටලයක් හදනවා කියලා පසුව ඔවුන් mini-cement factory එකක් හදනවා කියලා තමයි අවසර අරගෙන තිබෙන්නේ. UDA එකෙන් ඒ සඳහා අවසර දීලා තිබෙනවා. කෙසේ වෙතත්, අපේ දිස්ත්‍රික්කයේ කටාන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදීත් මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා තිබෙනවා. අපි ඔවුන්ට යෝජනා කරලා තිබෙනවා, මේ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අවසරය ගන්න අවශ්‍ය වෙලා තිබෙන නිසා ඒක ගන්නත්, ඊට අමතරව traffic impact assessment එකක් කරලා, ඊට අදාළ වාර්තාවක් ගන්නත් කියලා. ඒ වාගේම මේ ස්ථානය වෙනුවට වෙනත් තැනකට ඒක shift කරන්න පුළුවන්කම තිබෙනවා. එම නිසා ඒක shift කරන්න කියන යෝජනාවත් අපි කරලා තිබෙනවා. අපි මේ වෙනකොට ඒ කාරණය සම්බන්ධයෙන් මැදිහත් වෙමින් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරන කාරණය මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරලා තමයි එතුමාගේ කථාව පටන් ගත්තේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ නම සඳහන් කරලා ඔබතුමාට වැරදි දෙයක් කිව්වාද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එතුමා මගේ නම සඳහන් කරලා, මගේ කථාව ගැන කියමින් විනාඩියක් කථා කරලා තිබුණා. හැන්සාඩ් එක අරගෙන බලන්න. දෙයියනේ,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ නම සඳහන් කළ පමණින් අවස්ථාව දෙන්න බැහැ. ඔබතුමා ගැන මොකක් හෝ වැරැදි දෙයක් කිව්වාද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔව්, ඔව්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කියන්න, ඒ මොකක්ද කියලා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ කථාව හැන්සාඩ් එකෙන් අයින් කරන්න කිව්වා. මගේ කථාව හැන්සාඩ් එකෙන් අයින් කරන්න කියපු එක වැරැද්දක් නෙවෙයිද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක ගත්තා. තව මොකක්ද කියන්න තිබෙන්නේ?

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මගේ වෙලාව ගන්න එපා. මටයි මයික් එක දීලා තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට ඒක කියන්න දෙන්න කරුණාකරලා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
එතුමා point එක කිව්වේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්චුනා මන්ත්‍රීතුමනි, කියන්නකෝ ඔබතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ නම සඳහන් කරලා එතුමා ප්‍රකාශ කරලා තිබුණා, මගේ කථාව හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න කියලා. එතුමා කියන විදියට ඒක වැරැදි ප්‍රකාශයක් නම්, මට ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්න විනාඩියක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ලේකම් මණ්ඩලය ඒ සම්බන්ධයෙන් කටයුතු කරයි.

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ විනාඩි 9 එහෙමම තිබෙනවා ඇති කියලා මම හිතනවා. ඔබතුමා සටහන් කර ගත්තාට, විනාඩි 9 අඩු කරන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමා එතුමන්ලා ගැන හොඳ කථා දෙකක් කිව්වා. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන රෙගුලාසි කීපයක් පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ එතුමා කිව්වා, චීන ජාතිකයෙකුගේ කථාවක්. ඒක තමයි, ගෙම්බාගේ කථාව. ඒ කථාව ජේවීපී අයටම තමයි කියන්නේ. ගෙම්බාගේ කථාව තමුන්නාන්සේලාටම කියා ගත්තා. ඒක අංක එක. දෙවැනි කථාව තමයි, ගෙයක් අස්සේ හොල්මන් තිබෙනවා කියලා බිල්ලෝ මවනවා කියපු කථාව. 76 අවුරුද්දක බිල්ලෝ මැව්වේ තමුන්නාන්සේලා. ඒ නිසා එතුමා ඒ කියපු බිල්ලෝ සහ හොල්මන් අදාළ වෙන්නේ තමුන්නාන්සේලාටමයි කියන එක මා සඳහන් කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඒක ඔබතුමා විසින්ම කියපු එක ඉතාම වැදගත් කියලා මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ ඔබතුමාට තවත් විශේෂ ප්‍රශ්නයක් ගැන කියන්න ඕනෑ. ඇත්තටම රටේ ආනයන, අපනයන ක්ෂේත්‍ර දියුණු කරන්න නම් රටේ ආර්ථිකය දියුණු වෙන්න ඕනෑ. ඒ සඳහා ආර්ථිකය ආරක්ෂා වන වැඩ පිළිවෙළක් අවශ්‍ය වෙනවා. ආර්ථිකය ආරක්ෂා කරන්න නම් රටේ නීතිය හරියට ආරක්ෂා වෙන්න ඕනෑ. නීතිය ආරක්ෂා වෙන්න නම් රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රැකෙන්න ඕනෑ; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා වෙන්න ඕනෑ. අද තමුන්නාන්සේලාට ඕනෑ විදියට, වැරැදි විදියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පාවිච්චි කරමින් ගන්නා මේ තීන්දු තීරණ නිසා රටේ ඉදිරි ගමනට කිසිම සහයෝගයක් ලැබෙන්නේ නැහැ. තමුන්නාන්සේලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන්නේ, අධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස් සීමාව වෙනස් කරන්න විතරයි. මේ අවස්ථාවේ මේ රටේ තිබෙන ප්‍රශ්නය මේකද?

මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. කිරිපිටි මිල ද ඇතුළුව රටේ බඩු මිල ඉහළ යන එක පාලනය කිරීම සම්බන්ධව තමුන්නාන්සේලා යම්කිසි ප්‍රගතිශීලී වැඩසටහනක් ආරම්භ කරලා නැහැ. කිරිපිටි මිල අඩු කළාම දැන් මේ රටේ මාධ්‍ය ගහන්නේ breaking news. තමුන්නාන්සේලා ගිහින් තැන් තැන්වල කථා කරන්නේ, කිරිපිටි මිල මෙච්චරක් අඩු කළා කියලා. අද වන කොට ග්‍රෑම් 400 කිරිපිටි පැකට් එකක් රුපියල් 150කින් වැඩි වෙලා. ඒ වාගේම, කිලෝග්‍රෑම් එකක කිරිපිටි පැකට් එකක මිල රුපියල් 250කින් වැඩි වෙලා. මේක ගැන රටේ ජනතාවට අද කියලා නැහැ. හොරෙන් හොරෙන් වැඩේ දෙනවා, රටේ ආර්ථිකයට. ජනතාවගේ ආර්ථික තත්ත්වය කඩා වට්ටන වැඩසටහන යටින් හොරෙන් හොරෙන් ක්‍රියාත්මක කරමින් තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන අත්තනෝමතික ක්‍රියාපටිපාටිය තමුන්නාන්සේලා මේ රටේ කරගෙන යන්නේ.

ඒ වාගේම, විශේෂයෙන් මතක් කරන්න ඕනෑ තවත් කාරණාවක් තිබෙනවා. ආනයන, අපනයන ගැන කථා කරද්දී අපි

දන්නවා baggagesවලින් බෙහෙත් ගෙනෙන විධිය පිළිබඳව. එහෙම ගෙනාපු බෙහෙත්, ඊයේ පෙරේදා දවසක පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙන් ගිහිල්ලා සමහර කඩවලින් ඇල්ලුවා. හැබැයි, රට ඇතුළට ඒ විධියට බෙහෙත් ගෙනෙනවා. එහෙම බෙහෙත් ගෙනෙද්දී අල්ලලා නැහැ.

ඊළඟ කාරණය මේකයි. ඉන්දියාවෙන් බෝට්ටුවලින් ඒ බඩු ඔක්කෝම එනවා. හැබැයි, ඒවා අල්ලලා නැහැ. ඒවා අල්ලන්න බයයි. ඒ, ඉන්දියාවෙන් ප්‍රශ්නයක් වෙයි කියලායි. එහෙම අල්ලන්නේ නැතුව, රට ඇතුළට ගෙනැල්ලා විකුණන කොට අල්ලනවා. ඒක නොවෙයි කරන්න ඕනෑ වැඩේ. මේකට සෞඛ්‍ය අමාත්‍යාංශයේත් යම් යම් නිලධාරින්ගේ සම්බන්ධතාවක් තිබෙන බවක් කියැවෙනවා අපි දැක්කා. විශේෂයෙන් NMRA එකේ සම්බන්ධතාවක් තිබුණා, මේ baggagesවලින් බෙහෙත් ගෙනෙන එකට. මේ රටේ ඒ සම්බන්ධව තීන්දු තීරණ ගන්න එක තමයි තමුන්නාන්සේලා කරන්න ඕනෑ. එහෙම නැතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන එක නොවෙයි කරන්න ඕනෑ. මොකද, ඒක අත්‍යවශ්‍ය කාරණාවක් නොවෙයි.

බදු සම්බන්ධවත් බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නවා, බදු ගහන ක්‍රමවේදය අනුව මේ රටේ export කරන කණ්ඩායමට බරපතළ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන බව. කන්ටේනර් 323න් ගෙනාපු බඩු ටික කෝ? ඒ කන්ටේනර්වල තිබුණු භාණ්ඩ ආනයනය කළේ කවුද? එසේ ආනයනය කරලා ගෙනාවේ කුඩු ද, ගංජා ද, ආයුධ ද? මොනවාද, ඒ කන්ටේනර් ඇතුළේ ගෙනාවේ? ඒ සම්බන්ධව තීන්දු තීරණ ගන්න එක නේ, තමුන්නාන්සේලා කළ යුතුව තිබෙන්නේ. හැබැයි ඒ වෙනුවට තමුන්නාන්සේලා කරන්නේ වෙනම දෙයක්.

ඒ වාගේම මතක් කරන්න ඕනෑ, තමුන්නාන්සේලා මේ රටේ අධිකරණ විනිසුරුවරුන් සම්බන්ධව ගත්තු තීන්දුව ගැන. ඒ තීන්දුව නිසා මින් පස්සේ මේ රටේ ශිෂ්‍ය සංගම්වලට, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තමන්ගේ ප්‍රශ්නයකට පාරට එන්න බැරිව යයි; මින් පස්සේ ගොවියාට පාරට එන්න බැරිව යයි; මින් පස්සේ යම්කිසි ප්‍රශ්නයකදී රටේ සමස්ත ජනතාවට පාරට එන්න බැරිව යයි. මොකද, තමුන්නාන්සේලා ඒ සියලුදෙනාම අල්ලා හිරේ දමාවි. ඒක තමයි තමුන්නාන්සේලාගේ වැඩසටහන. ජනතාවට මේක බරපතළ විධියට බලපාන බව මතක තියා ගන්න. හොඳයි කියලා හිතුවාට තමුන්නාන්සේලා මේ කරන්න යන වැඩෙන් අවසානයේ තමුන්නාන්සේලාටම එනවා, බරපතළ ප්‍රශ්නයක්.

තමුන්නාන්සේලාට මේ රටේ බලය ආවේ අරගළයකින් පස්සෙයි. එහෙම නම් තමුන්නාන්සේලා දැන් මේ කරන්න හදන්නේ මොකක්ද? තමුන්නාන්සේලාගේ තිබෙන අසමත්භාවය නිසා ඊළඟ පාර අරගළයකින් තමුන්නාන්සේලාට ගෙදර යන්න සිද්ධ වෙන්න පුළුවන්. අන්න ඒක නවත්වා ගන්න තමයි තමුන්නාන්සේලා මේ වැඩ කොටස කරන්නේ. කවුරු හරි වැරැදි විධියට නීතියට අත තියනවා නම්, අධිකරණයට අත තියනවා නම් ඒක රටේ විනාශය බව මතක තබා ගන්න. එහෙම නම්, තමුන්නාන්සේලා මේ රට විනාශ කරන වැඩසටහනක් තමයි මේ ගෙන යන්නේ. ඒ බව විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම, තමුන්නාන්සේලා මීට පෙර - ඡන්ද ව්‍යාපාරයේදී - "අධිකරණය ගමට ගේනවා" යැයි කියනවා අපි දැක්කා. 1988-89 කාලයේ තමුන්නාන්සේලා ගමේ නඩු ඇහුවා. නඩු අහලා තීන්දු දුන්නා. තමුන්නාන්සේලා දැන් උත්සාහ කරන්නේ මේ අධිකරණ ක්‍රියාදාමය ගමට ගෙන යන වැඩසටහනක් හදන්නද? එහි ඊළඟ පියවරද තමුන්නාන්සේලා මේ ගන්නේ? සිරිපාලලා, සෝමදාසලා නඩු අහන්නද මේ හදන්නේ? එවැනි වැඩ පිළිවෙළකුත් හදන්නද මේ යන්නේ? මතක තියාගන්න, මේ තීරණය මේ රට ඉතාම භයානක තැනකට ගෙන යන බව. එහෙම ගෙනිච්චාට කමක් නැහැ. හැබැයි, මතක තියාගන්න, වරද්දා ගත්තොත් තමුන්නාන්සේලාට ගමේ නොවෙයි, රටේ නොවෙයි, කොතැනකවත් ඉන්න හම්බ වෙන්නේ නැහැ කියන එක. වැරැද්ද කරද්දී ඒ වැරැද්ද හරියට හඳුනා ගත්තේ නැත්නම් තමුන්නාන්සේලාට බරපතළ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙනවා. අද නීතිඥ සංගමය, ජාත්‍යන්තරය ඇතුළු සියලුදෙනා මේ සංශෝධනය ගැන අහන්නේ ඇයි? ඒ අය මේ කාරණය ගැන ප්‍රශ්න කරන්නේ ඇයි? මෙහි බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරද්දී ඒ ව්‍යවස්ථා සංශෝධනය ගැන ජනතාවත් එක්ක සාකච්ඡාවකට ඇවිල්ලා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුත් එක්ක සාකච්ඡා කරලා, විශේෂයෙන්ම ඒකට සම්බන්ධ සියලු ආයතනත් එක්ක සාකච්ඡාවකට ඇවිල්ලා රටේ සංවාදයක් ගොඩනගන්න ඕනෑ. ඒ සංවාදය ගොඩනගලා ඒ සංවාදයේ ප්‍රතිඵල අනුව තමයි තීන්දු තීරණ ගත යුත්තේ. මොකද, මේ වෙනස් කිරීම් බලපාන විශාල කොටසක් මේ රටේ ඉන්නවා. මේකට දැන් විනිශ්චයකාරවරුත් විරුද්ධයි; නීතිඥ සංගමයත් විරුද්ධයි; එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කණ්ඩායමත් විරුද්ධයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයත් අන්දනවාද කියලා ඇහුවා. ඒ කියන්නේ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේත් ඉන්නේ අන්දන්න පුළුවන් මිනිසුන් ටිකක්ද? ඒකද මේ කියන්නේ?

අපි විශේෂයෙන්ම ආණ්ඩුවෙන් අහන්න කැමැතියි, මේක පිටුපස කවුද ඉන්නේ කියලා. මේක පිටුපස කවුද ඉන්නේ කියලා ඔබතුමන්ලා කියන්න ඕනෑ. මොකද, මේක පිටුපස යම් කණ්ඩායමක් ඉන්නවා නම්, එය රටට බරපතළ ප්‍රශ්නයක් වෙනවා. අන්න ඒ බරපතළ ප්‍රශ්නය පිළිබඳව අපට කථා කරන්න තිබෙනවා.

අපි තවම බලාගෙන ඉන්නවා, පාස්කු ඉරු දින ප්‍රහාරයේ මහ මොළකරු හෙළි කරන කල්. අපට අවශ්‍යයි ඒක දැනගන්න. එම ප්‍රහාරයේ මහ මොළකරු ගැන තමයි තමුන්නාන්සේලා දිගින් දිගටම කිව්වේ. "මහ මොළකරු අල්ලනවා, අල්ලනවා, අල්ලනවා!" කියලා තමයි තමුන්නාන්සේලා ඡන්දෙට පෙරත් කිව්වේ, ඡන්දෙට පසුවත් කිව්වේ. හැබැයි ඒ මහ මොළකරු ගැන තවම කථාවක් නැහැ. විශේෂයෙන්ම කතෝලිකයෙකු හැටියට මට විශාල අවශ්‍යතාවක් තිබෙනවා, ඒ මහ මොළකරු කවුද කියලා හඳුනා ගන්න. සාරා ජැස්මින් කොහේද ඉන්නේ කියලා තමුන්නාන්සේලා මේ රටට කියන්න ඕනෑ. ඒ නිසා ඒ සම්බන්ධව තීන්දු තීරණ ගන්න, ඒ සම්බන්ධව හරියට පියවර ගන්න කියා මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. කාලය අවසානයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)

(The Hon. Hector Appuhamy)

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. දැන් යම් යම් දේශගුණික තත්ත්වයන් එනවා; "එල් නිනෝ" තත්ත්වයත් එනවා. වී කිලෝවක මිල ඉතාම පහළට වැටිලා, ගොවි ජනතාව බරපතළ ප්‍රශ්නයකට වැටිලා තිබෙන මොහොතක වියළි කලාපයේ වැව් ටික හිඳෙමින් යනවා. මතක තියාගන්න, ඊළඟ කන්නය වන කොට රටේ වගා කරන්න බැරි වන තත්ත්වයක් උදා වුණොත් ගොවියාට පාරට නොවෙයි, වැවට පැනලාවත් මැරෙන්න හම්බ වෙන්නේ නැහැ කියන එක. මොකද,

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

වැවේත් වතුර ටික නැහැ. එක පැත්තකින්, වී ටික විකුණා ගන්න බැහැ, හාල් ටික නැහැ, කන්න විධියක් නැහැ. ඉතුරු බඩු ටික ගන්න බැහැ. බඩු මිල අහස උසට ගිහිල්ලා. වැවට පනින්න බැහැ. වැවේ වතුර ටික නැහැ. තමුන්නාන්සේලා අඩු ගණනේ ගොවියාට සිය දිවි හානි කර ගන්නවත් අවස්ථාවක් උදා කරන්නේ නැහැ කියන එක මම විශේෂයෙන් සඳහන් කරනවා. මේවාට උත්තර සොයලා රටේ ජනතාව වෙනුවෙන් අවශ්‍ය වන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු යූ.පී. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.20]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන හැටියට හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාට මහ මොළකරු හොයා ගන්න අමාරු නැහැ. මොකද, පසුගිය දවස්වල ගම්මන්පිල මහත්මයාත් එක්ක ඔබතුමාගේ නායකතුමා ගිහිල්ලා මහ මොළකරු මුණ ගැහිලා තිබුණා. පොඩ්ඩක් එතුමාගෙන් ඇහුවා නම් ඒ කවුද කියලා දැන ගන්න තිබුණා. *[බාධා කිරීමක්]* ඔබතුමා නොවෙයි, ඔබතුමාගේ නායකයාගෙන් ඇහුවා නම් දැන ගන්න තිබුණා කියලායි මම කිව්වේ. මේ අලකලංචිය තමයි ඔබතුමන්ලාට වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා විශාල පඹ ගාලක පැටලිලා තිබෙනවා, මේ ආණ්ඩුවේ කටයුතුත් එක්ක. ඔබතුමන්ලා දැන් සටන් කරන්න ඕනෑ කොහොමද, මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනකොට ඒවාට ප්‍රතිචාර දක්වන්න ඕනෑ කොහොමද කියන එක සම්බන්ධයෙන් කිසිම අවබෝධයක් නැතිව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් විධියට තමයි නායකයා ඇතුළු සියලුදෙනාටම මේ ඉරණම අත් වෙලා තිබෙන්නේ.

උදාහරණයක් කිව්වොත්, පසුගිය කාලයේ අපේ ආණ්ඩුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනාවා. ඒක ගෙනෙනකොටම සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා කිව්වා, මේක අධ්‍යාපන අසභ්‍යකරණය කියලා. එහෙම කියලා විශාල හා හුවක් මුළු සමාජය තුළම හැදුවා. දැන් මම හිතන හැටියට සජබ ට යන එන මං නැති වෙලා තිබෙනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට දක්වපු ප්‍රතිචාරත් එක්ක.

ඊළඟට, ප්‍රවාහන ක්ෂේත්‍රය ගත්තාම, ප්‍රවාහන ක්ෂේත්‍රයේ අපි ඇති කරන්න ගත්ත ප්‍රතිසංස්කරණවලට දක්වපු ප්‍රතිචාරත් ඒ වාගේ තමයි. මොන දේ කරන්න ගියත් විපක්ෂයේ ඉන්න අයට ඒවා තේරුණේ නැහැ. තමන්ට ලැබෙන කොටස ගැන කල්පනා කරලා ඒගොල්ලන් කළා වාගේ අපිත් මේ ප්‍රතිසංස්කරණ කරන්න යනවා කියලා තමයි ඒ අය හිතාගෙන ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව වැඩ කරන්නේ රටේ ජනතාව අපට පසුගිය මැතිවරණ කිහිපයේදීම ලබා දුන් ජන වරමට අනුව. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ අපි පැහැදිලිව ඉදිරිපත් කර තිබෙනවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" සඳහා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ. එහිදී සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන විධියට යම් මූලික මූලධර්ම කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා. අධිකරණය සම්බන්ධයෙන් අපි ඉදිරිපත් කර තිබෙන මූලධර්මය තමයි, "නීතිය මත පාලනයක් - සම ප්‍රවේශී අධිකරණ පද්ධතියක්" කියන එක. එතකොට, නීතිය මත පාලනයක් ඇති කරන්න කටයුතු කරනකොට අපට අවස්ථාව ලැබුණා, ජනතාව වෙනුවෙන් මේ දේවල් කරන්න.

මේ රටේ ජනතාව දන්නවා, පසුගිය කාලයේ මේ රටේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයකුටවත්, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයෙකුටවත් ක්‍රියාත්මක නොවුණු නීතිය වෙනුවට, තරාතිරම නොබලා කිසි කෙනෙකුට නීතියට උඩින් කටයුතු කරන්න බැරි විධියට අපි මේ රට මෙහෙයවමින් ඉන්න බව. අධිකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් හැම දාම තිබුණු සාකච්ඡාව තමයි, අධිකරණයේ නඩු කටයුතුවල විශාල ප්‍රමාදයක් තිබෙනවා, ජනතාවට විශාල පීඩාවකට පත් වෙලා ඉන්නවාය කියන එක. නීතිඥවරු, විනිශ්චයකාරවරු, අධිකරණයේ සේවය ලබන ජනතාව ඇතුළු මේ කිසිම කෙනෙක් මේ කටයුතුවලින් තෘප්තියට පත් වෙලා තිබුණේ නැහැ. ඒ සියල්ල බිඳ වැටුණු තත්ත්වයක තමයි මේ රට තිබුණේ. මෑත කාලීනව ගත්තාම, බන්ධනාගාරවල ඇති වුණු තත්ත්වයත් මේ සියලු ක්ෂේත්‍රවල සංයුක්ත ප්‍රතිඵලයක්. ඒ නිසා ආණ්ඩුවක් හැටියට අපට තිබෙන වගකීමක් තමයි මේ තිබෙන ප්‍රශ්න ටිකට උත්තර හොයන්නේ කොහොමද කියන එක. ඒ සඳහා ආණ්ඩුව සෑම ක්ෂේත්‍රයකටම අදාළ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින්, කමිටු පිහිටුවමින්, සාකච්ඡා පවත්වමින්, තීන්දු තීරණ ගනිමින් ඒ ඒ කටයුතු කරගෙන යන අතරේ අපි දැකපු දෙයක් තිබුණා.

විශේෂයෙන්ම අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ වයස් සීමාව දීර්ඝ කිරීම කියන කාරණාව විශාල කලබැගෑනියක් ඇති කර ගන්න ඕනෑ කාරණාවක් නොවෙයි. අපි මේ ප්‍රශ්නයට විසඳුම් සොයන්නේ කොහොමද කියන කාරණාව සාකච්ඡා කරනකොට, ඒ කටයුතු සම්පාදනය කරන වැඩ පිළිවෙළේ එක් අංශයක් හැටියට අපි කල්පනා කළා, අධිකරණ ක්ෂේත්‍රය තුළ දැනට සේවයේ ඉන්න අත්දැකීම් සහිත විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස් සීමාව ඉහළ දමන්න.

දැන් තිබෙන අර්බුදය යටතේ විශේෂයෙන්ම ලක්ෂ 11කට වැඩි නඩු ප්‍රමාණයක් උසාවිවල තිබෙනවා. උපරිමාධිකරණ ගත්තොත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ධුර සංඛ්‍යාව විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් වැඩි කළා. අභියාචනාධිකරණ විනිශ්චයකාර ධුර සංඛ්‍යාව විසිවන ආණ්ඩුක්‍රම සංශෝධනයෙන් වැඩි කළා. පහළ අධිකරණවලින්, විශේෂයෙන් මහාධිකරණයෙන්, නීතිපති දෙපාර්තමේන්තුවෙන් මේ ආදී තැන්වලින් තමයි උපරිමාධිකරණවලට විනිශ්චයකාරවරු තෝරා පත් කරනු ලබන්නේ. එතකොට අපට සිද්ධ වෙනවා පහළ අධිකරණවල ඉන්න අත්දැකීම් සහිත විනිශ්චයකාරවරු ඉහළ අධිකරණවලට ගන්න. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු 17දෙනෙක් ඉන්නවා. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු 20දෙනෙක් ඉන්නවා. පහළ අධිකරණවලින් අරගෙන මේ ඉහළ අධිකරණවල විනිශ්චයකාර ධුර පුරවන්න ගියොත් මහාධිකරණවල තිබෙන නඩු සංඛ්‍යාවට බලපෑමක් වෙනවා.

දැනට මේ තිබෙන තත්ත්වයේ බරපතළම අර්බුද තිබෙන්නේ මහාධිකරණවලින් පහළ අධිකරණවල. එම නිසා අපේ රටේ සියලු අධිකරණවල ඉන්න විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු දෙකකින් දීර්ඝ කිරීම හරහා එක්තරා වේගයකින් කටයුතු කිරීමේ අවස්ථාවක් අපට ලැබෙනවා කියලා කල්පනා කළා. එය

ලැබෙන්නේ ඔවුන්ගේ පරිණතභාවයත් එක්කයි. විශේෂයෙන්ම උපරිමාධිකරණවල විනිශ්චයකාර ධුරයක් ලබා ගන්න අවුරුදු තිහක්, හතළිහක් ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වය ලබන්න ඕනෑ. පහළ අධිකරණ ගත්තොත් ඉතාම වේගයෙන් නඩු විසඳීම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක වෙන්නේ අත්දැකීම් සහිත විනිශ්චයකාරවරු. මේ අධිකරණ පවත්වාගෙන යෑම ගැනත් මේ අවස්ථාවේදී කල්පනා කරන්න ඕනෑ. ඒ හැරෙන්න වෙනත් කිසිදු අපේක්ෂාවක් මේ යෝජනාව තුළ තිබුණේ නැහැ.

මේ සම්බන්ධයෙන් කථාබහ කරනකොට විරුද්ධ පක්ෂයේ අයට ආණ්ඩුවට විරුද්ධව තනිවම සටන් කරන්න බැරි හින්දා නීතිඥ සංගමය සහ විවිධ ආයතනවලටත්, ස්වාමීන් වහන්සේලාටත් විවිධ අසත්‍ය තොරතුරු දුන්නා. ඒ නොමඟ යැවීම් හමුවේ තමයි මේ ගොල්ලන් කොඩිය අරගෙන දුවන්න ගත්තේ. විශේෂයෙන්ම නීතිඥ සංගමය මුල් අවස්ථාවේදී මේ සම්බන්ධ සාකච්ඡා වට ගණනාවක් පවත්වලා, පදනම් ආයතනයේ විශාල සමුළුවක් පැවැත්වූවා. ඒ අවස්ථාවේදී ඒ අය කිව්වේ උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව විතරක් වැඩි කරනවා කියන කථාවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි දෙයක් කවදාවත් අපේ සාකච්ඡාවේ තිබුණේ නැහැ. අපේ සාකච්ඡාව තිබුණේ අර්බුද තිබෙන සෑම ක්ෂේත්‍රයක් පිළිබඳවමයි. වෛද්‍ය වෘත්තිය ඇතුළු රජයේ තවත් වෘත්තීන් ගණනාවක් පිළිබඳවත් සාකච්ඡා වෙමින් පැවතුණා. නමුත්, විරුද්ධ පක්ෂය කල්පනා කළා ආණ්ඩුවට එරෙහිව විශාල ඝෝෂාවක් නඟන්න මේක හොඳ අවස්ථාවක් කියලා. ඒ නිසා ඔවුන් මේ ලණුව හැම තැනටම ගෙනිහිල්ලා දුන්නා. නමුත් අපේ කැබිනට් මණ්ඩලයට සංකල්ප පත්‍රිකාවක් ඉදිරිපත් කළාට පස්සේ තමයි ඒ පිළිබඳව කතිකාවක් ගොඩ නැගෙන්න පුළුවන්කම තිබෙන්නේ. ඊට පස්සේ ඒ කාරණය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සේ ඒ පිළිබඳ ගැටලුවක් තිබෙනවා නම් ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය විමසන්න පුළුවන්. නමුත් මේ කිසිම අවස්ථාවක් නැතිව මේගොල්ලන් මේකට විරුද්ධව විශාල ඝෝෂාවක් නඟන්න උත්සාහ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට දැන් නම් කිසි ගැටලුවක් නැහැ.

මේ රටේ ජනතාව අපේ ආණ්ඩුව විශ්වාස කරනවා. අපි මේ අධිකරණ ක්ෂේත්‍රයේ ඇතිවෙලා තිබෙන ගැටලු නිරාකරණය කරන්න අවශ්‍ය තීන්දු තීරණ ගනිමින් ඉන්නවා. මේ සම්බන්ධයෙන් කවුරුවත් කිසිම සැකයක් තියා ගන්නා එපා. පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අපි කවුරුත් පිළිගන්නවා, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ලංකා ඉතිහාසයේ ගෙනාපු ප්‍රගතිශීලීම සංශෝධනය මේකයි කියලා. මේ විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැනත් අපේ රටේ ජනතාවට කවදාහරි දවසක පැහැදිලි වෙයි, මේ තුළ අපේ කිසිම යටි අරමුණක් තිබුණේ නැහැ කියලා. අපට තිබෙන එකම අරමුණ තමයි, අධිකරණ ක්ෂේත්‍රයේ ඇතිවෙලා තිබෙන නඩු ප්‍රමාදය සහ විවිධ ගැටලුවලට අවශ්‍ය ප්‍රතිකර්ම ලබාදීම. ඒ සඳහා රජයක් හැටියට අවංකව විනිවිදභාවයෙන් යුක්තව කටයුතු කරන බවත්, එහිදී ඇති වන කිසිදු තර්ජනයකට හෝ බාහිර බලපෑමකට ආණ්ඩුව යටත් නොවන බවත් ප්‍රකාශ කරමින්, මට මේ කාලය ලබාදීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.29]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நாடு பூராவும் ஒரு பேசுபொருளாக இருப்பது, கல்முனை வடக்கு ஆதார வைத்தியசாலையில் புதிதாக நியமனம் பெற்ற சுகாதார உதவியாளர்களுடைய பிரச்சினை. இந்தப் பிரச்சினை தொடர்பாக இந்தப் பாராளுமன்றத்திலே இருக்கின்ற முஸ்லிம், தமிழ்ப் பிரதிநிதிகள் எல்லோரும் கௌரவ அமைச்சரோடு பேசி, ஒரு தீர்வை எட்டுவதற்கான சந்தர்ப்பத்தைப் பெற்றிருந்ததன் அடிப்படையில், அவர்களைக் கௌரவ அமைச்சர் வேறொரு வைத்தியசாலைக்கு இடமாற்றம் செய்திருக்கின்ற ஒரு விடயம் இடம்பெற்றிருப்பதைப் பார்க்கின்றோம். உண்மையிலே, "இடமாற்றம் என்பதுதான் இதற்கான தீர்வா?" என்று கேட்டபோது, "அது தற்காலிகமானது" என்று கூறப்பட்டது.

கல்முனையைப் பொறுத்தவரையில், 'தற்காலிகம்' என்கின்ற ஒரு விடயத்தை நாங்கள் விலக்கவேண்டிய ஒரு தேவை இருக்கின்றது. அங்கு தற்காலிகமாக வழங்கப்பட்ட ஒரு பிரதேச செயலகம், இன்று அங்குள்ள மக்களுடைய சக வாழ்விலே பாரியதொரு பிரச்சினையை உண்டுபண்ணி இருக்கின்றது. இங்கு பேசுகின்ற அரச தரப்புப் பாராளுமன்ற உறுப்பினர்கள் பலரும் இந்த நாட்டினுடைய நலனைக் கருத்திற்கொண்டு தாங்கள் அடிக்கடி அரசியலமைப்பில் மாற்றங்களைக் கொண்டுவருவதாகக் கூறுகின்றார்கள். அப்படியானால், சுமார் 22 மில்லியன் மக்கள் வாழுகின்ற இந்த நாட்டிலே, முஸ்லிம்களும் இருக்கின்றார்களா, இல்லையா? என்பதை நாங்கள் இந்த இடத்திலே கேள்விக்கு உட்படுத்தப்பட வேண்டிய நிலை இருக்கின்றது. எனவே, 'தற்காலிக இடமாற்றம்' என்று சொல்கின்ற விடயத்தை அரசினுடைய ஒரு கையறு நிலையாகவே நாங்கள் பார்க்கின்றோம்.

எந்த விடயத்திலும் ஓர் உறுதியான தீர்வைப் பெறுவதற்கு ஏற்றவகையில் திடகாத்திரமான ஓர் அரசாங்கமாக இது இருக்கின்றது. 159 பாராளுமன்ற உறுப்பினர்களை வைத்துக் கொண்டு அதிக பலத்துடன் இருக்கின்ற அரசாங்கத்திற்கு ஏன் முஸ்லிம்களுடைய பிரச்சினையை நிரந்தரமாகத் தீர்க்க முடியாதிருக்கின்றது? இது முஸ்லிம்களுடைய ஒரு பிரச்சினையாகவே மாற்றப்பட்டிருக்கின்றது. இதனை ஒரு வைத்தியசாலையினுடைய பிரச்சினையாக நாங்கள் காணவில்லை. கல்முனை வடக்கு வைத்தியசாலை எதிர்காலத்திலே ஒரு தனியார் வைத்தியசாலை போன்று மாற்றம் பெற்றுவிடுமா என்றவொரு பயம் எங்களுக்கு இருக்கின்றது. அங்கே இருக்கின்ற சுகுணன் என்கின்ற ஒரு வைத்தியர், அரசினுடைய ஏனைய விடயங்களைக் கவனத்திற்கொள்ளாமல், அதாவது, E-code என்றாலும் சரி, அமைச்சின் சுற்றுநிருபம் என்றாலும் சரி அல்லது 'இந்த நாட்டிலே வாழுகின்ற எல்லா மக்களும் சமன்' என்று கூறுகின்ற அரசியலமைப்பு என்றாலும் சரி, அவற்றுக்கு மாற்றமாக அவர் எடுக்கின்ற முடிவுக்கு இணக்கமாக அமைச்சும் அரசும் இணைந்து செயற்படுகின்றதா என்பது கேள்விக்கு உட்படுத்தப்பட வேண்டிய விடயமாக இருக்கின்றது. எனவே, நாங்கள் அந்தச் சீருடை விவகாரம் தொடர்பான தற்காலிகத் தீர்மானத்தில் திருப்தி பெறவில்லை. "அங்கு முஸ்லிம், தமிழ் என்ற இனவாதத்தை யாரோ உட்புகுத்துகின்றார்கள்" என்று கூறிவிட்டு, தற்காலிகமாக

[ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා]

வழங்கிய இந்தத் தீர்வை நாங்கள் ஏற்றுக் கொள்ளவில்லை. எனவே, அந்தச் சகோதரிகள் தங்களுக்கு உரித்தான கலாசார ஆடைகளோடு அந்த வைத்தியசாலையிலே கடமை புரிவதற்கு ஏற்றவகையில் நிரந்தரமான ஒரு தீர்வுக்கு இந்த உயர்ந்த சபை அனுமதி வழங்க வேண்டும் என்று கேட்டு, இச்சந்தர்ப்பத்தைத் தந்தமைக்கு நன்றி கூறி, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.32]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපේ ආණ්ඩුව යටතේ ආර්ථිකය වර්ධනය කිරීම, ස්ථායීකරණය, සංවර්ධනය කිරීම සහ එහි ප්‍රතිලාභ මහජනතාවට ලබා දෙන ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති ඇතුළේ තිබෙන එක් ප්‍රධාන ක්ෂේත්‍රයක් තමයි අපනයන වෙළෙඳ පොළ. විදේශ වෙළෙඳ පොළේ සැලකිය යුතු ප්‍රමාණයක් අත්පත් කර ගැනීම අපේ ඉලක්කයක්. අපි ආණ්ඩුව ලබා ගත් මොහොතේ සිට මේ දක්වා තිබෙන්නේ සැලකිය යුතු ප්‍රමාණයක් නොවෙයි. හැබැයි, අපි ක්‍රමිකව ඒ සඳහා සැලසුම් සකස් කරමින්, දියත් කරමින් ඉදිරියට ගමන් කරමින් ඉන්නවා. ඒ අනුව අපි 2026-2030 සඳහා අපනයන සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කර තිබෙනවා, විදේශ වෙළෙඳ පොළෙන් වැඩි පංගුවක් අත්පත් කර ගන්නේ කොහොමද කියන එක ගැන. විදේශ වෙළෙඳ පොළේ වැඩි පංගුවක් අත්පත් කර ගන්නකොට, භාණ්ඩ අපනයනයේදී අපේ ප්‍රතිපත්තිවලට පරිබාහිරව ලෝකයේ වෙනත් රටවල් සහ වෙනත් කණ්ඩායම් ගන්නා තීන්දු මඟිනුත් අපේ උපාය මාර්ගවලට, අපේ අපනයන වෙළඳාමට යම් බාධා සහ ගැටලු පැන නඟින්න පුළුවන්.

අපි කාටත් මතක විදියට, ඉන් එක් අවස්ථාවක් තමයි ලෝක වෙළෙඳාම පිළිබඳ තරගය. ඇමෙරිකා එක්සත් ජනපදය ලෝකයේ අනෙක් රටවල් එක්ක තිබෙන වෙළෙඳ පරතරය සමහන් කර ගැනීමේ පරමාර්ථයෙන් අන්‍යෝන්‍ය තීරුබදු පැනවීමක් සිදු කරනවා. ඒක අපිට පාලනය කරන්න පුළුවන් එකක් නොවෙයි. ඒක, අපට පිටින් තිබිච්ච කාරණයක්. ඒ අනුව අපට පළමුවෙන්ම සියයට 44ක අන්‍යෝන්‍ය තීරු බද්දක් පැනෙව්වා. ඒ අවස්ථාවේදී අපි ඒ සඳහා වේගයෙන් මැදිහත් වෙලා, අදාළ කණ්ඩායම් පත් කරලා, තාක්ෂණික කමිටු පත් කරලා, ඇමෙරිකානු වෙළෙඳ ආයතනයත් සමඟ නිරන්තරයෙන් සාකච්ඡා කළා. අද වනතුරු ඒ සාකච්ඡා පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් විදියට ඒ සියයට 44 අන්‍යෝන්‍ය තීරු බද්ද එක් අදියරකදී සියයට 30 දක්වාත්, ඉන්පසුව සියයට 20 දක්වාත් අඩු කර ගන්න අපට ක්‍රමිකව පුළුවන්කම ලැබුණා. ඒ විදියට තමයි පිටින් එන කාරණාවලට අපි ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන ක්‍රියාත්මක වෙන්නේ. ඒ අතරතුරේ මෑතකදී බලහත්කාර ශ්‍රමය යොදාගෙන භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ඒවා අපනයනය කිරීම යන කාරණාවලදී 1974 ඇමෙරිකා එක්සත් ජනපද වෙළෙඳ පනතේ 301 වගන්තිය තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ අනුව ඔවුන් ස්වාධීනත්වය මත පරීක්ෂණ කටයුතු කිරීමෙන්, යම් විමර්ශන කටයුතු කිරීමෙන් ලැබුණු ප්‍රතිඵල අනුව යම් ආකාරයකින් රටවල් ගණනාවකටම භාණ්ඩ නිෂ්පාදනය තුළ මේ බලහත්කාර ශ්‍රමය භාවිත විය හැකියි කියන අවදානම මත රටවල් 67කින් තෝරාගත් රටවලට සියයට 12.5ක බද්දක් සහ සියයට 10ක බද්දක් යෝජනා කරලා තිබුණා. ශ්‍රී ලංකාව සම්බන්ධයෙනුත් කරුණු එක්රැස් කිරීමේදී, මූලික විමර්ශනවලදී යම් අවදානමක් තිබෙන්න පුළුවන්. බලහත්කාර ශ්‍රමය ගැටගැහිච්ච භාණ්ඩ ගෝලීය වටිනාකම් දාමය තුළ නිෂ්පාදනය වෙන්න පුළුවන්. මොකද, අතීතයේ දී වාගේ නොවෙයි, දැන් භාණ්ඩ නිෂ්පාදනය කරනකොට - සියලුම අමුද්‍රව්‍ය, ශ්‍රමය සහ අනෙකුත් සියලුම කාරණා සහිතව සමස්ත භාණ්ඩය එකම ස්ථානයක නිෂ්පාදනය වෙනවාට වඩා - ලෝක වෙළෙඳ පොළෙන් අමුද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් හැම රටකටම ගමන් කරනවා. ඒ නිසා වටිනාකම් දාමයක් තිබෙනවා. ඒ දාමය ගැටගැසී තිබෙනවා, ලෝක සැපයුම් දාමයකට. ඒ අනුව සියයට 12.5ක අතිරේක බද්දක් පැනවීම සඳහා හැකියාවක් තිබෙන්න පුළුවන් කියලා යෝජනා කළා. අපි ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව, ඒ නීතිමය රාමුව පිළිබඳව පැහැදිලි කරන්න, සාකච්ඡා කරන්න අවශ්‍යයි. ඒ නිසා, ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් හා මැදිහත්වීම පරිදි වේගයෙන්ම ක්ෂණික කමිටුවක් - අමාත්‍ය කමිටුවක් - පත් කළා. ඒ වාගේම, ඒ සඳහා තාක්ෂණික සහාය ලබාදීමට කමිටුවක් පත් කරලා අපි මේ වෙනකොට ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන තිබෙනවා.

විශේෂයෙන්ම වෙනත් බලපෑම්, බාහිර ලෝකයේ මොනවා තිබුණත්, රට ඇතුළේ භාණ්ඩ නිෂ්පාදනය කරනකොට බලහත්කාර ශ්‍රමය, ළමා ශ්‍රමය, වහල් ශ්‍රමය වාගේ දේවල් යොදවා ගන්නට අපි රටක් විදියට කිසිදු ආකාරයකට ඉඩ දෙන්නේ නැහැයි කියලා නීති අණපනත් සකස් කර තිබෙනවා. ඒ වාගේම, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තිබෙන සම්මුතීන් අපරානුමත කරලා ඒ අදාළ ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. ඒ නිසා අපි ප්‍රතිපත්තිමය වශයෙන් රටක් විදියට ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය කිසිදු ආකාරයකින් නිෂ්පාදන ක්‍රියාවලිය ඇතුළේ යොදවන්නේ නැහැ. අපි ඒ සඳහා නීති-රීති අරගෙන තිබෙනවා. ඒ වාගේම මේ සැපයුම්දාමයට, වටිනාකම්දාමයට අනුව අපි ආනයනය කරන අමුද්‍රව්‍යවල යම් ආකාරයක වෙන රටක බලහත්කාර ශ්‍රමය සම්බන්ධ වෙච්ච භාණ්ඩ තිබෙනවාද කියන කාරණයේදී දැනටත් එය අනුගමනය කරමින්, පරීක්ෂා කරමින්, ඒ අනුව තමයි රේගුවෙන් භාණ්ඩ ආනයනය කරන්නේ.

කෙසේ වෙතත්, අපට පෙන්නුම් කරන්නට අවශ්‍ය වුණා, ඒ කරුණු කාරණා අනුව මේ නිෂ්පාදන ක්‍රියාවලිය ඇතුළේ බලහත්කාර ශ්‍රමය යොදවන්න දෙන්නේ නැහැ කියන එක සම්බන්ධයෙන් අපි ඉතාම කැපවෙනවා කියන එක. ඒ අනුව, වේගයෙන් අපි ගත් ඒ ක්‍රියාමාර්ග මොනවාද කියා ඉදිරිපත් කරමින්, තවදුරටත් අපි ඍජුව ආනයනය කරන භාණ්ඩයක් තිබෙනවා නම්, ඒක බලහත්කාර ශ්‍රමයට සම්බන්ධ වෙලා නම්, ඒ නිෂ්පාදන තහනම් කිරීම සඳහා වූ ගැසට් නිවේදනයක් 2026.07.10වැනි දා නිකුත් කළා. එහි ප්‍රතිඵලයක් විදියට, අන්න ඒ අතිරේකව පනවපු සියයට 12.5ක තීරු බදු ප්‍රමාණය සියයට 10 දක්වා අඩු කරගන්න අපට හැකියාව ලැබුණා. ඒ අනුව, අපේ අපනයනකරුවන්ට විශේෂ වාසියක් ලැබුණා. මේ කලාපයේ තිබෙන රටවල් ගත්තාම, රටවල් කිහිපයකට සියයට 10ක අනුපාතය තමයි තිබෙන්නේ. ඒ වාගේම, රටවල් ගණනාවකට සියයට 12.5ක අනුපාතය තිබෙනවා. ඒ නිසා අපි අවාසිදායක තත්ත්වයක නැහැ. අපේ තරගකාරී රටවල් වන බංග්ලාදේශය සහ අනෙකුත් රටවල් එක්ක අපි සම මට්ටමේ සිටිනවා. ඒ නිසා අපනයන වෙළෙඳාමට, අපේ අපනයන උපාය මාර්ගයට මෙයින් ගැටලුවක් පැන නැඟී නැහැ. අපේ අපනයන උපාය මාර්ගයේදී යුරෝපය, ඇමෙරිකා එක්සත් ජනපදය, අප්‍රිකානු කලාපය ඉලක්ක කරගෙන වෙළෙඳ පොළත්, භාණ්ඩ විවිධාංගීකරණය සිදු කිරීමත් මේ අනුව බලාපොරොත්තු වෙනවා. ඒත් එක්කම මේ තිබෙන නීතිමය තත්ත්වය සහ අප ගත් ක්‍රියාමාර්ග උපයෝගී කරගෙන ඉදිරියේදී යුරෝපීය සංගමයේ GSP Plus සහනය සඳහා වූ අයදුම් පත්‍රය නැවත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා. කැබිනට් අනුකමිටුවක්, ඒ වාගේම තාක්ෂණික කමිටුවක් පත් කරලා, ඒ ඒ නීති-රීතිවලට අනුගතව අපි කොහොමද මේ

වැඩකටයුත්ත සිද්ධ කරන්නේ කියන එක ගැන ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ඒ අනුව අපට පෙනෙන දෙයක් තමයි මේ ගන්නා ක්‍රියාමාර්ග ඇතුළේ කොච්චර දුරට අපේ ආර්ථිකය සවිමත් වෙලා තිබෙනවාද කියන එක.

අපේ ආර්ථිකයේ සෞඛ්‍ය තත්ත්වය, ප්‍රගතිය මැනීමේ දර්ශක ගත්තාම විවිධ ආකාරයේ දර්ශක තිබෙනවා. ඒවා දේශීය පරිමාණයෙන්, ලෝක පරිමාණයෙන් තිබෙනවා. එහි ප්‍රධානම දර්ශකයක් තමයි ආර්ථික වර්ධනය. මොන ආකාරයට ආර්ථිකය වර්ධනය වෙනවාද, ඒ කියන්නේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන භෞතික ප්‍රමාණය වැඩි වෙනවාද කියලා බලනවා. අපි දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය කියන්නේ ඒකට. 2025 වර්ෂයේදීත්, 2026 වර්ෂයේදීත් මෙය අඛණ්ඩව වේගයෙන් ඉදිරියට අරගෙන එන්න, අපි සැලසුම් කරපු ඉලක්ක අබිබවා යන්න අපට හැකියාව ලැබී තිබෙනවා. 2026 වර්ෂයේ පළමු කාර්තුවේදී සියයට 5.1ක ආර්ථික වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ වාගේම, නාමික දළ දේශීය නිෂ්පාදිතයත් වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම, රටවල් අතර සංසන්දනය කරනකොට ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය යොදා ගන්නවා. ඒ අනුව මේ වෙනකොට ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඩොලර් 5,000 ඉක්මවන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා. එහි අගය ඩොලර් 5,004යි. ඒ කියන්නේ, වර්ධනය වීමේ සාර්ව ආර්ථික මට්ටමේ ප්‍රගතීන් ගණනාවක් තිබෙනවා. ඒ වාගේම, ඉහළ මැදි ආදායම් ලබන කාණ්ඩයක් විධියට අපේ රට වර්ගීකරණය වෙලා තිබෙනවා. අන්න ඒ ආර්ථික වර්ධනය පැත්තෙන් ලබා ගත් ජයග්‍රහණවල ප්‍රතිලාභය මහජනතාවට දිගුකාලීනව, තිරසරව ලබා දෙන්න වැඩසටහන් ගණනාවක් අපි යෝජනා කර තිබෙනවා, මහජනතාව සවිබලගන්වමින් ඒ සියලුදෙනා ආර්ථික ක්‍රියාවලියට එකතු කරගන්න. ඒක තමයි අපේ දිගුකාලීන ක්‍රියාමාර්ගය වෙන්නේ.

ඒ වාගේම මේ ආර්ථික වෘද්ධියේදී උද්ධමනය පාලනය කරගැනීම වැදගත් වෙනවා. අර මැද පෙරදිග යුද්ධය තත්ත්වයේදී, විශේෂයෙන් ඉන්ධනවලට ඇති වෙච්ච බලපෑම නිසා උද්ධමනයට යම් පුංචි බලපෑමක් ඇති වුණත්, අපි සැලසුම් සහගතව ඒ උද්ධමනය පාලනය කරන රාමුව ඇතුළේ තවමත් ඉන්නවා. ඒ රාමුව ඇතුළේ ඉඳගෙන මේ අවුරුද්ද ඇතුළතදී උද්ධමනය පාලනය කරමින්, මහජනතාවට අනවශ්‍ය පීඩනයක් නොදී වැඩකටයුතු කරන්න පුළුවන් වෙයි කියන එක ගැන අපට දැඩි විශ්වාසයක් තිබෙනවා. ඒ වාගේම තමයි, ගෙවුම් ශේෂ තුලනය. ගෙවුම් ශේෂ තුලනයේදීත් 2025 වර්ෂයේදී අපි විශාල ප්‍රගතියක් අත්පත් කර ගත්තා. මේ මාස කිහිපයේදී ගෙවුම් ශේෂ තුලනයේ යම් ඍණාත්මක බලපෑමක් ඇතිවෙලා තිබෙනවා. නමුත්, 2026 වර්ෂය ඉතාම සාධනීය, ධනාත්මක විධියට අවසන් කරගන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා.

ඊළඟට වැදගත් වන කාරණය තමයි, රට ඇතුළේ ආදායම් ඒකාග්‍රතාව. සාමාන්‍යයෙන් ආදායම් ඒකාග්‍රතාව - fiscal consolidation - ඇති කරගන්න ගියාම ඇති වන ගැටලුව තමයි පවතින බදු අනුපාත වැඩි කර ගැනීමට සිදු වීම. ඒ නිසා තමයි මේ බදු අනුපාත වැඩි කරලා, බදු ගහනවා; බදු ගහනවා කියලා පොදුවේ විපක්ෂයෙනුත් අපට චෝදනා කරන්නේ. ඇත්තටම අපේ ආදායම් ඒකාග්‍රතාව ඇතුළේ අපි එවැනි ක්‍රියාමාර්ග එකක්වත් අරගෙන නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැම තිස්සේම බදු කාර්යක්ෂමතාව වැඩි කරමින්, බදු දැල පුළුල් කරමින්, ඒ බදු ගෙවීමේ එකඟතාව, අනුකූලතාව වැඩි කරමින් තමයි අපේ බදු ආදායම වැඩි කරගෙන තිබෙන්නේ. ඒක ඉතාම වැදගත්. අනෙක් පැත්තෙන් වියදම් කප්පාදුව තමයි අතීතයේදී අපට දකින්නට ලැබුණේ. අපේ මේ ආදායම් ඒකාග්‍රතාවේදී කිසිදු ආකාරයකට වියදම් කප්පාදු කරලා නැහැ. වියදම් ප්‍රමුඛතාගත කරලා, විශේෂයෙන්ම ඒ ඉලක්කගත ප්‍රජාවට වියදම් ලබා දීලා තිබෙනවා. එහි ප්‍රතිඵලය විධියට තමයි, "දිට්වා" සුළි කුණාටුව වෙලාවේදී අතිරේක ඇස්තමේන්තුවක් මඟින් මුදල් වෙන් කර ගන්නට අපට හැකියාව ලැබුණේ. ඒ වාගේම මැද පෙරදිග යුද්ධමය තත්ත්වයේදී අතිරේක ඇස්තමේන්තුවක් මඟින් රුපියල් බිලියන 100ක් වෙන් කරගන්නත් අපට හැකියාව ලැබුණා. ඒ, දේශීය තත්ත්වය. අපි ඉතා පැහැදිලිව, නිශ්චිතව, ස්ථාවරව, තිරසරව, ඔරොත්තු දීමේ හැකියාව පෙන්වමින් තමයි ඉදිරියට ගමන් කරන්නේ. ඒ වාගේම ජාත්‍යන්තර මට්ටමේ සංචිත පිළිබඳව සැක බය මතු කළා, විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්. එහෙම ගැටලුවක් ඇති කර ගත යුතු වන්නේ නැහැ. සංචිත කියන්නේ, ආර්ථික ක්‍රියාවලිය ක්‍රියාත්මක කරමින් ක්‍රමිකව ගොඩනඟා ගන්න දෙයක්. ඕනෑ නම් ආර්ථික ක්‍රියාවලිය නවත්වා අපට සංචිත ගොඩනඟා ගන්න පුළුවන්. නමුත්, අපි ආර්ථික ක්‍රියාවලියට ඔරොත්තු දෙමින්, ආනයන සීමා නොකරමින්, ඒවාට ඉඩ තබමින් තමයි ඉදිරියට යන්නේ. ඒ අනුව අපි ඉලක්ක කර ඇති, අපේක්ෂා කරන සංචිත ප්‍රමාණය මේ අවුරුද්ද අවසාන වන විට ලබා ගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා.

ණය තිරසරභාවයත් ඒ වාගේම ඉතා වැදගත් බව අපි කවුරුත් දන්නවා. මේ ස්ථාවරත්වයේදී එයත් වැදගත් වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය ප්‍රතිව්‍යුහගතකරණය මඟින් ණය තිරසරභාවය ඇති කරන්න අපට පුළුවන්කම ලැබුණා. පසුගිය ආණ්ඩු විසින් ඵලදායී නොවන ව්‍යාපෘති සඳහා අත්තනෝමතිකව ලබා ගත් ණය අපේ ආර්ථිකයට විශාල බරක් සහ පීඩනයක් ගෙනැවිත් දී තිබුණා. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ගත්තාම විශාල ණය බරක් අපට තිබුණා. ඒ ණයවලට ගෙවිය යුතු පොලී ප්‍රමාණය ඉතා විශාලයි. අපි ආණ්ඩුවේ ආදායම වැඩි කරලා, වියදම් කළමනාකරණය කරලා, ප්‍රාථමික ශේෂයක් ඇති කරගෙන, ආර්ථික ස්ථාවරත්වය අත්පත් කර ගත්තාට ඒකෙන් විශාල පංගුවක් අපට යොදන්න සිද්ධ වෙලා තිබෙනවා, ණය පොලී ගෙවීමට. උපාය මාර්ගිකව ඉදිරියේදී ණය පොලිය අඩු කර ගැනීමේ ක්‍රියාමාර්ගයක් අපි දැන් තෝරමින් සිටිනවා. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ක්‍රමිකව අපි ඒ ණය බර අඩු කරගෙන එනවා. එහි කැපී පෙනෙන ස්ථානයක් තමයි අපි කවුරුත් දන්නා ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර - ISBs. ඒවා සම්බන්ධයෙන් අතීතයේදී තිබුණා, අවදානමක්. ඒ බැඳුම්කර වෙළෙඳ පොළේ විකිණුනේ නැහැ. ඩොලර් 100ක බැඳුම්කර ඩොලර් 30කට හෝ 40කට විකිණිලා ඉතා අනතුරුදායක, අවදානම් බැඳුම්කරයක් විධියට තමයි ලංකාවේ ඒ බැඳුම්කර නිර්ණය වුණේ. එයට අපි junk bonds කියලා කියනවා. දැන් කියන්න සතුටුයි, ලෝක වෙළෙඳ පොළේ - ද්විතීයික වෙළෙඳ පොළ ඇතුළේ - එම බැඳුම්කර විකිණෙන්නේ ඉතා ඉහළ මිල ගණන්වලට බව. අපේ coupon rate එක, එයට ලබා දෙන පොලියට වඩා අඩු yield එකක්, ඵලදාවක් ලැබෙන විට ඒවා වෙළෙඳ පොළේ විකිණෙනවා. ඒ කියන්නේ, දැන් ඉතා වැඩි මිලක් නිර්මාණය වෙලා තිබෙනවා. දැන් අපේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් මේ සම්බන්ධව සැලසුම් සකස් කරමින් සිටිනවා. අපට යම් හැකියාවක් තිබේවි, අර පරණ වැඩි පොලියට තිබෙන ණය වෙනුවට අඩු පොලියේ ණයවලින් මේක ආදේශනය කර ගැනීමට. එය ඉදිරියේදී ඉතා වැදගත් වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මූල්‍ය ස්ථාවරත්වය අත්පත් කර ගන්නකොට මේ ණය අපට විශාල බරක් වනවා. අතීත ආණ්ඩු ගත් ණය තවමත් අපට විශාල බරක් වෙලා තිබෙනවා. අපි ඒ සඳහාත් මුහුණ දෙමින් ඉදිරියට ගමන් කරමින් ඉන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් කථාව අවසාන කරන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියලා මම කථාව අවසාන කරනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

අපි දුෂ්කරතා සහ අභියෝග මතින් පියමං කරද්දි ජාත්‍යන්තර සහයෝගීතාව වාගේම ප්‍රාදේශීය සහයෝගීතාවත් ඉතා වැදගත් වනවා. මෙහිදී වැදගත් වනවා, BIMSTEC - Bay of Bengal Initiative for Multi-Sectoral Technical and Economic Cooperation - සමුළුව. ලංකාවත් එහි සාමාජිකයෙක්. ලංකාව සම සභාපතිත්වය දරමින් අද සහ හෙට විශේෂ සමුළුවක් පැවැත්වෙනවා. ඒ අය තමයි, Expert Group on Fiscal and Monetary Policy. බදු ප්‍රතිපත්ති, රාජ්‍ය ආදායම් ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ අපේ දැනුම එහිදී බෙදා ගන්නවා. විශේෂයෙන් අපි කොහොමද මේ අර්බුදය හමුවේ කටයුතු කළේ, එය අතික්‍රමණය කරලා ජයග්‍රහණ අත්පත් කර ගත්තේ කොහොමද කියලා අපේ ක්‍රියාකාරකම් පෙන්නුම් කළ හැකි සමුළුවක් තමයි එය. අද එය පැවැත්වුණා. එයට සම්බන්ධ වන්න මට අවස්ථාව ලැබුණා. ඒ අනුව අපි ප්‍රාදේශීය සහයෝගීතාව වැඩිදියුණු කර ගන්නවා. ඒ වාගේම අද සම්මත කර ගන්නා මේ රෙගුලාසි මඟිනුත් ජාත්‍යන්තර වශයෙන් වෙළෙඳාම සහ ආයෝජන තව තව වැඩිදියුණු කර ගන්න අනාගතයේදී අපට හැකි වෙයි. අද ගෙන ආ මෙම රෙගුලාසි රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඉවහල් වන බව සඳහන් කරමින්, මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ අනුව අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 යථා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත දෙවන වර කියවීම.

## ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## இலங்கை தேசிய புகைப்படக் கலைச் சங்கம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
## NATIONAL PHOTOGRAPHIC ART SOCIETY OF SRI LANKA (INCORPORATION) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 53(3) වන ස්ථාවර නියෝගය යටතේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.***
*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக்கட்டளை 53(3)இன்படி சட்டவாக்க நிலையியற் குழுவுக்கு மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்களால் சாட்டப்பட்டது.*
*Bill accordingly read a Second time, and allocated by THE HON. PRESIDING MEMBER to Legislative Standing Committee under Standing Order 53(3).*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

### දේශීය වෛද්‍ය උපාධිධාරින්ට පත්වීම් ලබාදීම
### சுதேச மருத்துவப் பட்டதாரிகளுக்கு நியமனம் வழங்குதல்
### GRANT OF APPOINTMENTS FOR INDIGENOUS MEDICINE GRADUATES

[பி.ப. 5.47]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய ஒத்திவைப்புப் பிரேரணையாக, சுதேச வைத்திய துறைப் பட்டதாரிகளின் தொழில் வாய்ப்பின்மை பற்றிய மிக முக்கியமான ஒரு விடயத்தை நான் சுருக்கமாகக் குறிப்பிட விரும்புகின்றேன்.

" எமது உள்நாட்டு வைத்தியத் துறை என்பது எமது பாரம்பரிய, பக்க விளைவுகளற்ற உன்னத மருத்துவத் துறையாகும். இத்தகைய பாரம்பரிய வைத்திய முறையைப் போற்றி வளர்க்கவேண்டியது அரசாங்கத்தின் தார்மீகக் கடமையாகும். எனினும், எமது சுதேச வைத்தியத் துறைக்குரிய ஆயுர்வேதம், சித்த வைத்தியம் மற்றும் யுனானி ஆகிய மருத்துவ முறைகள் தற்காலத்தில் முக்கியத்துவம் குறைந்தவையாகக் கணிக்கப்படுகின்றனவா? என்ற பலத்த கேள்வி மக்கள் மத்தியில் எழுகின்றது. இத்துறை சார்ந்த பல்கலைக்கழகப் பட்டதாரிகள் தங்களது உள்ளகப் பயிற்சி - internshipஐ வெற்றிகரமாக முடித்த பின்னரும், முறையான வேலைவாய்ப்புகளின்றித் தொழிலற்ற பட்டதாரிகளாக, தொழிலற்ற வைத்தியர் களாகப் பல வருடங்களாகக் காத்துக் கிடக்கின்றனர். இவர்களது பணிகள் பொதுமக்களுக்கு மிகவும் அவசிய மானவையாக இருந்தபோதிலும், அவை கொள்கை வகுப்பாளர்களால் போதியளவு உணர்ந்துகொள்ளப் படவில்லை என்பது வேதனைக்குரிய ஒரு விடயமாகும்.

உள்நாட்டுப் பாரம்பரிய வைத்தியர்களை எமது தாய் நாட்டிலேயே முறையாகப் பயன்படுத்த வேண்டும். நமது துறைசார்ந்த விசேடத்துவக் கல்வி காரணமாக, அவர்கள் வேறு தொழில்களை நாடிச் செல்ல முடியாத நிலையில் உள்ளனர். தற்காலத்தில் தொற்றா நோய்களினால் பெருமளவிலான மக்கள் பாதிக்கப்பட்டு வருவதுடன், பல மரணங்களும் சம்பவிக்கின்றன. இத்தகைய நோய்களை ஆரம்பத்திலேயே கட்டுப்படுத்தக்கூடிய ஆற்றலும் திறமையும் சுதேச வைத்தியத் துறைக்கு இருக்கின்றது.

மேலும், தமிழ் மக்கள் செறிந்து வாழும் வடக்கு, கிழக்கு மற்றும் ஊவா மாகாணங்களில் மாகாண மட்டத்திலான சுதேச வைத்தியசாலைகள் அமைக்கப்படவில்லை என்ற கருத்தும் நிலவுகின்றது. ஏனைய 06 மாகாணங்களிலும் இத்தகைய மாகாண வைத்தியசாலைகள் வெற்றிகரமாக இயங்கிவரும் நிலையில், இந்த மூன்று மாகாணங்களிலும் அந்த வைத்தியசாலைகள் இல்லை என்று சொல்லப்படுகின்றது. தற்போது அறிந்த தகவலின் அடிப்படையில் ஊவா மாகாணத்துக்குரிய சுதேச மருத்துவ வைத்தியசாலை தியத்தலாவையில் இருப்பதாகச் சொல்லப்படுவதனால், வடக்கு, கிழக்கில் மாகாண மட்டத்திலான சுதேச மருத்துவ வைத்தியசாலைகள் இல்லை என்பது பெரும் குறைபாடாக இருக்கின்றது. துறைசார்ந்து தொழில்சார் தகைமைபெற்ற வைத்தியர்களை உரிய முறையில் பயன்படுத்த முடியாமல் இருப்பது, நாட்டின் உயர் கல்விக்காக முதலீடு செய்யப்பட்ட நிதியினதும் வளத்தினதும் வீண் விரயமாகவே அமையும். அத்துடன், நாட்டில் நிலவும் மேலைத்தேய வைத்தியர்களின் பற்றாக்குறையை ஓரளவேனும் ஈடுசெய்யப்படுவதற்கும் சுதேச வைத்தியர்களின் பங்களிப்பு அவசியமாக உள்ளது. எனவே, ஒட்டுமொத்த சுகாதார மேம்பாட்டுக்கும் தீராத கொடிய நோய்களிலிருந்தும் தொற்றா நோய்களிலிருந்தும் மக்களைப் பாதுகாப்பதற்கு சுதேச வைத்தியத் துறை இன்றியமையாதது என்பதை அரசாங்கம் உணர்ந்து செயற்பட வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

தகைமை வாய்ந்த சுகாதார வளவாளர்களைப் புறக்கணிப்பதென்பது தேசத்தின் மனித வளத்தை நாங்கள் விரயமாக்குவது போன்று அமையும். எனவே, அரசாங்கம் இவ்விடயத்தில் உடனடியாகத் தலையிட்டு, சுதேச வைத்தியர்களுக்கான முறையான தொழில் வாய்ப்புகளை வழங்குவதற்குரிய சூழலை உருவாக்க வேண்டும். வளத்தைக் காப்போம்! வளமாக வாழ்வோம்! Clean Sri Lanka திட்டத்தின் ஆரோக்கியமான வெற்றிக்கு எமது சுதேச வைத்தியர்களையும் முழுமையாகப் பயன்படுத்த வேண்டுமென்று இந்தப் பிரேரணையின்மூலம் கேட்டுக் கொள்கின்றேன்."

இது தொடர்பில் இங்கு சில தகவல்களைக் குறிப்பிட விரும்புகின்றேன். 2019ஆம் ஆண்டிலிருந்து இதுவரை 1,800 சுதேச வைத்தியர்கள் தொழில் வாய்ப்பு இல்லாமல் இருக்கின்றார்கள். அப்படிப் பார்க்கின்றபொழுது, அந்த வைத்தியத் துறையில் பட்டத்தைப் பெற்றும்கூட, ஏழு வருடங்களாகத் தொழில்களைப் பெற முடியாத நிலையில் இவர்கள் காணப்படுகின்றார்கள். எனவே, இந்த வைத்தியத் துறைப் பட்டதாரிகளுக்குத் தொழில் வாய்ப்பை அளிக்க வேண்டிய தேவையுள்ளது. ஏனென்றால், உங்களுக்குத் தெரிய வேண்டும், மேலைத்தேய வைத்தியத் துறையில் கல்வி கற்றவர்கள் பெரும்பாலும் மேலைத்தேய நாடுகளுக்குச் சென்று தொழில் வாய்ப்புக்களைப் பெறக்கூடிய வசதிகள் இருந்தாலும், சுதேச வைத்தியத் துறையில் கற்கின்றவர்களுக்கு அப்படியான வசதி வாய்ப்புக்கள் இல்லை என்பது. இவர்கள் ஏற்கனவே சுதேச வைத்தியத் துறையை நாடாமல் அல்லது பிற துறைகளில் கற்பதற்கு வாய்ப்பளித்திருந்தாலும் அவர்கள் உயிரியல் பட்டதாரிகளாக, விவசாயப் பட்டதாரிகளாக அல்லது வேறு துறைசார்ந்த பட்டதாரிகளாகத் தொழில் வாய்ப்புக்களைப் பெற்றிருப்பார்கள். இப்பொழுது நாங்கள் அவர்களைச் சுதேச வைத்தியத் துறை சார்ந்த வைத்தியர்களாகக் குறிப்பிட்டாலும்கூட, தொழில் வாய்ப்பு அற்றவர்களாக இருக்கும் அவர்கள் மன உழைச்சலுடன் வாழ்ந்து கொண்டிருக்கின்றார்கள். எனவே, கௌரவ சுகாதார அமைச்சர் அவர்களிடம் நான் கேட்டுக் கொள்கின்ற விடயம் என்னவென்றால், நாட்டின் பல பகுதிகளிலும் வேலையில்லாமல், தாங்கள் கற்ற கல்வி பிரயோசனம் அற்றது என்ற உணர்வுடன் இருக்கின்ற இந்த வைத்தியர்களுக்கு நிச்சயமாகத் தொழில் வாய்ப்பை அளிக்க நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும் என்பதாகும்.

இந்த இடத்தில் இன்னுமொரு விடயத்தைச் சொல்கின்றேன். அண்மையில், தன்னுடைய பட்டப்படிப்பை முடித்த ஒரு கலைப் பட்டதாரியான க.டிலக்சன் என்ற பையன், தாய், தகப்பன் இல்லாத நிலையில் தனது கல்வியைக் கற்றும், தொழில் வாய்ப்பின்மையால் கூலித் தொழிலுக்குச் - மேசன் தொழிலுக்கு - சென்ற இடத்தில், அங்குள்ள சுவரொன்று இடிந்து விழுந்ததனால் இறந்திருக்கின்றார். இது வேதனைக் குரிய ஒரு விடயமாகும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Hon. Presiding Member, please give me a minute.

அவருக்கு இந்த இடத்தில் எனது அனுதாபத்தைத் தெரிவித்துக்கொள்வதோடு, அவரைப் போன்ற இன்னும் பல பட்டதாரிகள் தாம் கற்ற கல்விக்குப் பெறுமதியில்லாமல் கூலிகளாகப் போகின்ற ஒரு நிலைமை காணப்படுவதை இங்கு சுட்டிக்காட்ட விரும்புகிறேன். இந்த நிலைமையை மாற்று வதற்குச் சுதேச வைத்தியப் பட்டதாரிகளுக்குரிய தொழில் வாய்ப்புகளை உடனடியாக வழங்க கௌரவ சுகாதார அமைச்சர் அவர்கள் நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டுக் கொள்கிறேன். அதுபோல், Bachelor of Education பட்டதாரிகளுக்கு இப்பொழுது பரீட்சை இல்லாமல் தொழில் வழங்குவதற்காக எடுத்திருக்கும் முயற்சியை நான் பாராட்டுவதுடன், அதனையும் விரைவில் வழங்க வேண்டுமெனக் கோரி, எனது முன்மொழிவை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

பி.ப. 5.54]

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஞானமுத்து ஸ்ரீநேசன் அவர்களால் இன்றைய நாளில் கொண்டுவரப்பட்டுள்ள இந்தப்

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

